# ඇතුළු පිටු


1. ප්‍රාරම්භක වාක්‍යය ....................................................................01

2. උපලේඛන අංක 2 - පොදු විධිවිධාන හා වරප්‍රසාද
   2.1 පදිංචිය, චාරිකා හා රැකියාව ....................................................................02
   2.2 වයස සනාථ කිරීම ....................................................................02
   2.3 නීතිය හා අර්ථ දැක්වීම ....................................................................02
   2.4 වාරික ගෙවීම/අනුග්‍රහ කාලසීමාව ....................................................................02-03
   2.5 ආයෝජන ගිණුම ....................................................................03
   2.6 මූලික ප්‍රතිලාභය ....................................................................04
   2.7 පවාරණ අගය ....................................................................05
   2.8 කොටස් වශයෙන් මුදල් ආපසු ගැනීම ....................................................................05
   2.9 වාරික නොගෙවීම ....................................................................06
   2.10 ගෙවා නිමි ඔප්පු හා අහිමි නොවීමේ ප්‍රතිලාභ ....................................................................06
   2.11 අප්‍රාණික ඔප්පු ප්‍රාණවත් කිරීම/ප්‍රතිශ්ඨාපනය ....................................................................06
   2.12 ඔප්පු වෙනස්වීම ....................................................................07
   2.13 ලාභාංශ ....................................................................07
   2.14 පාරිතෝෂිත දීමනා ....................................................................07
   2.15 අමතර තනි වාරික ....................................................................08
   2.16 ඔප්පු ණය මුදල් ....................................................................08
   2.17 පැවරීම ....................................................................08
   2.18 නම් කිරීම ....................................................................08
   2.19 හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රියාපටිපාටිය ....................................................................09
   2.20 සියදිවි නසා ගැනීම ....................................................................10
   2.21 සම්පූර්ණයෙන්ම වගකීම් බැහැර කිරීම ....................................................................10
   2.22 වාරිකයන් අහිමිවීම ....................................................................11
   2.23 අතුරුදහන් වූ පුද්ගලයන් ....................................................................11
   2.24 අවලංගු කිරීමේ අයිතිය ....................................................................11
   2.25 විවාද රහිත බව ....................................................................11
   2.26 බදුකරණය ....................................................................11
   2.27 පැමිණිලි සහ අභියාචනා කළමණාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය ....................................................................11-12

3 උපලේඛන අංක 3 - ජීවිත රක්ෂණ අතිරේක ආවරණ
   3.1 ජීවිත රක්ෂණ අතිරේක ප්‍රතිලාභ (සෞඛ්‍යය නොවන)
      3.1.1 මරණයකදී වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPWPD) ....................................................................13
      3.1.2 හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPADB) ....................................................................14-15
      3.1.3 පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හේතුවෙන් (සීමිත ගෙවීම්)(LPTPA)16-18
      3.1.4 දීර්ඝ කරන ලද අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හේතුවෙන් (සීමිත ගෙවීම්) (LPEPD) ....................................................................19-21
      3.1.5 සමකාල ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPLTB) ....................................................................22
      3.1.6 අවමංගල්‍ය වියදම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPFEB) ....................................................................23-24
      3.1.7 හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස්වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPWP) ....................................................................25-27
      3.1.8 යූනියන් පවුල් ආදායම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPFIB) ....................................................................28
      3.1.9 සහකරුගේ ජීවිතය මත සමකාලීන ප්‍රතිලාභය (සීමිත ගෙවීම්)(LPSPB) ....................................................................29

   3.2 ජීවිත රක්ෂණ අතිරේක ප්‍රතිලාභ (සෞඛ්‍යය)
      3.2.1 යූනියන් සුවමග ප්‍රතිලාභය (SMB) ....................................................................30-48
      3.2.2 රෝහල් දීමනා ප්‍රතිලාභය (HCB/HCC) ....................................................................49-53
      3.2.3 පූර්ණ සැත්කම් ප්‍රතිලාභය (CSB) ....................................................................54-63
      3.2.4 යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් (USHP) ....................................................................64-81
      3.2.5 පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන්) (TPS) ....................................................................82-84
      3.2.6 යූනියන් හෙල්ත් 360 (UH360) ....................................................................85-111
      3.2.7 ළමා සෞඛ්‍ය ප්‍රතිලාභය (CHB) ....................................................................112-123

4. උපලේඛන අංක 4 - මෙම රක්ෂණ ඔප්පුව සඳහා අදාල වන නිර්වචන අඩංගු උපලේඛණය
   4.1 මූලික නිර්වචන ....................................................................124-126
   4.2 අතිරේක ප්‍රතිලාභ සඳහා අදාල වන මූලික නිර්වචන ....................................................................126-128


Specimen

යූනියන් ඇෂුවරන්ස්
ජෝන් කීල්ස් සමාගමකි

මෙහි පළමු උපලේඛණයේ නම් කර ඇති රක්ෂිතයා/යන්, 1982 අංක 17 දරණ සමාගම් පණත යටතේ සංස්ථාපිත කොට එන් (පී බී එස්) 137 අංකය යටතේ ලියාපදිංචි කොට හා 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ නැවත සංස්ථාපිත කොට පී කියු 12 අංකය යටතේ ලියාපදිංචි කොට අංක 20, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 යන ලිපිනයේ ලියාපදිංචි ව්‍යාපාර ආයතනය පවත්වාගෙන යන යූනියන් ඇෂුවරන්ස් පී එල් සී (මින් මතු "සමාගම" යනුවෙන් හැඳින්වෙන) සමඟ මෙම ඔප්පුවේ අඩංගු නියමයන් මත හා රක්ෂිතයා/යන් විසින් රක්‍ෂණය සඳහා කර ඇති යෝජනාවක (සහ කිසියම් අතිරේක යෝජනාවක හෝ මැමයක) පදනම මත රක්‍ෂණයක් සඳහා ගිවිසගෙන ඇත.

ඔප්පුවේ පළමු උපලේඛණයට අනුකූලව වාරිකයන් සමාගම වෙත ගෙවනු ලැබුවහොත්, එවිට එකී උපලේඛණයේ සඳහන් ප්‍රතිලාභ ගෙවිය යුතු වන සිද්ධියක් සිදුවූ විට, එවැනි ප්‍රතිලාභ සමාගම විසින් ගෙවනු ඇත.

මෙය අදාල පාර්ශව විසින් උපරිම සද්භාවයෙන් ඇති කරගන්නා ලද ගිවිසුමකි. ඒ අනුව කරුණු හුවා නොදැක්වීම හෝ සදොස් ලෙස හුවා දැක්වීමක දී සමාගම මෙම ඔප්පුව ශූන්‍ය බවට ප්‍රකාශ කරනු ඇත.

මෙම ඔප්පුව සම්බන්ධයෙන් වන පැවරුමක් හෝ නාමිකයෙකු පිළිබඳ දැන්වීම් කිසිවක් වෙතොත්, එකී දැන්වීම ජීවිත මෙහෙයුම් අංශය, යූනියන් ඇෂුවරන්ස් සෙන්ටර්, නො.20, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 යන ලිපිනයට එවිය යුතුය.

මින්මතු දැක්වෙන උපලේඛණ, පොදු ඔප්පු කොන්දේසි හා වරප්‍රසාද, කොන්දේසී, වගන්ති, තහවුරු ප්‍රකාශ ආදියද මෙහිලා ගිවිසුමේ පදනමට අඩංගු බව සලකනු ලැබේ.

ප්‍රධාන මෙහෙයුම් නිළධාරී | ප්‍රධාන විධායක නිලධාරී/ප්‍රධාන නිලධාරී

වැදගත්

මෙය නීත්‍යානුකූලව බැඳී ඇති ලේඛනයකි. කරුණාකර මෙය සුරක්ෂිත ස්ථානයක තබන්න. තවද, නියමිත පරිදි වාරික ගෙවා ඔප්පුවේ උපරිම ප්‍රතිලාභ ලබාගන්න.

යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) බලපත්‍රලාභී රක්ෂණ ආයතනයකි



Specimen

**උපලේඛන අංක 02**

## 2. පොදු විධිවිධාන හා වරප්‍රසාද

### 2.1 පදිංචිය, චාරිකා හා රැකියාව

මෙහි එබඳු සඳහනක් තිබේ නම් මිස, මෙම ඔප්පුව පදිංචිය, චාරිකා හා රැකියාවට අදාල සෑම සීමාවකින්ම නිදහස්ය.

### 2.2 වයස සනාථ කිරීම

ඔප්පුව යටතේ යම් ගෙවීමක් කිරීමට පෙර, ජීවිත රක්ෂිතයාගේ (කලත්‍රයා, දරුවන්, දෙමව්පියන්) උපන් දිනය පිළිබඳව පිළිගත හැකි සහතිකයක් ඉල්ලා සිටීමේ අයිතිය සමාගම සතුවේ. ඔප්පුවේ සඳහන් කරන ලද වයස සාවද්‍ය වීම හේතුවෙන්ම ඔප්පුව අවලංගු නොවන නමුත් එයට අදාලව යම් සාධාරණ ගැලපීමක් අදාල වාරිකය හෝ/සහ ප්‍රතිලාභ සම්බන්ධයෙන් සමාගම විසින් කරනු ඇත.

### 2.3 නීතිය හා අර්ථ දැක්වීම

(i) මෙම ඔප්පුවට අදාල වනුයේ ශ්‍රී ලංකාවේ වලංගු නීතියයි.

(ii) පද සම්බන්ධයෙන් අනුකූල වන අවස්ථා වලදී රක්ෂිතයා යන යෙදුමට ඔහුගේ හෝ ඇයගේ බූදල් භාරකාරයාද ඇතුලත් වන අතර ඒක වචන වලට බහු වචන පදද, බහු වචන පද වලට ඒක වචන පදද ඇතුලත් වේ.

(iii) එලෙසම මෙහිලා පද සම්බන්ධයෙන් අනුකූල වන අවස්ථා වලදී පුරුෂ ලිංග පද ස්ත්‍රී ලිංග පද වෙනුවෙන් ද ස්ත්‍රී ලිංග පද පුරුෂ ලිංග පද වෙනුවෙන් ද අදාල වේ.

(iv) ඔප්පුවෙහි පළමු උපලේඛනයේ දක්වා ඇති "අතිරේක ප්‍රතිලාභ" ප්‍රදානය කිරීම, අදාල අතිරේක ප්‍රතිලාභ උපලේඛනයෙහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

(v) මෙම ඔප්පුවට අදාල ව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර නොගැලපීමක් ඇති වුවහොත් හෝ වෙනත් ඕනෑම අර්ථ නිරූපණයක් අවශ්‍ය වුවහොත් එය සිංහල පිටපතට අනුකූලව බලපැවැත්වෙනු ඇත.

(vi) මෙම රක්ෂණය යටතේ සියළුම වාරික හා ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකාවේ වලංගු මුදලිනි.

(vii) ඔබගේ පෞද්ගලික දත්ත පිළිබඳව සමාගම විසින් පිළිපදින ප්‍රතිපත්ති සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට සමාගමේ නිළ වෙබ් අඩවියේ ඇති (www.unionassurance.com/privacy-policy) පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති ප්‍රකාශනය වෙත පිවිසෙන්න

### 2.4 වාරික ගෙවීම/අනුග්‍රහ කාලසීමාව

මෙම ඔප්පුව යටතේ සලසා ඇති ප්‍රතිලාභ වෙනුවෙන් ගෙවනු ලබන සියලුම වාරික සඳහා පහත සඳහන් කොන්දේසි අදාල වනු ඇත.

(i) සෑම වාර මුදල් ගෙවීමක්ම නියමිත දින හෝ ඊට පෙර ගෙවිය යුතු අතර එම වාර මුදල් ගෙවූ බව පිළිගනුයේ සමාගමේ ප්‍රධාන කාර්යාලයට හෝ ඕනෑම ශාඛා කාර්යාලයකට හෝ වාර මුදල් ලබා ගැනීමට සමාගම විසින් බලය ලබා දී ඇති ආයතනයකට හෝ එහි ශාඛාවකට වාර මුදල් ලැබුණු විටදී පමණි.

(ii) අදාල වාරිකය ගෙවූ බවට වලංගු සාධකය ලෙස පිළිගැනෙනුයේ, සමාගම විසින් හෝ සමාගම විසින් වාරික ලබා ගැනීම සඳහා නිසි පරිදි බලය ලබාදී ඇති අනෙකුත් ආයතන විසින් මුදල් ලබා දුන් බවට ලබා දෙන සහතිකය වේ.

(iii) වාර මුදල් ගෙවීමට නියමිත දින සිට දින තිහක (30) අනුග්‍රහ කාලසීමාවක් වාරික ගෙවීම සඳහා ලබාදෙනු ලැබේ. මෙම අනුග්‍රහ කාල සීමාව අවසන් වූ පසුවද අදාල වාරිකය නොගෙවා ඇත්නම්, පූර්ව දැනුම් දීමකින් තොරව රක්ෂණ ඔප්පුව හා එහි අඩංගු සියලුම ප්‍රතිලාභ සඳහා වන ආවරණ, අහෝසි වනු ඇත. මෙම අනුග්‍රහ කාලසීමාව තුළදී ඔප්පුවට අදාල සෑම ප්‍රතිලාභයක්ම අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

Specimen

(iv) සෞඛ්‍ය සම්බන්ධ අතිරේක ආවරණ සඳහා අදාළ වන වාරික ඔප්පුවෙහි උපලේඛනයේ සඳහන් වන කාලසීමාව දක්වා අඛණ්ඩව ගෙවිය යුතු වේ. නිසි පරිදි වාරික නොගෙවා ඇත්නම්, පූර්ණ දැනුම් දීමකින් තොරව අදාල සෞඛ්‍ය ආවරණ අහෝසි වන අතර ඉන් පසුව පැනනඟින හිමිකමක් සඳහා ප්‍රතිලාභ හිමි නොවේ.

## 2.5 ආයෝජන ගිණුම

සමාගම විසින් මෙම සැලසුම යටතේ නිකුත් කරනු ලබන ඔප්පු සඳහා ආයෝජන ගිණුම් වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ .

(i) පළමුවන උපලේඛනයේ ii කොටසේ විස්තර කර ඇති පරිදි, මූලික රක්ෂිත මුදල සඳහා ගෙවන ලද වාරික මුදල් ආයෝජන ගිණුමට ගැලපීම, වාරික ගෙවූ දිනට අනුකූලව පහත සඳහන් වගුවේ ප්‍රතිශතයන් වලට අනුව ගලපනු ලැබේ.

| රක්ෂණ ඔප්පු වර්ෂය | වෙන් කිරීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|
| | වාරික ගෙවිය යුතු කාලය 5 | වාරික ගෙවිය යුතු කාලය 7 | වාරික ගෙවිය යුතු කාලය 10 |
| 1 | 50% | 50% | 50% |
| 2 | 80% | 80% | 80% |
| 3 | 100% | 100% | 100% |
| 4 | 100% | 100% | 100% |
| 5 | 100% | 100% | 100% |
| 6 | - | 100% | 100% |
| 7 | - | 100% | 100% |
| 8 | - | - | 100% |
| 9 | - | - | 100% |
| 10 | - | - | 100% |

(ii) සෑම වසරකම ආරම්භයේදී අතුරු ලාභාංශ ප්‍රතිශතය තීරණය කරනු ලබන අතර එමගින් මුළු අවුරුද්ද පුරාම අරමුදල ගොඩනැගීම සිදුකෙරෙයි. අවුරුද්ද අවසානයේදී සමාගම විසින් මුළු අවුරුද්ද සඳහාම සහතික කරන ලද ලාභාංශ බෙදාදීම තීරණය කරනු ලැබේ. අවුරුද්ද ආරම්භයේදී සමාගම තීරණය කරන ලද අතුරු ලාභාංශ ප්‍රතිශතය එම වසර සඳහා වන අවම ලාභාංශ බෙදීම් ප්‍රතිශතය වන බව සහතික කරනු ලැබේ.

(iii) ආයෝජන ගිණුමෙන් පහත ගාස්තු අය කරනු ලැබේ. එනම්;

(අ) පළමු උපලේඛනයේ II කොටසේ සඳහන් මූලික රක්ෂිත මුදලෙහි ජීවිත ආවරණය වෙනුවෙන් වන වාරිකය මාසිකව අයකරනු ලැබේ. ජීවිත අවදානම මත වාරිකය ගණනය කරනු ලබන්නේ ඉන් මතුවන අවදානමට අනුකූලවය. මෙම ගණනය කිරීම මූලික රක්ෂිත මුදල සහ වත්මන් වයසට සමීප උපන් දිනයට වසර 3ක් එක් කළ පසු ඇති වයස සඳහායි.

(ආ) මාසික අරමුදල් කළමනාකරණ ගාස්තුව - ආයෝජන, පරිපාලන,අත්පත්කරගැනීම් සහ සමාගම විසින් සපයනු ලබන අනෙකුත් සේවාවන් ආවරණය කිරීම සඳහා මෙම ගාස්තුව අය කරන අතර එය ආයෝජන ගිණුමෙන් 1.25% ක වාර්ෂික ප්‍රතිශතයකි.

ජීවිත ආවරණ වියදම ගණනය කිරීමේදී භාවිතා කරන මරණ අනුපාත සඳහා II ඇමුණුම වෙත යොමු වන්න

Specimen

## 2.6 මූලික ප්‍රතිලාභය

මූලික ප්‍රතිලාභය සඳහා සුදුසුකම් ලැබීම සඳහා පහත සීමා ක්‍රියාත්මක වේ.

| කාණ්ඩය | අවම (වර්ෂ) | උපරිම (වර්ෂ) |
|---|---|---|
| වයස | 18 | 60 |
| ඔප්පු කාලය | 10 | 40 |

### 2.6.1 ජීවිත හිමිකම් ප්‍රතිලාභය

#### 2.6.1.1 වාරික ගෙවීමේ කාලය තුළ

රක්ෂණ වාරික ගෙවීමේ කාලසීමාව තුළ ජීවිත රක්ෂිතයා මිය ගියහොත්, සමාගම විසින් නාමිකයාට/ නාමිකයන්ට මූලික රක්ෂිත මුදල (පළමුවන උපලේඛනයේ ii වන කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි,) ගෙවනු ලැබේ. මෙහි පහත උපලේඛන අංක 3.1.1 යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි, මරණයකදී වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය සක්‍රිය වීම හරහා ආයෝජන ගිණුම අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහ මාසික ලාභාංශ මත ක්‍රමයෙන් ගොඩ නැගෙනු ඇත. පළමුවන උපලේඛනයේ ii වන කොටසේ නිශ්චිතව දක්වා ඇති විකල්පයට යටත්ව, සමාගම විසින් නාමිකයාට / නාමිකයන්ට කල්පිරීමේ ප්‍රතිලාභය ගෙවනු ඇත.

#### 2.6.1.2 කල්පිරීමට පෙර වාරික ගෙවීමේ කාලයෙන් පසු

කල්පිරීමේ දිනට පෙර වාරික ගෙවීමේ කාලයෙන් පසු ජීවිත රක්ෂිතයා මිය ගියහොත්, සමාගම විසින් නාමිකයාට / නාමිකයන්ට මූලික රක්ෂිත මුදල (පළමුවන උපලේඛනයේ ii වන කොටසේ දක්වා ඇති පරිදි,) ගෙවනු ලැබේ. ආයෝජන ගිණුම මාසික ලාභාංශ හරහා අඛණ්ඩව ගොඩනැගෙනු ඇත. පළමුවන උපලේඛනයේ ii වන කොටසේ නිශ්චිතව දක්වා ඇති විකල්පයට යටත්ව, සමාගම විසින් නාමිකයාට / නාමිකයන්ට කල්පිරීමේ ප්‍රතිලාභය ගෙවනු ඇත.

#### 2.6.1.3 වාත්සරික ගෙවීමේ කාලසීමාව තුළ

වාත්සරික ගෙවීමේ කාලසීමාව තුළ ජීවිත රක්ෂිතයා මිය ගියහොත්, සමාගම විසින් ඉතිරි වාත්සරික ගෙවීම/ගෙවීම් (පළමුවන උපලේඛනයේ ii වන කොටසේ දක්වා ඇති පරිදි,) නාමිකයාට / නාමිකයන්ට ගෙවනු ලැබේ.

### 2.6.2 කල්පිරීමේ ප්‍රතිලාභය

පළමුවන උපලේඛනයේ ii වන කොටසේ දක්වා ඇති කල්පිරීමේ ප්‍රතිලාභ යනු අදාළ ලාභාංශ අනුපාත යටතේ පාරිතෝෂිත දීමනා (loyalty bonus) සමග සමුච්චිත අරමුදල සඳහා නිදර්ශනයන් පමණක් වන අතර එය ප්‍රාථමික ප්‍රතිලාභයේ කල් ඉකුත්වන දිනයේදී ලැබිය හැකි යැයි උපකල්පනය කළ හැකි කල්පිරීමේ ප්‍රතිලාභ පිළිබඳ අවබෝධයක් සැපයීම සඳහා වේ. සමාගම විසින් ගෙවනු ලබන තථ්‍ය කල්පිරීමේ වටිනාකම ප්‍රකාශිත තථ්‍ය ලාභාංශ සහ වාරික ගෙවීමේ දිනයන් මත රඳා පවතී.

කල්පිරීමේ දිනයේ දී, රක්ෂණ ඔප්පුව ආරම්භයේ දී තෝරාගත් කල්පිරීමේ ගෙවීම් විකල්පයට යටත්ව, සමාගම විසින් ජීවිත රක්ෂිතයාට හෝ නාමිකයාට / නාමිකයන්ට මුළු ආයෝජන ගිණුමේ වටිනාකම ගෙවනු ලබන අතර, තෝරාගත් ගෙවීම් විකල්පය රක්ෂණ ඔප්පු කාලය තුළ / පසුව වෙනස් කළ නොහැකිය.

### කල්පිරීමේ ගෙවීම් විකල්ප

**(i)** වාත්සරික ප්‍රතිලාභ විකල්පය

මුළු ආයෝජන ගිණුමේ වටිනාකම, පළමුවන උපලේඛනයේ ii වන කොටසේ නිදර්ශනවල විස්තර කර ඇති

specimen

පරිදි, තෝරාගත් කාලසීමාව තුළ මාසිකව ගෙවනු ලැබේ.

**(ii)** එකවර ගෙවීමේ ප්‍රතිලාභ විකල්පය

කල්පිරීමේ දී, මුළු ආයෝජන ගිණුමේ වටිනාකම එකවර ගෙවනු ලැබේ.

## 2.7 පවාරණ අගය

ආරම්භක දිනයේ සිට ඔප්පුවට අවුරුදු තුන (03) ක කාලයක් සම්පූර්ණ වීමෙන් හා යටත් පිරිසෙයින් අවුරුදු තුන (03) ක කාලයක් සඳහා වාරික ගෙවීමෙන් අනතුරුව මෙම ඔප්පුව පවාරණ අගයක් ලබනු ඇත. පළමු උපලේඛනයේ II කොටසේ දක්වා ඇති කිසිදු අතිරේක ප්‍රතිලාභයක් සඳහා පවාරණ අගයක් හිමි නොවේ.

සමාගම විසින් තීරණය කරන පරිදි, පවාරණ අගය රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් සමාගම වෙත ලැබිය යුතු යම් මුදලක් වේ නම්, එම මුදල අඩු වන අතර, සමාගමේ නියමයන්ට අනුකූල වීමට යටත්ව, රක්ෂණ ඔප්පුවේ හිමිකම් ඇති තැනැත්තා / තැනැත්තන් විසින් ලබාගත හැකිය.

රක්ෂණ ඔප්පුව පවාරණය කිරීමෙන් පසුව ගෙවනු ලබන ඕනෑම වාරික ගෙවීමක් නිසා, සමාගමට කිසිඳු වගකීමක් ඇති නොකරයි. පවාරණ අගය පහත සඳහන් පරිදි ගණනය කෙරේ.

ශුද්ධ පවාරණ අගය = පවාරණය කරන ලද දිනට ඇති ආයෝජන ගිණුමෙහි වටිනාකම - පවාරණ ගාස්තුව - ගෙවිය යුතු ණය මුදල් (අදාළ නම්)

පවාරණ ගාස්තුව ගණනය කරන්නේ පහත පරිදිය.

පවාරණ ගාස්තුව = පවාරණය කරන ලද දිනට ඇති ආයෝජන ගිණුමෙහි වටිනාකම **x** පවාරණ ගාස්තු %

පවාරණ ගාස්තු සඳහා ඇමිණුම් I වෙත යොමු වන්න.

## 2.8 අර්ධ වශයෙන් මුදල් ආපසුගැනීම්

ඉහත 2.7 වගන්තියේ විස්තර කර ඇති පරිදි පවාරණ අගයක් ලබාගැනීමෙන් පසුව සහ රක්ෂණ ඔප්පුව ආරම්භ කළ දින සිට වසර දහයක් (10) සම්පූර්ණ වූ පසුව, රක්ෂණ ඔප්පුහිමියාට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ආයෝජන ගිණුමෙන් අර්ධ වශයෙන් මුදල් ආපසු ලබාගැනීමක් සිදු කළ හැකිය.

(අ) මුදල් ආපසු ගැනීමකින් පසුව ආයෝජන ගිණුමේ අවම වශයෙන් රුපියල් 100,000/- ක ශේෂයක් තිබිය යුතුය.

(ආ) ඕනෑම අවස්ථාවකදී අර්ධ වශයෙන් ආපසු ලබා ගනු ලබන මුදල රුපියල් 25,000/- ට නොඅඩු විය යුතුය.

(ඇ) රක්ෂණ ඔප්පු වර්ෂය තුළ මුදල් ආපසු ගැනීම් වාර ගණන එකකට (1) සීමා කළ යුතුය.

(ඈ) රක්ෂණ ඔප්පු කාලසීමාව තුළ මුදල් ආපසු ගැනීම් වාර ගණන දෙකකට (2) සීමා කළ යුතුය.

(ඉ) ඕනෑම අවස්ථාවක ආපසු ලබා ගනු ලබන මුළු මුදල ආයෝජන ගිණුමේ වටිනාකමෙන් 25% නොඉක්මවිය යුතුය.

(ඊ) අර්ධ වශයෙන් මුදල් ආපසු ලබාගෙන ඇත්නම් එය කල්පිරීමේදී පාරිතෝෂිත දීමනා වටිනාකමෙන් අඩු කරනු ලැබේ.

Specimen

## 2.9 වාරික නොගෙවීම

අනුග්‍රහ කාලසීමාවෙන් පසුවද, වාරිකයන් හිඟව තිබේ නම් පහත සඳහන් කොන්දේසි අදාල වේ.

(i) **පවාරණ අගයක් ලබා නොමැති ඔප්පුවක් නම්,**

නියමිත වාරිකය නොගෙවූ දින සිට පවාරණ අගයක් ලබා නොමැති ඔප්පුවක් නම් අප්‍රාණිකවේ. ඔප්පුව අප්‍රාණික වූ දිනෙන් පසුව පැන නගින හිමිකම් පෑමක් සඳහා ප්‍රතිලාභ හිමි නොවේ.

(ii) **පවාරණ අගයක් ලබා ඇති ඔප්පුවක් නම්,**

ඉහත අංක 2.7 හි දක්වා ඇති ලෙස ඔප්පුව පවාරණ අගයක් ලබා ඇත්නම් ඔප්පුව ස්වයංක්‍රීයව ගෙවා නිමි ඔප්පුවක් බවට පත්වන අතර අංක 2.10 හි සඳහන් කොන්දේසි හා වරප්‍රසාද අදාල වනු ඇත

## 2.10 ගෙවා නිමි ඔප්පු හා අහිමි නොවීමේ ප්‍රතිලාභ

ඔප්පුවට හිමිකම් ඇති තැනැත්තා/තැනැත්තන්ගේ ලිඛිත ඉල්ලීමකට අනුව සහ ඒ හිමිකම් සනාථ කිරීමට යටත්ව, පවාරණ අගයකට හිමිකම් ලැබූ ඔප්පුවක් එසේ පවාරණ අගය ලැබීමෙන් පසු ඕනෑම අවස්ථාවක ගෙවා නිමි ඔප්පුවක් බවට පත්කල හැක. රක්ෂිතයාගේ ඉල්ලීම අනුව හෝ ඉහත අංක 2.9 (ii) හි දක්වා ඇති ලෙස ස්වයංක්‍රීයව ගෙවා නිමි ඔප්පුවක් බවට පත්වීමෙන් අනතුරුව මෙහි සඳහන් වරප්‍රසාද හා කොන්දේසි අදාල වේ.

(i) ගෙවා නිමි ඔප්පුවක් බවට පරිවර්තනය වූවායින් පසුව: අනුග්‍රහ කාලය තුළ නිතිපතා වාරික ගෙවීම් පැහැර හරිනු ලැබුවහොත්, ආයෝජන ගිණුමට වාත්සරික ලාභාංශ බැර කරනු ලබන අතර, ගාස්තු දිගටම හර කරනු ලැබේ. එකවර ගෙවීම් විකල්පය තෝරාගෙන තිබේ නම්, ආයෝජන ගිණුමේ ඇති මුදල කල්පිරීමේදී ගෙවනු ලබන අතර, වාර්ෂික ප්‍රතිලාභ විකල්පය තෝරාගෙන තිබේ නම්, තෝරාගත් කාලසීමාව තුළ මාසික ගෙවීමක් ලෙස ගෙවනු ලැබේ.

(ii) කලින් සිදුවන මරණයක දී, ආයෝජන ගිණුමේ ඇති මුදල ගෙවනු ලැබේ. එසේ වුවත් නොගෙවන ලද මුල් වාරිකය ගෙවීමට නියමිතව තිබූ දින සිට දින එකසිය අසුවක් (180) තුලදී ගෙවානිමි ඔප්පුවක මුලික ප්‍රතිලාභ යටතේ මරණ හිමිකමක් ඉදිරිපත් වුවහොත්, නොගෙවන ලද වාරික අඩුකර ගැනීමෙන් පසු මුලික රක්ෂිත මුදල හෝ ආයෝජන ගිණුමේ ඇති මුදල යන දෙකින් වැඩි අගය ගෙවනු ලැබේ.

(iii) මෙම පරිවර්තන දිනයෙන් පසු ඔප්පුව යටතේ ලබාගෙන තිබූ සියළු අතිරේක ප්‍රතිලාභ අහෝසි වන අතර එදිනෙන් පසු පැන නගින එබඳු හිමිකම් සඳහා ප්‍රතිලාභ ගෙවීමක් සිදු නොවේ.

(iv) ඉහත කොන්දේසි ක්‍රියාත්මක වීමෙන් පසු ඔප්පුව යලි ප්‍රාණවත් කර තිබේ නම් හැර, කිසියම් වාරිකයක් ගෙවීම හෝ භාර ගැනීම නිසා සමාගම වෙත කිසිදු වගකීමක් නොපැවරේ.

## 2.11 අප්‍රාණික ඔප්පු ප්‍රාණවත් කිරීම/ ප්‍රතිෂ්ඨාපනය කිරීම

වාරික නොගෙවීම හේතුවෙන් අප්‍රාණිකවූ හෝ ස්වයංක්‍රීයව ගෙවා නිමි තත්වයට පත්වූ ඔප්පු නැවත ප්‍රාණවත් කිරීම / ප්‍රතිෂ්ඨාපනය කිරීම මුලික ප්‍රතිලාභයට අදාල අවසාන වාරිකය ගෙවීමට නියමිත දිනට පෙර ජීවිත රක්ෂිතයාගේ ජීවිත කාලය තුල පහත සඳහන් කොන්දේසි වලට අනුව සිදුකල හැක.

1) නොගෙවන ලද මුල් වාරිකය ගෙවීමට නියමිතව තිබූ දින සිට සය මසක් තුලදී හිඟ වාරික සියල්ල ගෙවීමෙන්

2) නොගෙවන ලද මුල් වාරිකය ගෙවීමට නියමිතව තිබූ දින සිට සය මසක් ගතවීමෙන් පසු සමාගම සෑහීමකට පත්වන සේ සමගාමේ වියදමෙන් තොරව ජීවිත රක්ෂිතයා රක්ෂණයට සුදුසු බවට වෛද්‍ය සාක්ෂි සමග හිඟ වාරික සියල්ල හා ඔප්පු ප්‍රාණවත් කිරීමේ ගාස්තු ගෙවීමෙන්

Specimen

මූලික ප්‍රතිලාභය සඳහා වාරික ගෙවීමේ කාලසීමාවෙන් පසුව, අතිරේක ප්‍රතිලාභ ප්‍රාණවත් කිරීම / ප්‍රතිෂ්ඨාපනය කිරීම නොගෙවන ලද මුල් වාරිකය ගෙවීමට නියමිතව තිබූ දින සිට දෙවසරකට (2) පමණක් සීමාවේ.

කෙසේ වෙතත්, ඔප්පුව / අතිරේක ප්‍රතිලාභ ප්‍රාණවත් කිරීම/ ප්‍රතිෂ්ඨාපනය කිරීම සලකා බැලීම සමාග මේ ප්‍රාරක්ෂණ රීතින්වලට අනුකූලව සහ ඔප්පුහිමියාගේ රක්ෂණය වීමට ඇති සුදුසුකම් මත තීරණය වේ.

## 2.12 රක්ෂණ ඔප්පුවේ වෙනස්කිරීම්

රක්ෂණ ඔප්පුවේ වෙනස්කිරීම් සඳහා රක්ෂණ ඔප්පුහිමියාගෙන් ලැබෙන ඉල්ලීම්, සමාගම විසින් සිය අභිමතය පරිදි, අවශ්‍ය යැයි සලකන නියමයන් සහ කොන්දේසි මත සලකා බැලිය හැකිය.

රක්ෂණ ඔප්පුවේ වරප්‍රසාද සහ කොන්දේසි, සමාගමේ බලයලත් නිලධාරියෙකු විසින් නිසි ලෙස අනුමත කර අත්සන් කරන ලද රක්ෂණ ඔප්පු පිටසනක් සහිතව මිස, අත්හැරීම හෝ වෙනස් කිරීම සිදුකල නොහැකිය.

මරණයක දී වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) සහ හදිසි අනතුරක් හෝ රෝගාබාධයක් හේතුවෙන් සිදුවන පූර්ණ සහ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) රක්ෂණ ඔප්පු කාල සීමාව තුළ ඉවත් කළ නොහැකිය.

## 2.13 ලාභාංශ

සෑම වසරකම දෙසැම්බර් 31 වන දිනයන්හීදී ආයෝජන ගිණුමට ලාභාංශ ගලපනු ලැබේ. සමාගමේ ජීව ගණකාධිකරු විසින් තීරණය කරනු ලබන පරිදි සමාගමේ ජීවිත රක්ෂණ අරමුදලෙහි "ආයෝජන ගිණුමට" අදාලවන ආයෝජන ඉපැයීම් වලින් සියයට සීයය (100%) ක් ලාභාංශ ලෙස දැක්වේ.

## 2.14 පාරිතෝෂිත දීමනා

පහත සඳහන් වගුවේ දක්වා ඇති පරිදි, සමාගම විසින් මූලික රක්ෂිත මුදලින් යම් ප්‍රතිශතයක් කල්පිරීමේදී පාරිතෝෂිත දීමනා ලෙස, ආයෝජන ගිණුමට බැර කරනු ලැබේ. පාරිතෝෂිත දීමනා සඳහා හිමිකම් ලබන්නේ, වාරික ගෙවීමට අදාළ නියමිත දින සිට දින 180 ක කාලයක් ඇතුළත සම්පූර්ණ රක්ෂණ ඔප්පු කාලසීමාව සඳහා නියමිත වාරික සම්පූර්ණ කර තිබේ නම් පමණි.

| පාරිතෝෂිත දීමනා ප්‍රතිශතය % | | | |
|---|---|---|---|
| රක්ෂණ ඔප්පු කාලසීමාව | රක්ෂණ වාරික කාලසීමාව 5 | රක්ෂණ වාරික කාලසීමාව 7 | රක්ෂණ වාරික කාලසීමාව 10 |
| 10 සිට 19 | 10% | 10% | 10% |
| 20 සිට 29 | 20% | 20% | 20% |
| 30 සහ ඊට වැඩි | 30% | 30% | 30% |

නැවත ප්‍රාණවත් කිරීමක් / ප්‍රතිෂ්ඨාපනය කිරීමක්, වාරික අඩු කිරීමක්, රක්ෂණ ඔප්පු ණයක්, රක්ෂනාවරය නිම් ඔප්පුවක් බවට පත් වුවහොත් හෝ පවාරණයක් සිදුවුවහොත් පාරිතෝෂිත දීමනා සඳහා හිමිකම් නොලබයි.

අර්ධ වශයෙන් මුදල් ආපසු ලබාගෙන ඇත්නම්, එය ඔප්පු කල්පිරීමේ දී පාරිතෝෂිත දීමනා වටිනාකමින් අඩු කරනු ලබන අතර, "අමතර තනි වාරික" පාරිතෝෂිත දීමනා සඳහා සලකා බලනු නොලැබේ

Specimen

## 2.15 අමතර තනි වාරික

පවාරණ අගයක් ලබාගැනීමෙන් පසුව, රක්ෂණ ඔප්පුව ආරම්භ කළ දින සිට වසර 3 කට පසු රක්ෂණ ඔප්පුව වසරකට උපරිම වශයෙන් අමතර තනි වාරික දෙකක් (02) දක්වා ගෙවීමට ජීවිත රක්ෂිතයාට අවස්ථාව ලබා දී ඇත. මූලික ප්‍රතිලාභය සඳහා නිතිපතා වාරික ගෙවා, රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක තත්ත්වයේ පවතී නම් පමණක්, අමතර තනි වාරික සඳහා ඉඩප්‍රස්ථාව දෙනු ලැබේ. මෙම අමතර තනි වාරික ආයෝජන ගිණුමට බැර කරනු ලැබේ. ඕනෑම එක් අවස්ථාවක දී අවසර දී ඇති අවම තනි වාරිකය රුපියල් විසිපන්දහසක් (රු. 25,000/-) වන අතර, මෙම රක්ෂණ ඔප්පුව යටතේ ලබාදෙන මූලික ප්‍රතිලාභ, අමතර තනි වාරික හේතුවෙන් වැඩි නොවේ. අමතර තනි වාරික සම්බන්ධයෙන් අවශ්‍ය යැයි සලකන අමතර මූල්‍ය තොරතුරු ඉල්ලා සිටීමට සමාගමට අයිතියක් ඇති අතර, ලබාගත් තොරතුරු මත පදනම්ව, අමතර තනි වාරික පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සමාගමට අයිතිය ඇත

## 2.16 ඔප්පු ණය මුදල්

ඔප්පුවට ඇති අයිතිය පිළිබඳ සතුටුදායක ඔප්පු කිරීමකට යටත්ව සහ රක්ෂණ ඔප්පුව සුරැකුමක් ලෙස භාවිතා කරමින්, පවාරණ අගයෙන් සියයට අනූවක් (90%) නොඉක්මවන මුදලක් සඳහා, ලිඛිත අයදුම්පතක් මත, සමාගම විසින් කලින් කලට තීරණය කරන නියමයන් සහ කොන්දේසි සහ පොලී අනුපාතය මත, ණය ලබා දිය හැකිය. එවැනි ණය මුදල්වලට අදාල නියමයන් සහ කොන්දේසි, ණය ලබාදෙන අවස්ථාවේ ක්‍රියාත්මක වන සමාගමේ සම්මත ණය ගිවිසුමට අනුකූල විය යුතු වේ.

රක්ෂණ ඔප්පු කාලසීමාව තුළ ණය ආපසු ගෙවන ලෙස සමාගම විසින් නියම කළ හැකි අතර, ආපසු නොගෙවන්නේ නම්, ණය සහ ඒ මත ඕනෑම හිඟ පොළියක් මරණ හිමිකම් පෑමෙන්, පවාරණ අගයෙන් හෝ කල්පිරීමේ ප්‍රතිලාභයෙන් යන මැයෙන් පළමුව එළඹෙන අවස්ථාවෙන් අඩු කරනු ලැබේ.

නිතිපතා රක්ෂණ වාරික නොගෙවීම සහ/හෝ ණය ආපසු නොගෙවීම හේතුවෙන් ණය මුදලේ මුළු මුදල සහ හිඟ පොළිය රක්ෂණ ඔප්පුවේ පවාරණ අගය ඉක්මවා ගියහොත්, පූර්ව දැනුම්දීමකින් තොරව රක්ෂණ ඔප්පු ස්වයංක්‍රීයව අවලංගු වන අතර, සමාගම විසින් පවාරණ අගය භාවිතා කරමින් හිඟ ණය සහ පොලී මුදල අයකර ගනු ඇත.

## 2.17 පැවරීම

මෙම ඔප්පුව පිළිබඳව යම්කිසි පැවරීමක් වේ නම් එකී පැවරුම පිළිබඳ ලිඛිත දැන්වීමක් සමාගමට ලැබී, එය සමාගම විසින් පිළිගෙන වාර්තාගත කොට, තහවුරු කරන තෙක් එම පැවරීම සම්බන්ධයෙන් කිසිදු බැඳීමක් සමාගම සතු නොවේ. තවද පැවරීමක් ලැබී එය ලේඛනගත කිරීමට පෙර සමාගම සෑහීමකට පත්වන පරිදි පරීක්ෂා කිරීම සඳහා මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය සමාගම සතුවේ. පැවරීම ලේඛනගත කිරීමේදී, පැවරුමෙහි අඩංගු කරුණු පිළිබඳව හෝ එහි වලංගුභාවය හෝ නීතිමය බලපෑම පිළිබඳව වගකීමට හෝ ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට හෝ සමාගම බැඳී නොමැත.

## 2.18 නම්කිරීම

(i) ඔප්පු කාලසීමාව අතරතුර සමාගම වෙත ඉදිරිපත් කරන ලිඛිත දැන්වීමක් මගින් මෙම ඔප්පුව යටතේ නාමිකයෙකු/නාමිකයන් පත් කිරීමට හෝ එසේ නම් කරන ලද්දකු වෙනස් කිරීමට රක්ෂිතයාට හැකිවේ.

(ii) අදාල නීතිවලට යටත්ව නාමිකයා වෙනස් කිරීමක් වලංගු වනුයේ එම වෙනස් කිරීම පිළිබඳව රක්ෂිතයා විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීම සමාගම විසින් පිළිගෙන වාර්තාගත කොට තහවුරු කරන ලද්දේ නම් පමණි.

(iii) නාමිකයා එසේ වෙනස් කරන ලද කල එම වෙනස්වීම් වලංගු ලෙස සලකනුයේ ලිඛිත දැන්වීම ලැබුණු දිනයේ සිටය. මෙම ඔප්පුව යටතේ සමාගම විසින් ගෙවිය යුතු මුදල් නාමිකයාට ලැබීම හා



Specimen

එම මුදල් ලැබුණු බව පිළිගැනීම, මෙම ඔප්පුව අනුව සමාගම මත පැවරෙන වගකීමෙන් නිදහස් කිරීමේ හා එකී මුදල් ගෙවීම පිළිබඳ තීරණාත්මක සාක්ෂියද වේ.

(iv) ජීවිත රක්ෂිතයා මරණයට පත්වන විට නාමිකයා ජීවත්ව නොසිටී නම්, ගෙවිය යුතු මුදල ජීවිත රක්ෂිතයාගේ උරුමකරුවන්ට ගෙවනු ඇත.

(v) මෙම ඔප්පුව පිලිබඳව පැවරීමක් කල විට, දැනට පවතින නම්කිරීම්/නාමිකයා අවලංගු වේ.

(vi) නම් කිරීමකට අදාල නාමිකයෙකුගේ අයිතිය ක්‍රියාත්මක වන්නේ ජීවිත රක්ෂිතයාගේ අභාවය හේතුවෙන් පැන නගින ප්‍රතිලාභ ගෙවීම්වලට පමණි.

## 2.19 හිමිකම් ඉල්ලා සිටීමේ ක්‍රියාපටිපාටිය

ඔබගේ හිමිකම් ඉල්ලා සිටීම සම්බන්ධයෙන් කඩිනම් සහාය ලබාගැනීම සහ විමසීම් සඳහා කරුණාකර පහත දැක්වෙන ක්‍රම ඔස්සේ අප හා සම්බන්ධ වන්න.

- ඇමතුම් මධ්‍යස්ථාන පොදු දුරකථන අංකය: 0112 990 990
- ක්ෂණික ඇමතුම්: 1330 (ක්‍රියාත්මක කාලය: පැය 24/7)
- ආයතනික විද්‍යුත් තැපෑල: info@unionassurance.com

හිමිකම් ක්‍රියාවලියේ කොටසක් ලෙස, ඔබේ හිමිකම් ඉල්ලා සිටීම තක්සේරු කිරීම සඳහා කරුණාකර පහත සඳහන් සම්මත ලේඛන ඉදිරිපත් කළ යුතු වේ. හිමිකම් වර්ගය මත පදනම්ව අවශ්‍ය වන සම්මත ලේඛන සඳහන් කර ඇත.

සෑම හිමිකම් ඉල්ලා සිටීමක්ම තක්සේරුකරණයකට යටත් වන අතර, ලැබී ඇති ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව අවශ්‍ය වුවහොත්, හිමිකම් ඉල්ලා සිටීමක් හා සම්බන්ධ වැඩිදුර හෝ අමතර ලේඛන සමාගමේ හිමිකම් අංශය විසින් හිමිකම් ඉල්ලා සිටින අයගෙන් ඉල්ලා සිටිනු ඇති බව කරුණාවෙන් සලකන්න. එසේම, ඉල්ලා ඇති පරිදි සියලුම අදාළ ලේඛන නිසි කලට ඉදිරිපත් කිරීම හිමිකම් තක්සේරුකරණ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.

- සෞඛ්‍ය හිමිකම්
  - o හිමිකම් පෝරමය
  - o රෝග නිශ්චය තුණ්ඩුව
  - o ප්‍රතිපූරණ ප්‍රතිලාභ සඳහා බිල්පත් සහ මුදල් ලදුපත්වල මුල් පිටපත්
  - o අදාළ වෛද්‍ය වාර්තා

- මරණ හිමිකම්
  - o හිමිකම් පෝරමය
  - o මරණ සහතිකය
  - o ජීවිත රක්ෂණ ඔප්පුවෙහි මුල් පිටපත/රක්ෂණ ඔප්පු සහතිකය
  - o නාමිකයාගේ/නාමිකයන්ගේ ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය
  - o නාමිකයා සහකරු හෝ සහකාරිය වන්නේ නම් විවාහ සහතිකය
  - o මරණ පරීක්ෂණ වාර්තාව හා පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව (පවත්වා ඇත්නම්)

- අසාධ්‍ය රෝග හිමිකම්
  - o හිමිකම් පෝරමය
  - o වෛද්‍ය වාර්තා/බරපතළ රෝග තත්ත්වයට අදාළ රෝග නිශ්චය ටිකට් පත
  - o ප්‍රතිකාර කරන ලද වෛද්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු වාර්තාව (Private Medical Attendants Report – PMAR)

Specimen

- අකර්මණ්‍යතා හිමිකම්
    - o හිමිකම් පෝරමය
    - o වෛද්‍ය වාර්තා/රෝග නිශ්චය තුණ්ඩුව
    - o ප්‍රතිකාර කරන ලද වෛද්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු වාර්තාව (Private Medical Attendants Report – PMAR)

රක්ෂණ ඔප්පු කොන්දේසි සහ විධිවිධාන සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුවේ අදාළ කොන්දේසි පරීක්ෂා කර බලන්න.

හිමිකම් ප්‍රමාණය ස්ථාපිත කිරීම, මුදාහැරීමේ ලේඛන ලැබීම සහ හිමිකම් ඉල්ලා සිටින අයගේ අනන්‍යතාව තහවුරු කිරීම ඇතුළු සියලු ලේඛන කටයුතු සපුරා ඇති විට, දින 14ක් ඇතුළත හිමිකම් පියවීම සිදුකෙරෙනු ඇත.

## 2.20 සියදිවි නසා ගැනීම

ඔප්පුව නිකුත් කල දින සිට හෝ ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දින සිට ලිත් මාස දොළහ (12) ක් ඇතුළත ජීවිත රක්ෂිතයා ප්‍රකෘති සිහිය ඇතිව හෝ නැතිව සියදිවි නසාගත හොත් වටිනා ප්‍රතිෂ්ඨාවක් සඳහා සද්භාවයෙන් තුන්වන පාර්ශවයක් විසින් අත්කර ගන්නා ලද පැවරීමක් පිළිබඳ දැන්වීමක් මරණය වූ දිනට පෙරාතුව සමාගම වෙත ලිඛිතව ලැබී එය පිළිගෙන ඇත්නම්, ඒ ප්‍රමාණය දක්වා හැර, මෙම ඔප්පුව ශූන්‍ය ඔප්පුවක් වනු ඇත.

## 2.21 වගකීමෙන් සම්පූර්ණයෙන් බැහැර වීම

පහත සඳහන් අවස්ථාවලදී මෙම ඔප්පුව යටතේ කිසිඳු ගෙවීමක් කිරීමට සමාගම බැඳී නැත.

(i) පැමිණිලි කරන ලද මරණයට හෝ හදිසි අනතුරට හේතු වී ඇත්තේ හෝ සිදුවී ඇත්තේ ජීවිත රක්ෂිතයා කිසියම් යුද්ධයකට හෝ යුධ තත්ත්වයකට සමාන සිද්ධීන් වලට හෝ ත්‍රස්තවාදී ක්‍රියාවකට හෝ ආක්‍රමණයකට හෝ විදේශීය සතුරු ක්‍රියාවකට හෝ එදිරිවාදිකම් හෝ යුද්ධයකට සමාන සිද්ධීන් වලට (යුධ තත්ත්වයක් ප්‍රකාශයට පත්කර හෝ නොකර ඇති විට) හෝ සිවිල් යුද්ධයකට හෝ කැරලි කෝලාහලයකට, හමුදාවට විරුද්ධව කැරලි ගැසීමකට, විප්ලවයකට, රාජසන්නතක කිරීමකට සහ/හෝ රාජ්‍ය හෝ පලාත් පාලන අධිකාරියක නියෝගයක් මත කරන ලද ජනසතු කිරීමකට හෝ සෘජුව හෝ වක්‍රව සහභාගි හෝ සම්බන්ධවීමකදී හෝ තත්ත්වාකාරයෙන් හෝ නීත්‍යානුකූලව පිහිටුවන ලද ආණ්ඩුවක් සාහසිකව පෙරලා දැමීමකට ඉලක්කවන යම් ක්‍රියාකාරකම් සිදුකරන සංවිධානයක් නමින් සහ/හෝ ඊට සම්බන්ධව යම් පුද්ගලයකු විසින් කරන ක්‍රියාවන් සඳහා සහභාගි වීමෙන් නම්; සහ/හෝ

(ii) පැමිණිලි කරන ලද මරණය හෝ හදිසි අනතුර සිදුවී ඇත්තේ එවැනි යුද්ධයක්, කැරැල්ලක්, ජන කැළඹීමක්, හමුදා කැරැල්ලක් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් මැඩ පැවැත්වීමට තැත් කිරීමේදී සන්නද්ධ හෝ පොලිස්, හමුදා වල කිසියම් සාමාජිකයෙකු විසින් ගත් කිසියම් ක්‍රියා මාර්ගයක ප්‍රතිඵල හේතුවෙන් හෝ එවැනි යුද්ධයක්, කැරැල්ලක් හෝ ජන කැළඹිල්ලක්, හමුදා කැරැල්ලක් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනියම් ලෙසින් සහභාගී වීමෙන් හෝ සම්බන්ධවීමක් සම්බන්ධයෙන් ජීවිත රක්ෂිතයා අත් අඩංගුවට ගැනීමට හෝ අල්ලා ගැනීමට තැත් කිරීමක දී; සහ/හෝ

(iii) මෙම රක්ෂණ ඔප්පුවට අදාල යෝජනාවේ, හෝ ප්‍රකාශනයේ සහ/හෝ එයට සම්බන්ධ සහ/හෝ මෙම රක්ෂණ ඔප්පුව යටතේ නියම කරන ලද වෙනත් ඕනෑම ලියවිල්ලක් සම්බන්ධව සියළු කරුණු අවංකව රක්ෂිතයා විසින් හෙලිදරව් කිරීමට අපොහොසත් වුවහොත් සහ/හෝ

(iv) වංචා සහගතව හෝ සාවද්‍ය ලෙස තොරතුරු ඉදිරිපත් කිරීමෙන් වන හිමිකමකදී; සහ/හෝ

Specimen

(v) ජීවිත රක්ෂිතයා විසින් කරන ලද නීති විරෝධී ක්‍රියාවක් හේතුවෙන්; සහ/හෝ

(vi) ජීවිත රක්ෂිතයා විසින් කුපිත කිරීමෙන් වූ පහරදීමකින් හෝ සාපරාධි ක්‍රියාවක් කිරීමේදී එසේ කරන්නට තැත් කිරීමේදී හෝ අත් අඩංගුවකට ගැන්මකට ප්‍රතිරෝධය දැක්වීමේදී හටගත් තුවාල.

මෙම වගන්ති යටතේ සමාගම එහි වගකීම බැහැර කළ කවර අවස්ථාවක වුවද පැමිණිලි කර ඇති මරණය හෝ හදිසි අනතුර සිදුවූයේ ඉහත සඳහන් ක්‍රියාවන් හෝ සිදුවීම් කිසිවක් හේතුවෙන් නොවුන බව ඔප්පු කිරීමේ භාරය මෙම ඔප්පුව යටතේ කිසියම් ප්‍රතිලාභයකට හිමිකම් පානු ලබන අයෙකු වෙත පැවරේ.

## 2.22 වාරිකයන් අහිමිවීම

මෙම ඔප්පුවට අදාල යෝජනාවේ සහ ප්‍රකාශනයෙහි හෝ ගිවිසුම යටතේ වූ වෙනත් ලියකියවිලි වල අසත්‍ය හෝ වැරදි සහගත ප්‍රකාශ අඩංගු වේ නම්, මෙම ඔප්පුව බලරහිත වන අතර දැනටමත් ගෙවා ඇති වාරිකයන්ද අහිමිවනු ඇත.

## 2.23 අතුරුදහන් වූ පුද්ගලයන්

ජීවිත රක්ෂිතයා ජීවත්ව සිටියේ නම්, ඔහු ගැන තොරතුරු ස්වාභාවයෙන් දැනගත යුතුව තිබුණු තැනැත්තන් විසින් එක් වර්ෂයක් ඔහු ගැන කිසිම තොරතුරක් දැන නොගන්නා විටකදී ජනිත වන පූර්ව නිගමනයක් පදනම් කරගෙන ජීවිත රක්ෂිතයාගේ මරණය ඔප්පුකිරීමට උත්සුක වන අවස්ථාවකදී ජීවිත රක්ෂිතයා පිළිබඳව අසන්නට නොලැබුණු දින සිට වසර හත (07) ක කාලයක් ගෙවීයන තෙක් මෙම රක්ෂණ ඔප්පුව යටතේ කිසිඳු හිමිකමක් ගෙවිය යුතු නොවේ.

## 2.24 අවලංගු කිරීමේ අයිතිය

රක්ෂිතයාට හෝ ජීවිත රක්ෂිතයාට ඔප්පුව ලැබී දින 21 ක් ඇතුලත (Cooling-off period/free-look period) ජීවිත රක්ෂණ ඔප්පුව සමාගමට ආපසු බාර දීමෙන් එම ඔප්පුව අවලංගු කරනු ලැබිය හැකිය. එවිට, වෛද්‍ය පරීක්ෂණ වාර්තා හා රසායනාගාර පරීක්ෂණ සම්බන්ධ ගාස්තු අයකර ගැනීමෙන් පසුව, ගෙවන ලද ඉතිරි සියලුම වාරික මුදල් සමගම විසින් ආපසු ගෙවනු ලැබේ. කෙසේ වුවද ඔප්පුව අවලංගු කරනුයේ, රක්ෂණ ඔප්පුව ලැබී දින විසි එකක් (21) ගතවීමෙන් පසුව නම්, එකී ඔප්පුව යටතේ පවාරණ අගයක් ලබා ඇත්නම් හැරෙන්නට, කිසිදු මුදලක් නොගෙවනු ඇත.

## 2.25 විවාද රහිත බව

ඔප්පුව නිකුත් කළ දින, ප්‍රාණවත් හෝ ප්‍රතිෂ්ඨාපනය කළ දින අතුරෙන් අවසානයට යෙදෙන දින සිට අවුරුදු දෙකක (02) කාලසීමාවක් ඔප්පුව බලාත්මකව පැවතීමෙන් පසු, සමාගම ජීවිත රක්ෂිතයා හෝ රක්ෂිතයා සමග මෙම ඔප්පුව යටතේ ගිවිසුමකට ඇතුලත් කරවා ගැනීමට පෙළඹවීම සඳහා වැදගත් කරුණු පිළිබඳව අසත්‍යය, සාවද්‍ය හෝ වංචනික ප්‍රකාශ කර ඇති බවට පෙනී යන විටකදී හැරෙන්නට, මෙම ඔප්පුවේ වලංගුභාවය සම්බන්ධයෙන් විවාදයක් ඇති නොවන්නේය.

## 2.26 බදුකරණය

සමාගම, ඔප්පුහිමියා, නාමිකයා හෝ හිමිකම්පාන්නා විෂයෙහි යම් නීතියක්, නියමයක් මගින් හෝ අන්‍යාකාරයකින් පනවනු ලැබිය හැකි යම් බද්දක් හෝ වෙනත් ගෙවීමක් වෙනුවෙන් ආයෝජන ගිණුමෙන් සහ රක්ෂණය යටතේ ලැබීමට ඇති ප්‍රතිලාභ කිසිවකින් අඩු කිරීම අවශ්‍ය යයි හා උචිත යයි සමාගමේ මතය වන යම් අඩු කිරීම් කිරීමට සමාගමට හැකියාව ඇත.

## 2.27 පැමිණිලි සහ අභියාචනා කළමණාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය

පැමිණිලි සහ අභියාචනා කළමණාකරණය කිරීමේ ක්‍රියාවලියට අනුව සමාගම විසින් පිරිනමනු ලබන සේවාවන් හෝ සැලසුම් හා සම්බන්ධ පැමිණිලි හා අභියාචනා සඳහා වන ක්‍රියාපටිපාටිය පහත දැක්වෙයි. මෙම ක්‍රියාපටිපාටිය මඟින් කඩිනමින් සහ කාර්යක්ෂමව පැමිණිලි නිරාකරණය කිරීම සඳහා සැකසූ ක්‍රියාප්‍රවේශයක් සහතික කෙරෙයි.



Specimen

(i) **පැමිණිලි ඉදිරිපත් කළ හැකි ක්‍රම**

- පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම්: 011 2 990990 හෝ 1330 කෙටි කේතය ඔස්සේ.
- ලිඛිත පැමිණිලි: සමාගමේ ප්‍රධාන කාර්යාලයට හෝ ශාඛා කාර්යාලවලට පැමිණිල්ලක්, ලිඛිතව ඉදිරිපත් කිරීම මගින්.
- පෞද්ගලිකව පැමිණ හමුවීම: සමාගමේ ප්‍රධාන කාර්යාලයට හෝ ඕනෑම ශාඛාවකට පැමිණීම මගින්.
- ආයතනික වට්ස්ඇප් අංකය: ආයතනික වට්ස්ඇප් අංකය වන 077 1 330 000 ඔස්සේ ලිඛිත පැමිණිල්ලක් යොමු කිරීම මගින්.
- ආයතනික විද්‍යුත් තැපෑල: විද්‍යුත් තැපෑල ඔස්සේ info@unionassurance.com වෙත ලිඛිත පැමිණිල්ලක් යොමු කිරීම මගින්.

පැමිණිල්ල ඉදිරිපත් කළ පසු, වැඩකරන දින 3ක් ඇතුළත පැමිණිල්ලට අදාල යොමු අංකයක් සමඟ පැමිණිල්ල ලද බවට දැනුම්දීමක් රක්ෂණ ඔප්පුහිමියාට ලැබෙනු ඇත. මෙම යොමු අංකය භාවිතයෙන් පැමිණිල්ලට අදාල කටයුතු සිදුකිරීමේ ක්‍රියාවලිය පුරා සිය පැමිණිල්ල සම්බන්ධ තත්ත්වය ගැන තොරතුරු සොයා බැලීමට රක්ෂණ ඔප්පුහිමියාට ඉඩ සැලසෙයි. සමාගමේ පැමිණිලි කළමණාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය හා සම්බන්ධ වැඩිදුර තොරතුරු www.unionassurance.com වෙත පිවිසීමෙන් ලබාගත හැක.

(ii) **පැමිණිලි නිරාකරණය සඳහා ගත වන කාලය:**

පැමිණිල්ල ලැබුණු දිනයේ සිට වැඩකරන දින 14ක් ඇතුළත පැමිණිල්ල නිරාකරණය කිරීමේ ක්‍රියා පටිපාටිය අවසන් වනු ඇත. යම් හෙයකින් සමාගමට අදාල පැමිණිල්ල නිරාකරණය සඳහා අමතර කාලයක් අවශ්‍යවන අවස්ථාවන්හිදී ඒයට අදාලවන හේතු සමග විසඳුමක් අපේක්ෂාකල හැකි දිනයක් රක්ෂණ ඔප්පුහිමියාට නිසි පරිදි සමාගම මගින් දැනුම් දෙනු ලැබේ.

(iii) **ආරවුල් නිරාකරණය:**

සමාගම විසින් මූලිකව ලබාදෙන ලද විසඳුම සම්බන්ධව රක්ෂණ ඔප්පුහිමියා තෘප්තිමත් නොවන්නේ නම් අදාල පැමිණිලි නිරාකරණය හෝ ප්‍රතිචාරය සමාගම වෙතින් ලැබී සති 4 ක් ඇතුළත විකල්ප ආරවුල් නිරාකරණ ක්‍රමවේදය යටතේ නම්කරනු ලබන නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඇත. එමෙන්ම පැමිණිල්ල නිරාකරණය/ප්‍රතිචාරය සමාගම වෙතින් ලැබී සති 4 ක් ඇතුලතදී රක්ෂණ ඔප්පුහිමියාට විසින් ඊට අදාලව ප්‍රතිචාරයක් නොදැක්වුවහොත් සමාගම විසින් අදාල පැමිණිල්ල නිමාකරන ලද පැමිණිල්ලක් සේ සලකනු ලැබේ.

සමාගම විසින් සපයනු ලබන විසඳුම පිළිනොගන්නා අවස්ථාවලදී, පැමිණිල්ල රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම වෙත යොමු කිරීමේ හෝ ශ්‍රී ලංකාව ඇතුළත අධිකරණ හරහා නීතිමය කටයුතු ඇරඹීමේ අයිතිය රක්ෂණ ඔප්පුහිමියා සතුය. මෙමගින් අපක්ෂපාතී නිරාකරණය සහ නියාමන ප්‍රමිතීන්ට අනුගතවීම සහතික කෙරෙයි.

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම (IRCSL) පිළිබඳ විස්තර:**

විමර්ශන අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම
11 වැනි මහල, නැගෙනහිර කුලුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථන: 011 2396184-9 /011 2335167
ඊමේල්: investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

**රක්ෂණ ඔම්බුඩ්ස්මන් කාර්යාලය පිළිබඳ විස්තර:**

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා
අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, බම්බලපිටිය.
දුරකථන: 011 452 8671/011 2505542
ඊමේල්: info@insuranceombudsman.lk
වෙබ්: www.insuranceombudsman.lk

Specimen

**උපලේඛණ අංක 3**

## 3 අමතර (අතිරේක) ප්‍රතිලාභ සඳහා උපලේඛන

**උපලේඛණ අංක 3.1**

### 3.1 අතිරේක ප්‍රතිලාභ (සෞඛ්‍යය හැර)

**උපලේඛණ අංක 3.1.1**

### 3.1.1 මරණයකදී වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPWPD)

#### 3.1.1.1 ප්‍රධාන අරමුණ සහ ආවරණය

මරණයකදී වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPWPD) මෙම රක්ෂණ ඔප්පුවේ අත්‍යවශ්‍ය ප්‍රතිලාභයක් ලෙස ඇතුළත් කර ඇති අතර, එය පළමු උපලේඛනයේ ii කොටසෙහි දක්වා ඇත. මෙම ඔප්පුව වෙනුවෙන් වාරික ගෙවන කාල සීමාව තුලදී ජීවිත රක්ෂිතයාගේ මරණය සිදුවුවහොත් සහ එහිදී ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම් මරණය සිදු වූ දින සිට පරිණත දින දක්වා ඉදිරියට ගෙවිය යුතු වාරික මුදල් සමාගම විසින් නිතිපතා ගෙවනු ලැබේ.

ජීවිත රක්ෂිතයාගේ මරණය රක්ෂණ ඔප්පුවේ වාරික ගෙවීමේ කාලසීමාව තුළ සිදුවුවහොත්, ජීවිත රක්ෂිතයා මියගිය දින සිට රක්ෂණ ඔප්පුවේ වාරික ගෙවීමේ කාලසීමාව ඉකුත් වන තෙක්, ප්‍රාථමික ප්‍රතිලාභය මත ගෙවිය යුතු නිතිපතා වාරිකය සමාගම විසින් අත්හැර දැමිය යුතුය.

මරණයක දී සීමිත ගෙවීම් අත්හැරීම් වාරික ප්‍රතිලාභය, රක්ෂණ ඔප්පුවේ සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි සහ පහත දක්වා ඇති නිශ්චිත නියමයන් සහ කොන්දේසිවලට යටත් වේ.

#### 3.1.1.2 හිමිකම් දැන්වීම සහ සනාථ කිරීම

ජීවිත රක්ෂිතයාගේ මරණය සිදු වූ දින සිට දින හැටක් (60) ඇතුළත සමාගමට ලිඛිත දැනුම්දීමක් ලැබිය යුතු අතර, ඒ මත හිමිකම් පෑම පදනම් වේ. එවැනි දැන්වීමක් ප්‍රධාන කාර්යාලයට හෝ සමාගමේ ළඟම ඇති ශාඛාවට භාරදිය යුතුය. මරණය සනාථ කිරීම සඳහා සාක්ෂි සමාගම වෙත ඉදිරිපත් කළ යුතුය.

#### 3.1.1.3 කොන්දේසි

(i) මෙම ප්‍රතිලාභය සලකා බැලීම සඳහා, ජීවිත රක්ෂිතයාගේ මරණය සිදුවිය යුත්තේ

(අ) පළමු උපලේඛනයේ ii කොටසේ දක්වා ඇති පරිදි, මෙම ප්‍රතිලාභයේ කල් ඉකුත් වීමේ දිනයට පෙර; හෝ

(ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසුව එළඹෙන ඔප්පු සංවත්සර දින යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමට පෙරය.

(ii) වාරිකය නොගෙවා පවතින්නේ නම්, දින තිහක (30) සහන කාලය ඉකුත් වූ පසු මෙම අමතර ප්‍රතිලාභය අවලංගු වේ.

(iii) ප්‍රධාන රක්ෂණ ඔප්පුව අවසන් වුවහොත්, මරණයකදී වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPWPD) අවසන් වේ.

(iv) මෙම අමතර ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා සහභාගී වීම හෝ

(ආ) පාවාරණ අගය, ගෙවා නිමි අගය වටිනාකම හෝ විශ්‍රාම වැටුප් වටිනාකම ලබා ගැනීම නොකළ යුතුය.

Specimen

## උපලේඛණ අංක 3.1.2

## 3.1.2 හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPADB)

### 3.1.2.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි II කොටසේ හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPADB) ඇතුලත් කර ඇති බවට සඳහන් වේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාල වේ.

පහත සඳහන් කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම්, සහ මෙම ප්‍රතිලාභය සඳහා අදාල වාරික ගෙවා තිබේ නම්, සමාගම සෑහීමකට පත්වන පරිදි රක්ෂිතයාගේ මරණය, හදිසි අනතුරක් නිසා එය සිදුවී, හදිසි අනතුර සිදුවූ දින සිට දින අනූවක් (90) ඇතුලත සිදුවූ බවට සාක්ෂි ඉදිරිපත් කලහොත් පළමු උපලේඛණයේ II කොටසේ LPADB යටතේ සඳහන් රක්ෂිත මුදලට සමාන මුදලක් ගෙවනු ලැබේ. උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාල වේ.

### 3.1.2.2 රැකියාවේ වෙනස්වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීමේ දින සිට දින දහහතරක් (14) ඇතුලත ඒ බව සමාගම වෙත දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කරගත යුතුය. මරණය සිදුවන අවස්ථාවේදී ජීවිත රක්ෂිතයා, යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් රැකියාවට වඩා වෙනස් වූ රැකියාවක නිරත වීමෙන් පැන නගින්නා වූ හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

### 3.1.2.3 කොන්දේසි

(i) ප්‍රතිලාභ ගෙවීම සලකා බැලීම සඳහා, ජීවිත රක්ෂිතයාගේ හදිසි අනතුරු මරණය සිදුවිය යුත්තේ;

(අ) මෙහි පළමු උපලේඛණයේ (II) කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල්පිරීමේ දිනයට පෙර; හෝ

ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමේ දීය.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ, ගෙවානිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) තනි පුද්ගලයෙකු විසින් සියළුම රක්ෂණ සමාගම් මඟින් මෙම ප්‍රතිලාභය සඳහා උපරිම වශයෙන් හිමිකම් කිව හැක්කේ රුපියල් මිලියන පනහක් (රු.50,000,000) දක්වා පමණයි.

(vi) මෙම ඔප්පුව යටතේ, හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (TPS) සහ/හෝ හදිසි අනතුරක් පමණක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (LPTPA) සහ/හෝ හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවකදී වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (LPWP) යටතේ හිමිකම් පෑමක් සඳහා වගකීම පිළිගතහොත් මෙම ප්‍රතිලාභය අහෝසි වේ.

Specimen

### 3.1.2.4 මෙම ප්‍රතිලාභය සඳහා අදාළ වන බැහැර කිරීම්

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතුවූ සිද්ධිය හෝ රෝග තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට හෝ වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම් මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(iv) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිදෝශයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල; සහ/හෝ

(v) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vi) න්‍යෂ්ටික අනතුරු උදා: න්‍යෂ්ටික බල ශක්තියට නිරාවරණය වීම (විකිරණශීලීතා දූෂණය, න්‍යෂ්ටික බද්ධය, විබද්ධය) හෝ ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යයක් නිසා හෝ රසායනික දූෂණය හේතුවෙන්; සහ/හෝ

(vii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මගින් පැනීම, හැංග් ග්ලයිඩින්, කඳු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජී පැනීම, පොතොලින්, දඩයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්; සහ/හෝ

(viii) ස්වාභාවික අනතුරු පහත සඳහන් ස්වාභාවික අනතුරු වලට පමණක් සීමා නොවූ අයිස් කඳු කඩා වැටීම්, නාය යෑම්, භූමි කම්පා, ගංවතුර, භූමි කම්පා හෝ ගිණිකඳු පිපිරීම් මඟින් ඇතිවන සුනාමි හෝ උදම් රළ තත්ත්වයන්, සුළිසුළං, ධාරානිපාත වර්ෂාව, හරිකේන්, ටෝනාඩෝ හා ටයිෆුන් වැනි ස්වාභාවික විපත්; සහ/හෝ

Specimen

**උපලේඛණ අංක 3.1.3**

## 3.1.3 පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හේතුවෙන් (සීමිත ගෙවීම්) (LPTPA)

### 3.1.3.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි II කොටසේ පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හේතුවෙන් (සීමිත ගෙවීම්) (LPTPA) සඳහන් වේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව, පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම් සහ මෙම ප්‍රතිලාභය සඳහා අදාළ වාරික ගෙවා තිබේනම්, සමාගම සෑහිමට පත්වන පරිදි රක්ෂිතයාගේ පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවය හදිසි අනතුරක් මගින් සිදුවු බවට සහ එම අනතුර සිදුවූ දිනයේ සිට දින අනූව (90) ක් ඇතුලත එම අකර්මණ්‍යතාවය සිදුවූ බවට සාක්ෂි ඉදිරිපත් කළහොත්, සහ එම අකර්මණ්‍යතාවය දින එකසිය අසූවකට (180) නොඅඩු කාලයක් පැවතීමෙන් පසු, මෙම ප්‍රතිලාභය යටතේ අදාළ පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයක් වශයෙන් ඔප්පු වුවහොත් සහ රැකියාවක හෝ වෘත්තියක ප්‍රමාණවත්ව යෙදී ආදායමක් ලැබීමට නොහැකි බව තහවුරු වුවහොත්, රක්ෂණ ඔප්පුවේ පළමු උපලේඛණයේ II කොටසේ 'LPTPA' යටතේ සඳහන් රක්ෂිත මුදලට සමාන මුදලක්, සමාන වාර්ෂික වාරික පහ (05) කින් ගෙවන අතර, ඉන් පළමු කොටස සමාගම හිමිකම් සඳහා වගකීම භාරගත් දිනද, ඉතිරි කොටස් මුදල් පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා හිමිකමට පසුව යෙදෙන ඔප්පු සංවත්සරයන්හිදී ගෙවනු ලැබේ. රක්ෂණ ඔප්පුව කල්පිරීම හෝ ජීවිත රක්ෂිතයාගේ මරණය යන අවස්ථාවන්, මේ කොටස් මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිමකිරීමට පෙර සිදුවුවහොත්, එම නොගෙවන ලද ඉතිරි කොටස් මුදල්, රක්ෂණ ඔප්ව කල්පිරීමේදී ජීවිත රක්ෂිතයා වෙතද, ජීවිත රක්ෂිතයාගේ මරණයකදී රක්ෂිතයාගේ උරුමකරුවන් වෙතද ගෙවනු ලැබේ.

### 3.1.3.2 රැකියාවේ වෙනස් වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීමේ දින සිට දින දහහතර (14) ක් ඇතුලත ඒ බව සමාගම වෙත දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කරගත යුතුය. අකර්මණ්‍යතාවය සිදුවන අවස්ථාවේ දී ජීවිත රක්ෂිතයා යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් රැකියාවට වඩා වෙනස් වූ රැකියාවක නිරතවීමෙන් පැනනඟින්නා වූ හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

### 3.1.3.3 හිමිකම්පෑම පිළිබඳ දැන්වීම හා සනාථ කිරීම

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමකට තුඩුදිය හැකි තුවාල පිළිබඳව එම සිදුවීමෙන් දින හැටක් (60) ඇතුළත සමාගමේ ප්‍රධාන කායාර්ලය හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිතව දැන්වීමක් කළ යුතු වන අතර යෝජනා පත්‍රයේ දී ඇති ලිපිනය හා වර්තමාන ලියාපදිංචි ලිපිනයද සමාගම වෙත දැන්විය යුතුය. නියමිත කාලය තුළදී එසේ දැන්වීමට අපොහොසත් වීම මගින් එම හිමිකම නිශ්ප්‍රභා කිරීමේ බලය සමාගම සතුවේ. අකර්මණ්‍යතාවය සනාථ කිරීම සඳහා අවශ්‍ය වන සාක්ෂි, සමාගමේ වියදම මත ලබාදිය යුතුය.

### 3.1.3.4 අකර්මණ්‍යතාවය දිගටම පවත්නා බවට සාධක

අකර්මණ්‍යතාවය (හදිසි අනතුරකින්) පිළිබඳ සාධක සෑහීමකට පත්විය හැකි බව සමාගම විසින් පිළිගෙන තිබුණත් එම අකර්මණ්‍යතාවය දිගටම පවතින බවට සාධක ජීවිත රක්ෂිතයාගෙන් සාධාරණ කාල සීමාවක් ඇතුළත, රක්ෂිතයාගේ වියදම මත ඉල්ලීමට සමාගමට අයිතිය තිබේ. එබඳු සාධක සමාගමට සැපයීමට ජීවිත රක්ෂිතයා පැහැර හරින විටෙක හෝ වැටුපක් ලැබීම සඳහා හෝ වෙනත් අයුරින් හෝ යම් වැඩක හෝ රැකියාවක යෙදීමට ජීවිත රක්ෂිතයාට හැකියාවක් ඇති වූ විටක හෝ එම අවස්ථා දෙකෙන් කුමක් එළඹියද මෙම ප්‍රතිලාභය යටතේ රක්ෂිතයාට කරනු ලබන ගෙවීම් නතර වනු ඇත.

Specimen

### 3.1.3.5 කොන්දේසි

(i) ප්‍රතිලාභ ගෙවීම සලකා බැලීම සඳහා, මෙම පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාව සිදුවිය යුත්තේ;

(අ) මෙහි පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය ඉකුත්වීමට පෙර; හෝ

(ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසුව එළඹෙන ඔප්පු සංවත්සර දිනය යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමේදීය.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ, ගෙවානිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට මෙම ප්‍රතිලාභය යටතේ පැනනගින හිමිකමක් ලබා ගැනීමට අයිතිවාසිකමක් නොමැත.

(vi) තනි පුද්ගලයෙකු විසින් සියළුම රක්ෂණ සමාගම් මඟින් මෙම ප්‍රතිලාභය සඳහා උපරිම වශයෙන් හිමිකම් කිව හැක්කේ රුපියල් මිලියන පනහක් (රු.50,000,000) දක්වා පමණයි.

(vii) මෙම ඔප්පුවේ අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (LPEPD) යටතේ කිසියම් හිමිකමක් සඳහා සමාගම විසින් වගකීම පිළිගෙන ඇති නම් මෙම ප්‍රතිලාභය යටතේ වගකීම පිළිගැනීමේදී අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (LPEPD) සඳහා ගෙවන ලද මුදල අඩු කරනු ඇත.

### 3.1.3.6 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැර කිරීම්

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතුවූ සිද්ධිය හෝ රෝග තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට හෝ වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම් මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(Iv) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිදෝශයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල ; සහ/හෝ

(v) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vi) න්‍යෂ්ටික අනතුරු උදා: න්‍යෂ්ටික බල ශක්තියට නිරාවරණය වීම, (විකිරණශීලීතා දූෂණය, න්‍යෂ්ටික බද්ධය, විබද්ධය) හෝ ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යයක් නිසා හෝ රසායනික දූෂණය හේතුවෙන්; සහ/හෝ

Specimen

(vii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මගින් පැනීම, හැංග් ග්ලයිඩින්, කඳු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජි පැනීම, පොතොලින්, දඩයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්; සහ/හෝ

(viii) ස්වාභාවික අනතුරු පහත සඳහන් ස්වාභාවික අනතුරු වලට පමණක් සීමා නොවූ අයිස් කඳු කඩා වැටීම්, නාය යෑම්, භූමි කම්පා, ගංවතුර, භූමි කම්පා හෝ ගිණිකඳු පිපිරීම් මඟින් ඇතිවන සුනාමි හෝ උදම් රළ තත්ත්වයන්, සුළිසුළං, ධාරානිපාත වර්ෂාව, හරිකේන්, ටෝනාඩෝ හා ටයිෆූන් වැනි ස්වාභාවික විපත්; සහ/හෝ

Specimen

උපලේඛණ අංක 3.1.4

## 3.1.4 දීර්ඝ කරන ලද අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හේතුවෙන් (සීමිත ගෙවීම්) (LPEPD)

### 3.1.4.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ඔප්පුවේ පළමු උපලේඛණයෙහි II කොටසේ දීර්ඝ කරන ලද අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හේතුවෙන් (සීමිත ගෙවීම්) (LPEPD) ඇතුලත් කරන ලද බව සඳහන් වේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව, පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම් සහ මෙම ප්‍රතිලාභය සඳහා අදාළ වාරිකය ගෙවා තිබේ නම්, සමාගම සෑහීමකට පත්වන පරිදි රක්ෂිතයාගේ අර්ධ හා නිත්‍ය අකර්මණ්‍යතාවය හදිසි අනතුරක් මගින් සිදුවූ බවට හා එම අකර්මණ්‍යතාවය රක්ෂිතයාගේ බලපෑමකින් තොරව, සෘජුවම එම අනතුර මගින් සිදුවූ බවට සහ අනෙකුත් හේතුන්ගෙන් ස්වාධීනවූ බවට සහ හදිසි අනතුර සිදුවී දින අනූවක් (90) ඇතුලත වන අර්ධ හා නිත්‍ය අකර්මණ්‍යතාවයන් සඳහා සාක්ෂි ඉදිරිපත් කළහොත්, සමාගම විසින් පහත සඳහන් අකර්මණ්‍යතාවයන්ට අදාළ ප්‍රතිශත මුදල ගෙවනු ලැබේ. එකම අනතුරක ප්‍රතිඵලයක් වශයෙන් මෙහි දක්වා ඇති හානි එකකට වඩා සිදුවුවහොත් ඒ අතුරින් වැඩිම ප්‍රතිශතයක් දක්වා ඇති හානිය වෙනුවෙන් වූ මුදල පමණක් ගෙවනු ලැබේ. උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභට අදාළ වේ.

(i) සම්පූර්ණයෙන් අහිමි වීම හෝ පූර්ණ හා සදාකාලිකව භාවිත කිරීමට නොහැකි වීම.

(අ) එක ගාත්‍රාවක් ....................50% (රක්ෂිත මුදලින්)
(ආ) ආලෝකය හැඳිනීම හැර එක ඇසක පෙනීම ....................50% (රක්ෂිත මුදලින්)
(ඇ) එක ඇසක කාචය ....................50% (රක්ෂිත මුදලින්)

(ii) පූර්ණ හා සදාකාලිකව අහිමිවීම/නැතිවීම

(අ) කන් දෙකේම ඇසීම ....................75% (රක්ෂිත මුදලින්)
(ආ) එක කනක ඇසීම ....................30% (රක්ෂිත මුදලින්)
(ඇ) කතා කිරීම ....................50% (රක්ෂිත මුදලින්)

(iii) සම්පූර්ණයෙන් අහිමි වීම හෝ පූර්ණ හා සදාකාලිකව භාවිත කිරීමට නොහැකි වීම

(අ) එක අතක මහපට ඇඟිල්ල හා ඇඟිලි සතරක් ....................50% (රක්ෂිත මුදලින්)
(ආ) එක අතක ඇඟිලි සතරක් ....................40% (රක්ෂිත මුදලින්)
(ඇ) මහපට ඇඟිල්ල (පාලිකා දෙකම) ....................25% (රක්ෂිත මුදලින්)
(ඈ) මහපට ඇඟිල්ල (එක පාලිකාවක්) ....................10% (රක්ෂිත මුදලින්)
(ඉ) දබරැඟිල්ල (පාලිකා තුනක්) ....................15% (රක්ෂිත මුදලින්)
(ඊ) දබරැඟිල්ල (පාලිකා දෙකක්) ....................8% (රක්ෂිත මුදලින්)
(උ) දබරැඟිල්ල (පාලිකා එකක්) ....................4% (රක්ෂිත මුදලින්)
(ඌ) මැදැඟිල්ල (පාලිකා තුනක්) ....................10% (රක්ෂිත මුදලින්)
(එ) මැදැඟිල්ල (පාලිකා දෙකක්) ....................4% (රක්ෂිත මුදලින්)
(ඒ) මැදැඟිල්ල (පාලිකා එකක්) ....................2% (රක්ෂිත මුදලින්)
(ඔ) වෙදැඟිල්ල (පාලිකා තුනක්) ....................8% (රක්ෂිත මුදලින්)
(ඕ) වෙදැඟිල්ල (පාලිකා දෙකක්) ....................4% (රක්ෂිත මුදලින්)
(ක) වෙදැඟිල්ල (පාලිකා එකක්) ....................2% (රක්ෂිත මුදලින්)
(ග) සුලැඟිල්ල (පාලිකා තුනක්) ....................6% (රක්ෂිත මුදලින්)

Specimen

(ජ) සුලැඟිල්ල (පාලිකා දෙකක්) ............................................3% (රක්ෂිත මුදලින්)

(ට) සුලැඟිල්ල (පාලිකා එකක්) .............................................2% (රක්ෂිත මුදලින්)

(ඩ) පාදයක ඇඟිලි සියල්ලම................................................17% (රක්ෂිත මුදලින්)

(ණ) පාද මහපටැඟිල්ල (පාලිකා දෙකක්).................................5% (රක්ෂිත මුදලින්)

(ත) පාද මහපටැඟිල්ල (එක පාලිකාවක්)................................2% (රක්ෂිත මුදලින්)

(ද) වෙනත් පා ඇඟිල්ලක් (පාලිකා දෙකක්) .............................3% (රක්ෂිත මුදලින්)

### 3.1.4.2 රැකියාවේ වෙනස්වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීම සිදු වූ දින සිට දින දහහතර (14) ක් ඇතුලත ඒ බව සමාගම වෙත දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කරගත යුතුය. අර්ධ අකර්මණ්‍යතාවය සිදුවන අවස්ථාවේදී ජීවිත රක්ෂිතයා යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් රැකියාවට වඩා වෙනස් වූ රැකියාවක නිරත වීමෙන් පැනනගින්නා වූ හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

### 3.1.4.3 හිමිකම්පෑම පිළිබඳ දැන්වීම හා සනාථ කිරීම

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමකදී එම අකර්මණ්‍යතාවයට හේතු වූ සිදුවීමෙන් දින හැටක් (60) ඇතුළත සමාගමේ ප්‍රධාන කාර්යාලය හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිත දැනුම් දීමක් කළ යුතු වන අතර යෝජනා පත්‍රයේ දී ඇති ලිපිනය සහ වර්තමාන ලියාපදිංචි ලිපිනයද සමාගම වෙත දැන්විය යුතුය. නියමිත කාලය තුළදී එසේ දැන්වීමට අපොහොසත් වීම මගින් එම හිමිකම නිශ්ප්‍රභා කිරීමේ බලය සමාගම සතු වේ. අර්ධ අකර්මණ්‍යතාවය සනාථ කිරීම සදහා අවශ්‍ය වන සාක්ෂි, හිමිකම් ලබන්නාගේ වියදමින් සමාගම වෙත ලබාදිය යුතු වේ.

### 3.1.4.4 කොන්දේසි

(i) ප්‍රතිලාභ ගෙවීම සලකා බැලීම සඳහා, මෙම අර්ධ නිත්‍ය අකර්මණ්‍යතාව සිදුවිය යුත්තේ;

(අ) මෙහි පළමු උපලේඛණයේ II වන කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභ කල් පිරීමට පෙර; හෝ

(ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමේදී.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ,ගෙවානිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට මෙම ප්‍රතිලාභය යටතේ පැන නඟින හිමිකම් ලබාගැනීමට අයිතිවාසිකමක් නොමැත.

(vi) තනි පුද්ගලයෙකු විසින් සියළුම රක්ෂණ සමාගම් මඟින් මෙම ප්‍රතිලාභය සඳහා උපරිම වශයෙන් හිමිකම් කිව හැක්කේ රුපියල් මිලියන පනහක් (රු.50,000,000) දක්වා පමණයි.

(vii) පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභ (TPS) හෝ (LPTPA) හෝ වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (LPWP) යටතේ කිසියම් හිමිකම්පෑමක් සඳහා වගකීම පිළිගතහොත් මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් ගෙවනු නොලැබේ.

Specimen

### 3.1.4.5 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැර කිරීම්

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතුවූ සිද්ධිය හෝ රෝග තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට හෝ වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම් මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(iv) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිදෝශයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල; සහ/හෝ

(v) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණාමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vi) න්‍යෂ්ටික අනතුරු උදා: න්‍යෂ්ටික බල ශක්තියට නිරාවරණය වීම, (විකිරණශීලීතා දූෂණය, න්‍යෂ්ටික බද්ධය, විබද්ධය) හෝ ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යයක් නිසා හෝ රසායනික දූෂණය හේතුවෙන්; සහ/හෝ

(vii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මඟින් පැනීම, හැංග් ග්ලයිඩින්, කඳු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජි පැනීම, පොතොලින්, දඩයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්; සහ/හෝ

(viii) ස්වාභාවික අනතුරු පහත සඳහන් ස්වාභාවික අනතුරු වලට පමණක් සීමා නොවූ අයිස් කඳු කඩා වැටීම්, නාය යෑම්, භූමි කම්පා, ගංවතුර, භූමි කම්පා හෝ ගිණිකඳු පිපිරීම් මඟින් ඇතිවන සුනාමි හෝ උදම් රළ තත්ත්වයන්, සුළිසුළං, ධාරානිපාත වර්ෂාව, හරිකේන්, ටෝනාඩෝ හා ටයිෆුන් වැනි ස්වාභාවික විපත්; සහ/හෝ

Specimen

**උපලේඛණ අංක 3.1.5**

## 3.1.5 සමකාල ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPLTB)

### 3.1.5.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ඔප්පුවේ පළමු උපලේඛණයෙහි II කොටසේ සමකාල ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPLTB) ඇතුලත් බවට සඳහන් වන්නේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව, පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව සම්පූර්ණ රක්ෂිත මුදල සඳහා ප්‍රාණවත්ව තිබිය දී හා මෙම ප්‍රතිලාභය කල් පිරීමට ප්‍රථමයෙන් වන ජීවිත රක්ෂිතයාගේ මරණයකදී ඔප්පු කොන්දේසි වලට යටත්ව සමාගම විසින් පළමු උපලේඛණයේ II කොටසේ සමකාල ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPLTB) ලෙස දක්වා ඇති මුදල ගෙවනු ලැබේ. උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.1.5.2 කොන්දේසි

(i) ප්‍රතිලාභ ගෙවීම සලකා බැලීම සඳහා, රක්ෂිතයාගේ මරණය සිදුවිය යුත්තේ;

  (අ) මෙහි පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල් පිරීමට පෙර; හෝ

  (ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන දෙකෙන් පළමු සිදුවීමේ දී.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

  (අ) ලාභ සඳහා දායක නොවන අතර

  (ආ) පවාරණ, ගෙවා නිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

### 3.1.5.3 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැර කිරීම්

අදාළ නැත.

Specimen

**උපලේඛණ අංක 3.1.6**

## 3.1.6 අවමංගල්‍ය වියදම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPFEB)

### 3.1.6.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

අවමංගල්‍ය වියදම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPFEB) ඇතුලත් වන බව ඔප්පුවෙහි පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් වී තිබේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

අවමංගල්‍ය වියදම් ප්‍රතිලාභයට අදාළ වාරික මුදල ගෙවා ඔප්පුව බලාත්මකව පවතින අතරතුර, එම ප්‍රතිලාභය කල් ඉකුත්වීමේ දිනට පෙර, ජීවිත රක්ෂිතයාගේ මරණය සිදුවුවහොත් සමාගම විසින් පළමුවන උපලේඛණයේ II කොටසෙහි "LPFEB" ඉදිරියෙන් සඳහන් ප්‍රතිලාභය, රක්ෂණ ඔප්පුවේ නියමයන්ට හා කොන්දේසි වලට හා පහත සඳහන් විශේෂිත වූ කොන්දේසි හා නියමයන්ට යටත්ව ගෙවනු ලැබේ.

මෙම ප්‍රතිලාභය යටතේ යම් එක් ජීවිතයක් සඳහා සමාගම විසින් නිකුත් කරනු ලබන සියළුම රක්ෂණ ඔප්පු මත ගෙවනු ලබන මුදල රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000) ක උපරිමයකට යටත්වේ. උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.1.6.2 ආවරණ හිමිනොවන කාලය

මෙම ප්‍රතිලාභය ආරම්භ කල දින සිට හෝ ඔප්පුවේ දින සිට හෝ අවසන් වරට ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දින සිට හෝ යන සිදුවීම් වලින් අවසන් වරට සිදුවූ සිදුවීමෙන් දින තුන්සිය හැට පහ (365) ක් සඳහා ආවරණ හිමිනොවන කාලසීමාවක් බලපැවැත්වේ.

### 3.1.6.3 හිමිකම් පෑම පිළිබඳ දැන්වීම හා සනාථ කිරීම

මරණය සිදුවී දින හත (07) ක් ඇතුලත හිමිකම් සලකා බැලීම සඳහා ඒ පිළිබඳව සමාගමේ ප්‍රධාන කාර්යාලය හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිතව දැනුම් දීමක් කලයුතු වේ. එම කාලය තුල දැනුම් දීමට අපොහොසත් වීම මගින් එවැනි හිමිකම් ඉල්ලීම් නිෂ්ප්‍රභා කිරීමට බලයක් සමාගම වෙත ලබාදේ.

මරණය සනාථ කිරීම සඳහා අවශ්‍යය වන සාක්ෂි, හිමිකම් ලබන්නාගේ වියදමින් සමාගම වෙත ලබාදිය යුතුවේ.

### 3.1.6.4 කොන්දේසි

(i) ජීවිත රක්ෂිතයාගේ මරණය සිදුවිය යුත්තේ;

(අ) මෙහි පළමු උපලේඛණයේ II වන කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල්පිරීමේ දිනයට පෙර; හෝ

(ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසු එළැඹෙන ඔප්පු සංවත්සර දින යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමේදී,

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ අගයක්, ගෙවා නිමි අගයක් හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) මෙම ප්‍රතිලාභය යටතේ එක් රක්ෂිතයෙකු වෙනුවෙන් සියළුම රක්ෂණ ඔප්පු යටතේ ලබාගත හැකි උපරිම රක්ෂිත මුදල රුපියල් දෙලක්ෂ පනස් දහසකි(රු.250,000/-).

Specimen

(vi) "FEB" ප්‍රතිලාභය යටතේ වගකීම් භාරගැනීමේ තීරණය මගින් මෙම රක්ෂණ ඔප්පුව යටතේ යම් කවර හෝ හිමිකම්පෑම්/ප්‍රතිලාභ වෙනුවෙන් වගකීම් භාරගැනීමක් සම්බන්ධයෙන් සමාගම කෙරෙහි බැඳීමක් ඇති නොකෙරෙන අතර, සමාගමේ වගකීම් වලට කිසිදු අගතියකින් තොරව එම තීරණය ගනු ලැබේ.

### 3.1.6.6 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැර කිරීම්

අදාළ නැත.

Specimen

**උපලේඛන අංක 3.1.7**

## 3.1.7 හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස්වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPWP)

### 3.1.7.1 ප්‍රධාන අරමුණු සහ ආවරණය

හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස්වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPWP), මෙම රක්ෂණ ඔප්පුවේ ඇතුළත් කර, මෙම රක්ෂණ ඔප්පුවේ පළමු උපලේඛනයේ ii කොටසේ දක්වා තිබේ නම්, අදාළ වේ. ජීවිත රක්ෂිතයා අනතුරක් හෝ අසනීපයක් හේතුවෙන් වාරික ගෙවීමේ කාලය තුළ සම්පූර්ණයෙන්ම සහ ස්ථිර ආබාධිත තත්ත්වයට / දුබලතාවකට පත්වුවහොත් සහ අවම වශයෙන් දින එකසිය අසූවක (180) කාලයක් තුළ ආබාධිත තත්ත්වය දිගටම පවතින්නේ නම්, ආබාධිතභාවය අඛණ්ඩව පවතින දින සිට ප්‍රතිලාභයේ කල් ඉකුත්වීම දක්වා කාලය තුළ ගෙවිය යුතු, පහත සඳහන් ප්‍රතිලාභ සඳහා නිතිපතා වාරිකය සමාගම විසින් අත්හැරිය යුතුය.

(i) මූලික ප්‍රතිලාභය

(ii) සමකාල ප්‍රතිලාභය (සීමිත ගෙවීම්)(LPLTB)

(iii) අවමංගල්‍ය වියදම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPFEB)

(iv) පවුල් ආදායම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPFIB)

(v) සහකරුගේ ජීවිතය මත සමකාල ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPSPB)

හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස්වීමේ ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPWP), රක්ෂණ ඔප්පුවේ සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි සහ පහත දැක්වෙන විශේෂිත නියමයන් සහ කොන්දේසිවලට යටත් වේ.

### 3.1.7.2 ආවරණය හිමි නොවන කාලය

කිසියම් රෝගයක් හේතුකොට ගෙන සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයක්, ආවරණය ආරම්භක දිනය හෝ ඔප්පුවේ දිනය හෝ නැවත ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනය යන අවස්ථාවලින් අවසාන සිදුවීමේ දින සිට දින තිහ (30) කට ප්‍රථම සිදුවන අකර්මණ්‍යතාවයකට මෙම ප්‍රතිලාභ ගෙවීම අදාළ නොවේ. මෙම ප්‍රතිලාභය රක්ෂණ ඔප්පුව ආරම්භ කළ දිනට පසුව ඔප්පුවට ඇතුලත් කරන ලද්දේ නම් ආවරණ හිමි නොවන කාල සීමාව, ප්‍රතිලාභය ඇතුලත් කල දින සිට දින එකසිය අසූව (180) කි.

### 3.1.7.3 වාර මුදල් හා කොන්දේසි සංශෝධනය කිරීම

මෙම ප්‍රතිලාභය සඳහා වාරික ගෙවීම පිළිබදව ඔප්පුවේ උපලේඛණයේ II කොටසේ දක්වා ඇති පරිදි පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය යටතේ ගෙවිය යුතු වාරිකය සහතික කරනුයේ මෙම ප්‍රතිලාභය ආරම්භ කල දින සිට වසර එක (01) ක කාලයක් සඳහා පමණක් වන අතර ඒ බව රක්ෂිතයාට දින තිහ (30) ක දැනුම් දීමකින් පසුව වාරික මුදල් හෝ අදාළ කොන්දේසි සංශෝධනය කිරීමේ බලය සමාගම සතුය. එවැනි ප්‍රතිශෝධන බලපවත්වනු ලබන්නේ ඊළග ඔප්පු සංවත්සර දිනයේ සිටය.

### 3.1.7.4 රැකියාවේ වෙනස්වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවේ සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීමේ දින සිට දින දහහතර (14) ක් ඇතුලත ඒ බව සමාගම වෙත දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කරගත යුතුය. අකර්මණ්‍යතාවය සිදුවන අවස්ථාවේදී ජීවිත රක්ෂිතයා යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් රැකියාවට වඩා වෙනස් වූ රැකියාවක නිරත වීමෙන් පැන නඟින්නාවූ හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

Specimen

### 3.1.7.5 හිමිකම්පෑම පිළිබඳ දැන්වීම හා සනාථ කිරීම

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම්පෑමකට තුඩුදිය හැකි රෝගයක් හෝ තුවාල පිළිබඳව එම සිදුවීමෙන් දින හැටක් (60) ඇතුලත සමාගමේ ප්‍රධාන කාර්යාලය හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිතව දැන්වීමක් කළ යුතු වන අතර යෝජනා පත්‍රයේ දී ඇති ලිපිනය සහ වර්තමාන ලියාපදිංචි ලිපිනයද සමාගම වෙත දැන්විය යුතුය. නියමිත කාලය තුළදී එසේ දැන්වීමට අපොහොසත් වීම මගින් එම හිමිකම නිශ්ප්‍රභා කිරීමේ බලය සමාගම සතුවේ. අකර්මණ්‍යතාවය සනාථ කිරීම සඳහා අවශ්‍ය වන සාක්ෂි, සමාගමේ වියදම මත ලබාදිය යුතුය.

### 3.1.7.6 අකර්මණ්‍යතාවය දිගටම පවත්නා බවට සාධක

අකර්මණ්‍යතාවය පිළිබඳ සාධක සෑහීමකට පත්විය හැකි බව සමාගම විසින් පිළිගෙන තිබුණත් එම අකර්මණ්‍යතාවය දිගටම පවතින බවට සාධක ජීවිත රක්ෂිතයාගෙන් සාධාරණ කාල සීමාවක් ඇතුළත, සමාගමේ වියදම මත ඉල්ලීමට සමාගමට අයිතිය තිබේ. එබඳු සාධක සමාගමට සැපයීමට ජීවිත රක්ෂිතයා පැහැර හරින විටක හෝ වැටුපක් ලැබීම සඳහා හෝ වෙනත් අයුරින් හෝ යම් වැඩක හෝ රැකියාවක යෙදීමට ජීවිත රක්ෂිතයාට හැකියාවක් ඇතිවූ විටක හෝ එම අවස්ථා දෙකෙන් කුමක් එළඹියද මෙම ප්‍රතිලාභ යටතේ හිමිකම් සලකා බැලීම නතර වනු ඇත. තවද, ඉන්පසුව යෙදෙන වාර මුදල් මූලික ඔප්පුවේ කොන්දේසි වලට යටත්ව ගෙවිය යුතුවේ.

### 3.1.7.7 කොන්දේසි

(i) ප්‍රතිලාභ සලකා බැලීම සඳහා, හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවය

(අ) පළමු උපලේඛනයේ ii කොටසේ දක්වා ඇති පරිදි, මෙම ප්‍රතිලාභයේ කල් ඉකුත් වීමේ දිනයට පෙර; හෝ

(ආ) ජීවිත රක්ෂිතයාගේ 70 වන උපන්දිනයෙන් පසු රක්ෂණ ඔප්පු සංවත්සරයට පෙර; යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමේදී ඇති විය යුතුය.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) ප්‍රධාන රක්ෂණ ඔප්පුව අවසන් කළහොත්, රක්ෂණ වාරික ප්‍රතිලාභ අත්හැරීම අවසන් වේ..

(iv) මෙම අමතර ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා සහභාගී වීම හෝ

(ආ) පවාරණ ගෙවානිම් හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) මෙම උපලේඛනයෙන් සපයා ඇති ප්‍රතිලාභ යටතේ හිමිකම් පෑමකින් පැන නගින කිසිදු ගෙවීමක් ලබාගැනීමට පැවරුම්ලාභියෙකුට, නාමිකයෙකුට හෝ ප්‍රතිලාභියෙකුට අයිතියක් නොමැත.

(vi) හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවය ප්‍රතිලාභය සක්‍රිය කිරීමේ දී, රක්ෂණ ණය සහ අර්ධ වශයෙන් අරමුදල් ආපසු ගැනීම සඳහා රක්ෂණ ඔප්පු හිමියා සුදුසුකම් නොලබයි.

(viii) ජීවිත රක්ෂිතයා මෙම ආවරණය ලබා ගැනීමට සුදුසුකම් නොලබන්නේ නම්, එම ආවරණය ඉවත් කිරීමට සමාගමට අයිතියක් ඇත. තවද ජීවිත රක්ෂිතයාගේ අභිමතය පරිදි මෙම ආවරණය ඉවත් කල නොහැක.

### 3.1.7.8 මෙම ප්‍රතිලාභය සඳහා අදාළ වන බැහැර කිරීම්

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතුවූ සිද්ධිය පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට හෝ වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම්

Specimen

මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) කලින් තිබූ රෝගී තත්ත්වයක් හෝ තුවාල හෝ එවන් තත්ත්වයන් රක්ෂිතයා ජීවිත රක්ෂණ යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කර ඔප්පුව ආරම්භක දිනට හෝ ඊට පෙර රක්ෂණ ඔප්පුව මගින් හෝ වෙනයම් තහවුරු ලිපියක් මගින් සමාගම විසින් ලිඛිතව පිළිගෙන තිබේනම් හැර; සහ/හෝ

(iv) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(v) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිදෝශයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල ; සහ/හෝ

(vi) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vii) න්‍යෂ්ටික අනතුරු උදා: න්‍යෂ්ටික බල ශක්තියට නිරාවරණය වීම, (විකිරණශීලීතා දූෂණය, න්‍යෂ්ටික බද්ධය, විබද්ධය) හෝ ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යයක් නිසා හෝ රසායනික දූෂණය හේතුවෙන්; සහ/හෝ

(viii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මගින් පැනීම, හැංග් ග්ලයිඩින්, කඳු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජි පැනීම, පොතොලින්, දඬයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්; සහ/හෝ

(ix) ස්වාභාවික අනතුරු පහත සඳහන් ස්වාභාවික අනතුරු වලට පමණක් සීමා නොවූ අයිස් කඳු කඩා වැටීම්, නාය යෑම්, භූමි කම්පා, ගංවතුර, භූමි කම්පා හෝ ගිණිකඳු පිපිරීම් මඟින් ඇතිවන සුනාමි හෝ උදම් රළ තත්ත්වයන්, සුළිසුළං, ධාරානිපාත වර්ෂාව, හරිකේන්, ටෝනාඩෝ හා ටයිෆූන් වැනි ස්වාභාවික විපත්; සහ/හෝ

Specimen

**උපලේඛණ අංක 3.1.8**

## 3.1.8 යූනියන් පවුල් ආදායම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPFIB)

### 3.1.8.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි II කොටසේ පවුල් ආදායම් ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPFIB) ඇතුලත් බවට සඳහන් වේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතීනම් සහ මෙම ප්‍රතිලාභයට අදාළව වාරිකය ගෙවා තිබේ නම් සමාගම විසින් රක්ෂිතයාගේ මරණින් පසුව රක්ෂණ ඔප්පුවේ පළමු උපලේඛණයේ (II) කොටසේ සඳහන් පවුල් ආදායම් ප්‍රතිලාභය යටතේ වන වාර්ෂික ආදායම, ත්‍රෛයිමාසිකව ගෙවනු ලැබේ. එහි පළමු කොටස මරණය සිදුවූ වහාම ගෙවන අතර ඉතිරි කොටස් එයින් පසු රක්ෂණ ඔප්පු සංවත්සරය හා සමගාමී වන කාර්තු වලදී ගෙවනු ලැබේ. උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.1.8.2 කොන්දේසි

(i) ප්‍රතිලාභ ගෙවීම සලකා බැලීම සඳහා ඔප්පුහිමියාගේ මරණය සිදුවිය යුත්තේ;

(අ) මෙහි පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල්පිරීමේ දිනයට පෙර; හෝ

(ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමේදී.

(ii) මෙම ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ, ගෙවානිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(iii) පැවැරුම්ලාභියාට මෙම ප්‍රතිලාභය යටතේ පැනනගින හිමිකමක් ලබාගැනීමේ කිසිදු අයිතිවාසිකමක් නොමැත.

(iv) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත

(v) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත

### 3.1.8.3 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැරකිරීම්

අදාළ නැත.

Specimen

උපලේඛණ අංක 3.1.9

## 3.1.9 සහකරුගේ ජීවිතය මත සමකාලීන ප්‍රතිලාභය (සීමිත ගෙවීම්) (LPSPB)

### 3.1.9.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි II කොටසේ සහකරුගේ ජීවිතය මත සමකාලීන ප්‍රතිලාභය (LPSPB) ඇතුලත් කර ඇති බවට සඳහන් වේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්‍ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව, පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව සම්පූර්ණ මුදල සඳහා ප්‍රාණවත්ව තිබිය දී හා මෙම ප්‍රතිලාභයට අදාළ වාරික නිසි පරිදි ගෙවා තිබිය දී සිදුවන සහකරුගේ මරණයකදී මෙහි පහත සඳහන් ඔප්පු කොන්දේසි හා බැහැර කිරීම් වලට යටත්ව සමාගම විසින් ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි ෂෂ කොටසේ සහකරුගේ ජීවිතය මත සමකාලීන ප්‍රතිලාභය (LPSPB) ලෙස දක්වා ඇති මුදල ගෙවනු ලැබේ. උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.1.9.2 කොන්දේසි

(i) ප්‍රතිලාභ ගෙවීම සලකා බැලීම සඳහා, සහකරුගේ මරණය සිදුවිය යුත්තේ;
- (අ) මෙහි පළමු උපලේඛණයේ II වන කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල් පිරීමේ දිනයේදී; හෝ
- (ආ) ජීවිත රක්‍ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන දෙකෙන් පළමු සිදුවීමේදී.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) මුල් රක්‍ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;
- (අ) ලාභ සඳහා දායක නොවන අතර
- (ආ) පවාරණ, ගෙවා නිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) ජීවිත රක්‍ෂිතයාගේ, ජීවිත කාලය තුළ සහකරුට මෙම ප්‍රතිලාභය යටතේ ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා වෙනත් පාර්ශවයන් නම් කිරීමට හෝ පැවරීමක් කිරීමට කිසිඳු බලයක් නොමැත.

(vi) ජීවිත රක්‍ෂිතයාගේ මරණයකදී, මෙම ප්‍රතිලාභ යටතේ ආවරණය අහෝසි වේ.

### 3.1.9.3 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැර කිරීම්
අදාළ නැත.

Specimen

**උපලේඛණ අංක 3.2**

## 3.2 ජීවිත රක්ෂණ අතිරේක ප්‍රතිලාභ (සෞඛ්‍ය)

**උපලේඛණ අංක 3.2.1**

## 3.2.1 යුනියන් සුවමග ප්‍රතිලාභය (SMB)

### 3.2.1.1 ප්‍රධාන අරමුණ සහ අවශ්‍යතාවය

ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි II කොටසේ සුවමග ප්‍රතිලාභය (SMB) ඇතුලත් බවට සඳහන් වේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ. මෙම ප්‍රතිලාභය බලපැවැත්වෙන්නේ රක්ෂිතයා; සහ/හෝ රක්ෂිතයාගේ කාලත්‍රයා, මෙම ප්‍රතිලාභය සඳහා ඇතුලත්වී ඒ බව පළමු උපලේඛණයේ සඳහන් වේ නම් පමණකි.

රක්ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව, පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතීනම් සහ මෙම ප්‍රතිලාභයට අදාළ වාරිකය ගෙවා තිබේ නම්, සමාගම සෑහීමකට පත්වන පරිදි රක්ෂිතයාගේ හෝ සහකරුගේ/සහකාරියගේ ජීවිත සම්බන්ධයෙන් පහත සඳහන් අසාධ්‍ය රෝගයක් නිර්ණය කර හෝ සැත්කමකට රක්ෂණ ඔප්පුවේ කාලය තුල භාජනය වී තිබූ බවට සාක්ෂි ඉදිරිපත් කළහොත්, සමාගම විසින් ජීවිත රක්ෂණ ඔප්පුවේ පළමු උපලේඛණයේ II කොටසේ 'SMB' යටතේ සඳහන් රක්ෂිත මුදල (‘ඇන්ජියෝප්ලාස්ටි’ යන අසාධ්‍ය රෝග තත්ත්වය යටතේ හැර) ගෙවනු ලැබේ.

‘ඇන්ජියෝප්ලාස්ටි’ ආවරණය සඳහා, රක්ෂණ සමාගම් සියල්ලෙන්ම ලබා ඇති සුවමග/අසාධ්‍ය රෝග ආවරණ යටතේ, උපරිමය රුපියල් මිලියනයකට (රු.1,000,000) යටත්ව පළමු උපලේඛණයේ II කොටසේ දක්වා ඇති සුවමග ප්‍රතිලාභ මුදලින් සියයට පනහක් (50%) ගෙවනු ලැබේ. උපලේඛණ අංක 05 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.2.1.2 ආවරණ හිමි නොවන කාලය

‘ඇන්ජියෝප්ලාස්ටි’ ආවරණය හැරුනු කොට අනෙකුත් අසාධ්‍ය රෝග සඳහා ඔප්පුව ආරම්භ කල දිනය හෝ ඔප්පුවේ දිනය හෝ ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනය හෝ මෙම ප්‍රතිලාභය රක්ෂණ ඔප්පුව ආරම්භ කල දිනට පසුව ඇතුලත් කරන ලද්දේ නම් එම දිනය හෝ යන සිදුවීම් වලින් අවසන් සිදුවීමෙන් දින අනූව (90) ක් සඳහා ආවරණ හිමි නොවන කාල සීමාවක් බලපවතී.

‘ඇන්ජියෝප්ලාස්ටි’ ආවරණය ඔප්පුව ආරම්භ කල දිනය හෝ ඔප්පුවේ දිනය හෝ ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනය හෝ මෙම ප්‍රතිලාභය රක්ෂණ ඔප්පුව ආරම්භ කල දිනට පසුව ඇතුලත් කරන ලද්දේ නම් එම දින හෝ යන සිදුවීම් වලින් අවසන් සිදුවීමෙන් දින එකසිය අසූව (180) ක් සඳහා ආවරණ හිමි නොවන කාලසීමාවක් බලපැවැත්වේ. කෙසේ වෙතත් යුනියන් සුවමග ප්‍රතිලාභය (SMB) ඔප්පුව ආරම්භක දිනයට පසුව ඔප්පුවට ඇතුලත් කරන ලද්දේ නම් අදාළ වන ආවරණ හිමි නොවන කාලය ප්‍රතිලාභය ආරම්භක දිනයේ සිට දින එකසිය අසූව (180) කි.

### 3.2.1.3 අසාධ්‍ය රෝග අර්ථ දැක්වීම

(i) **පිළිකා** (CANCER)

ඍතික වේදීය සොයාගැනීම් මගින් තහවුරු කරන ලද මාත්සරික සෛලයන්ගේ පාලනය කළ නොහැකි වර්ධනය හා පටකයන් ආක්‍රමණය කිරීම පෙන්නුම් කරනු ලබන සියළු අර්බුදයක් (Malignant Tumour) මෙයින් අදහස් කෙරේ. රෝග නිර්ණය පිළිකා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් තහවුරු කල යුතු වේ

විශේෂයෙන් බැහැරකල අවස්ථාවකදී හැරුනුකොට ලියුකේමියාව (Leukaemia) හෝ මාත්සරික ලිම්පෝමා හා මයලොඩිස්ප්ලාස්ටික් සහලක්ෂණය මෙම නිර්වචනය යටතේ ආවරණය වේ .

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.



Specimen

- ඖතික වේදීය සාක්ෂි මගින් පූර්ව මාත්සරික ලෙස වර්ගීකරණය කරන ලද හෝ ආක්‍රමණික නොවන හෝ ස්වාස්ථිත අර්බුදයන් (පයෝධරයන්හි ස්වාස්ථිත ප්‍රණාලීය හෝ ඛන්ඩිකාමය කාර්සිනෝමාවන් හා ග්‍රෛවීය ඩිස්ප්ලාසියාවන් (CIN-1, CIN-2 and CIN-3).
- ග්ලිසන් අගය 6 ඉක්මවූ හෝ TNM සායනික වර්ගීකරණයට අනුව ඔ2හ0එ0ග අවස්ථාව දක්වාවත් ප්‍රගමණය වූ පිළිකාවන් හැර අනෙකුත් සියළු පුරස්ථි ග්‍රන්ථි පිළිකාවන් හා අර්බුදයන්.
- බිනෙට් ඊ අවස්ථාව දක්වා වත් ප්‍රගමණය නොවූ නිදන්ගත වසා සෛලික ශ්වේත රක්තිය (lymphocytic leukaemia).
- ස්ථානාත්තරයන් (metastases) පිළිබඳ සාක්ෂි නොමැති මූලස්ථ සෛල කාර්සිනෝමාවන්, ශල්කමය සෛල කාර්සිනෝමාවන් සහ මාත්සරික මෙලනෝමා 1A අවස්ථාව (T1aN0M0).
- ඖතික වේදීය හඳුනාගැනීම් මගින් T1N0M0 ලෙස විස්තර කෙරුනු හා සෙ.මී. 1 ට අඩු විශ්කම්භයකින් යුතු තෛරොයිඩ් පිටිකා පිළිකාවන් .
- ඖතිකවේදීය මගින් Ta ලෙස විස්තර කෙරුනු හා ආශගත (මුත්‍රාශයෙහි) පිටිකාමය ක්ෂුද්‍ර කාර්සිනෝමාවන්.
- තත්‍ය රුබිරා පොලිසයිතිමීයාව හා සාමාන්‍ය ත්‍රොම්බොසයිතිමියාව.
- තීව්‍රතාවය නිර්ණය නොකල ඒක ක්ලෝනික ගැමෝපතිය.
- හෙලිකො බැක්ටීරියා සමූලෝත්පාධනය මගින් ප්‍රතිකාර කල හැකි ජඨර MALT ලිම්පෝමාව.
- AJCC පිළිකා අවස්ථානිර්ණ සංග්‍රහයේ 7 වන වෙළුමට (2010) අනුව 1 හා 11 අවස්ථාවේ පවතින ජඨර හා ආන්ත්‍රික පංජර අර්බුද (GIST).
- රසායන හෝ කිරණ චිකිත්සා මගින් ප්‍රතිකාර කිරීම අවශ්‍ය නොවන ත්වචීය ලිම්පෝමාවන්
- රසායන හෝ කිරණ චිකිත්සා මගින් ප්‍රතිකාර කිරීම හෝ කුච විච්ඡේදනය (Mastectomy) අවශ්‍ය නොවන ඖතික වේදීය පරීක්ෂණ මගින් T1 mic ලෙස වර්ගීකරණය කෙරුණු පයොධරයන්හි ක්ෂුද්‍ර ආක්‍රමණික කාර්සිනෝමාවන්.
- රසායන හෝ කිරණ චිකිත්සා මගින් ප්‍රතිකාර කිරීම හෝ ජරායු විච්ඡේදනය (Hysterectomy) අවශ්‍ය නොවන ඖතික වේදීය පරීක්ෂණ මගින් IA1 ලෙස වර්ගීකරණය කෙරුණු ධරා ග්‍රිවයෙහි (cervix) ක්ෂුද්‍ර ආක්‍රමණික කාර්සිනෝමාවන්.

(ii) **හෘදයාබාධ (වහිර්කන්තුක ඉන්පාකීභවනය** Myocardial Infarction)

හෘදයාබාධයක් (වහිර්කන්තුක ඉන්පාකීභවනය) මුල් වතාවට ඇතිවීම හා අදාල ප්‍රදේශයට රුධිර සැපයුම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් හෘද පේශියේ (වහිර්කන්තුකයේ) කොටසක් මිය යාම මෙයින් අදහස් කෙරේ. වහිර්කන්තුක ඉන්පාකීභවනය රෝග විනිශ්චය පහත සඳහන් සියළුම නිර්ණායකයන් සම්පූර්ණ කිරීම මගින් සනාථ කල යුතු වේ.

- උග්‍ර වහිර්කන්තුක ඉන්පාකීභවනය රෝග නිශ්චයට අනුරූප වන දර්ශීය සායනික රෝග ලක්ෂණයන් සහිත රෝග ඉතිහාසය (උදාඃ දර්ශීය පපුවේ වේදනාව)
- නව හෘදයාබාධයකට ලාක්ෂණික විද්‍යුත් කන්තුක රේඛණ වෙනස්කම්
- ඉන්පාකීභවයනයකට විශේෂිත එන්සයිම ඉහල යාම. (ට්‍රොපොනින් හෝ අනෙකුත් විශේෂිත ජෛව රසායනික සළකුණුකාරක) බැහැර කිරීම් ඃ

වෙනත් උග්‍ර කිරීටක සහලක්ෂණයන් (සින්ඩ්‍රෝමයන්)

- සියළු ආකාරයන්හි උරස් සම්බාධයන් (ඇන්ජයිනා පෙක්ටෝරිස්)
- අන්තහ් ධමනි කන්තුක ක්‍රියාවලියකට අනුගාමීව හෝ ඉස්කිමීය හෘද රෝගයක තත්වයක සාක්ෂියකින් තොරව හෝ ඉන්පාකීභවයනයකට විශේෂිත ජෛව රසායනික සළකුණුකාරක වන ට්‍රොපොනින් අයි හෝ ට්‍රොපොනින් ටී ඉහලයෑම.



Specimen

(iii) **ස්ඵාර ආඝාතය** (STROKE)

පහතින් සඳහන් තත්ත්වයන් සමගින් ඇතිවන කපාලික ශ්‍යානියක් (ඉන්ට්‍රා ක්‍රනියල් ත්‍රොම්බෝසිස්) හෝ රුධිර වහනයක් හෝ බාහිර මූලයකින් හටගත් නිනඹිතියක් (එම්බොලිසම්) හේතුවෙන් ඇතිවන මස්තිශ්ක වාහිණී ඉසච්චක ප්‍රතිඵලයක් ලෙස මශ්තිෂ්ක (මොලයේ) පටක මිය යාම මෙයින් අදහස් කෙරේ.

- උග්‍ර නව ස්නායුක රෝග ලක්ෂණ පහල වීම
- සායනික පරීක්ෂණවලදී හඳුනාගත් නව ස්නායුක ඌනතා පිලිබඳ වාස්තවික සාක්ෂි

රෝගය හඳුනාගත් දිනයේ සිට මාස තුනකට වැඩි කාලයක් ස්නායුක ඌනතා පැවතිය යුතුය. රෝග නිශ්චය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතු අතර පරිලෝකණ පරීක්ෂණ ප්‍රතිඵල ඇසුරින් සනාථ කල යුතු වේ.

ඉහත අර්ථ දැක්වීමට මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- තාවකාලික ඉස්කිමීය ප්‍රහාර (TIA) හා ප්‍රතිවර්තීය කල්පවත්නා ඉස්කිමීය ස්නායුක ඌනතා (PRIND);
- මශ්තිෂ්ක පටකයන්ට හෝ රුධිර වාහිණිවලට සිදුවන ක්ෂතික හානි.
- සාමාන්‍ය ඔක්සිජන් ඌනතාවය , ආසාදන, ප්‍රදාහක රෝග, අඩිසුදය (මිග්‍රේන්) හෝ වෛද්‍යමය ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන ස්නායුක ඌනතා.
- සායනික රෝග ලක්ෂණයන් හා පැහැදිලි සම්භන්ධතාවයක් නොදක්වන අහඹු පරිලෝකණ පරීක්ෂණ ප්‍රතිඵල (උදාඃ නිහඩ ස්ඵාර).

(iv) **කිරීටක ධමනි ශල්‍යකර්මය** (CORONARY ARTERY(BYPASS) SURGERY)

අවම හානිකර යතුරු සිදුරු කිරීටක ධමණි බයිපාස් ශල්‍යකර්මයක් හෝ ක්‍රෝඩක විභේදනයක් හරහා සිදුකෙරෙන සැබෑ කිරීටක ධමණි බයිපාස් ශල්‍යකර්මයක් මගින් එක් කිරීටක ධමණියක හෝ කිහිපයක ඇති පටු වීම් හෝ අවහිරවීම් නිදොස් කිරීම සඳහා හෘද සැත්කමක් සිදුකිරීම මෙයින් අදහස් කෙරේ. රෝග නිශ්චය කිරීටක ධමණි ඇන්ජියෝග්‍රෑම් (වහිත්‍ර කන්තු රේඛණ) වාර්ථා මගින් සනාථ වියයුතු අතර ශල්‍යකර්මය අත්‍යවශ්‍යයෙන්ම සිදුකලයුතු බව හෘද රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතු වේ.

මතු කියැවෙන තත්ත්වයන් මෙම අර්ථ දැක්වීමෙන් බැහැර කෙරේ.

- ඇන්ජියෝප්ලාස්ටි සහ/හෝ අන්තභ් ධමණික ක්‍රියාවලීන්

(v) **වකුගඩු අක්‍රියවීම** (RENAL FAILURE)

වකුගඩු බද්ධ කිරීමක් සිදුකල හෝ නිත්‍ය රුධිර කාන්දු පෙරීම හෝ පරිතාන කාන්දු පෙරීම අරඹා ඇති වකුගඩු දෙකෙහිම නිදන්ගත අප්‍රතිවර්ත්‍ය අකර්මන්‍යවීමක් මෙයින් අදහස් කෙරේ. රෝග නිශ්චය හා කාන්දුකරණය සඳහා වූ වෛද්‍යමය අවශ්‍යතාවය වකුගඩු පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් සනාථ කළ යුතුය.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- තාවකාලිකව කාන්දුකරණය අවශ්‍ය වන උග්‍ර ප්‍රතිවර්ත්‍ය වකුගඩු ක්‍රියා විරහිත වීම්

(vi) **ප්‍රධාන ඉන්ද්‍රිය බද්ධ** (MAJOR ORGAN TRANSPLANTATION)

ස්වවර්ග බද්ධ (ඇලෝග්‍රැෆ්ට්) හෝ සර්වසම බද්ධ (අයිසොග්‍රැෆ්ට්) කිරීමකට ප්‍රතිග්‍රාහකයෙකු වීම මෙයින් අදහස් කෙරේ. එහිදී පහත සඳහන් ඉන්ද්‍රීයයන්ගෙන් එකක් හෝ කිහිපයක්

Specimen

බද්ධකිරීම සිදු කල යුතුය.

- හෘදය,
- වකුගඩු
- අක්මාව (සජීවී දායක අක්මා බද්ධය හා විභේදන අක්මා බද්ධයද ඇතුළුව)
- පෙනහළු (සජීවී දායක පෙනහළු ඛණ්ඩිකා බද්ධය හා තනි පෙනහළු බද්ධයද ඇතුළුව)
- ඇටමිදුළු (සම්පූර්ණ අස්ථි මජ්ජා අපහරණයට පෙර ඇලෝජීනික් රක්තපාත ප්‍රාථමික සෛල බද්ධ කිරීම ඇතුළුව)
- කුඩා බඩවැල
- අග්න්‍යාසය,

අර්ධ හෝ පූර්ණ වශයෙන් මුහුණ, හස්තය සහ පාදය බද්ධ කිරීම (සංයුක්ත පටක ඇලෝග්‍රැෆ්ට් බද්ධ කිරීම) ද මෙම අර්ථ දැක්වීම යටතේ ආවරණය වේ.

බද්ධ කිරීමකට තුඩු දෙන තත්ත්වයට වෙනත් ආකාරයකින් ප්‍රතිකාර කළ නොහැකි බවට විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් සනාථ කල යුතුය.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- වෙනත් අවයව, ශරීර කොටස් හෝ පටක බද්ධ කිරීම (කණීනිකාව සහ චර්මය ඇතුළු)
- වෙනත් සෛල බද්ධ කිරීම (රක්තෝත්පාදකයන් හැර ද්වීපිකා සෛල හා වෙනත් ප්‍රාථමික සෛල ඇතුළුව)

(vii) **අංශභාගය/පක්ෂාඝාතය** (PARALYSIS)

සුෂුම්නාව හෝ මොළයට හානි වීම හෝ එම අවයවයන්හි රෝගයක් හේතුවෙන් ඕනෑම ගාත්‍රා දෙකක හෝ ඊට වැඩි ගණනක මාංශපේශී ක්‍රියාකාරීත්වය පූර්ණ හා අප්‍රතිවර්ත්‍ය ලෙස අහිමි වීම මෙයින් අදහස් කෙරේ. සම්පූර්ණ හස්තය හෝ සම්පූර්ණ පාදය ගාත්‍රාවක් ලෙස අර්ථ දැක්වේ. පක්ෂඝාතය මාස 3 කට වඩා වැඩි කාලයක් පැවතිය යුතුය. එය ස්නායු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් සනාථ කල යුතු අතර සායනික හදුනාගැනීම් හා රෝග විනිශ්චය මගින් තහවුරු වියයුතුය.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- ස්වයං හානියක් හෝ මානසික ආබාධයක් හේතුවෙන් ඇතිවූ අංශභාගය
- ගුයිලේන්-බාරේ-සහලක්ෂණය
- ආවර්තිත (periodical) හෝ ප්‍රවේණික අංශභාගය

(viii) **අන්ධභාවය** (BLIDNESS)

වර්ත්‍ය නිවැරදි කිරීමකින්, ශල්‍යකර්මයකින් හෝ ඖෂධ මගින් නිවැරදි කළ නොහැකි රෝග යක් හෝ ක්ෂතික හේතුවෙන් ඇස් දෙකෙහිම ගැඹුරු පෙනීම නැතිවීම මෙයින් අදහස් කෙරේ. සාර්ථකම නිවැරදි කිරීමෙන් පසුව වඩා හොඳ ඇසෙහි දෘශ්‍ය ක්‍රියාකාරීත්වය 3/60 හෝ ඊට අඩු (දශම අංකනයෙන් 0.05 හෝ ඊට අඩු) වීම හෝ හොඳම නිවැරදි කිරීමෙන් පසු වඩා හොඳ ඇසෙහි දෘශ්‍ය පරාසය ඩයමීටර 10 ට අඩු වීම මගින් ගැඹුරු පෙනීම අහිමිවීම පෙන්නුම් කරයි. රෝග විනිශ්චය අක්ෂි රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් තහවුරු කළ යුතුය.

(ix) **හෘද කපාට ශල්‍යකර්මය** (HEART VALVE SURGERY)

රෝගී හෘද කපාට එකක් හෝ කිහිපයක් පුනස්ථාපනය හෝ ප්‍රතිසංස්කරණය සඳහා ශල්‍යකර්මයකට භාජනය වීම මෙයින් අදහස් කෙරේ. මතු කියැවෙන ක්‍රියාවලීන් මෙම නිර්වචනය මගින් ආවරණය කෙරේ.

- ක්‍රෝඩක වීභේදනය අර්ධ ක්‍රෝඩක වීභේදනය හෝ උරස් වීභේදනය හරහා සිදු කෙරෙන හෘද කපාට පුනස්ථාපනය හෝ ප්‍රතිසංස්කරණය

Specimen

- රෝස් ක්‍රියාවලිය
- කැතීටර පාදක කපාට කලප්‍රය (valvuloplasty)
- කතීටරික ප්‍රාහ්‍යුද කපාට රෝපණය

හෘදරෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු හෝ හෘද ශල්‍ය වෛද්‍යවරයකු විසින් ශල්‍යකර්මයක වෛද්‍යමය අවශ්‍යතාවය තහවුරු කල යුතු අතර එකෝ කාර්ඩියෝග්‍රෑම් හා කැතීටරිකරණ ප්‍රතිඵල මගින් සනාථ කල යුතු වේ

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ

- කැතීටරිකරන ද්විතුණ්ඩ කපාට ඉමැයීම

(x) **ප්‍රාහ්‍යුද රෝග ශල්‍යකර්ම** (SURGERY FOR A DISEASE OF THE AORTA)

ප්‍රාහ්‍යුදයේ විඛණ්ඩනයක් (Dissection) අවහිර වීමක් හා උපුලුවක් (Aneurysm) හෝ පටු වීමක් සඳහා ප්‍රතිකාරය ලෙස ශල්‍යකර්මයට භාජනය වීම මෙයින් අදහස් කෙරේ. අන්තඃ වාහිණී ප්‍රතිසංස්කරණයන් (endovascular repair) වැනි අව හානි ක්‍රියාවලීන් මෙම නිර්වචනය මගින් ආවරණය කෙරේ. ප්‍රාහ්‍යුද ශල්‍යකර්මයක් අවශ්‍ය බව හෘදරෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් තහවුරු කළ යුතු අතර පරිලෝකණ පරීක්ෂණ ප්‍රතිඵල ඇසුරින් සනාථ කල යුතු වේ.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- උරස් හෝ උදර සංස්ථානික ධමණි ශාඛාවන්හි ශල්‍යකර්ම (ඌර්වසංස්ථානික හෝ ජඝනසංස්ථානික බයිපාස් වැනි ශල්‍යකර්ම)
- ප්‍රවේණිගත සම්භන්ධක පටක රෝගයන් හා සම්භන්ධ ප්‍රාහ්‍යුද ශල්‍යකර්ම (මර්ෆන් සහලක්ෂණය එහ්ලෙර්ස් ඩන්ලොස් සහලක්ෂණය වැනි)
- ක්ෂතික හානියක් හේතුවෙන් සිදුකෙරෙන ප්‍රාහ්‍යුද ශල්‍යකර්ම

(xi) **බහුවිධ ජරාධ්‍යය** (MULTIPLE SCLEROSIS)

බහුවිධ ජරාධ්‍යය රෝග නිර්ණය ස්නායුවේදී විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කළයුතු අතර පහත සඳහන් සියලු නිර්ණායකයන් සම්පූර්ණ විය යුතුය.

- අවම වශයෙන් මාස 6 ක කාලයක් අඛණ්ඩව පවතින වර්තමාන අනවරත චාලක හෝ සංවේදක ක්‍රියාකාරිත්වයේ සායනික අපහායනය,
- බහුවිධ ජරාධ්‍යය ට ලාක්ෂණික වූ මයලිනීහරණ තුවාල අවම වශයෙන් දෙකක්වත් මොළයේ හෝ සුෂුම්නාවේ පවතින බව පෙන්නුම් කරන චුම්භක අනුනාද රූප (MRI)

ඉහත අර්ථ දැක්වීම සඳහා, පහත සඳහන් තත්ත්වයන් ආවරණය නොකෙරේ:

- බහුවිධ ජරාධ්‍යය ලෙස තහවුරු නොකල තත්වයන් හා බහුවිධ ජරාධ්‍යය ලෙස සැක කෙරෙන නමුත් බහුවිධ ජරාධ්‍යය ලෙස රෝග විනිශ්චය නොකල ස්නායු විද්‍යාත්මක සාක්ෂියක් හෝ විකිරණ පරීක්ෂණ සාක්ෂියක් මත පමණක් පදනම් වූ ඒකල සහලක්ෂණයන්.
- ඒකල දෘෂ්ටි ස්නාසාදාහය (නියුරයිටිස්) සහ දෘෂ්ඨි ස්නායු නියුරෝමෙලයිටිස්.

(xii) **ඇන්ජියෝප්ලාස්ටි** (ANGIOPLASTY)

අවම වශයෙන් 50% බැගින් අවහිරතාවයක් හෝ පටු වීමක් ප්‍රධාන කිරීටක ධමනි එකක හෝ කිහිපයක ඇති වූ අවස්ථාවකදී එය නිවැරදි කිරීම සඳහා ස්ටෙන්ට් යෙදීමෙන් හෝ යෙදීමකින් තොරව බැලුන් විස්ථාරණයක් මගින් සිදු කෙරෙන පරිත්වචීය කිරීටක මැදිහත්වීම (පෙර්කියුටනෙයුස් කොරනරි ඇන්ජියෝප්ලාස්ටි) කිරීටක ඇන්ජියෝප්ලාස්ටි ලෙස නිර්වචනය කෙරේ. එම ක්‍රියාවලියේ වෛද්‍යමය අත්‍යවශ්‍යතාවය හෘදරෝග විශේෂඥ වෛද්‍ය වරයකු

Specimen

විසින් තහවුරු කර වහිත්‍ර රේඛණ (ඇන්ජියෝග්‍රෑම්) පරීක්ෂණයක් මගින් සනාථ කල යුතු වේ.

ප්‍රධාන කිරීටක ධමනි ලෙස වම් කිරීටක ධමනිය, වම් පූර්ව අවරෝහණ ධමනිය ,වක්‍රාකාර ධමනිය හා දකුණු කිරීටක ධමනිය සැලකේ .

ඇන්ජියෝප්ලාස්ටි හෝ ස්ටෙන්ට් ඇතුළු කිරීමක් රහිත රෝග නිශ්චය සඳහා කෙරෙන (ඇන්ජියෝග්‍රැෆි) වහිත්‍ර රේඛහය පරීක්ෂණ හෝ විමර්ෂණ ක්‍රියාවලීන් බැහැර කෙරේ.

(xiii) **ඇපලික සහලක්ෂණය** (APALLIC SYNDROME)

ස්වසනය හා හෘද ක්‍රියාකාරිත්වය යථාස්ථව පවතින අතර මශ්තිෂ්ක අර්ධගෝල සමග මශ්තිෂ්ක මූල ක්‍රියාකාරිත්වය අඩපණ වීම හේතුවෙන් ප්‍රතිචාර්යතා හා සම්ප්‍රජාන (Awareness) විරහිත එක්තැන් වූ අවස්ථාව මෙයින් අදහස් කෙරේ. නිශ්චිත රෝග විනිශ්චය පහත සඳහන් සියළු කරුණු මගින් සනාථ විය යුතුය.

1. තමන් සහ පරිසරය පිළිබඳ සම්ප්‍රජානය/දැනුවත්භාවය සම්පූර්ණයෙන්ම නොමැති වීම.
2. අන් අය සමඟ සන්නිවේදනය කිරීමට නොහැකි වීම.
3. බාහිර උත්තේජක සඳහා තිරසාර හෝ පුනර්ජනනීය චර්යාත්මක ප්‍රතිචාර දැක්වීම පිළිබඳ සාක්ෂි නොමැති වීම.
4. සංරක්ෂිත මශ්තිෂ්ක මූලයේ ක්‍රියාකාරිත්වය

- ස්නායුභෞතිය හෝ ස්නායු මනෝවිද්‍යාත්මක පරීක්ෂණ ප්‍රතිඵල හෝ පරිලෝකණ පරීක්ෂණ ප්‍රතිඵල මගින් තහවුරුවන ප්‍රතිකාර කළ හැකි වෙනත් ස්නායු හෝ මානසික ආබාධ බැහැර කෙරේ.

රෝග විනිශ්චය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතු අතර සායනිකව අවම වශයෙන් මාසයක්වත් මෙම තත්වය කිසිදු ධනාත්මක වෙනසක් නොපෙන්වන බවට වෛද්‍ය විද්‍යාත්මකව ලේඛනගත විය යුතුය.

(xiv) **අබරමස්තිෂ්ක අර්බුද** (BENIGN BRAIN TUMOUR)

මොළයට (මශ්තිෂ්කයට), ආවෘතීන්ට (මශ්තිෂ්ක සුෂුම්නා පටල) හෝ කපාල ස්නායු වලට සීමා වූ කපාල කුටීරය තුල පිහිටා ඇති මාත්සර්ක නොවන පටක වර්ධනයක් ලෙස නිර්ණය කරන ලද නිශ්චිත රෝග විනිශ්චයකින් යුතු අබර මශ්තිෂ්ක අර්බුදය මෙයින් අදහස් කෙරේ. පහත දැක්වෙන ප්‍රතිකාර ක්‍රම එකක් හෝ අර්බුදය සඳහා ප්‍රතිකාර කිරීමට යොදාගත යුතුය.

- ශල්‍යකර්ම මගින් සම්පූර්ණ හෝ අසම්පූර්ණ ඉවත් කිරීම
- ඒකාකෘති විකිරණ ශල්‍ය ක්‍රියාවලි
- බාහිර කදම්භ විකිරණය

වෛද්‍යමය හේතූන් මත ප්‍රතිකාර විකල්ප කිසිවක් කළ නොහැකි නම්, රෝග විනිශ්චය කල දිනට පසු අවම වශයෙන් මාස 3 ක්වත් ලේඛනගත කළ අඛණ්ඩ ස්නායු ඌනතාවයන් පැවතිය යුතුය. රෝග විනිශ්චය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් හෝ ස්නායු ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතු අතර පරිලෝකණ පරීක්ෂණ ප්‍රතිඵල ඇසුරින් සනාථ කල යුතු වේ.

ඉහත අර්ථ දැක්වීම සඳහා, පහත සඳහන් තත්ත්ව ආවරණය නොකෙරේ:

- කෝෂ්ඨ, කැටිති, ලේ ගෙඩි හෝ මොළයේ ධමනි හෝ ශිරාවන්හි කුමුර්තිකරණය හඳුනා ගැනීම හෝ ප්‍රතිකාර කිරීම.
- පිටියුටරි ග්‍රන්ථි අර්බුද.

Specimen

(xv) **නිදන්ගත අක්මා රෝග** (CHRONIC LIVER DISEASE)

චයිල්ඩ් පග් පරිමාණයෙන් අවම වශයෙන් ලකුණු 7 ක (චයිල්ඩ් පග් බී හෝ සී ශ්‍රේණිය) මට්ටමේ දරුණු අක්මා රෝගයක් පිළිබඳ නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ. පහත සඳහන් සියලු විචල්‍යයන් මගින් අදාල ලකුණු ගණනය කළ යුතුය:

- සම්පූර්ණ බිලිරුබින් මට්ටම්
- රුධිර මස්තුක ඇල්බියුමින් මට්ටම
- ජලෝධරයේ දරුණුබව
- ජාත්‍යන්තර සාමාන්‍යකරණය කළ අනුපාතය (INR)
- යාකෘතික නිර්කටීපවෘතය

රෝග විනිශ්චය අක්මාව හෝ ආමාශ රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් තහවුරු කළ යුතු අතර පරිලෝකණ පරීක්ෂණ ප්‍රතිඵල ඇසුරින් සනාථ කල යුතු වේ.

ඉහත අර්ථ දැක්වීම සඳහා, පහත සඳහන් දෑ ආවරණය නොකෙරේ:

- මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ තත්ත්වයන් (අන්තඃ වාහිණී මත්ද්‍රව්‍ය භාවිතය නිසා ඇතිවන හෙපටයිටිස් බී හෝ සී ආසාදන ඇතුළුව)

(xvi) **නිදන්ගත පෙනහළු රෝග** (CHRONIC LUNG DISEASE)

පහත සඳහන් සියළු නිර්ණායකයන්ට යටත් වන දැඩි ශ්වසන අකර්මන්‍යතාවයකට හේතුවන නිදන්ගත පෙනහළු රෝගය පිළිබඳ නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

- අවම වශයෙන් මාස 1 කාල ප්‍රාන්තරයක් තුල අවස්ථා 2 කදී (FEV1) තත්පරයකදී බල ප්‍රශ්වාස පරිමාව පුරෝකථනය කළ ප්‍රමාණයෙන් 40% ට වඩා අඩු වීම
- මාස තුනක් අවම වශයෙන් දිනකට පැය 16 ක් වත් ඔක්සිජන් චිකිත්සාව යටතේ ප්‍රතිකාර කිරීම
- ඔක්සිජන් ලබා දීමකින් තොරව මනිනු ලබන ධමනිගත රුධිර වායු විශ්ලේෂණයේ දී (55mmHg /7.3 kPa ට අඩු) අර්ධ ඔක්සිජන් පීඩනයේ (PaO2) අනවරත අඩු වීම

රෝග විනිශ්චය පෙනහළු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කළ යුතුය.

(xvii) **කෝමාව/සන්‍යාසය** (COMA)

බාහිර උත්තේජක හෝ අභ්‍යන්තර අවශ්‍යතා සඳහා ප්‍රතිචාරයක් හෝ ප්‍රතික්‍රියාවක් නොදක්වන සිහිසුන් තත්වයක සිටින බවට නිශ්චිත රෝග විනිශ්චය සහ

- අවම වශයෙන් පැය 96 ක්වත් ග්ලාස්ගෝ කෝමා පරිමාණයෙන් ලකුණු 8 ක් හෝ ඊට අඩු මට්ටමක සිටින,
- ජීවිත ආධාරක උපකරණ භාවිතය අවශ්‍ය වන, සහ
- සන්‍යාසය ඇති වී දින 30 කට පසුවත් තක්සේරු කළ යුතු අනවරත ස්නායු ඌනතා ප්‍රතිඵල වන තත්වයක් මෙයින් අදහස් කෙරේ.

රෝග විනිශ්චය ස්නායු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් තහවුරු කළ යුතුය.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- ප්‍රේරිත සන්‍යාසය (වෛද්‍යමය වශයෙන්)
- ස්වයං-හානිකරගැනීම්, මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇති වන ඕනෑම කෝමා තත්වයක්

Specimen

(xviii) **ශ්‍රවණය අහිමිවීම /බිහිරි බව** (DEAFNESS)

රෝගයක් හෝ හදිසි අනතුරක ප්‍රතිපලයක් ලෙස සිදුවූ තුවාලයක් හේතුවෙන් කන් දෙකෙහිම ස්ථිර හා අප්‍රතිවර්ත්‍ය ශ්‍රවණය අහිමිවීමක් ඇති බවට නිශ්චිත ලෙස රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

රෝග විනිශ්චය උගුර කණ හා නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කළ යුතු අතර සංශුද්ධ ස්වර කර්ණ රේඛණයක් (ඕඩියෝග්‍රෑම්) මගින් සිදුකෙරෙන පරීක්ෂණයකින් වඩා හොඳ කණෙහි ඩෙසිබල් 90 ඉක්මවූ මධ්‍යයන ශ්‍රවණ ඒලකයක් හර්ට්ස් 500, 1000 සහ 2000 අවස්ථාවන්හි පවතින බව සනාථ කල යුතුය.

(xix) **ෆුල්මිනන්ට් වෛරස් යාකෘතිදාහය** (Fulminant Viral Hepatitis )

පහත සඳහන් සියලු නිර්නායකයන්ට යටත් වන ෆුල්මිනන්ට් වෛරස් හෙපටයිටිස් පිළිබඳ නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

- උග්‍ර වෛරස් හෙපටයිටිස් රෝගයට අදාල දර්ශීය මස්තුවේද අනුක්‍රමය
- යාකෘතික නිර්කර්පදාහය ඇතිවීම
- අක්මාවේ ප්‍රමාණය කුඩාවීම
- බිලිරුබින් මට්ටම ඉහළ යාම
- ජාත්‍යන්තර සාමාන්‍යකරණය කළ අනුපාතය (INR) 1.5 ඉක්මවූ අතංචව්‍යතය කොගුලෝපති
- රෝග ලක්ෂණ ආරම්භ වී දින 7 ක් ඇතුළත අක්මාව අකර්මන්‍ය වීම.
- අක්මා රෝග පිළිබඳ රෝග ඉතිහාසයක් නොමැති වීම.

රෝග විනිශ්චය අක්මා හෝ ආමාශ හා ආන්ත්‍ර රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කළ යුතුය.

ඉහත අර්ථ දැක්වීම සඳහා, පහත සඳහන් දෑ ආවරණය නොකෙරේ:

- වෛරස් නොවන හේතු වලින් හටගන්නා උග්‍ර අක්මාව අකර්මණ්‍යතාව (පැරසිටමෝල් හෝ ඇෆ්ලාටොක්සින් මත්ද්‍රව්‍ය ඇතුළුව)
- අන්තඃ ශිරා මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ ෆුල්මිනන්ට් වෛරස් හෙපටයිටිස්

(xx) **ගොළුභාවය /කථනය අහිමිවීම** (LOSS OF SPEECH)

කායික රෝගයක හෝ හදිසි අනතුරක ප්‍රතිපලයක් ලෙස ස්ථිර හා අප්‍රතිවර්ත්‍ය කථන හැකියාව අහිමිවීමක් ඇති බවට නිශ්චිත ලෙස රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ. මෙම තත්ත්වය අඛණ්ඩව මාස 6 ක කාලයක්වත් පැවතිය යුතුය. රෝග විනිශ්චය උගුර කණ හා නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කළ යුතුය.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ

- මානසික හේතූන් නිසා ඇතිවූ ගොළුභාවය

(xxi) **අධික පිළිස්සීම්** (MAJOR BURNS)

සම හා සමට යටින් පවතින පටක සම්පූර්ණ ගැඹුර හරහා (තෙවන මට්ටමේ පිළිස්සුම්) විනාශ වීම හා "නයින්ස් නියමය" හෝ "ලුන්ඩ් සහ බ්‍රෝඩර් ප්‍රස්ථාරය" ට අනුව ශරීරයේ මතුපිටින් අවම වශයෙන් 20% ක් ආවරණය වන සේ පිළිස්සුම් තුවාල ඇති වීම මෙයින් අදහස් කෙරේ. රෝග විනිශ්චය ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කලයුතුය.

ඉහත අර්ථ දැක්වීම සඳහා, පහත සඳහන් දෑ ආවරණය නොකෙරේ:

- ස්වයං හානිකරගැනීමකට අදාල තුන්වන මට්ටමේ පිළිස්සුම්

Specimen

- ඕනෑම පළමු හෝ දෙවන මට්ටමේ පිළිස්සුමක්

(xxii) **චාලක ස්නායු (නියුරෝන) රෝග** (MOTOR NEURONE DISEASE)

මතු දැක්වෙන චාලක ස්නායු රෝග වලින් එකක් නිශ්චිතව රෝග නිශ්චය මෙයින් අදහස් කෙරේ.

1. ඇමියෝට්‍රොෆික පාර්ශ්වීය ජරාධ්‍යය (ALS හෝ Lou Gehrigzs disease)
2. ප්‍රාථමික පාර්ශ්වීය ජරාධ්‍යය (PLC)
3. ප්‍රගාමී මාංශ පේශි ක්ෂයය (PMA)
4. ප්‍රගාමී බල්බ පෝල්සි (PBP)

ප්‍රමාණවත් ඖෂධ ප්‍රතිකාර යටතේ වුවද අඛණ්ඩව රෝගාරම්භයේ පටන් මාස තුනක් පුරාවට මෙම රෝගය හේතුවෙන් දෛනික ජීවන ක්‍රියාකාරකම් 6 න් 3 ක් වත් තනිව කිරීමට නොහැකි විය යුතුය

දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම්ඃ

- සේදීම - නාන බේසමකින් හෝ වතුර මලකින් ස්නානය කිරීමේ හැකියාව (නාන බේසමකට හෝ වතුර මලකට ඇතුළු වීම මෙන්ම එයින් පිටතට පැමිණීමේ හැකියාවද මෙයට ඇතුලත් වේ) හෝ වෙනත් ක්‍රමයකින් සතුටුදායක ලෙසින් සෝදා ගැනීමේ හැකියාව
- ඇඳුම් ඇඟලාගැනීම හා උනාදැමීම - ඇඳුම් ඇඟලාගැනීම හා ගලවා දැමීමට, පියවීමට හා විවර කිරීමට හැකියාව (අවශ්‍ය වුවහොත් කෘත්‍රිම අත් පා ශල්‍ය උපාංග හා සවිකිරීම්ද ඇතුළුව)
- තනිව ආහාර හා පාන ගැනීම - පිළියෙල කර සූදානම් කර දෙන ලද ආහාර හා පාන බාහිර උදව් නැතිව තනිවම ගැනීමේ හැකියාව
- පුද්ගලික සනීපාරක්ෂාව පවත්වාගැනීම - වැසිකිලියක් භාවිත කිරීමෙන් හෝ මුත්‍රාශයේ හා අන්ත්‍ර ක්‍රියාකාරීත්වය නිසි පරිදි කළමණාකරණය කිරීමෙන් පුද්ගලික සනීපාරක්ෂාව සතුටුදායක තත්වයෙන් පවත්වාගැනීමට හැකියාව
- කාමර අතර සංචරණය - එකම තට්ටුවක පිහිටි කාමරයකින් කාමරයකට යාමේ හැකියාව
- ඇඳට යැම හා ඇඳෙන් බැසීම - ඇඳෙන් බැස රෝද පුටුවකට හෝ පුටුවකට ගොඩවීමේ හා නැවත ඇඳට ගොඩවීමේ හැකියාව

රෝග නිශ්චය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතු අතර ස්නායු සන්නයන අධ්‍යයනයකින (NCS) හා විද්‍යුත් පේශි රේඛණ සොයාගැනීම් (EMG) මගින් ද සනාථ කල යුතු වේ.

ඉහත අර්ථ දැක්වීම සඳහා, පහත සඳහන් දෑ ආවරණය නොකෙරේඃ

- බහුකේන්ද්‍රීය චාලක ස්නායු වෘතය සහ කායික මයෝසයිටිස්
- පශ්චාත් පෝලියෝ සහලක්ෂණය
- කශේරුක මාංශපේශී ක්ෂයය

(xxiii) **මාංශ පේශි සදොස්පෝෂණය** (MUSCULAR DYSTROPHY)

පහත දැක්වෙන මාංශ පේශී සදොස්පෝෂණයක් ලෙස නිශ්චිත රෝග විනිශ්චයක් මෙයින් අදහස් කෙරේ.

- ඩුචෙන් මාංශ පේශි සදොස්පෝෂණය (DMD)
- බෙකර් මාංශ පේශි සදොස්පෝෂණය (BMD)
- එමරි-ඩ්‍රයිෆස් මාංශ පේශි සදොස්පෝෂණය (EDMD)
- ලිම්බ්-ගර්ඩ්ල් මාංශ පේශි සදොස්පෝෂණය (LGMD)
- ෆැසියෝස්කපුලෝහමරල් මාංශ පේශි සදොස්පෝෂණය (FSHD)

Specimen

- මයෝටොනික් සදොස්පෝෂණය වර්ගය 1 (MMD /ස්ටයිනර්ට් රෝගය)
- අක්ෂි-ග්‍රසනික මාංශ පේශි සදොස්පෝෂණය (OPMD)

ප්‍රමාණවත් ඖෂධ ප්‍රතිකාර යටතේ වුවද අඛණ්ඩව රෝගාරම්භයේ පටන් මාස තුනක් පුරාවට මෙම රෝගය හේතුවෙන් දෛනික ජීවන ක්‍රියාකාරකම් 6 න් 3 ක් වත් තනිව කිරීමට නොහැකි විය යුතුය.

දෛනික ජීවන ක්‍රියාකාරකම්ඃ

- සේදීම - නාන බේසමකින් හෝ වතුර මලකින් ස්නානය කිරීමේ හැකියාව (නාන බේසමකට හෝ වතුර මලකට ඇතුළු වීම මෙන්ම එයින් පිටතට පැමිණීමේ හැකියාවද මෙයට ඇතුලත් වේ) හෝ වෙනත් ක්‍රමයකින් සතුටුදායක ලෙසින් සෝදා ගැනීමේ හැකියාව
- ඇඳුම් ඇඟලාගැනීම හා උනාදැමීම - ඇඳුම් ඇඟලාගැනීම හා ගලවා දැමීමට, පියවීමට හා විවර කිරීමට හැකියාව (අවශ්‍ය වුවහොත් කෘත්‍රිම අත් පා ශල්‍ය උපාංග හා සවිකිරීම්ද ඇතුළුව)
- තනිව ආහාර හා පාන ගැනීම - පිළියෙල කර සූදානම් කර දෙන ලද ආහාර හා පාන බාහිර උදව් නැතිව තනිවම ගැනීමේ හැකියාව
- පුද්ගලික සනීපාරක්ෂාව පවත්වාගැනීම - වැසිකිලියක් භාවිත කිරීමෙන් හෝ මුත්‍රාශයේ හා අන්ත්‍ර ක්‍රියාකාරීත්වය නිසි පරිදි කළමණාකරණය කිරීමෙන් පුද්ගලික සනීපාරක්ෂාව සතුටුදායක තත්වයෙන් පවත්වාගැනීමට හැකියාව
- කාමර අතර සංචරණය - එකම තට්ටුවක පිහිටි කාමරයකින් කාමරයකට යාමේ හැකියාව.
- ඇඳට යැම හා ඇඳෙන් බැසීම - ඇඳෙන් බැස රෝද පුටුවකට හෝ පුටුවකට ගොඩවීමේ හා නැවත ඇඳට ගොඩවීමේ හැකියාව

ඉහත අර්ථ දැක්වීම සඳහා, පහත සඳහන් දෑ ආවරණය නොකෙරේ:

- වෙනත් ආකාර වල මයෝටෝනික් සදොස්පෝෂණයන් සහ වෙනත් ආකාර වල මයෝටෝනියා

(xxiv) **පුප්ඵුසීය ධමනි අධ්‍යාතතිය** (PULMONARY ARTERIAL HYPERTENSION)

පහත සඳහන් සියළු නිර්ණායකයන්ට යටත් වන ප්‍රාථමික පුප්ඵුසීය ධමනි අධ්‍යාතතිය පිළිබඳ නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

- මාස 3 කට වැඩි කාලයක් තෙහෙට්ටුව, අභිස්පන්දනය, නිශ්වාසය හෝ පපුවේ වේදනාව (නිව් යෝර්ක් හෘද සංගමයේ වර්ගීකරණයේ III හෝ IV) හේතුවෙන් ශාරීරික ක්‍රියාකාරකම් සාමාන්‍ය මට්ටමට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් සීමාවීම
- විවේකයේදී 25 mmHg ට වැඩි මධ්‍ය පුප්ඵුසීය ධමනි පීඩනය (දකුණු හෘද කැතීටරීකරණය මගින් මනිනු ලබන)

රෝග විනිශ්චය හෘද රෝග විශේෂඥ වෛද්‍යවරයකු හෝ පෙනහළු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කළ යුතුය.

ඉහත අර්ථ දැක්වීම සඳහා, පහත සඳහන් තත්ත්වයන් ආවරණය නොකෙරේ:

- පෙනහළු, හෘදය හෝ කායික රෝගයක් හේතුවෙන් හටගන්නා ද්විතියික පුප්ඵුසීය ධමනි අධ්‍යාතතිය
- නිදන්ගත ශ්‍යානිනිකඛිතික (ත්‍රොම්බොම්බොලික්) පුප්ඵුසීය ධමනි අධ්‍යාතතිය
- ඖෂධ හෝ විෂ මගින් ප්‍රේරිත පුප්ඵුසීය ධමනි අධ්‍යාතතිය

(xxv) **ඇල්ෂයිමර් රෝගය (වයස 65 ට පෙර)** - (ALZHEIMER'S DISEASE - BEFORE AGE 65)

පහත සඳහන් සියළු සාධක මගින් සනාථ වන නිශ්චිත ඇල්ෂයිමර් රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.



Specimen

- බුද්ධිමය ධාරිතාව ක්ෂයවීමට අදාලව මතකය හා විධායක ක්‍රියාවන් (අනුක්‍රමණය, සංවිධානය වියුක්තිය හා සැලසුම්කරණය) අඩපණ වීම හේතුවෙන් මානසික හා සාමාජීය ක්‍රියාකාරීත්වය සැලකිය යුතු තරමින් අඩු වීම.
- පෞර්ෂත්ව විපර්යාස.
- සංජානන ක්‍රියාවන් පරිහාණිය - ක්‍රමිකව ආරම්භ වී හා අඛණ්ඩව අඩපණ වීම
- විඥානයට බාධා නොවීම
- දර්ශිය ස්නායුමනෝවිද්‍යාත්මක හා ස්නායකප්‍රතිරූපණ සොයා ගැනීම් (උදා CT ස්කෑන්)

රෝගය හේතුවෙන් පැය 24 පුරාවට නිරන්තර අධීක්ෂණය අවශ්‍ය විය යුතු අතර රෝග නිශ්චය හා අධීක්ෂණ අවශ්‍යතාවය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතුයි

ඉහත අර්ථ දැක්වීමට මතු කියවෙන තත්ත්වයන් ආවරණය නොවේ ඃ

- මොලයේ ආබාධයක් හෝ ශාරීරික ආබාධයක් හෝ මානසික තත්ත්වයක් හේතුවෙන් ඇතිවූ වෙනත් ආකාර වල මානසික වීක්ෂෝපයන් හෝ වීස්මෘතික (ඩිමෙන්ෂියා) තත්ත්වයන්

(xxvi) **ඇමියෝට්‍රොෆික් පාර්ශවීය ජාරථ්‍යය** (AMYOTROPHIC LATERAL SCLEROSIS)

ඇමියෝට්‍රොෆික් පාර්ශවීය ජාරථ්‍යය ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

ප්‍රමාණවත් ඖෂධ ප්‍රතිකාර යටතේ වුවද අඛණ්ඩව රෝගාරම්භයේ පටන් මාස තුනක් පුරාවට මෙම රෝගය හේතුවෙන් දෛනික ජීවන ක්‍රියාකාරකම් 6 න් 3 ක් වත් තනිව කිරීමට නොහැකි විය යුතුය.

දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම්ඃ

- සේදීම - නාන බේසමකින් හෝ වතුර මලකින් ස්නානය කිරීමේ හැකියාව (නාන බේසමකට හෝ වතුර මලකට ඇතුළු වීම මෙන්ම එයින් පිටතට පැමිණීමේ හැකියාවද මෙයට ඇතුලත් වේ) හෝ වෙනත් ක්‍රමයකින් සතුටුදායක ලෙසින් සෝදා ගැනීමේ හැකියාව
- ඇඳුම් ඇඟලාගැනීම හා උනාදැමීම - ඇඳුම් ඇඟලාගැනීම හා ගලවා දැමීමට, පියවීමට හා විවර කිරීමට හැකියාව (අවශ්‍ය වුවහොත් කෘත්‍රිම අත්පා ශල්‍ය උපාංග හා සවිකිරීම්ද ඇතුළුව)
- තනිව ආහාර හා පාන ගැනීම - පිළියෙල කර සූදානම් කර දෙන ලද ආහාර හා පාන බාහිර උදව් නැතිව තනිවම ගැනීමේ හැකියාව
- පුද්ගලික සනීපාරක්ෂාව පවත්වාගැනීම - වැසිකිලියක් භාවිත කිරීමෙන් හෝ මුත්‍රාශයේ හා අන්ත්‍ර ක්‍රියාකාරීත්වය නිසි පරිදි කළමණාකරණය කිරීමෙන් පුද්ගලික සනීපාරක්ෂාව සතුටුදායක තත්වයෙන් පවත්වාගැනීමට හැකියාව
- කාමර අතර සංචරණය - එකම තට්ටුවක පිහිටි කාමරයකින් කාමරයකට යාමේ හැකියාව
- ඇඳට යැම හා ඇඳෙන් බැසීම - ඇඳෙන් බැස රෝද පුටුවකට හෝ පුටුවකට ගොඩවීමේ හා නැවත ඇඳට ගොඩවීමේ හැකියාව

රෝග නිශ්චය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතු අතර ස්නායු සන්නයන අධ්‍යයනයකින් හා විද්‍යුත් ජේෂි රේඛණ සොයාගැනීම් මඟින් ද සනාථ කල යුතු වේ.

ඉහත අර්ථ දැක්වීමට මතු කියවෙන තත්ත්වයන් ආවරණය නොවේ.

- සියළු ආකාරයන් හි චාලක ස්නායුක රෝග
- ඉන්ක්ලුෂන් බොඩි මයොසයිටිස් හා බහු කේන්ද්‍රිය චාලක ස්නායුව්‍යතය
- පශ්චාත් පෝලියෝ සින්ඩ්‍රෝමය
- කණ්ටක පේශික්ෂීණය (Spinal muscular atrophy )
- පොලිමයෝසයිටීස් හා ඩෙර්මටොමයෝසයිටීස් (Polymyositis and dermatomyositis)

Specimen

(xxvii) **ඇප්ලාස්ටික නිරක්තිය** - (APLASTIC ANAEMIA)

අස්ථි මජ්ජා අසමාර්ථය, නිරක්තිය ,නියුට්‍රොපේනියාව හා ත්‍රොම්බොසයිටොපේනියාව සහිත ඇප්ලාස්ටික නිරක්තිය ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ .එම තත්වයට රුධිර පාරවිලයනය හා මතු කියැවෙන එක් ක්‍රමයත්වත් යොදාගනිමින් ප්‍රතිකාර කල යුතුය.

- අස්ථි මජ්ජා උත්තේජක
- ප්‍රතිශක්තිමර්ධක
- අස්ථි මජ්ජා බද්ධය

රෝග නිශ්චය රුධිර ගත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතු අතර හා අස්ථි මජ්ජා ඖතිකවේදීය (හිස්ටොලොජි) සොයාගැනීම් මගින් සනාථ කලයුතු වේ.

(xxviii) **නිධිකර්පරදාහය - එන්සෙපලයිටිස්** (ENCEPHALITIS)

උග්‍ර වෛරස නිධිකර්පරදාහය නිශ්චිත රෝග විනිශ්චය හා එම රෝගය හේතුවෙන් රෝග නිශ්චයේ සිට මාස 3 කාලයක් පවතින අප්‍රත්‍යවර්තිත ස්නායුක විෂමතාවයක් වාර්තා වීම මෙයින් අදහස් කෙරේ.

රෝග නිශ්චය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කලයුතු අතර දර්ශීය සායනික රෝග ලක්ෂණ පැවතීම සහ මස්තිෂ්ක සුෂුම්නා තරල හෝ මස්තිෂ්ක වානු (බයොප්සි) පරීක්ෂාවක් මගින් සනාථ කල යුතු වේ.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය හේතුවෙන් ඇතිවන නිධිකර්පරදාහය
- බැක්ටීරියාවක් හෝ ප්‍රොටොසෝවා ආසාදනයක් හේතුවෙන් ඇතිවන නිධිකර්පරදාහය
- මයැල්ජීය හෝ පැරානව්‍ය ප්ලාස්ටීය (පැරානියොප්ලාස්ටික්) එන්සෙෆලෝමයලයිටීස්

(xxix) **බරපතල ශීර්ෂ ක්ෂන්ති (මේජර් හෙඩ් ට්‍රවුමා)** (MAJOR HEAD TRAUMA)

ක්ෂතික ශීර්ෂ හානියක් හේතුවෙන් මෂ්තිෂ්ක ක්‍රියාකාරීත්වයට බාධා වීම නිශ්චිත ලෙස රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

ප්‍රමාණවත් ඖෂධ ප්‍රතිකාර යටතේ වුවද අඛණ්ඩව රෝගාරම්භයේ පටන් මාස තුනක් පුරාවට මෙම රෝගය හේතුවෙන් දෛනික ජීවන ක්‍රියාකාරකම් 6 න් 3 ක් වත් තනිව කිරීමට නොහැකි විය යුතුය.

දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම්ඃ

- සේදීම - නාන බේසමකින් හෝ වතුර මලකින් ස්නානය කිරීමේ හැකියාව (නාන බේසමකට හෝ වතුර මලකට ඇතුළු වීම මෙන්ම එයින් පිටතට පැමිණීමේ හැකියාවද මෙයට ඇතුලත්වේ) හෝ වෙනත් ක්‍රමයකින් සතුටුදායක ලෙසින් සෝදා ගැනීමේ හැකියාව
- ඇඳුම් ඇඟලාගැනීම හා උනාදැමීම - ඇඳුම් ඇඟලාගැනීම හා ගලවා දැමීමට, පියවීමට හා විවර කිරීමට හැකියාව (අවශ්‍ය වුවහොත් කෘත්‍රිම අත් පා ශල්‍ය උපාංග හා සවිකිරීම්ද ඇතුළුව)
- තනිව ආහාර හා පාන ගැනීම - පිළියෙල කර සූදානම් කර දෙන ලද ආහාර හා පාන බාහිර උදව් නැතිව තනිවම ගැනීමේ හැකියාව
- පුද්ගලික සනීපාරක්ෂාව පවත්වාගැනීම - වැසිකිලියක් භාවිත කිරීමෙන් හෝ මුත්‍රාශයේ හා අන්ත්‍ර ක්‍රියාකාරීත්වය නිසි පරිදි කළමණාකරණය කිරීමෙන් පුද්ගලික සනීපාරක්ෂාව සතුටුදායක තත්වයෙන් පවත්වාගැනීමට හැකියාව
- කාමර අතර සංචරණය - එකම තට්ටුවක පිහිටි කාමරයකින් කාමරයකට යාමේ හැකියාව
- ඇඳට යැම හා ඇඳෙන් බැසීම - ඇඳෙන් බැස රෝද පුටුවකට හෝ පුටුවකට ගොඩවීමේ හා නැවත ඇඳට ගොඩවීමේ හැකියාව



Specimen

රෝග නිශ්චය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු හෝ ස්නායු ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු විසින් සනාථ කල යුතු අතර දර්ශීය සී. ටී. හෝ එම්. ආර් .අයි. සොයාගැනීම් මගින් ද තහවුරු විය යුතු වේ.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- ස්වයං හානිකරගැනීමකදී හෝ මත්ද්‍රව්‍ය හෝ මධ්‍යසාර බලපෑම යටතේ සිටියදී සිදු වූ ශීර්ෂ ක්ෂතික.

(xxx) **මජ්ජා කෝෂ්ටක ව්‍යාධිය (මෙඩුයිලරි සිස්ටික් රෝගය)** (MEDULLARY CYSTIC DISEASE)

පහත සඳහන් සියළු සාධක මගින් තහවුරු වන මජ්ජා කෝෂ්ටක ව්‍යාධීය ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

- අල්ට්‍රාසවුන්ඩ්, එම්. ආර්. අයි. හෝ සී.ටී. ස්කෑන් පරීක්ෂණයන් මගින් වකුගඩු දෙකෙහිම මජ්ජා සහ බාහික මජ්ජා ප්‍රදේශයන්හි බහුවිධ කෝෂ්ඨ දැක්වීම.
- නාලිකා ක්ෂීණ වීම , පාදම් පටල ඝණවීම, බාහික මජ්ජා ප්‍රදේශයන්හි කෝෂ්ඨ නිර්මාණය සමග දර්ශිය ඖතිකවේදී සොයාගැනීම් .
- ගුච්ඡිකා පෙරන සීඝ්‍රතාව මිනිත්තුවකට මිලි ලීටර 40 ට අඩු වීම (MDRD සූත්‍රය)

රෝග විනිශ්චය වකුගඩු පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කලයුතුය.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- බහුවිධ කෝෂ්ඨ (පොලිසිස්ටික්) වකුගඩු රෝගය
- බහු කෝෂ්ඨික වෘක්කීය දුර්විකාර්ය (මල්ටි සිස්ටික් රේනල් ඩිස්ප්ලේසියා) සහ මජ්ජා ස්පත්‍ය (මෙඩුයිලරි ස්පොන්ජ්) වකුගඩු රෝගය
- වෙනත් කෝෂ්ඨ වකුගඩු රෝග

(xxxi) **පාකින්සන් රෝගය (වයස අවු 65 ට පෙර)** (PARKINSON'S DISEASE – BEFORE AGE 65)

මූලික නිජතික්ෂ පාකින්සන් රෝගය ලෙස නිශ්චිත රෝග විනිශ්චය හා එය පහත දැක්වෙන තත්ත්වයන් තුනෙන් දෙකක් මගින් සායනිකව විද්‍යාමාන වීම මෙයින් අදහස් කෙරේ.

- පේශි දෘඪතාවය
- වේපනය
- ලැසි චලිතය (අසාමාන්‍යලෙස මන්දගාමී චලනයන් හා මන්දගාමී කායික හා මානසික ප්‍රතිචාරයන්)

ප්‍රමාණවත් ඖෂධ ප්‍රතිකාර යටතේ වුවද අඛණ්ඩව රෝගාරම්භයේ පටන් මාස තුනක් පුරාවට මෙම රෝගය හේතුවෙන් දෛනික ජීවන ක්‍රියාකාරකම් 6 න් 3 ක් වත් තනිව කිරීමට නොහැකි විය යුතුය.

දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම්ඃ

- සේදීම - නාන බේසමකින් හෝ වතුර මලකින් ස්නානය කිරීමේ හැකියාව (නාන බේසමකට හෝ වතුර මලකට ඇතුළු වීම මෙන්ම එයින් පිටතට පැමිණීමේ හැකියාවද මෙයට ඇතුලත්වේ) හෝ වෙනත් ක්‍රමයකින් සතුටුදායක ලෙසින් සෝදා ගැනීමේ හැකියාව
- ඇඳුම් ඇඟලාගැනීම හා උනාදැමීම - ඇඳුම් ඇඟලාගැනීම හා ගලවා දැමීමට, පියවීමට හා විවර කිරීමට හැකියාව (අවශ්‍ය වුවහොත් කෘත්‍රිම අත් පා ශල්‍ය උපාංග හා සවිකිරීම්ද ඇතුළුව)
- තනිව ආහාර හා පාන ගැනීම - පිළියෙල කර සූදානම් කර දෙන ලද ආහාර හා පාන බාහිර උදව් නැතිව තනිවම ගැනීමේ හැකියාව
- පුද්ගලික සනීපාරක්ෂාව පවත්වාගැනීම - වැසිකිලියක් භාවිත කිරීමෙන් හෝ මුත්‍රාශයේ

Specimen

හා අන්ත්‍ර ක්‍රියාකාරීත්වය නිසි පරිදි කළමණාකරණය කිරීමෙන් පුද්ගලික සනීපාරක්ෂාව සතුටුදායක තත්වයෙන් පවත්වාගැනීමට හැකියාව

- කාමර අතර සංචරණය - එකම තට්ටුවක පිහිටි කාමරයකින් කාමරයකට යාමේ හැකියාව
- ඇඳට යැම හා ඇඳෙන් බැසීම - ඇඳෙන් බැස රෝද පුටුවකට හෝ පුටුවකට ගොඩවීමේ හා නැවත ඇඳට ගොඩවීමේ හැකියාව

රෝග නිශ්චය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් හෝ ස්නායු ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතුය.

දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් හැකියාවට ස්වායත්තව ගැඹුරු මස්තිෂ්ක උත්තේජනය මගින් රෝග ලක්ෂණ පාලනයට ස්නායු උත්තේජක රෝපණය මෙම අර්ථ දැක්වීම යටතේ ආවරණය වේ. ස්නායු උත්තේජක රෝපණයක වෛද්‍යවිද්‍යාත්මක අත්‍යාවශ්‍යතාවය ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් හෝ ස්නායු ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු විසින් සනාථ කල යුතුය.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- ද්විතීයක පාකින්සන් රෝගය (ඖෂධ හෝ ධූලක ප්‍රේරික පාකින්සන් රෝගය ඇතුළුව)
- තාත්වික වේපනය (Essential tremor)
- පාකින්සන් රෝගය හා සම්බන්ධ වෙනත් ස්නායු විජනන (Degenerative) ආබාධ

(xxxii) **ශාරීරික රක්තිමා ලියුපසය** (SYSTEMIC LUPUS ERYTHEMATOSUS)

පහත දැක්වෙන සියළු සාධක මගින් සනාථ වන ශාරීරික රක්තිමා ලියුපසය ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

- ප්‍රති න්‍යෂ්ටික ප්‍රතිදේහ හෝ ප්‍රති DNA ප්‍රතිදේහ පවතින බවට වූ දර්ශීය රසායනාගාර වාර්තා
- රක්තිමා ලියුපසය හා සංඝතික රෝග ලක්ෂණ පැවතීම (සමණල කරප්පම සිරොසයිටි ආලෝක අධිසංවේදනය)
- කෝර්ටිකෝ ස්ටීරොයිඩයන් හෝ වෙනත් ප්‍රතිශක්ති මර්ධක මගින් අඛණ්ඩව ප්‍රතිකාර සිදුකිරීම

අතිරේකව මතු කියැවෙන ග්‍රන්ථීන්ට සිදුවූ බලපෑම් එකක් හෝ රෝග නිශ්චය කල යුතුයි

- දිනකට මුත්‍රා සමග ප්‍රෝටීන ග්‍රෑම් 0.5 ක් වත් පිටවීම සහ ගුච්ඡිකා පෙරණ සීඝ්‍රතාව 60 ට අඩු වීම සමග ලියුපසීය වෘක්ක දාහය පැවතීම
- ලිබ්මාන් සැක්ස් අන්තෝ කන්තුදාහය හෝ වහිර්කන්තුදාහය
- මෂ්තිෂ්ක සුෂුම්නා තරල පරීක්ෂාවකින් හෝ විද්‍යුත් නිකර්ප රේඛණ සටහනකින් සනාථ කරන ලද මාස තුනත් වත් පවතික ස්නායුක ඌනතාවය හෝ ආක්ෂේපයන්. හිසරදයන් විඥානික හෝ මානසික අසාමාන්‍යතා විශේෂයෙන්ම බැහැර කෙරේ.

රෝග නිශ්චය වකුගඩු පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු හෝ රූමැටික් රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයක විසින් තහවුරු කලයුතු වේ.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- මණ්ඩලාකාර රක්තිමා ලියුපසය හෝ මන්දතීව්‍ර ත්වචීය රක්තිමා ලියුපසය
- ඖෂධ ප්‍රේරිත රක්තිමා ලියුපසය

(xxxiii) **උග්‍ර රූමැටොයිඩ පර්වදාහය** (SEVERE RHEUMATIC ARTHRITIS)

පහත දැක්වෙන සාධක සියල්ල මගින් සනාථ වන උග්‍ර වාතරක්ත පර්වදාහය ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

- රෝග නිශ්චය සිදුකරන අවස්ථාව වන විට සති 6ක් වත් දර්ශීය ආසාදන රෝග



Specimen

ලක්ෂණයන් (සන්ධී වේදනාව, ඉදිමුම හා දැඩි බව) සන්ධි20 ක වත් පැවතීම.

- රක්තවාත සාධකය (රූමටොයිඩ ෆැක්ටර්) ධනාත්මක වීම (අවම වශයෙන් ඉහල සාමාන්‍ය අගය මෙන් දෙගුණයක්) සහ/ හෝ ප්‍රති සිට්‍රුලයින් ප්‍රතිදේහ පැවතීම.
- කෝර්ටිකෝස්ටිරොයිඩ මගින් වන අඛණ්ඩ ප්‍රතිකාර .
- රෝග විකරණ ප්‍රති රක්තවාත ඖෂධ (උදා: මෙතොට්‍රෙක්සේට් හා සල්ෆර් සැලසයින්/ ලෙෆුනොමයිඩ) හෝ ටි එන් එෆ් නිෂේධක (ඉන්හිබිටර්) ප්‍රතිකාර සංයෝජනය මගින් මාස 6ක් වත් ප්‍රතිකාර කිරීම.

රෝග නිශ්චය රූමැටික් රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කලයුතුය.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- ප්‍රතික්‍රියක පර්වදාහය, සොරයිසීය පර්වදාහය සහ සක්‍රියායිත අස්ථිපර්වදාහය

(xxxiv) **පෝලියෝ මයලයිටිස් (ධූසර මජ්ජාදාහය)** (POLIOMYELITIS)

ගාත්‍රා පේශීන්ගේ හෝ ස්වසන පේශීන්ගේ අඝාතයට හේතුවන උග්‍ර පෝලියෝ වෛරස් ආසාදනයක් ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ. එම රෝගය හේතුවෙන් රෝගාරම්භයේ පටන් මාස තුනක් පුරාවට අඝාතය පැවති බවට සාක්ෂි වෛද්‍යමය වශයෙන් ලේඛණගත විය යුතුය. රෝග නිශ්චය ස්නායු විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කලයුතු අතර පෝලියෝ වෛරස ආසාදනයක් පවතින බව රසායනාගාර වාර්තා මගින් සනාථ විය යුතුය.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- අඝාත තත්ත්වයක් රහිත පෝලියෝ වෛරස් ආසාදනය
- වෙනත් එන්ටරෝ වෛරස් ආසාදනයන්
- තීර්යක් මජ්ජාදාහය හෝ ගුලියන් බාර් සින්ඩ්‍රෝමය

(xxxv) **ආන්තික රෝග** (TERMINAL ILLNESS)

මෙබඳු රෝග තත්වයන්ට ප්‍රතිකාර සඳහා විශේෂඥ වූ ස්වාධීන කායික රෝග වෛද්‍යවරුන් දෙදෙනෙකුගේ මතය අනුව සුවකල නොහැකි මාස 6 කාලයක් තුල මරණය සිදුවන පරිනත හෝ ඉක්මනින් ප්‍රගමණය වන රෝගයක් ලෙස නිශ්චිත රෝග විනිශ්චය කෙරුණු හෝ පෙලෙමින් සිටින රෝග තත්ත්වයන් මෙයින් අදහස් කෙරේ. රෝගියා නිවාරන චිකිත්සා (රෝගයෙහි හෝ රෝග ලක්ෂණ වල බරපතල බව අඩු කිරීමට) හැර තව දුරටත් සක්‍රිය ප්‍රතිකාර නොලැබිය යුතුයි. ඒඩ්ස් රෝගය හේතුවෙන් ඇති වූ ආන්තික රෝග මේ යටතේ බැහැර කෙරේ. සමාගම විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙහි ලියාපදිංචි වෛද්‍යවරයකු විසින් ආන්තික රෝගයක් ලෙස රෝග විනිශ්චය හා තහවුරු කිරීම සිදුකල යුතුය.

(xxxvi) **කන්තුකපේශිව්‍යතය - කාඩියෝමයෝපති** (CARDIOMYOPATHY)

පහත දැක්වෙන ප්‍රාථමික කන්තුකපේශිව්‍යතය ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

- විස්තෘත කන්තුකපේශිව්‍යතය
- අතිභරණ කන්තුකපේශිව්‍යතය (ආලාවරෝධක හෝ ආලාවරෝධක නොවන)
- බාධක කන්තුකපේශිව්‍යතය
- අරිත්මීයජනක දකුණු කෝෂිකා කන්තුකපේශිව්‍යතය

එම රෝගය හේතුවෙන් මතු කියැවෙන තත්ත්වයන් එකක් හෝ ඇතිවී තිබීය යුතුයි

- අවම වශයෙන් මාස තුනක කාල ප්‍රාන්තරයකදී දෙවරක් මනින ලද වම් කෝෂිකා විසර්ජන ඛණ්ඩ මිනුම (LVEF) 40% ට අඩුවීම

Specimen

- අවම වශයෙන් මාස 6 ක කාල පරිච්ඡේදයක් තුල ශාරීරික ක්‍රියාකාරකම් පැහැදිලි ලෙස සීමාවීම, සාමාන්‍ය පමණට වඩා අඩු ක්‍රියාකාරකමකදී තෙහෙට්ටුවීම හෘද අභිස්ඵන්දනය (පැල්පිටේෂන්) නිශ්වාසීත්වය (හුස්ම සිරවීම) හෝ පපුවේ වේදනාව (නිව්යෝර්ක් හෘද රෝග සංගමයේ වර්ගීකරණයට අනුව 3 හෝ 4 පන්තිය)
- ක්ෂණික හෘද මරණයක් වැලැක්වීම උදෙසා වන රෝපනයකල හැකි කන්තුකවාහක ඩිෆ්‍රිබ්‍රිලේටර් රෝපනය

රෝග නිශ්චය හෘද රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කලයුතු අතර එකෝ කන්තුක හෘද එම් ආර් අයි හෝ හෘද සී ටී ස්කෑන් පරීක්ෂණයක් මගින් සනාථ කල යුතු වේ. echocardiogram, cardiac MRI or cardiac CT scan

රෝපනයකල හැකි කන්තුකවාහක ඩිෆ්‍රිබ්‍රිලේටර් රෝපනයේදී වෛද්‍යවිද්‍යාත්මක අත්‍යවශ්‍යතාවය හෘද රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් සනාථ කල යුතුයි.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- ද්විතීයක කන්තුකපේශිව්‍යතය (ඉස්කීමීය, කපාට, පරිවෘත්තීය, ධූලක හෝ අධ්‍යාතතික)
- වහිර්කන්තුකදාහය (මයෝකාඩයිටිස්) හේතුවෙන් විටින් විට ඇතිවන වම් කෝෂිකා ක්‍රියාකාරීත්වය අඩු වීම
- ශාරීරික රෝගයක් හේතුවෙන් ඇතිවන කන්තුකපේශිව්‍යතය
- ප්‍රාථමික අරිත්මියාව හේතුවෙන් රෝපනයකල හැකි කන්තුකවාහක ඩිෆ්‍රිබ්‍රිලේටර් රෝපනය (උදාඃ බෲගාඩා/Long-QT-Syndrome)

(xxxvii) **අත් පා අහිමිවීම** (LOSS OF LIMBS)

හදිසි අනතුරක් හෝ වෛද්‍යමය අවශ්‍යතාවයක් හේතුවෙන් වන අංගඡේදනයකදී අත් පා දෙකක් හෝ කිහිපයක් වළලුකර හෝ මැණික් කටු සන්ධියට ඉහලින් සම්පූර්ණනේම විභේදනය වීම ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

රෝග නිශ්චය විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයකු විසින් තහවුරු කලයුතුය.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- ස්වයං හානිකර ගැනීමක් හේතුවෙන් වන ගාත්‍රා අහිමිවීම

(xxxviii) **විපත්‍යක කවලිකාසාදනය (නික්රෝටයිසින් ෆැසිලිටිස්)** (NECROTISING FASCIITIS)

පහත දැක්වෙන සියළුම තත්ත්වයන් මගින් සනාථ වන විපත්‍යක කවලිකාසාදනය ලෙස නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ.

- ගාත්‍රාවල හෝ බඳෙහි උපත්වචීය පටකයෙහි ද්විතීයක විපත්‍යයන් (necrosis) ඇතිකරන ගැඹුරින් පිහිටි කවලිකාවන්හි වේගයෙන් පැතිරෙන ප්‍රගාමී බැක්ටීරියා ආසාදනයක්
- උණ සහ ඉක්මනින් ඉහල යන සී ප්‍රතික්‍රියක ප්‍රෝටීන (CRP) මට්ටම
- විපත්‍ය පටක ශල්‍ය පරිඛණ්ඩනය.

ඉහත අර්ථ දැක්වීම යටතේ ෆෝර්නියර් කෝථය ආවරණය වේ. රෝග විනිශ්චය විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයකු විසින් තහවුරු කලයුතු අතර ක්ෂුද්‍රජීව විද්‍යා හා ඖතිකවේදී සොයාගැනීම් මගින් සනාථ කල යුතු වේ.

ඉහත අර්ථ දැක්වීමෙන් පහත දැක්වෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- වායු කෝථය
- දියවැඩියාව, ස්නායුව්‍යතය හා වාහිණික රෝග හේතුවෙන් හටගන්නා කෝථයන්

Specimen

(xxxix) **ස්වාධීන පැවැත්ම අහිමිවීම** (LOSS OF INDEPENDENT EXISTENCE)

ස්වාධීනව ජීව ක්‍රියාකාරකම් 6 න් 3 ක් වත් ඉටුකරගැනීමට සම්පූර්ණ නොහැකියාව තහවුරු වන නිශ්චිත රෝග විනිශ්චය මෙයින් අදහස් කෙරේ. රෝගාරම්භයේ පටන් මාස තුනක් පුරාවට අඛණ්ඩව හා ස්වාධීනව එකී ක්‍රියාකාරකම් ඉටුකිරීමට නොහැකි විය යුතු අතර සුවය ලැබීමේ සාධාරණ ප්‍රවනතාවයක් හෝ හැකියාවක් නොපැවතිය යුතුයි .

දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම්ඃ

- සේදීම - නාන බේසමකින් හෝ වතුර මලකින් ස්නානය කිරීමේ හැකියාව (නාන බේසමකට හෝ වතුර මලකට ඇතුළු වීම මෙන්ම එයින් පිටතට පැමිණීමේ හැකියාවද මෙයට ඇතුලත්වේ) හෝ වෙනත් ක්‍රමයකින් සතුටුදායක ලෙසින් සෝදා ගැනීමේ හැකියාව
- ඇඳුම් ඇඟලාගැනීම හා උනාදැමීම - ඇඳුම් ඇඟලාගැනීම හා ගලවා දැමීමට, පියවීමට හා විවර කිරීමට හැකියාව (අවශ්‍ය වුවහොත් කෘත්‍රිම අත් පා ශල්‍ය උපාංග හා සවිකිරීම්ද ඇතුළුව)
- තනිව ආහාර හා පාන ගැනීම - පිළියෙල කර සූදානම් කර දෙන ලද ආහාර හා පාන බාහිර උදව් නැතිව තනිවම ගැනීමේ හැකියාව
- පුද්ගලික සනීපාරක්ෂාව පවත්වාගැනීම - වැසිකිලියක් භාවිත කිරීමෙන් හෝ මුත්‍රාශයේ හා අන්ත්‍ර ක්‍රියාකාරීත්වය නිසි පරිදි කළමණාකරණය කිරීමෙන් පුද්ගලික සනීපාරක්ෂාව සතුටුදායක තත්වයෙන් පවත්වාගැනීමට හැකියාව
- කාමර අතර සංචරණය - එකම තට්ටුවක පිහිටි කාමරයකින් කාමරයකට යාමේ හැකියාව
- ඇඳට යැම හා ඇඳෙන් බැසීම - ඇඳෙන් බැස රෝද පුටුවකට හෝ පුටුවකට ගොඩවීමේ හා නැවත ඇඳට ගොඩවීමේ හැකියාව

රෝග නිශ්චය කායිකරෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතුය.

### 3.2.1.4 වාර මුදල් හා කොන්දේසි සංශෝධනය කිරීම

මෙම ප්‍රතිලාභය සඳහා වාරික ගෙවීම පිළිබඳව ඔප්පුවේ උපලේඛණයේ II කොටසේ දක්වා ඇති අතර, සුවමග ප්‍රතිලාභය යටතේ ගෙවිය යුතු වාරිකය සහතික කරනුයේ මෙම ප්‍රතිලාභය ආරම්භ කළ දින සිට වසර (01) ක කාලයක් සඳහා පමණක් වන අතර, ඒ බව රක්ෂිතයාට දින තිහ (30) ක දැනුම් දීමකින් පසුව වාරික මුදල් සහ/හෝ අදාළ කොන්දේසි සංශෝධනය කිරීමේ බලය සමාගම සතුය. එවැනි ප්‍රතිශෝධන බලපවත්වනු ලබන්නේ ඊළඟ ඔප්පු සංවත්සර දිනයේ සිටය.

### 3.2.1.5 රැකියාවේ වෙනස්වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීමේ දින සිට දින දාහතරක් (14) ක් ඇතුළත ඒ බව සමාගම වෙත ලිඛිතව දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කරගත යුතුය. රෝගී තත්ත්වයට පත් වූ අවස්ථාවේදී ජීවිත රක්ෂිතයා යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් රැකියාවට වඩා වෙනස් වූ රැකියාවක නිරත වීම හේතුකොටගෙන ඍජුව හෝ වක්‍රව පැන නගින්නා වූ හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

### 3.2.1.6 හිමිකම්පෑම පිළිබඳ දැන්වීම හා සනාථ කිරීම

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමකට තුඩුදිය හැකි සැත්කමක් හෝ රෝග නිර්ණය පිළිබඳව එම සිදුවීමෙන් දින තිහ (30) ක් ඇතුළත සමාගමේ ප්‍රධාන කාර්යාලය හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිතව දැන්වීමක් කළ යුතු වන අතර යෝජනා පත්‍රයේ දී ඇති ලිපිනය හා වර්තමාන ලියාපදිංචි ලිපිනයද සමාගම වෙත දැන්විය යුතුය. නියමිත කාලය තුළදී එසේ දැන්වීමට අපොහොසත් වීම මගින් එම හිමිකම නිශ්ප්‍රභා කිරීමේ බලය සමාගම සතුවේ. අසාධ්‍ය රෝගය සනාථ කිරීම සඳහා අවශ්‍ය වන සාක්ෂි, හිමිකම් ලබන්නාගේ වියදමින් සමාගම වෙත ලබාදිය යුතුවේ.



Specimen

### 3.2.1.7 කොන්දේසි

(i) පහත සඳහන් අවස්ථා වලදී මෙම ප්‍රතිලාභ අහෝසි වේ;

(අ) මෙහි පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල්පිරීමේ දිනයේදී හෝ ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන දෙකෙන් කලින් එළඹෙන සිද්ධියේදී; සහ/හෝ

(ආ) රක්ෂිතයා පළමු වරට සුවමග ප්‍රතිලාභය යටතේ ආවරණය වන රෝගී තත්වයකින් පෙළෙන බවට රෝග නිශ්චය කිරීමේදී හෝ සුවමග ප්‍රතිලාභය යටතේ ආවරණය වන සැත්කමකට භාජනය වූ අවස්ථාවේදී.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත. මෙම ආවරණය නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා සමාගමට අයිතියක් ඇත. මෙම ප්‍රතිලාභය සඳහා "ආවරණ හිමි නොවන කාලය" අදාළ වන්නේ නම්, ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දින සිට අදාළ ආවරණය හිමි නොවන කාලය නැවත බලපැවැත්වේ.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා දායක නොවන අතර,

(ආ) පවාරණ, ගෙවානිමි හෝ පරිණත අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) කිසියම් අසාධ්‍ය රෝගයක් සඳහා විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් රෝග නිර්ණය කල යුතු වන අතර, සමාගම සෑහීමකට පත්වන පරිදි රෝග විනිශ්චය පිළිබඳ වූ චිකිත්සාගාර වාර්තා හා වෙනත් වාර්තා මගින් එම රෝගය තහවුරු විය යුතුය.

(vi) කිසියම් අසාධ්‍ය රෝගයකින් පෙළෙනු ලබන බවට රෝග නිර්ණය කරනු ලැබූ ජීවිත රක්ෂිතයා පරීක්ෂා කිරීම සඳහා විශේෂඥ වෛද්‍යවරයෙකු/වෛද්‍යවරයන් පත් කිරීමේ අයිතිය සමාගම සතුවේ.

(vii) කිසියම් අසාධ්‍ය රෝගයකින් පෙළෙනු ලබන බවට රෝග නිර්ණය කරනු ලැබූ ජීවිත රක්ෂිතයා එසේ රෝග නිර්ණය කරනු ලැබූ දිනයේ සිට දින තිහ (30) ක් ඉක්මයාමට පෙර මියගිය හොත් මෙම ප්‍රතිලාභය යටතේ ගෙවිය යුතුව ඇති/ගෙවා ඇති මුදල, ඔප්පුවේ පළමු උපලේඛණයේ II කොටසේ මූලික ප්‍රතිලාභය යටතේ ගෙවිය යුතු මුදලින් අඩු කරනු ලැබේ.සහකරුගේ ආවරණය ලබා ගෙන ඇති ජීවිත රක්ෂිතයා රෝග නිර්ණය කරනු ලැබූ දින සිට දින තිහ (30) ඉක්මයාමට පෙර මියගිය හොත් මෙම ප්‍රතිලාභය යටතේ ගෙවිය යුතුව ඇති/ගෙවා ඇති මුදල ඔප්පුවේ පළමු උපලේඛණයේ II කොටසේ සහකරුගේ ජීවිතය මත සමකාල ප්‍රතිලාභ යටතේ ගෙවිය යුතු මුදලින් අඩු කරනු ලැබේ.

(viii) යුනියන් සුවමග ප්‍රතිලාභය යටතේ හිමිකමක් ගෙවීමෙන් අනතුරුව, ජීවිත රක්ෂිතයා තවදුරටත් ජීවත්ව සිටින්නේ නම් ඔප්පුවෙහි අනෙකුත් ප්‍රතිලාභ සඳහා ඉදිරි වාරික ගෙවා ඔප්පුව පවත්වාගෙන යා යුතුය.

(ix) පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට සුවමග ප්‍රතිලාභය යටතේ හිමිකම් ලබා ගැනීමේ අයිතිවාසිකමක් නොමැත.

(x) තනිපුද්ගලයෙකු විසින් සමාගම මගින් මෙම ප්‍රතිලාභ සඳහා උපරිම වශයෙන් හිමිකම් කිවහැක්කේ රුපියල් මිලියන පහක් (රු.5,000,000) සඳහා පමණක් වන අතර මෙම ප්‍රතිලාභය සඳහා සියළුම රක්ෂණ සමාගම් මගින් හිමිකම් කිව හැක්කේ රුපියල් මිලියන දහයක් (රු.10,000,000) දක්වා පමණි.

(xi) ජීවිත රක්ෂිතයාගේ ජීවිත කාලය තුලදී සහකරුට මෙම ප්‍රතිලාභය වෙනත් අයෙකුට පැවරීම හෝ වෙනත් අයෙකු නම් කිරීමට හෝ බලයක් නොමැත.

Specimen

(xii) කිරීටක ධමනි ශල්‍යකර්මයක් (Angioplasty) සඳහා වූ සුවමග ප්‍රතිලාභය යටතේ හිමිකම් ගෙවනු ලබන්නේ ජීවිත රක්ෂිතයාගේ පනස් පස් වන (55) උපන් දිනයට පෙර සුවමග ප්‍රතිලාභය ලබා ගෙන ඇත්නම් පමණි.

### 3.2.1.8 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැරකිරීම්

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතුවූ සිද්ධිය හෝ රෝග තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට හෝ වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම් මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) කලින් තිබූ රෝගී තත්ත්වයක් හෝ තුවාල හෝ එවන් තත්ත්වයන් රක්ෂිතයා ජීවිත රක්ෂණ යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කර ඔප්පුව ආරම්භක දිනට හෝ ඊට පෙර රක්ෂණ ඔප්පුව මගින් හෝ වෙනයම් තහවුරු ලිපියක් මගින් සමාගම විසින් ලිඛිතව පිළිගෙන තිබේනම් හැර; සහ/හෝ

(iv) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(v) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිදෝශයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල ; සහ/හෝ

(vi) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මගින් පැනීම, හැංග් ග්ලයිඩින්, කදු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජි පැනීම, පොතොලින්, දඩයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්.

Specimen

උපලේඛණ අංක 3.2.2

## 3.2.2 රෝහල් දීමනා ප්‍රතිලාභය (HCB/HCC)

### 3.2.2.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

රෝහල් දීමනා ප්‍රතිලාභය (HCB) ඇතුලත් වන බව ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි (II) කොටසේ සඳහන් වී තිබේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව, පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම් සහ මෙම ප්‍රතිලාභයට අදාළ වාරිකය ගෙවා තිබේ නම්, මෙම ප්‍රතිලාභය මගින් ආවරණය වන ජීවිත රක්ෂිතයා/සහකරු/සහකාරිය හෝ දරුවන් රෝග තත්ත්වයන් හෝ හදිසි අනතුරක් නිසා විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අනුදැනුම හා අනුමැතිය මත පෞද්ගලික හෝ රජයේ රෝහලක රෝහල් ගත කොට ඇත්නම්, සමාගම මෙම ප්‍රතිලාභය යටතේ දෛනික රෝහල් ගාස්තු ආවරණය රක්ෂණ ඔප්පුවේ පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් කොට ඇති ආකාරයට ගෙවනු ලැබේ.

ජීවිත රක්ෂිතයා/සහකරු/සහකාරිය හෝ දරුවන් පෞද්ගලික හෝ රජයේ 'රෝහලක' රෝහල් ගත විය යුතුය. මෙම වගන්තියේ අරමුණ පිණිස ආයුර්වේද රෝහල්, දේශීය චිකිත්සක, හෝමියෝපති සහ කටු චිකිත්සා ආයතන මෙයට ඇතුලත් නොවේ.

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකමක් සඳහා සුදුසුකම් ලැබීමට නම් ජීවිත රක්ෂිතයා/සහකරු/සහකාරිය හෝ දරුවන් 'රෝහලක' අවම වශයෙන් පැය හතලිස් අටක (48) කාලයක් අඛණ්ඩව නැවතී සිටිය යුතුය. උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.2.2.2 ප්‍රතිලාභ අගය

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් සලකා බලනු ලබන්නේ පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් රෝහල් දීමනා ප්‍රතිලාභ මුදල, රෝහල් ගතව සිටි සම්පූර්ණ දින ගණනින් වැඩිකර ලැබෙන අගය වේ.

ජීවිත රක්ෂිතයාට දැඩි සත්කාර ඒකකයක ප්‍රතිකාර ගැනීමට සිදුවුවහොත් ගෙවනු ලබන දෛනික රෝහල් ප්‍රතිලාභය, දැඩිසත්කාර ඒකකයේ සිටි කාලය සඳහා දෙගුණයක් කොට ගෙවනු ඇත. ප්‍රතිකාර කරනු ලබන වෛද්‍යවරයා විසින් දැඩි සත්කාර ඒකකයක ප්‍රතිකාර ලැබිය යුතු බවට සහ ප්‍රතිකාර ලබාගත් බවට සහතික කල යුතුය.

සමාගම විසින් එක් අයෙකු සඳහා නිකුත් කර ඇති සියළුම ඔප්පු වලින් එක් දිනක් සඳහා උපරිම ආවරණය වනුයේ රුපියල් විසිදහස (20,000/-) කි.

මෙම පහත සඳහන් අවස්ථා වලදී රෝහල් දීමනා ප්‍රතිලාභය යටතේ සමාගම විසින් තවදුරටත් කිසිඳු ගෙවීමක් කරනු නොලැබේ.

(i) ඔප්පු වසරක් තුලදී සිදුවූ සියලු රෝහල් ගතවීම් වෙනුවෙන් සමාගම විසින් දින එකසිය අසූවක් (180) සඳහා රෝහල්ගත වීමේ ප්‍රතිලාභ ගෙවා තිබීම.

(ii) රක්ෂණ ඔප්පුවේ වලංගු කාල සීමාව තුලදී එක් රෝගයක් සඳහා සිදුවූ සියලු රෝහල් ගත වීම් වෙනුවෙන් සමාගම විසින් මුළු ඔප්පු කාලය තුලදී දින එකසිය අසූවක් (180) සඳහා රෝහල් ගත වීමේ ප්‍රතිලාභය ගෙවා තිබීම. අදාළ එකම රෝගය ආශ්‍රයෙන්/මගින් ඇති වන තවත් රෝගාබාධ සඳහා වන රෝහල් ගත වීමකදී, එය අදාල එකම මූලික රෝගයට රෝහල් ගතවීමේ කාලයෙහිම දීර්ඝ වීමක් ලෙස සලකනු ලැබේ.

(iii) රක්ෂණ ඔප්පුවේ වලංගු කාල සීමාව තුලදී රෝහල් ගතව සිටි ඕනෑම අඛණ්ඩ කාල සීමාවක් වෙනුවෙන් සමාගම විසින් දින එකසිය අසූවක් (180) සඳහා රෝහල් දීමනා ප්‍රතිලාභය යටතේ මුදල් ගෙවා තිබීම. වරක් රෝහල්ගතව සිටි එම කාලය අවසාන වී දින තිහක් (30) ඉක්ම වීමට මත්තෙන් (ඕනෑම හේතුවක් නිසා) නැවතත් රෝහල්ගත වූයේ නම් එම කාලයද පළමු රෝහල්ගත වීමේ කාලයෙහිම දීර්ඝවීමක් සේ සලකනු ලැබේ.

උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාල වේ.



Specimen

### 3.2.2.3 ආවරණ හිමි නොවන කාලය

රෝහල් දීමනා ප්‍රතිලාභය ආරම්භක දිනය, ඔප්පුව ආරම්භක දිනය හෝ ඔප්පුවේ දිනය හෝ ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනය යන සිදුවීම් වලින් අවසන් සිදුවීමෙන් දින අනූවක් (90) සඳහා ආවරණ හිමිනොවන කාලසීමාවක් බලපැවැත්වේ. මෙම ප්‍රතිලාභය රක්‍ෂණ ඔප්පුව ආරම්භ කල දිනට පසුව ඔප්පුවට ඇතුලත් කරන ලද්දේ නම් ආවරණ හිමි නොවන කාල සීමාව, ප්‍රතිලාභය ඇතුලත් කල දින සිට දින එකසිය අසූව (180) කි.

හදිසි අනතුරක් හේතුවෙන් වන රෝහල් ගතවීම් සඳහා රෝහල් දීමනා ප්‍රතිලාභය යටතේ අදාළ ආවරණ හිමි නොවන කාල සීමාව සමාගම විසින් නොසලකනු ඇත.

### 3.2.2.4 වාර මුදල් හා කොන්දේසි සංශෝධනය කිරීම

මෙම ප්‍රතිලාභය සඳහා වාරික ගෙවීම පිළිබඳව ඔප්පුවේ උපලේඛණයේ II කොටසේ දක්වා ඇති පරිදි රෝහල් දීමනා ප්‍රතිලාභය යටතේ ගෙවිය යුතු වාරිකය සහතික කරනුයේ මෙම ප්‍රතිලාභය ආරම්භ කළ දින සිට වසර එක (1) ක කාලයක් සඳහා පමණක් වන අතර, ඒ බව රක්ෂිතයාට දින තිහ (30) ක දැනුම් දීමකින් පසුව වාරික මුදල් හෝ අදාළ කොන්දේසි සංශෝධනය කිරීමේ බලය සමාගම සතුය. එවැනි ප්‍රතිශෝධන බලපවත්වනු ලබන්නේ ඊලඟ ඔප්පු සංවත්සර දිනයේ සිටය.

### 3.2.2.5 රැකියාවේ වෙනස්වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ/සහකරුගේ හෝ සහකාරියගේ රැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීමේ දින සිට දින දාහතර (14) ක් ඇතුලත ඒ බව සමාගම වෙත ලිඛිතව දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කරගත යුතුය. රෝහල් ගතවන අවස්ථාවේදී ජීවිත රක්ෂිතයා/සහකරු හෝ සහකාරිය යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් රැකියාවට වඩා සැලකිය යුතු අන්දමින් වෙනස් වූ රැකියාවක නිරත වීමෙන් සෘජුව හෝ වක්‍රව පැනනගින්නාවූ හිමිකම් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

### 3.2.2.6 හිමිකම්පෑම පිළිබඳ දැන්වීම හා සනාථ කිරීම

හිමිකමක් සලකා බැලීම සඳහා, රෝහල්ගතවීම සම්බන්ධයෙන් වන ලිඛිත සාක්ෂි, රෝහල් ගතවී වැඩකරන දින තුනක් (3) ඇතුලත සමාගම හෝ ආසන්නතම ශාඛාව වෙත භාරදිය යුතුවේ. එම කාලය තුළ සමාගම වෙත රෝහල්ගතවීම නොදැන්වීම මගින් එම හිමිකම නිශ්ප්‍රභා කිරීමට බලයක් සමාගම වෙත ලැබෙනු ඇත.

එවැනි දැනුම් දීමකින් අනතුරුව සමාගම විසින් හිමිකම් පෑමක් සනාථ කිරීම සම්බන්ධයෙන් වන පෝරමයන් නිකුත් කරනු ලැබේ. එම පෝරමයන් නියමිත පරිදි සම්පූර්ණ කොට වැඩකරන දින දහය (10) ක් ඇතුලත නැවත සමාගම වෙත සැපයිය යුතුවේ. රෝහල්ගතවීම සනාථ කිරීම සඳහා වන පිළිගත හැකි ලිඛිත සාක්ෂි දින තිහ (30) ක් ඇතුලත රක්ෂිතයාගේ වියදමින් සමාගම වෙත ඉදිරිපත් කල යුතුවේ.

රක්ෂිතයා විසින්, ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් වගකීම දරණ විශේෂඥ වෛද්‍යවරයා විසින් දෙනු ලබන උපදෙස් නියමාකාරයෙන් පිළිපැදිය යුතුවන අතර, එම ප්‍රතිකාර සම්බන්ධයෙන් වන සම්පූර්ණ විස්තර සමාගම වෙත සැපයිය යුතුවේ. රක්ෂිතයා හා ඔහුගේ/ඇයගේ පැවතෙන්නන්, සමාගම නියෝජනය කරන විශේෂඥයන්ගේ පැමිණීම හා විමසීම් සඳහා අවසර දිය යුතු වන අතර එම විශේෂඥයන්ගේ රාජකාරීමය රහස්‍යභාවය රැකීමේ වගකීමෙන් සමාගම නිදහස්වේ.

රෝහල් ගතවී සිටින කාලය දින දාහතරක් (14) ඉක්ම වන්නේ නම් දින දාහතරක් (14) ඉක්මවා ගිය කාලසීමාව සඳහා ගෙවීම තීරණය කිරීම සමාගම විසින් නම් කරනු ලැබූ වෛද්‍යවරයෙකු විසින් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසාන සහ තීරණාත්මක වේ. ඒ සඳහා සමාගමට අවශ්‍ය වන යම් සායනික, විකිරණවේදීය, පටක වේදීය සහ පරීක්ෂණාගාර සාක්ෂි ඇතොත් ඒවා රක්ෂිතයාගේ වියදමින් සමාගම වෙත සැපයිය යුතු වේ.

ජීවිත රක්ෂිතයා හිමිකමක් පැන නැගුන විට සමාගම විසින් සඳහන් කරන ලද ක්‍රියා පිළිවෙල අනුගමනය

Specimen

කිරීමට අපොහොසත් වන්නේ නම්, රෝහල් ගාස්තු යටතේ වන හිමිකම් නිශ්ප්‍රභා කිරීමේ බලය සමාගම වෙත ලැබෙනු ඇත.

### 3.2.2.7 කොන්දේසි

(i) පහත සඳහන් අවස්ථා වලදී මෙම ප්‍රතිලාභ අහෝසි වේ;

(අ) මෙහි පළමු උපලේඛණයේ II වන කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල්පිරීමේ දිනයේදී; සහ/හෝ

(ආ) එක් එක් රක්ෂිතයන්ගේ පහත සඳහන් වයස් සීමාවන් සම්පූර්ණ වීමෙන් පසුව එළැඹෙන ඔප්පු සංවත්සර දින; යන දෙකෙන් කලින් එළැඹෙන දිනට පෙර, රෝහල් ගතවුවහොත් සහ/හෝ සැත්කමක් සඳහා භාජනය වුවහොත් පමණි.

- ජීවිත රක්ෂිතයා හැත්තෑව (70) වන උපන්දිනය හෝ

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

(අ) ලාභ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ, ගෙවානිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) ජීවිත රක්ෂිතයා පෞද්ගලික හෝ රජයේ 'රෝහලක' රෝහල් ගත විය යුතුය. ආයුර්වේද රෝහලක හෝ වෙනත් දේශීය වෛද්‍ය ආයතනයක ප්‍රතිකාර ගැනීම හා හෝමියෝපති හෝ කටු චිකිත්සක ප්‍රතිකාර ගැනීම මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය නොවේ.

(vi) මෙම අතිරේක ආවරණය බල පැවැත්වෙනුයේ ශ්‍රී ලංකා භූමිය තුළ නේවාසිකව කරනු ලබන වෛද්‍ය ප්‍රතිකාර සඳහා පමණි. තවද පහත සඳහන් අවස්ථා වලදී මෙම ප්‍රතිලාභය අහෝසි වේ.

(අ) එක් ඔප්පු වසරක් තුලදී දින එකසිය අසූවක් (180) දෛනික රෝහල් දීමනා ගෙවා ඇති විටකදී; සහ/හෝ

(ආ) ඔප්පුවෙහි මුළු ආවරණ කාලය තුළදී එක් රෝගයක්/අසනීපයක් නිසා දින එකසිය අසූවක් (180) දෛනික රෝහල් දීමනා ගෙවා ඇති විටකදී (යම් කිසි රෝගයක් නිසා සෘජුව හෝ වක්‍රාකාරයෙන් ඇතිවන ද්විතීයික රෝගයන්ද මූලික රෝගය ලෙසම සැලකේ); සහ/හෝ

(ඇ) මුළු ඔප්පු කාලය තුළදී එක් වතාවක දින එකසිය අසූවක් (180) කාලයක් අඛණ්ඩව රෝහල් ගතවීමක් සඳහා දෛනික රෝහල් දීමනා ගෙවා ඇති විටකදී (රෝහලෙන් පිටව ගොස් දින තිහක් (30) තුල මොනයම්ම හේතුවක් නිසා හෝ නැවත රෝහල් ගතවී නම් එය පළමු රෝහල් ගත වීමට සම්බන්ධ බව සලකා ක්‍රියාකරනු ලැබේ).

(vii) හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (TPS) සහ/හෝ හදිසි අනතුරක් පමණක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (TPA) සහ/හෝ හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයකදී වාරික ගෙවීමෙන් නිදහස්වීමේ ප්‍රතිලාභය (WP) යටතේ හිමිකම් පෑමක් සඳහා වගකීම් පිළිගතහොත්, මෙම ප්‍රතිලාභය අහෝසි වනු ඇත. එසේ වුවද සහකරු වෙනුවෙන් මෙම ප්‍රතිලාභය ලබා ඇති විටෙක එය ඉදිරියට ක්‍රියාත්මක වේ.

(viii) පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට මෙම රෝහල් දීමනා ප්‍රතිලාභය යටතේ හිමිකම් ලබාගැනීමේ අයිතිවාසිකමක් නොමැත.

(ix) සමාගම වෙතින් ලබා ඇති සියලුම ඔප්පු යටතේ එක් පුද්ගලයෙකුට ලබාගත හැකි උපරිම දෛනික රෝහල් දීමනාව රුපියල් විසිදහසකට (20,000/-) සීමා වේ.

Specimen

### 3.2.2.8 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැරකිරීම්

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතුවූ සිද්ධිය හෝ රෝග තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට හෝ වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම් මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) කලින් තිබූ රෝගී තත්ත්වයක් හෝ තුවාල හෝ එවන් තත්ත්වයන් රක්ෂිතයා ජීවිත රක්ෂණ යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කර ඔප්පුව ආරම්භක දිනට හෝ ඊට පෙර රක්ෂණ ඔප්පුව මගින් හෝ වෙනයම් තහවුරු ලිපියක් මගින් සමාගම විසින් ලිඛිතව පිළිගෙන තිබේනම් හැර; සහ/හෝ

(iv) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(v) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිද්‍රෝහයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල ; සහ/හෝ

(vi) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණාමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vii) න්‍යෂ්ටික අනතුරු උදාඃ න්‍යෂ්ටික බල ශක්තියට නිරාවරණය වීම, (විකිරණශීලීතා දූෂණය, න්‍යෂ්ටික බද්ධය, විබද්ධය) හෝ ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යයක් නිසා හෝ රසායනික දූෂණය හේතුවෙන්; සහ/හෝ

(viii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මගින් පැනීම, හැංග් ග්ලයිඩින්, කඳු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජි පැනීම, පොතොලින්, දඩයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්; සහ/හෝ

(ix) ස්වාභාවික අනතුරු පහත සඳහන් ස්වාභාවික අනතුරු වලට පමණක් සීමා නොවූ අයිස් කඳු කඩා වැටීම්, නාය යෑම්, භූමි කම්පා, ගංවතුර, භූමි කම්පා හෝ ගිණිකඳු පිපිරීම් මඟින් ඇතිවන සුනාමි හෝ උදම් රළ තත්ත්වයන්, සුළිසුළං, ධාරානිපාත වර්ෂාව, හරිකේන්, ටෝනාඩෝ හා ටයිෆුන් වැනි ස්වාභාවික විපත්; සහ/හෝ

(x) අනිවාර්ය ප්‍රතිශක්තීරකරණ එන්නත් ක්‍රම, රෝග නිවාරණ ක්‍රම, රෝග නිධානයන් තහවුරු කරගැනීමේ බලාපොරොත්තුවෙන් සිදුකරන පරීක්ෂා කිරීම් සඳහා වන, ප්‍රතිකාර ක්‍රමයන් හෝ ප්‍රතිකාර; බයොප්සි, එන්ඩොස්කොපි, ලැප්රොස්කොපි, අර්ත්‍රොස්කොපි ආදී; සහ/හෝ

(xi) දන්ත ප්‍රතිකාර, දන්ත සැත්කම්; සහ/හෝ

(xii) දරු උපත් සම්බන්ධ සංකූලතා, ගබ්සා, දරු උපත් පාලන ප්‍රතිසංගහන ක්‍රම; සහ/හෝ



Specimen

(xiii) වන්ද්‍යභාවය සඳහා කෙරෙන පරීක්ෂණ සහ ඒ සඳහා කෙරෙන ප්‍රතිකාර, නළ දරු උපත් හා ඒ සඳහා කෙරෙන ප්‍රතිකාර, ලිංග විපර්යාසය, පැලෝපීය නාලයේ වන සිඳලීම් හා මාරු කිරීම්, කළල මාරු කිරීම්, තුන්වන පාර්ශවයක් සඳහා වන ස්ත්‍රී බීජ බද්ධය; සහ/හෝ

(xiv) සංජානීය හෝ ප්‍රවේණික රෝග, සංජානීය රෝග හෝ දුබලතාවල ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන; සහ/හෝ

(xv) හදිසි අනතුරක් සිදුවී දින එකසිය අසූව (180) ක් ඇතුළත ඒ හේතුවෙන් ඇතිවන තුවාල සඳහා සිදුකරනු ලබන අංගාරාග සහ ප්ලාස්ටික් (කල්ප්‍ය) ශල්‍යකර්ම හැර, සහ එසේ නැත්නම් සමාගමේ පූර්ණ ලිඛිත අනුමැතිය මත අනතුර මගින් හානි සිදුවී ඇති ශරීර කොටසෙහි කායික ක්‍රියාකාරීත්වය නැවත යථා තතත්වයට පත්කර ගැනීමේ මූලික අරමුණ මත සිදුකරන ප්ලාස්ටික් සැත්කම් (කළින් පැවති රෝග, සංජානීය රෝග ආදී රෝග වලට පමණක් සීමා නොවූ; සහ/හෝ

(xvi) පිළිස්සුම් තුවාල නිසා සිදුවන අවරූපීවීම් සඳහා වන ප්ලාස්ටික් ශල්‍යකර්ම, රූපාලංකාරය සඳහා සිදුකරන්නේනම්; සහ/හෝ

(xvii) සැත්කමක් මගින් පියයුරු තුල ස්ථාපිත කරන ලද ද්‍රව්‍යයන් නැවතත් ස්ථාපිත කිරීම; සහ/හෝ

(xviii) තුන්වන පාර්ශවයන් සඳහා ප්‍රදානය කරන ඉන්ද්‍රීය බද්ධයන්; සහ/හෝ

(xix) වෛද්‍ය හේතූන් මත නොවන ප්‍රතිකාර; සහ/හෝ

(xx) අඥාත හේතුක අපස්මාරය සහ මනෝචිකිත්සක හෝ මානසික රෝග සඳහා කරනු ලබන ප්‍රතිකාර; සහ/හෝ

(xxi) වෛද්‍ය නිගමනයට අනුව හා සැත්කම් ලැයිස්තුවේ අඩංගු වන සැත්කමක් වශයෙන් හැරුණු කොට සිදු කරන සුන්නත් කිරීම; සහ/හෝ

(xxii) රක්ෂණ ඔප්පුවේ ආරම්භක දිනයට පෙර කරනු ලැබූ ශල්‍යකර්මයක් මගින් ස්ථාපිත කරන ලද ද්‍රව්‍යයන් ඉවත් කිරීම; සහ/හෝ

(xxiii) නිල වශයෙන් (ලෝක සෞඛ්‍ය සංවිධානය සහ/හෝ ජාතික මට්ටමින්) පිළිගැනෙන වසංගත රෝග/මුළු රටේ පැතිර පවතින රෝග; සහ/හෝ

(xxiv) ලිංගික ක්‍රියාකාරකම් මගින් පැතිරිය හැකි රෝග; සහ/හෝ

(xxv) අනතුරකින් සිදුවන තුවාලයක් හේතුවෙන් හෝ ඒ හා සමඟම සිදුවන ආසාදනයක් හේතුවෙන් හැර සිදුවන විෂවීමකින්.

Specimen

**උපලේඛණ අංක 3.2.3**

## 3.2.3 පූර්ණ සැත්කම් ප්‍රතිලාභය (CSB)

### 3.2.3.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

පූර්ණ සැත්කම් ප්‍රතිලාභය (CSB) ඇතුලත්වන බව ඔප්පුවෙහි පළමු උපලේඛණයේ II වන කොටසේ සඳහන් වී තිබේනම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්‍ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව සහ පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලටද යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම් සහ මෙම ප්‍රතිලාභය සඳහා අදාළ වාරිකය නියමිත පරිදි ගෙවා තිබේ නම්, රක්‍ෂිතයා හට මෙම උපලේඛණයේ 3.2.3.3 යටතේ ආවරණය වන සැත්කමක් සිදුකර ඇති බවට තහවුරු කිරීමෙන් අනතුරුව, සමාගම විසින් පූර්ණ සැත්කම් ප්‍රතිලාභයට අදාළ රක්‍ෂිත මුදලින් වලංගු ප්‍රතිශතයන් ගණනය කොට එකවර ගෙවනු ලැබේ. උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.2.3.2 ප්‍රතිලාභ අගය

මෙම ප්‍රතිලාභය යටතේ වන සැත්කම් කාණ්ඩයක් මගින් අදාළ සැත්කම ආවරණය වන්නේ නම් සමාගම සෑහීමට පත්වන පරිදි සාක්‍ෂි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සමාගම විසින් පූර්ණ සැත්කම් ප්‍රතිලාභයට අදාළ රක්‍ෂිත මුදලින් වලංගු ප්‍රතිශතයන් ගණනය කොට එකවර ගෙවනු ලැබේ. සැත්කම සිදුකරන අතරතුර හෝ සිදු කිරීමෙන් අනතුරුව සිදුවන කිසිදු වියදමක් සම්බන්ධයෙන් සමාගම වගකීමක් දරනු නොලැබේ. එමෙන්ම රෝහල් ගත වීමෙන් හෝ සැත්කම සිදුකිරීම ආශ්‍රයෙන් පැනනගින ප්‍රතිකාර ක්‍රම සම්බන්ධයෙන් ද සමාගම කිසිදු වගකීමක් දරනු නොලැබේ.

### 3.2.3.3 ආවරණ හිමි නොවන කාලය

පූර්ණ සැත්කම් ප්‍රතිලාභයෙහි වගකීම ආරම්භ වනුයේ:

- පූර්ණ සැත්කම් ප්‍රතිලාභය ආරම්භක දිනයේ සිට; හෝ
- ඔප්පුවේ දින සිට; හෝ
- ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනයේ සිට;

යන දින වලින් අවසන් වරට එළඹෙන සිදුවීමේ සිට දින අනූවකට (90) පසුව වේ. උපලේඛණ අංක "3.2.3.3 ආවරණය වන සැත්කම් කාණ්ඩ" යටතේ දක්වා ඇති "සැත්කම් කාණ්ඩ III" සහ "සැත්කම් කාණ්ඩ IV" මෙයට අදාළ නොවේ.

"සැත්කම් කාණ්ඩ III" සහ "සැත්කම් කාණ්ඩ IV" යටතේ ආවරණය වන සැත්කම් වෙනුවෙන් සමාගමේ වගකීම ආරම්භ වනුයේ;

- පූර්ණ සැත්කම් ප්‍රතිලාභය ආරම්භක දිනයේ සිට; හෝ
- ඔප්පුවේ දින සිට; හෝ
- ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනයේ සිට;

යන දින වලින් අවසන් වරට එළඹෙන සිදුවීමේ සිට, දින තුන්සිය හැට පහකට (365) පසුව වේ.

රක්‍ෂිතයා;

- පූර්ණ සැත්කම් ප්‍රතිලාභය ආරම්භක දිනයේ සිට; හෝ
- ඔප්පුවේ දින සිට; හෝ
- ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනයේ සිට;

යන දින වලින් අවසන් වරට එළඹෙන සිදුවීමන් පසුව හදිසි අනතුරකට භාජනය වීම හේතුවෙන් සිදුකරන

specimen

සැත්කම් සම්බන්ධයෙන් ඉහත "ආවරණ හිමි නොවන කාලය" අදාළ නොවේ.

සැත්කමට හෝ සැත්කම් ක්‍රියාවලියට සෘජුව හෝ වක්‍රව හේතුවන රෝගය/රෝග කාරකය රෝග නිශ්චය කිරීම "ආවරණ හිමි නොවන කාලය" සම්පූර්ණ වීමෙන් පසුව සිදු වී තිබිය යුතුය. එනම්;

- පූර්ණ සැත්කම් ප්‍රතිලාභය ආරම්භක දිනයේ සිට;හෝ
- ඔප්පුවේ දින සිට; හෝ
- ඔප්පුව ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනයේ සිට;

යන දින වලින් අවසන් වරට එළඹෙන සිදුවීමේ දින සිට "සැත්කම් කාණ්ඩ I" සහ"සැත්කම් කාණ්ඩ II" සඳහා දින අනූවකට (90) පසුව රෝග නිශ්චය කළ යුතු වන අතර "සැත්කම් කාණ්ඩ III" සහ "සැත්කම් කාණ්ඩ IV" සඳහා දින තුන්සිය හැට පහකට (365) පසුව රෝග නිශ්චයට එළඹී තිබිය යුතුය. කෙසේ වෙතත් පූර්ණ සැත්කම් ප්‍රතිලාභය (CSB) ඔප්පුව ආරම්භක දිනයට පසුව ඔප්පුවට ඇතුලත් කරන ලද්දේ නම් ඉහතින් සඳහන් කරන ලද දින අනූව (90) ක ආවරණ හිමි නොවන කාලය දින එකසිය අසූව (180) ක් වනු ඇත.

### 3.2.3.4 ආවරණය වන සැත්කම් කාණ්ඩ

පූර්ණ සැත්කම් ප්‍රතිලාභය යටතේ ආවරණය වන සැත්කම් කාණ්ඩ හා ඒ ඒ සැත්කම් කාණ්ඩ සඳහා ගෙවනු ලබන රක්ෂිත මුදලේ ප්‍රතිශතය පහත සඳහන් පරිදි වේ.

යුනියන් සුවමග ප්‍රතිලාභය (SMB) යටතේ ආවරණය වන සැත්කම් මෙම ප්‍රතිලාභය යටතේ විශේෂයෙන් බැහැර කර ඇත.

#### 3.2.3.4.1 සැත්කම් කාණ්ඩ I (රක්ෂිත මුදලින් 100%)

සුදුසුකම් ලත් ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් සිදු කරනු ලබන පහත සඳහන් සැත්කම් හෝ සැත්කම් ක්‍රියාවලීන් වෙනුවෙන් පූර්ණ සැත්කම් ප්‍රතිලාභයට (CSB) අදාළ රක්ෂිත මුදලින් 100% ක ප්‍රතිශතයක් වෙනුවෙන් හිමිකම් පෑ හැකිය.

(i) මස්තිෂ්ක/සුෂුම්නා, ධමනි හා ශිරා ආශ්‍රිත විකෘතිතාවයන් හෝ මස්තිෂ්ක රුධිරවාහිනි විස්ථාරනයන් නිවැරිදි කිරීමේ ශල්‍යකර්ම (Repairing Cerebral or Spinal Arterio Venous malformations or Cerebral Aneurysms)

(ii) පෙනහලු ඉවත් කිරීමේ ශල්‍යකර්මය (Total Lung resection including Pneumonectomy or Pleuropneumonectomy)

(iii) පිටියුටරි ග්‍රන්ථිය හෝ පීනයිල් ග්‍රන්ථිය ඉවත්කිරීමේ ශල්‍යකර්මය (Excision of Pituitary or Pineal glands)

(iv) කාලික පරිකන්තුකදාහය (පරිහෘද පටක වල සිදුවන ආසාදනයක්) හේතුවෙන් සිදුකෙරෙන පරිහෘද පටක ඉවත් කිරීමේ ශල්‍යකර්මය (Pericardectomy done in chronic constrictive Pericarditis)

(v) ආමාශය හා අන්නස්‍රෝතය ඉවත් කිරීමේ ශල්‍යකර්මය (Excision of Oesophagus and Stomach)

#### 3.2.3.4.2 සැත්කම් කාණ්ඩ II (රක්ෂිත මුදලින් 50%)

සුදුසුකම් ලත් ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් සිදුකරනු ලබන එහෙත්, "සැත්කම් කාණ්ඩ I" යටතට අදාළ නොවන, ශරීර කුහර එකක් හෝ වැඩි ප්‍රමාණයක් විවෘත කිරීමෙන් සිදුකරන අභ්‍යන්තර ඉන්ද්‍රියන්හි සැත්කමක් ලෙස අර්ථ දැක්විය හැකි (උදාහරණ ලෙස උරස් කුහරය, උදර කුහරය, කපාල කුහරය හා ශ්‍රෝණි කුහරය) ශල්‍යකර්මයන් මෙම කාණ්ඩය යටතේ ආවරණය වේ. යුනියන් සුවමග ප්‍රතිලාභය (SMB) යටතේ හිමිකම් සඳහා සුදුසුකම් නොලබන කිරීටක ධමනි ශල්‍යකර්මය (Percutaneous Tranluminal Coronary Angioplasty/ PTCA) සහ බයිපාස් සැත්කම ද (Coronary Artery Bypass Graft/CABG) මේ යටතේ ආවරණය වේ.

Specimen

කෙසේ නමුත් "සැත්කම් කාණ්ඩ III" යටතේ ආවරණය වන සැත්කම් හා සැත්කම් ක්‍රියාවලීන් මෙම කාණ්ඩය යටතේ බැහැර කෙරේ.

මෙම කාණ්ඩය යටතට ගැනෙන සැත්කම් හා සැත්කම් ක්‍රියාවලීන් වෙනුවෙන් පූර්ණ සැත්කම් ප්‍රතිලාභයේ රක්ෂිත මුදලින් 50% ක ප්‍රමාණයක් ගෙවනු ලබයි.

### 3.2.3.4.3 සැත්කම් කාණ්ඩ III (රක්ෂිත මුදලින් 15%)

සාර්ව, කණ්ඨකීය (කශේරුකා) හෝ ස්ථානීය නිර්වින්දනය යටතේ පිළිගත් රෝහලක වෛද්‍යවරයෙකු විසින් සිදුකරනු ලබන පහතින් දක්වා ඇති ශල්‍යකර්මයන් සහ සැත්කම් ක්‍රියාවලීන් මෙම කාණ්ඩය යටතේ ආවරණය වේ. මෙම සැත්කම් කාණ්ඩය යටතට ගැනෙන සැත්කම්/සැත්කම් ක්‍රියාවලීන් වෙනුවෙන් පූර්ණ සැත්කම් ප්‍රතිලාභයේ රක්ෂිත මුදලින් 15% ක ප්‍රමාණයක් වෙනුවෙන් හිමිකම් පෑ හැකිය.

**Microsurgical operations on the middle ear**

1 Stapedectomy
2 Revision of a Stapedectomy
3 Other operations on the Auditory Ossicles
4 Myringoplasty (Type -I Tympanoplasty)
5 Tympanoplasty (closure of an eardrum perforation/reconstruction of the Auditory Ossicles)
6 Revision of a Tympanoplasty

**Other operations on the middle & internal ear**

7 Removal of a Tympanic drain
8 Incision of the Mastoid process and middle ear
9 Reconstruction of the middle ear
10 Other excisions of the middle and inner ear
11 Fenestration of the inner ear
12 Revision of a fenestration of the inner ear
13 Incision (opening) and destruction (elimination) of the inner ear
14 Other operations on the middle and inner ear

**Operations on the nose & the nasal sinuses**

15 Excision and destruction of diseased tissue of the nose
16 Operations on the turbinates (nasal concha)
17 Other operations on the nose

**Operations on the eyes**

18 Incision of tear glands
19 Other operations on the tear ducts
20 Incision of diseased eyelids
21 Excision and destruction of diseased tissue of the eyelid
22 Incision of diseased eyelids
23 Operations on the canthus and epicanthus

Specimen

24 Corrective surgery for entropion and ectropion
25 Corrective surgery for blepharoptosis
26 Removal of a foreign body from the conjunctiva
27 Removal of a foreign body from the cornea
28 Incision of the cornea
29 Operations for pterygium
30 Other operations on the cornea
31 Removal of a foreign body from the lens of the eye
32 Removal of a foreign body from the posterior chamber of the eye
33 Removal of a foreign body from the orbit and eyeball

**Operations on the skin & subcutaneous tissues**

34 Incision of a pilonidal sinus
35 Free skin transplantation, donor site
36 Free skin transplantation, recipient site

**Operations on the tongue**

37 Incision, excision and destruction of diseased tissue of the tongue
38 Partial glossectomy
39 Glossectomy
40 Reconstruction of the tongue
41 Other operations on the tongue

**Operations on the salivary glands & salivary ducts**

42 Incision and lancing of a salivary gland and a salivary duct
43 Excision of diseased tissue of a salivary gland and a salivary duct
44 Resection of a salivary gland
45 Reconstruction of a salivary gland and a salivary duct
46 Other operations on the salivary glands and salivary ducts

**Other operations on the mouth & face**

47 Incision of the hard and soft palate
48 Excision and destruction of diseased hard and soft palate
49 Incision, excision and destruction in the mouth
50 Plastic surgery to the floor of the mouth

**Operations on the tonsils & adenoids**

51 Transoral incision and drainage of a pharyngeal abscess
52 Tonsillectomy without adenoidectomy

Specimen

53 Tonsillectomy with adenoidectomy
54 Excision and destruction of a lingual tonsil

**Trauma surgery and orthopaedics**

55 Incision on bone, septic and aseptic
56 Closed reduction on fracture, luxation or epiphyseolysis with osteosynthesis
57 Suture and other operations on tendons and tendon sheath
58 Reduction of dislocation under GA

**Operations on the digestive tract**

59 Division of the anal sphincter (sphincterotomy)
60 Other operations on the anus
61 Ultrasound guided aspirations
62 Cholecystectomy
63 Appendicectomy
64 Herniotomy/plasty
65 Haemorrhoidectomy

**Operations on the female sexual organs**

66 Incision of the ovary
67 Insufflation of the fallopian tubes
68 Other operations on the fallopian tube
69 Dilatation of the cervical canal
70 Conisation of the uterine cervix
71 Other operations on the uterine cervix
72 Incision of the uterus (hysterotomy)
73 Therapeutic curettage
74 Culdotomy
75 Incision of the vagina
76 Local excision and destruction of diseased tissue of the vagina and the pouch of Douglas
77 Incision of the vulva
78 Hysterectomy

**Operations on the prostate & seminal vesicles**

79 Prostatectomy
80 Transurethral and percutaneous destruction of prostate tissue
81 Open surgical excision and destruction of prostate tissue
82 Radical prostatovesiculectomy
83 Other excision and destruction of prostate tissue

Specimen

84 Operations on the seminal vesicles

85 Incision and excision of periprostatic tissue

**Operations on the scrotum & tunica vaginalis testis**

86 Incision of the scrotum and tunica vaginalis testis

87 Excision and destruction of diseased scrotal tissue

88 Plastic reconstruction of the scrotum and tunica vaginalis testis

89 Other operations on the scrotum and tunica vaginalis testis

**Operations on the testes**

90 Incision of the testes

91 Excision and destruction of diseased tissue of the testes

92 Unilateral orchidectomy

93 Bilateral orchidectomy

94 Orchidopexy

95 Abdominal exploration in cryptorchidism

96 Surgical repositioning of an abdominal testis

97 Reconstruction of the testis

98 Implantation, exchange and removal of a testicular prosthesis

**Operations on the spermatic cord, epididymis and ductus deferens**

99 Excision in the area of the epididymis

100 Epididymectomy

101 Reconstruction of the spermatic cord

102 Reconstruction of the ductus deferens and epididymis

103 Other operations on the spermatic cord, epididymis and ductus deferens

**Operations on the penis**

104 Local excision and destruction of diseased tissue of the penis

105 Amputation of the penis

106 Plastic reconstruction of the penis

**Operations on the urinary system**

107 Cystoscopical removal of stones

**Other Operations**

108 Lithotripsy

109 Coronary angiography

110 Haemodialysis

111 Radiotherapy for Cancer

112 Cancer Chemotherapy

සැත්කම් ලැයිස්තුවේ අවසානය

Specimen

### 3.2.3.4.4 සැත්කම් කාණ්ඩ IV (රක්ෂිත මුදලින් 10%)

ඉහත 3.2.3.3.1, 3.2.3.3.2 සහ 3.2.3.3.3 සැත්කම් කාණ්ඩ යටතේ ආවරණය නොවන සැත්කම් හෝ සැත්කම් ක්‍රියාවලීන් මේ යටතේ ආවරණය වේ. මේ යටතේ ආවරණය වන සැත්කම්/සැත්කම් ක්‍රියාවලීන් වෙනුවෙන් පූර්ණ සැත්කම් ප්‍රතිලාභයේ රක්ෂිත මුදලින් 10% ක ප්‍රමාණයක් වෙනුවෙන් හිමිකම් පෑ හැකිය.

### 3.2.3.5 වාර මුදල් හා කොන්දේසි සංශෝධනය කිරීම

මෙම ඔප්පුවේ පළමු උපලේඛණයේ II කොටසේ දක්වා ඇති පූර්ණ සැත්කම් ප්‍රතිලාභය යටතේ ගෙවිය යුතු වාරික මුදල සහතික කරනු ලබන්නේ මෙම ප්‍රතිලාභය ආරම්භ කළ දින සිට වසර එක (01) ක කාලයක් සඳහා පමණි. රක්ෂිතයා වෙත දින තිහ (30) ක පූර්ව දැනුම් දීමකින් පසුව වාරික මුදල් හෝ අදාළ කොන්දේසි සංශෝධනය කිරීමේ අයිතිය සමාගම සතුය. එවැනි ප්‍රතිශෝධන බලපවත්වනු ලබන්නේ ඊළග ඔප්පු සංවත්සර දිනයේ සිටය.

### 3.2.3.6 රැකියාවේ වෙනස් වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීමේ දින සිට දින දහ හතර (14) ක් ඇතුළත ඒ බව සමාගම වෙත ලිඛිතව දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කර ගත යුතුය. සැත්කම සිදුකරන අවස්ථාවේදී ජීවිත රක්ෂිතයාගේ යෝජනා පත්‍රයේ හෝ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් රැකියාවට වඩා සැලකිය යුතු අන්දමින් වෙනස් වූ රැකියාවක නිරත වීමෙන් පැන නගින්නා වූ හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

### 3.2.3.7 හිමිකම්පෑම පිළිබඳ දැන්වීම හා සනාථ කිරීම

පූර්ණ සැත්කම් ප්‍රතිලාභ යටතේ ආවරණය වන සැත්කම සඳහා හිමිකමක් සලකා බැලීමට ඒ සඳහා රෝහල් ගත කිරීමෙන් වැඩ කරන දින තුනක් (03) ඇතුළත සමාගමේ ප්‍රධාන කාර්යාලය හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

එවැනි දැනුම් දීමකින් අනුතුරුව සමාගම විසින් හිමිකම්පෑමක් සඳහා අවශ්‍ය වන පෝරම නිකුත් කරනු ලැබේ. එම පෝරම නියමිත පරිදි සම්පූර්ණ කොට වැඩ කරන දින දහයක් (10) ඇතුළත නැවත සමාගම වෙත ඉදිරිපත් කළ යුතු වේ. සිදුකරන ලද සැත්කම සනාථ කිරීම සඳහා වන පිළිගත හැකි සාක්ෂි රක්ෂිතයාගේ වියදමින් සමාගම වෙත ඉදිරිපත් කල යුතුවේ.

ආවරණය වූ තැනැත්තා ප්‍රතිකාර සම්බන්ධයෙන් වගකීම දරණ විශේෂඥ වෛද්‍යවරයා විසින් දෙනු ලබන උපදෙස් නියමාකාරයට අනුගමනය කළ යුතු වන අතර සැත්කමට අදාළ සම්පූර්ණ විස්තර සමාගමට සැපයිය යුතුවේ.

ආවරණය වූ තැනැත්තා සහ ඔහු හෝ ඇයගේ ඥාතීන් හෝ පැවතෙන්නන් සමාගමේ අනුමැතිය මත සමාගම නියෝජනය කරන විශේෂඥයන්ගේ පැමිණීම හා විමසීම සඳහා අවසර දිය යුතු වන අතර එම විශේෂඥයන්ගේ රාජකාරීමය රහස්‍යභාවය රැකීමේ වගකීමෙන් ඔවුන් නිදහස් වේ.

ආවරණය වූ තැනැත්තා හිමිකමක් පැන නැගුනු විටකදී සමාගම විසින් සඳහන් කරන ලද ක්‍රියා පිළිවෙල අනුගමනය නොකරන්නේ නම් මෙම ප්‍රතිලාභය යටතේ වන හිමිකම් නිශ්ප්‍රභා කිරීමේ බලය සමාගම වෙත හිමිවේ.

### 3.2.3.8 කොන්දේසි

(i) පූර්ණ සැත්කම් ප්‍රතිලාභය පහත සඳහන් අවස්ථාවලදී අහෝසි වේ.

(අ) මෙහි පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල්පිරීමේ දිනයේ දී හෝ ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දින හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන දෙකෙන් කළින් එළඹෙන සිදුවීමේදී; සහ/හෝ

Specimen

(ආ) සඳහන් කරන ලද උපරිම ප්‍රතිලාභ, මෙම ආවරණය යටතේ සඳහන් කර ඇති ඕනෑම සැත්කමක් වෙනුවෙන් ගෙවා ඇති විටෙකදී; කෙසේ නමුත් කලත්‍රයා මෙම ප්‍රතිලාභ යටතේ ආවරණය වන්නේ නම්, මෙම ප්‍රතිලාභය යටතේ අදාළ හිමිකම් මුදල ලබා නොගත් ජීවිතය වෙනුවෙන් නියමිත වාරිකය ගෙවා ඉදිරියට පවත්වාගෙන යා හැක.

(ii) වාරික ගෙවීම සඳහා වාරික ගෙවීමට නියමිත දිනයේ සිට දින තිහ (30) ක අනුග්‍රාහක කාලසීමාවක් ලබා දෙනු ලැබේ. එම අනුග්‍රාහක කාලසීමාව තුළ වාරිකය නොගෙවුවහොත් පූර්ව දැනුම්දීමකින් තොරව මෙම ප්‍රතිලාභය අප්‍රාණික (අහෝසි) වන අතර එවැනි අවස්ථාවක මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකම් ගෙවීමට සමාගම බැඳී නොමැත. එසේ අනුග්‍රාහක කාලසීමාව පසුවී වාරික ගෙවීම් කරන අවස්ථාවක ඔප්පුව අප්‍රාණික වී නැවත ප්‍රතිෂ්ඨාපනයක් සිදුවන අතර ඉහත 3.2.3.2.3 යටතේ "ආවරණ හිමි නොවන කාලය" එදින සිට නැවත බලපැවැත්වේ.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය

(අ) ලාභ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ, ගෙවා නිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට මෙම පූර්ණ සැත්කම් ප්‍රතිලාභය යටතේ හිමිකම් ලබාගැනීමේ අයිතිවාසිකමක් නොමැත. මෙම ප්‍රතිලාභය මගින් ආවරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා, ඉන්දිය සහ සිංගප්පූරු දේශ සීමා තුළ සිදුකරන ලද සැත්කම් පමණි. එමෙන්ම එම සැත්කමට සෘජුව හෝ වක්‍රව හේතු වු අදාළ රෝග තත්ත්වය නිශ්චය කිරීමට ශ්‍රී ලංකාව, ඉන්දියාව හෝ සිංග ප්පූරු දේශ සීමා තුළ සිදුවී තිබිය යුතුය.

(vi) එක් සැත්කම් විවෘත කිරීමක් මඟින් සැත්කම් එකකට වැඩි සංඛ්‍යාවක් සිදු කරන ලද විටකදී සමාගම විසින් ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ වැඩිම ප්‍රතිශතයක් හිමි සැත්කම සඳහා පමණි.

(vii) එකම සැත්කම් ක්‍රියාවලියකදී සැත්කම් එකකට වැඩි ප්‍රමාණයක් විවිධ විවෘත කිරීම් මගින් සිදුකල විටකදී සමාගම විසින් ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ වැඩිම ප්‍රතිශතයක් හිමි සැත්කම සඳහා වන අතර අනෙකුත් සෑම සැත්කමක් වෙනුවෙන්ම එයට නියමිත අගයෙන් සියයට විසිපහක් (25%) පමණක් ගෙවනු ලැබේ.

(viii) එක් ඔප්පු වර්ෂයක් තුලදී එක් පුද්ගලයෙකු වෙනුවෙන් ලබාගත හැකි උපරිම ප්‍රතිලාභය පූර්ණ සැත්කම් ප්‍රතිලාභ රක්ෂිත මුදලින් සියයට සීයයක් (100%) ඉක්මවිය නොහැකිය.

(ix) රක්ෂණ ඔප්පු හිමියෙකුට ඔප්පු කාලය තුලදී ඕනෑම සැත්කම් ප්‍රමාණයක් වෙනුවෙන් හිමිකම් පෑ හැකි නමුත් එකම සැත්කම සම්බන්ධයෙන් දෙවරක් හිමිකම් ඉදිරිපත් කළ නොහැකිය.

(x) රක්ෂණ ඔප්පු හිමියෙකුට ඔප්පු කාලය තුලදී සැත්කම් සඳහා ගෙවිය හැකි සම්පූර්ණ ප්‍රතිලාභය පූර්ණ සැත්කම් ප්‍රතිලාභයේ රක්ෂිත මුදලෙහි තුන් (03) ගුණයකට හෝ උපරිම රුපියල් ලක්ෂ පහළොව (රු.1,500,000/-) යන දෙකෙන් අවම අගයට සීමා වේ. ඉන් අනතුරුව මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු සැත්කමක් වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවනු නොලැබේ.

(xi) සියළුම රක්ෂණ ඔප්පු මගින් එක් පුද්ගලයෙකු වෙනුවෙන් ලබාගත හැකි උපරිම පූර්ණ සැත්කම් ප්‍රතිලාභ රක්ෂිත මුදල රුපියල් හත් ලක්ෂ පනස් දහස (රු.750,000/-) ඉක්මවිය නොහැකිය.

(xii) ජීවිත රක්ෂිතයාගේ ජීවිත කාලය තුලදී මෙම ප්‍රතිලාභය වෙනත් අයෙකුට පැවරීමට හෝ මෙම ප්‍රතිලාභය වෙනුවෙන් නාමිකයෙකු පත්කිරීමට හෝ කලත්‍රයාට බලයක් නොමැත.

Specimen

### 3.2.3.9 පූර්ණ සැත්කම් ප්‍රතිලාභය සඳහා බලපැවැත්වෙන බැහැර කිරීම්

පූර්ණ සැත්කම් ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතු වූ සිද්ධිය හෝ රෝග තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම් මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) කලින් තිබූ රෝගී තත්ත්වයක් හෝ තුවාල හෝ එවන් තත්ත්වයන් රක්ෂිතයා ජීවිත රක්ෂණ යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කර ඔප්පුව ආරම්භක දිනට හෝ ඊට පෙර රක්ෂණ ඔප්පුව මගින් හෝ වෙනයම් තහවුරු ලිපියක් මගින් සමාගම විසින් ලිඛිතව පිළිගෙන තිබේනම් හැර; සහ/හෝ

(iv) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(v) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිද්‍රෝශයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල ; සහ/හෝ

(vi) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vii) න්‍යෂ්ටික අනතුරු උදා: න්‍යෂ්ටික බල ශක්තියට නිරාවරණය වීම, (විකිරණශීලීතා දූෂණය, න්‍යෂ්ටික බද්ධය, විබද්ධය) හෝ ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යක් නිසා හෝ රසායනික දූෂණය හේතුවෙන්; සහ/හෝ

(viii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මගින් පැනීම, හැංග් ග්ලයිඩින්, කඳු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජි පැනීම, පොතොලින්, දඩයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්; සහ/හෝ

(ix) ස්වාභාවික අනතුරු පහත සඳහන් ස්වාභාවික අනතුරු වලට පමණක් සීමා නොවූ අයිස් කඳු කඩා වැටීම්, නාය යෑම්, භූමි කම්පා, ගංවතුර, භූමි කම්පා හෝ ගිණිකඳු පිපිරීම් මගින් ඇතිවන සුනාමි හෝ උදම් රළ තත්ත්වයන්, සුළිසුළං, ධාරානිපාත වර්ෂාව, හරිකේන්, ටෝනාඩෝ හා ටයිෆුන් වැනි ස්වාභාවික විපත්; සහ/හෝ

(x) රෝග නිධානයන් තහවුරු කර ගැනීමේ බලාපොරොත්තුවෙන් සිදුකරන පරීක්ෂා කිරීම් සඳහා වන ප්‍රතිකාර (බයොප්සි, එන්ඩොස්කොපි, ලැප්රොස්කොපි, අර්ත්‍රොස්කොපි) ආදී; සහ/හෝ

(xi) දෘෂ්ටිය නිවැරදි කිරීමේ සැත්කම්, ඇස් කණ්නාඩි, කාච, ශ්‍රවණාධාර සම්පාදනය හා සවි කිරීම්, දන්ත ප්‍රතිකාර, දන්ත සැත්කම්; සහ/හෝ

(xii) ස්වභාවිකව ශරීරයේ සිදුවන වෙනස්කම් සඳහා කරන සැත්කම් (ආර්තවහරණය) දරු උපත් හා ඒ සම්බන්ධ සංකූලතා, ගබ්සා, දරු උපත් පාලන ප්‍රතිසංගහන ක්‍රම; සහ/හෝ

Specimen

(xiii) වන්ද්‍යභාවය සඳහා කෙරෙන පරීක්ෂණ සහ ඒ සඳහා කෙරෙන ප්‍රතිකාර, නළ දරු උපත් හා ඒ සඳහා කෙරෙන ප්‍රතිකාර, ලිංග විපර්යාසය, පැලෝපීය නාලයේ වන සිඳලීම් හා මාරු කිරීම්, කළල මාරු කිරීම්, තුන්වන පාර්ශවයක් සඳහා වන ස්ත්‍රී බීජ බද්ධය; සහ/හෝ

(xiv) සංජානීය හෝ ප්‍රවේණික රෝග, සංජානීය රෝග හෝ දුබලතාවල ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන; සහ/හෝ

(xv) හදිසි අනතුරක් සිදුවී දින එකසිය අසූව (180) ක් ඇතුළත ඒ හේතුවෙන් ඇතිවන තුවාල සඳහා සිදුකරනු ලබන අංගාරාග සහ ප්ලාස්ටික් (කල්ප්‍ය) ශල්‍යකර්ම හැර, සහ එසේ නැත්නම් සමාග මේ පූර්ණ ලිඛිත අනුමැතිය මත අනතුර මගින් හානි සිදුවී ඇති ශරීර කොටසෙහි කායික ක්‍රියාකාරීත්වය නැවත යථා තතත්වයට පත්කර ගැනීමේ මූලික අරමුණ මත සිදුකරන ප්ලාස්ටික් සැත්කම් (කළින් පැවති රෝග, සංජානීය රෝග ආදී රෝග වලට පමණක් සීමා නොවූ; සහ/හෝ

(xvi) පිළිස්සුම් තුවාල නිසා සිදුවන අවරූපීවීම් සඳහා වන ප්ලාස්ටික් ශල්‍යකර්ම, රූපාලංකාරය සඳහා සිදුකරන්නේනම්; සහ/හෝ

(xvii) සැත්කමක් මගින් පියයුරු තුල ස්ථාපිත කරන ලද ද්‍රව්‍යයන් නැවතත් ස්ථාපිත කිරීම; සහ/හෝ

(xviii) තුන්වන පාර්ශවයන් සඳහා ප්‍රදානය කරන ඉන්ද්‍රීය බද්ධයන්; සහ/හෝ

(xix) වෛද්‍ය හේතූන් මත නොවන ප්‍රතිකාර ක්‍රම හෝ සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකු විසින් නිර්දේශ නොකරන ලද සැත්කම් හා එහි ප්‍රතිඵලයන් ලෙස ඇති වූ රෝගාබාධ හෝ අනතුරු; සහ/හෝ

(xx) අඥාත හේතුක අපස්මාරය සහ මනෝචිකිත්සක හෝ මානසික රෝග සඳහා කරනු ලබන ප්‍රතිකාර; සහ/හෝ

(xxi) ස්ථූලත්වය සඳහා කරනු ලබන සැත්කම් හෝ ප්‍රතිකාර සම, පටක හෝ සන්ධි වලට හටන්නා ප්‍රධාහයන් විවෘත කිරීම; සහ/හෝ

(xxii) චර්ම සුවිකරණය; සහ/හෝ

(xxiii) යෝනි පටක හා අනෙකුත් සුන්නත් කිරීමේ සහ ප්‍රකෘතිමත් කිරීම; සහ/හෝ

(xxiv) රක්ෂණ ඔප්පුවේ ආරම්භක දිනයට පෙර කරනු ලැබූ ශල්‍යකර්මයක් මගින් ස්ථාපිත කරන ලද ද්‍රව්‍යයන් ඉවත් කිරීම; සහ/හෝ

(xxv) නිල වශයෙන් (ලෝක සෞඛ්‍ය සංවිධානය සහ/හෝ ජාතික මට්ටමින්) පිළිගැනෙන වසංගත රෝග/මුළු රටේ පැතිර පවතින රෝග ; සහ/හෝ

(xxvi) ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග (ලිංගික රෝග) ඒඩ්ස් සහ ඒඩ්ස් සම්බන්ධ රෝග; සහ/හෝ

(xxvii) අනතුරකින් සිදුවන තුවාලයක් හේතුවෙන් හෝ ඒ හා සමඟම සිදුවන ආසාදනයක් හේතුවෙන් හැර සිදුවන විෂවීමකින්; සහ/හෝ

(xxviii) රැකියාවේදී සිදුවන අනතුරු හා රැකියාව මගින් ඇතිවන රෝගාබාධ; සහ/හෝ

(xxix) ස්වාභාවිකව නොපැතිරෙන පිළිකාව හා පැතිරෙන මාත්සරික මෙලනොමාව හැර අනෙකුත් සියළුම චර්ම පිළිකා; සහ/හෝ

(xxx) සුදුසුකම් නොලත් වෛද්‍යවරයෙකු/ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් කරනු ලැබූ ප්‍රතිකාර හෝ රක්ෂිතයාගේ සම වෘත්තිකයෙකු විසින් දෙන ලද වෛද්‍ය සේවාවක් සම්බන්ධයෙන් හෝ රක්ෂිතයාගේ පවුලේ සාමාජිකයෙකු කලත්‍රයා, සහෝදරයා, සහෝදරිය, දෙමව්පියන් හෝ දරුවෙකු විසින් දෙන ලද වෛද්‍ය සේවාවන් සම්බන්ධයෙන්; සහ/හෝ

(xxxi) විෂම චිකත්සා ඖෂධ සහ ආයුර්වේද ප්‍රතිකාර.

Specimen

**උපලේඛන අංක 3.2.4**

## 3.2.4 යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් (USHP)

### 3.2.4.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් (USHP) අදාළ වන්නේ එම ප්‍රතිලාභය ඇතුළත් බවට පළමු උපලේඛනයේ දෙවන කොටසේ සඳහන් වන්නේ නම් පමණි.

යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ හිමිකම් ගෙවීම සලකා බලනුයේ

(i) පළමු උපලේඛනයේ පරිදි මෙම ආවරණය යටතේ ආවරණය වී ඇති තැනැත්තා රෝගයක් හෝ හදිසි අනතුරක් හේතුවෙන් වෛද්‍යවරයකුගේ නිර්දේශය හා අනුමැතිය ඇතිව පෞද්ගලික හෝ රජයේ රෝහලක අඛණ්ඩව පැය විසි හතරකට (24) වැඩි කාලයක් රෝහල් ගතව සිටියේ නම් සහ/හෝ මෙහි 3.2.4.4 කොටසේ නිර්වචනය කර ඇති සැත්කමක් සිදුකලේ නම් සහ රෝහල් ගාස්තු සහ ප්‍රතිකාර සඳහා වියදම් දරා ඇති විටකදී සහ/හෝ

(ii) ආවරණය හිමි පුද්ගලයා කිසියම් රෝගයක් හෝ හදිසි අනතුරක් නිසා, වෛද්‍යවරයකුගේ නිර්දේශය හා අනුමැතිය ඇතිව අවම වශයෙන් පැය විසි හතරක (24) කාලයක් රජයේ රෝහලක මුදල් නොගෙවන වාට්ටුවක අඛණ්ඩව ප්‍රතිකාර ලැබීමට සිදුවන අවස්ථාවකදී මෙම ලේඛනයේ 3.2.4.2.2 කොටසේ දක්වා ඇති පරිදි රෝහල් දීමනා ප්‍රතිලාභය හිමි වේ.

මෙම ආවරණය ඔප්පුවේ පොදු විධිවිධාන, කොන්දේසි හා බැහැරකිරීම් වලට සහ පහත දක්වා ඇති විශේෂ විධිවිධාන, කොන්දේසි හා බැහැර කිරීම් වලට යටත් වේ. උපලේඛන අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.2.4.2 ප්‍රතිලාභ අගය

ඔප්පුවේ පළමු උපලේඛනයේ සහ පහත දක්වා ඇති ප්‍රතිලාභ වගුවෙහි සඳහන් සීමාවන්ට යටත්ව සමාගම රෝහල් ගාස්තු පියවීම වෙනුවෙන් වැයවු වියදම් ප්‍රතිපූරණය කරනු ලබයි. රෝහල් ගතවු බවට සහ/හෝ සැත්කමක් සිදුකළ බවට ඔප්පු කිරීම සඳහා (සමාගම සෑහීමකට පත්වන පරිදි) සාක්ෂි ඉදිරිපත් කළ විට අදාළ මුදල එකවර ගෙවනු ලැබේ. රෝහල් ගතව ලැබු ප්‍රතිකාර නිසා හෝ සැත්කමක් නිසා හෝ සැත්කමකට පසුව පැන නගින හෝ සංකූලතා වෙනුවෙන් සමාගම වගකීමක් දරන්නේ නැත.

ඔප්පු හිමියෙකුට, රෝහල් ගතවන ඕනෑම වාර ගණනක් වෙනුවෙන් යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑ හැකි අතර, ආවරණය වන තැනැත්තාට අදාල වන වාර්ෂික ප්‍රතිලාභ සීමාවන් නොඉක්ම වන පරිදි සමාගම විසින් අදාළ හිමිකම් මුදල් ගෙවනු ලබයි.

ප්‍රතිලාභය ලබාගෙන ඇත්තේ පවුල් ඒකකයක් ලෙස නම්, එම පවුල සඳහා අදාළ වන වාර්ෂික සමස්ත ප්‍රතිලාභ සීමාව (මෙම ප්‍රතිලාභය යටතේ සඳහන් කර ඇති රක්ෂිත මුදලේ වටිනාකමට සමාන වේ) ප්‍රථම උපලේඛනයේ සඳහන් ආකාරයට පළමු ජීවිත රක්ෂිතයා, ඔහුගේ/ඇයගේ දෙමාපියන්, ඔහුගේ/ඇයගේ සහකාරිය/සහකරු සහ අවුරුදු 23 ට අඩු දරුවන් අතර බෙදී යයි. එක් පුද්ගලයකු සඳහා සමාගමේ යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර්, යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්ලස්, යූනියන් ස්මාර්ට් හෙල්ත් සහ යූනියන් මෙඩිගාඩ් ප්‍රතිලාභ යටතේ ලබාගන්නා සියලුම රක්ෂණ සැලසුම් සඳහා වන සමස්ත උපරිම රක්ෂිත මුදල රු. මිලියන හතලිහක (රු. 40,000,000/-) සීමාවට යටත් වේ.

Specimen

### 3.2.4.2 (i) ප්‍රතිලාභ වගුව

| | ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | සැලසුම 1 | සැලසුම 2 | සැලසුම 3 | සැලසුම 4 | සැලසුම 5 | සැලසුම 6 | සැලසුම 7 | සැලසුම 8 | සැලසුම 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආවරණය වන රටවල්** | **ශ්‍රී ලංකාව** | | | | | | | | |
| | **වාර්ෂික සමස්ථ සීමාව - මූලික වාර්ෂික රක්ෂණ මුදල** | **රු.** 100,000/- | **රු.** 200,000/- | **රු.** 300,000/- | **රු.** 400,000/- | **රු.** 500,000/- | **රු.** 750,000/- | **රු.** 1,000,000/- | **රු.** 1,250,000/- | **රු.** 1,500,000/ |
| | **විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන්** | | | | | | | | | |
| 1 | **රෝහල්ගතවීමේ ප්‍රතිලාභය** | **මූලික වාර්ෂික රක්ෂිත මුදලෙන් 30% ක උපරිමයකට යටත්ව රෝහල් කාමර ගාස්තු සහ දැඩි සත්කාර ඒකක ගාස්තු ගෙවනු ලැබේ** | | | | | | | | |
| | (අ) දෛනික රෝහල් දීමනා ප්‍රතිලාභය | | | | | | | | | |
| | ශ්‍රී ලංකාව තුළ උපරිම දෛනික රෝහල් කාමර ගාස්තු - ප්‍රතිලාභ මුදලින් 2% | **රු.** 2,000/- | **රු.** 4,000/- | **රු.** 6,000/- | **රු.** 8,000/- | **රු.** 10,000/- | **රු.** 15,000/- | **රු.** 20,000/- | **රු.** 25,000/- | **රු.** 30,000/- |
| | ශ්‍රී ලංකාවෙන් පිටත උපරිම දෛනික රෝහල් කාමර ගාස්තු | අදාළ නැත | | | | | | | | |
| | (ආ) දෛනික දැඩි සත්කාර ඒකක ගාස්තු ප්‍රතිලාභය | | | | | | | | | |
| | ශ්‍රී ලංකාව තුළ උපරිම දෛනික දැඩි සත්කාර සේවා ගාස්තු - ප්‍රතිලාභ මුදලින් 4% | **රු.** 4,000/- | **රු.** 8,000/- | **රු.** 12,000/- | **රු.** 16,000/- | **රු.** 20,000/- | **රු.** 30,000/- | **රු.** 40,000/- | **රු.** 50,000/- | **රු.** 60,000/- |
| | ශ්‍රී ලංකාවෙන් පිටත උපරිම දෛනික දැඩි සත්කාර සේවා ගාස්තු | wod< ke; | | | | | | | | |
| 2 | සැත්කම් ප්‍රතිලාභ (ශල්‍ය වෛද්‍ය, නිර්වින්දන වෛද්‍ය, වෛද්‍ය, උපදේශක වෛද්‍ය, විශේෂඥ වෛද්‍ය ගාස්තු සහ සත්කාර සේවා ඇතුළත් වේ). | රටේ සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු, අයකරනු ලබන පරිදි ආවරණය වේ. | | | | | | | | |
| 3 | අනෙකුත් රෝහල් සේවා සහ සැපයුම් ප්‍රතිලාභය (වෛද්‍ය නොවන සේවාවන් හැර, ශල්‍යාගාර ගාස්තු, නිර්වින්දන, රුධිරය, ඔක්සිජන් සහ ඖෂධ ඇතුළත් වේ) | i. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු, අයකරනු ලබන පරිදි ආවරණය වේ. | | | | | | | | |
| 4 | **ගිලන්රථ ගාස්තු** | i. මූලික රක්ෂිත මුදලින් 2% ක උපරිමයකට යටත්ව, අයකරනු ලබන පරිදි<br>ii. ලියාපදිංචි ගිලන්රථ සේවාවක් භාවිතා කරන ලද අවස්ථාවකදී සහ අදාල රෝහල්ගතවීම සඳහා යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ආවරණය යටතේ හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් සහ හිමිකම් මුදල් ඉල්ලීම පිළිගත හැකි නම් පමණක්, වසරකට එක වරක් ගෙවනු ලැබේ | | | | | | | | |
| | | **රු.** 2,000/- | **රු.** 4,000/- | **රු.** 6,000/- | **රු.** 8,000/- | **රු.** 10,000/- | **රු.** 15,000/- | **රු.** 20,000/- | **රු.** 25,000/- | **රු.** 30,000/- |

Specimen

| ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | | සැලසුම 1 | සැලසුම 2 | සැලසුම 3 | සැලසුම 4 | සැලසුම 5 | සැලසුම 6 | සැලසුම 7 | සැලසුම 8 | සැලසුම 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආවරණය වන රටවල් | | ශ්‍රී ලංකාව | | | | | | | | |
| වාර්ෂික සමස්ථ සීමාව - මූලික වාර්ෂික රකෂණ මුදල | | රු. 100,000/- | රු. 200,000/- | රු. 300,000/- | රු. 400,000/- | රු. 500,000/- | රු. 750,000/- | රු. 1,000,000/- | රු. 1,250,000/- | රු. 1,500,000/ |
| විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන් | | | | | | | | | | |
| 5 | **එක්දින ප්‍රතිකර්ම** (අභ්‍යන්තර රෝගියෙකු ලෙස පැය 24 කට අඩු කාලයක් රෝහලේ නැවතී සිට ලබාගන්න ප්‍රතිකාර) | i. මූලික වාර්ෂික රක්ෂණ මුදල අනුව, ශ්‍රී ලංකාව තුළදී සිදුකරනු ලබන සැත්කම් හෝ ප්‍රතිකාර පමණක් ආවරණය වේ.<br>ii. ආවරණය වන සැත්කම් ලැයිස්තුවේ සැත්කම් සඳහා පමණක් ආවරණය හිමි වේ.<br>iii. බාහිර රෝගියෙකු ලෙස සිදුකරන ලබන සැත්කම් හෝ ප්‍රතිකාර ආවරණය නොවේ. | | | | | | | | |
| 6 | **රෝහල්ගත වීමට පෙර වියදම් ප්‍රතිලාභය** | රෝහල්ගත කිරීමට සිදුවන රෝගය/අනතුර නිසා රෝහල්ගත කිරීමට දින 30 කට පෙර සිදුවන වෙනත් වෛද්‍ය ගාස්තු/වියදම්, එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ. කෙසේ වුවත් මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි. | | | | | | | | |
| | (රජයේ සහ පෞද්ගලික රෝහල් සඳහා පොදුවේ අදාළ වේ) | රු. 5,000/- | රු. 10,000/- | රු. 15,000/- | රු. 20,000/- | රු. 25,000/- | රු. 37,500/- | රු. 50,000/- | රු. 62,500/- | රු. 75,000/- |
| 7 | **රෝහල්ගත වී ප්‍රතිකාර ලැබීමට පසු වියදම් ප්‍රතිලාභය** | රෝහල්ගත කිරීමට සිදුවන රෝගය/අනතුර නිසා රෝහල්ගත වී රෝහලෙන් පිටව යාමෙන් පසු දින 30 ක කාලසීමාවක් දක්වා සිදුවන වෙනත් වෛද්‍ය ගාස්තු/වියදම්, එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ. කෙසේ වුවත් මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි. | | | | | | | | |
| | (රජයේ සහ පෞද්ගලික රෝහල් සඳහා පොදුවේ අදාළ වේ) | රු. 5,000/- | රු. 10,000/- | රු. 15,000/- | රු. 20,000/- | රු. 25,000/- | රු. 37,500/- | රු. 50,000/- | රු. 62,500/- | රු. 75,000/- |
| 8 | **ඉන්ද්‍රිය දායක වියදම්** | ඉන්ද්‍රිය බද්ධ කරනු ලබන පුද්ගලයාගේ සමස්ත රක්ෂිත මුදලේ සීමාවන්ට යටත්ව ඉන්ද්‍රිය පරිත්‍යාග කරන පුද්ගලයාගේ රෝහල්ගත වීම් සඳහා පමණක් ආවරණය හිමි වේ. | | | | | | | | |
| 9 | **කෘත්‍රිම අවයව සහ උපාංග ශරීරයට බද්ධ කිරීම - මූලික වාර්ෂික රකෂණ මුදලින් 20% ක්** | රු. 20,000/- | රු. 40,000/- | රු. 60,000/- | රු. 80,000/- | රු. 100,000/- | රු. 150,000/- | රු. 200,000/- | රු. 250,000/- | රු. 300,000/- |
| 10 | **විදේශ ප්‍රතිකාර** | wod< ke; | | | | | | | | |
| 11 | **මුදල් නොගෙවන වාට්ටුවකට ඇතුළත් වීම (රජයේ හෝ වෙනත් එබඳු රෝහලක)** | මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 0.5% ක්, දිනකට රු. 20,000/- ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ. උපරිම සීමාව වසරකට මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 30% කි. | | | | | | | | |
| | | රු. 500/- | රු. 1,000/- | රු. 1,500/- | රු. 2,000/- | රු. 2,500/- | රු. 3,750/- | රු. 5,000/- | රු. 6,250/- | රු. 7,500/- |
| | | රෝහල්ගත වීමට සිදුවූ රෝගය සම්බන්ධයෙන් වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන පරීක්ෂණ සහ ඖෂධ සඳහා, වසරකට මූලික වාර්ෂික රක්ෂිත මුදල මෙන් 70% ක් දක්වා ප්‍රතිලාභ ගෙවනු ලැබේ. | | | | | | | | |
| 12 | **සෞඛ්‍ය පරීක්ෂණ විකල්පය** | අදාල නැත | | | | | | | | |
| 13 | **රෝහල් ඇතුලත් කිරීමේ ගාස්තු** | එක් රෝහල්ගතවීමක් සඳහා මූලික වාර්ෂික රකෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව සහ මූලික වාර්ෂික රකෂිත මුදලින් 70%ක උප සීමාවකට යටත්ව ගෙවනු ලැබේ. | | | | | | | | |

Specimen

| | ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | සැලසුම 10 | සැලසුම 11 | සැලසුම 12 | සැලසුම 13 | සැලසුම 14 | සැලසුම 15 | සැලසුම 16 | සැලසුම 17 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආවරණය වන රටවල් | ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව මැලේසියාව, තායිලන්තය හෝ සියලු රටවල් සඳහා ආවරණය (USA සහ කැනඩාව හැර) පළමු උපලේඛනයේ දක්වා ඇති පරිදි | | | | | | සියලු රටවල් සඳහා ආවරණය (USA සහ කැනඩාව හැර) | |
| | වාර්ෂික සමස්ථ සීමාව - මූලික වාර්ෂික රක්ෂණ මුදල | රු. 2,000,000/- | රු. 3,000,000/- | රු. 4,000,000/- | රු. 5,000,000/- | රු. 10,000,000/- | රු. 20,000,000/- | රු. 30,000,000/- | රු. 40,000,000/- |
| විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන් | | | | | | | | | |
| 1 | රෝහල්ගතවීමේ ප්‍රතිලාභය | මූලික වාර්ෂික රක්ෂිත මුදලෙන් 30% ක උපරිමයකට යටත්ව රෝහල් කාමර ගාස්තු සහ දැඩි සත්කාර ඒකක ගාස්තු ගෙවනු ලැබේ | | | | | | | |
| | (අ) දෛනික රෝහල් දීමනා ප්‍රතිලාභය | | | | | | | | |
| | ශ්‍රී ලංකාව තුළ උපරිම දෛනික රෝහල් කාමර ගාස්තු - ප්‍රතිලාභ මුදලින් 2% | රු. 40,000/- | රු. 60,000/- | රු. 80,000/- | රු. 100,000/- | රු. 200,000/- | රු. 400,000/- | රු. 600,000/- | රු. 800,000/- |
| | ශ්‍රී ලංකාවෙන් පිටත උපරිම දෛනික රෝහල් කාමර ගාස්තු - ප්‍රතිලාභ මුදලින් 3% | රු. 60,000/- | රු. 90,000/- | රු. 120,000/- | රු. 150,000/- | රු. 300,000/- | රු. 600,000/- | රු. 900,000/- | රු. 1,200,000/- |
| | (ආ) දෛනික දැඩි සත්කාර ඒකක ගාස්තු ප්‍රතිලාභය | | | | | | | | |
| | ශ්‍රී ලංකාව තුළ උපරිම දෛනික දැඩි සත්කාර සේවා ගාස්තු - ප්‍රතිලාභ මුදලින් 4% | රු. 80,000/- | රු. 120,000/- | රු. 160,000/- | රු. 200,000/- | රු. 400,000/- | රු. 800,000/- | රු. 1,200,000/- | රු. 1,600,000/- |
| | ශ්‍රී ලංකාවෙන් පිටත උපරිම දෛනික දැඩි සත්කාර සේවා ගාස්තු - ප්‍රතිලාභ මුදලින් 6% | රු. 120,000/- | රු. 180,000/- | රු. 240,000/- | රු. 300,000/- | රු. 600,000/- | රු. 1,200,000/- | රු. 1,800,000/- | රු. 2,400,000/- |
| 2 | සැත්කම් ප්‍රතිලාභ (ශල්‍ය වෛද්‍ය, නිර්වින්දන වෛද්‍ය, වෛද්‍ය, උපදේශක වෛද්‍ය සහ විශේෂඥ වෛද්‍ය ගාස්තු සහ සත්කාර සේවා ඇතුළත් වේ). | අදාළ රටේ සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු, අයකරනු ලබන පරිදි ආවරණය වේ. | | | | | | | |
| 3 | අනෙකුත් රෝහල් සේවා සහ සැපයුම් ප්‍රතිලාභය (වෛද්‍ය නොවන සේවාවන් හැර, ශල්‍යාග ාර ගාස්තු, නිර්වින්දනය, රුධිරය, ඔක්සිජන් සහ ඖෂධ ඇතුළත් වේ) | i. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු, අයකරනු ලබන පරිදි ආවරණය වේ.<br>ii. විදේශගත වී ප්‍රතිකාර ලබන අවස්ථාවකදී උපරිම සීමාව එක් රෝගියෙකුට එක් දිනකට වාර දෙකකි. | | | | | | | |
| 4 | ගිලන්රථ ගාස්තු | i. මූලික රක්ෂිත මුදලින් 2% ක උපරිමයකට යටත්ව, අයකරනු ලබන පරිදි<br>ii. ලියාපදිංචි ගිලන්රථ සේවාවක් භාවිතා කරන ලද අවස්ථාවකදී සහ රෝහල්ගත වීමට අදාළව හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණක් පමණක්, වසරකට එක වරක් ගෙවනු ලැබේ | | | | | | | |
| | | රු. 40,000/- | රු. 60,000/- | රු. 80,000/- | රු. 100,000/- | රු. 200,000/- | රු. 400,000/- | රු. 600,000/- | රු. 800,000/- |

Specimen

| | ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | සැලසුම 10 | සැලසුම 11 | සැලසුම 12 | සැලසුම 13 | සැලසුම 14 | සැලසුම 15 | සැලසුම 16 | සැලසුම 17 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආවරණය වන රටවල් | ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව මැලේසියාව, තායිලන්තය හෝ සියලු රටවල් සඳහා ආවරණය (USA සහ කැනඩාව හැර) පළමු උපලේඛනයේ දක්වා ඇති පරිදි | | | | | | සියලු රටවල් සඳහා ආවරණය (USA සහ කැනඩාව හැර) | |
| | වාර්ෂික සමස්ථ සීමාව - මූලික වාර්ෂික රක්ෂණ මුදල | රු. 2,000,000/- | රු. 3,000,000/- | රු. 4,000,000/- | රු. 5,000,000/- | රු. 10,000,000/- | රු. 20,000,000/- | රු. 30,000,000/- | රු. 40,000,000/- |
| විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන් | | | | | | | | | |
| 5 | එක්දින ප්‍රතිකර්ම (අභ්‍යන්තර රෝගියෙකු ලෙස පැය 24 කට අඩු කාලයක් රෝහලේ නැවතී සිට ලබාගන්නා ප්‍රතිකාර) | i. මූලික වාර්ෂික රක්ෂණ මුදලේ උප සීමාව අනුව, සැත්කම් හෝ ප්‍රතිකාර පමණක් ආවරණය වේ.<br>ii. ආවරණය වන සැත්කම් ලැයිස්තුවේ සැත්කම් සඳහා පමණක් ආවරණය හිමි වේ.<br>iii. බාහිර රෝගියෙකු ලෙස සිදුකරන ලබන සැත්කම් හෝ ප්‍රතිකාර ආවරණය නොවේ. | | | | | | | |
| 6 | රෝහල්ගත වීමට පෙර වියදම් නැවත ගෙවීමේ ප්‍රතිලාභය | රෝහල්ගත කිරීමට සිදුවන රෝගය/අනතුර නිසා රෝහල්ගත කිරීමට දින 30 කට පෙර සිදුවන වෙනත් වෛද්‍ය ගාස්තු/වියදම්, එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ. කෙසේ වුවත් මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි. | | | | | | | |
| | (රජයේ සහ පෞද්ගලික රෝහල් සඳහා පොදුවේ අදාළ වේ) | රු. 100,000/- | රු. 150,000/- | රු. 200,000/- | රු. 250,000/- | රු. 500,000/- | රු. 1,000,000/- | රු. 1,500,000/- | රු. 2,000,000/- |
| 7 | රෝහල්ගත වී ප්‍රතිකාර ලැබීමට පසු වියදම් ප්‍රතිලාභය | රෝහල්ගත කිරීමට සිදුවන රෝගය/අනතුර නිසා රෝහල්ගත වී රෝහලෙන් පිටව යාමෙන් පසු දින 30 ක කාලසීමාවක් දක්වා සිදුවන වෙනත් වෛද්‍ය ගාස්තු/වියදම්, එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ. කෙසේ වුවත් මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි. | | | | | | | |
| | (රජයේ සහ පෞද්ගලික රෝහල් සඳහා පොදුවේ අදාළ වේ) | රු. 100,000/- | රු. 150,000/- | රු. 200,000/- | රු. 250,000/- | රු. 500,000/- | රු. 1,000,000/- | රු. 1,500,000/- | රු. 2,000,000/- |
| 8 | ඉන්ද්‍රීය පරිත්‍යාග වියදම් | රක්ෂිතයාට සිදුවන ඉන්ද්‍රීය බද්ධයකදී, පරිත්‍යාගශීලියාගේ රෝහල්ගතවීමේ ගාස්තු ප්‍රතිලාභියාගේ රක්ෂිත මුදල මගින් ආවරණය වේ. | | | | | | | |
| 9 | ශරීර ප්‍රකෘතිතා සහ බද්ධ කිරීම් (ප්‍රතිලාභ මුදලින් 20%) | රු. 400,000/- | රු. 600,000/- | රු. 800,000/- | රු. 1,000,000/- | රු. 2,000,000/- | රු. 4,000,000/- | රු. 6,000,000/- | රු. 8,000,000/- |
| 10 | විදේශගත ප්‍රතිකාර | සැලසුම් කල රෝහල් ගත වීමකදී ඊට පෙර රක්ෂණ සමාගම දැනුවත් කිරීම අත්‍යවශය වේ. හදිසි රෝහල් ගත කිරීමකදී පැය 48 ක් ඇතුලත රක්ෂණ සමාගම දැනුවත් කිරීම සිදු කල යුතු වේ. රක්ෂණ සැලසුමට අදාල දෛනික කාමර ගාස්තු වලට වඩා ඉහල ගාස්තු අයකරනු ලබන කාමරයකට ඇතුලත්ව ප්‍රතිකාර ලබාගැනීම සිදු කලේ නම් ගෙවීම් සිදු කරනුයේ මුළු හිමිකම් මුදලින් 75% ක් පමණි. ඉතිරි 25% ක මුදල රක්ෂිතයා විසින් ගෙවිය යුතු වේ. | | | | | | | |
| 11 | නොගෙවන වාට්ටුවක රෝහල් ගත වීමකදී (රජයේ හෝ වෙනත් එබදු රෝහලක) | මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 0.5% ක්, දිනකට රු.20,000/-ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ. උපරිම සීමාව වසරකට මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 30% කි. | | | | | | | |
| | | රු. 10,000/- | රු. 15,000/- | රු. 20,000/- | රු. 20,000/- | රු. 20,000/- | රු. 20,000/- | රු. 20,000/- | රු. 20,000/- |
| | | රෝහල්ගත වීමට සිදු වීමට සිදුවූ රෝගය සම්බන්ධයෙන් වෛද්‍යවරයා වීසින් නියමු කරනු ලබන පරීක්ෂණ සහ ඖෂධ සඳහා, වසරකට මූලික වාර්ෂික රක්ෂිත මුදල මෙන් 70% ක් දක්වා ප්‍රතිලාභ ගෙවනු ලැබේ. | | | | | | | |
| 12 | සෞඛ්‍ය පරීක්ෂණ විකල්පය | අඛණ්ඩව ඔප්පු වර්ෂ 3කදී හිමිකම් ඉල්ලීමක් සිදුවී නොමැති නම් මූලික රක්ෂිත මුදලින් 1% ක උපරිමයකට යටත්ව යූනියන් ඇෂුවරන්ස් සමාගමේ බලයලත් රසායනාගාර මඟින් සෞඛ්‍ය පරීක්ෂණයක් කර ගැනීමේ හැකියාව ඇත. | | | | | | | |
| 13 | රෝහල් ඇතුලත් කිරීමේ ගාස්තු | එක් රෝහල්ගතවීමක් සඳහා මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව සහ මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 70%ක උප සීමාවකට යටත්ව ගෙවනු ලැබේ. | | | | | | | |

Specimen

### 3.2.4.2 (ii) ආවරණ වර්ධක ප්‍රතිලාභය

සම්පූර්ණ ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂණ මුදල් හිමිකම් ඉල්ලීමක් සිදුවී නොමැති නම් සහ, අනුග්‍රහ කාලසීමාව තුළ අඛණ්ඩව නිසි පරිදි වාරික මුදල් ගෙවමින් ඔප්පුව පවත්වා ගනු ලබන්නේ නම් එම ඔප්පුව සඳහා ආවරණ වර්ධක ප්‍රතිලාභය ක්‍රියාත්මක කිරීමට සමාගම කටයුතු කරයි. ඒ යටතේ ඊළඟ ඔප්පු වර්ෂය සඳහා යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ රක්ෂිත මුදල ස්වයංක්‍රීයව 25% කින් වැඩි වේ.

ආවරණ වර්ධක ප්‍රතිලාභය යටතේ යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ රක්ෂිත මුදල වැඩිවිය හැකි උපරිම සීමාව රක්ෂිත මුදල මෙන් 100% කි.

ආවරණ වර්ධක ප්‍රතිලාභය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව ඔප්පු වසරක් තුළ රක්ෂණ හිමිකමක් සඳහා ඉල්ලීමක් සිදුවේ නම්, ඊළඟ ඔප්පු වර්ෂය සඳහා යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ රක්ෂිත මුදල ස්වයංක්‍රීයව 25% කින් අඩු වේ. කෙසේ වුවත් මෙහිදී ප්‍රථම උපලේඛනයේ දෙවන කොටසේ සඳහන් කර ඇති, යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ මුල් රක්ෂිත මුදලට වඩා අඩුවීමක් සිදු නොවනු ඇත.

### 3.2.4.2 (iii) පුනස්ථාපන ප්‍රතිලාභය

යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ රක්ෂිත මුදල සහ ආවරණ වර්ධක ප්‍රතිලාභය යටතේ එක්රැස් වූ රක්ෂිත මුදල මුළුමනින්ම හිමිකම් ලෙස ලබාගෙන අවසන් වූ අවස්ථාවක රෝහල්ගත වීම සිදුවන්නේ නම් සහ එම රෝහල්ගත වීම ඊට පෙර රෝහල්ගත වීම්වලට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ නොමැති හේතුවක් නිසා නම්, ඔප්පු වර්ෂයකට එක් වරක් ප්‍රතිලාභය පුනස්ථාපනය කරගැනීමේ අවස්ථාවක් ලබාදීමට සමාගම කටයුතු කරයි. ඕනෑම ඔප්පු වර්ෂයක් තුළ මෙසේ පුනස්ථාපන ප්‍රතිලාභය මගින් යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ මුල් රක්ෂිත මුදල මෙන් 100% උපරිමයක් දක්වා අතිරේක ආවරණයක් හිමි වේ. එය එක් හිමිකමක් ලබාගැනීම සඳහා පමණක් වලංගු වන අතර ප්‍රතිලාභයේ ශේෂයක් පැවතුණහොත් එය ඉදිරි හිමිකමක් ලබාගැනීම සඳහා වලංගු නොවනු ඇත.

### 3.2.4.2 (iv) රෝහල්ගත කිරීමට පෙර හා පසු වියදම් නැවත ගෙවීමේ ප්‍රතිලාභය

රෝහල්ගත කිරීමට හේතු වන රෝගය/අනතුර නිසා, රෝහල්ගත කිරීමට දින 30 කට පෙර සහ දින 30 කට පසු කාලය දක්වා වැයවන වෛද්‍ය ගාස්තු, යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ කෙරෙන හිමිකම් මුදල් ඉල්ලීම් සඳහා සලකා බලනු ලැබේ. මෙසේ රෝහල්ගත වීමට පෙර හා පසු වැයවන වියදම් නැවත ගෙවීමේ සීමාව, එක් ඔප්පු වර්ෂයක් සඳහා යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ රක්ෂිත මුදලේ වටිනාකමින් 5% ක උපරිමයකට යටත් වනු ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑ හැකි වනුයේ යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි.

### 3.2.4.2 (v) රෝහල් දීමනා ප්‍රතිලාභය - රෝග නිශ්චය කිරීමේ පරීක්ෂණ/ඖෂධ ආදියට සම්බන්ධ දෛනික රෝහල් ගාස්තු හා වියදම් පියවීම

රෝහල්ගත කර ඇත්තේ රජයේ රෝහලක මුදල් නොගෙවන වාට්ටුවක නම් සහ අඛණ්ඩව රෝහල් ගතව සිටි කාලසීමාව පැය 24 ඉක්මවන්නේ නම් හිමිකමට අදාළ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අවස්ථාවක, පහත සඳහා ප්‍රතිලාභ ගෙවනු ලබනු ඇත.

- යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ රක්ෂිත මුදලේ වටිනාකමින් 0.5% ක් වන දෛනික රෝහල් වියදම් ප්‍රතිලාභය, රු. 20,000 ක උපරිමයක් දක්වා, රෝහල්ගත වී සිටින දින ගණනින් වැඩිකර, එක් ඔප්පු වර්ෂයක් සඳහා යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ රක්ෂිත මුදලේ වටිනාකමින් 30% ක උපරිමයකට යටත්ව සහ/හෝ

- ආවරණය ලැබූ පුද්ගලයාට රෝහල්ගත වීමට සිදුවන රෝග තත්ත්වය සම්බන්ධයෙන්, අදාළ රෝගයට ප්‍රතිකාර කරනු ලබන වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණ හෝ ඖෂධ සඳහා වැයවන වියදම්, එක් ඔප්පු වර්ෂයක් සඳහා යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභයේ රක්ෂිත මුදලේ වටිනාකමින් 70% ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ.



Specimen

### 3.2.4.2 (vi) ශරීර ඉන්ද්‍රියන් දන්දෙන පුද්ගලයන්ගේ වියදම්

මෙම ප්‍රතිලාභය යටතේ, ඉන්ද්‍රියන් දන්දෙන පුද්ගලයෙකු ඒ සම්බන්ධයෙන් රෝහල්ගත වීමට අදාළ වියදම් ආවරණය වේ. ඉන්ද්‍රිය ලබන පුද්ගලයා මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වී ඇත්නම්, එම පුද්ගලයා රෝහල්ගත වීම සම්බන්ධ හිමිකම් මුදල් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්නම් සහ එම ඉල්ලීම මෙම ආවරණයට අදාළ වගන්ති හා කොන්දේසි වලට අනුව පිළිගත හැකිනම් පමණක් මෙම ප්‍රතිලාභය ගෙවනු ලබනු ඇත. ඉන්ද්‍රියන් ප්‍රදානය කිරීම සම්බන්ධ මුදල් ගනුදෙනු මේ යටතේ ආවරණය නොවන අතර, යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ආවරණය යටතේ ආවරණය ලබන සාමාජිකයාට අවශ්‍ය වන ඉන්ද්‍රියන් දන්දීම සඳහා එසේ දන්දෙන පුද්ගලයා සැත්කමකට ලක්වීමට රෝහල්ගත වීම සම්බන්ධයෙන් වැයවන වියදම් පමණක් ආවරණය වේ.

අදාළ දායකයා මුදල් නොගෙවන රජයේ රෝහල් වාට්ටුවකට ඇතුළත් වන්නේ නම් දෛනික රෝහල් ගාස්තු දීමනාව අදාළ නොවේ.

ශරීර ඉන්ද්‍රියන් දන්දෙන පුද්ගලයන්ගේ වියදම් කාණ්ඩය යටතේ කරනු ලබන ඕනෑම ආකාරයක ගෙවීමක්, රක්ෂිත ඉන්ද්‍රිය ලාභියාගේ ප්‍රතිලාභ සීමාව තුළ සිදුකරන ලද ගෙවීමක් ලෙස සැලකේ. ශරීර ඉන්ද්‍රියන් දන්දෙන පුද්ගලයන්ගේ රෝහල්ගත වීම සම්බන්ධ වියදම් වලට අදාළව ප්‍රතිලාභ ගෙවීම් සලකා බැලෙනුයේ ප්‍රතිලාභ වගුවේ අංක 01 සහ 02 යටතේ සඳහන්, රක්ෂිතයාට අදාළ ප්‍රතිලාභ සීමාවන්ට යටත්ව ය.

### 3.2.4.2 (vii) කෘත්‍රිම අවයව සහ උපාංග ශරීරයට බද්ධ කිරීම්

මෙම රක්ෂණ සැලසුම යටතේ ආවරණය වන කරුණකට රක්ෂණ හිමියා රෝහල්ගත කිරීමෙන් අනතුරුව, ඔහුට හෝ ඇයට කෘත්‍රිම අවයවක් හෝ උපාංගයක් ශරීරයේ තැන්පත් කිරීමක් සිදුකිරීම අවශ්‍ය වන බවට වෛද්‍යවරයා විසින් තීරණය කරනු ලබන්නේ නම්, ප්‍රතිලාභ සටහනෙහි සහ මෙම රක්ෂණාවරණයේ ප්‍රථම උප ලේඛනයේ සඳහන් සීමාවන්ට යටත්ව අදාළ කෘත්‍රිම අවයව සහ උපාංග ශරීරයේ තැන්පත් කිරීම් සඳහා වැයවන සත්‍ය වියදම් පියවීමට සමාගම කටයුතු කරනු ඇත.

කෘත්‍රිම අවයව යන්නෙන් රක්ෂිතයාගේ ස්වාභාවික අත්, පා හෝ ඇස් අහිමි වීම නිසා සවිකරනු ලබන කෘත්‍රිම අවයව අදහස් වේ. පහත සඳහන් කොන්දේසි සපුරාලීමෙන් අනතුරුව, රක්ෂිතයාට කෘත්‍රිම අවයව මිලදී ගැනීම සඳහා වන වියදම් ගෙවනු ලබනු ඇත.

- රෝහල්ගත වී සිටීමට සිදුවන ආකාරයේ හදිසි අනතුරක් හෝ රෝගයක් නිසා අත්, පා, හෝ ඇස් අහිමි වීම මගින් රක්ෂිතයට කෘත්‍රිම අවයව අවශ්‍ය වී තිබිය යුතු ය.
- ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් අදාළ කෘත්‍රිම අවයවය සවිකළ යුතු බවට නිර්දේශ කර තිබිය යුතු ය.
- රක්ෂිතයා රෝහලෙන් පිට වී ගොස් දින 180 ක කාලයක් ඇතුළත අදාළ කෘත්‍රිම අවයව මිලදීගෙන තිබිය යුතු අතර මෙම ප්‍රතිලාභයට අදාළ සීමාව (ප්‍රතිලාභ සටහනෙහි දැක්වෙන පරිදි) රෝහලෙන් පිටත් ව යන දිනයේදී අදාළ වූ සීමාවන් මත පදනම් විය යුතු ය.

සමාගම විසින් මුදල් ගෙවනු ලබන්නේ දෑත්, දෙපා, හෝ දෑස් සඳහා වන කෘත්‍රිම අවයව වලින් එක් වර්ගයකින් එක් කෘත්‍රිම අවයවයක්/ඉන්ද්‍රියක් සඳහා පමණි. කෙසේ වුවද වෙනත් අනතුරක් හෝ රෝගයක් නිසා එම අවයවය/ඉන්ද්‍රිය වෙනුවෙන් නැවත කෘත්‍රිම අවයවයක් මිලදී ගැනීමට රක්ෂිතයාට සිදුවන්නේ නම් එම වියදම් පියවීමට සමාගම කටයුතු කරනු ඇත. අලුත් අවයව සවිකිරීම, කෘත්‍රිම අවයවය අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම ආදිය සඳහා සමාගම විසින් මුදල් ගෙවනු නොලැබේ.

ශල්‍යකර්ම මගින් ශරීරය තුළ සිදුකරන ලබන උපාංගය සාමාන්‍ය මිලගණන් යටතේ පවතින, අනුමත උපාංග වර්ග විය යුතු අතර ශල්‍යකර්මයෙන් පසු රක්ෂිතයාගේ සිරුර තුළ පවතින ඒවා විය යුතු ය.

Specimen

### 3.2.4.3 ආවරණ හිමි නොවන කාලය

යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය ආරම්භ වන්නේ,

- මෙම ආවරණය ආරම්භක දිනය ; හෝ
- ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කළ දිනය

යන දින වලින් අවසානයට යෙදෙන දිනයේ සිට දින අනූවක් (90) ගතවූ පසුවය.

පහත සඳහන් දින වලින් අවසානයට යෙදෙන දිනයට පසුව ඇතිවන හදිසි අනතුරු නිසා සිදුවන රෝහල්ගත කිරීම් සහ/හෝ සැත්කම් සඳහා, 'ආවරණය හිමි නොවන කාලය' අවලංගු කිරීමට සමාගම කටයුතු කිරීමට ඉඩ ඇත.

- මෙම ආවරණය ආරම්භක දිනය ; හෝ
- ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කළ දිනය

මෙහි පහතින් දක්වා ඇති සැත්කම් වර්ග/ රෝග සඳහා, යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ හිමිකමක් පෑමට සුදුසුකමක් ලබන්නේ

- මෙම ආවරණය ආරම්භක දිනය ; හෝ
- ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- නැවත ප්‍රාණවත් කිරීම කළ දිනය

යන දින වලින් අවසානයට යෙදෙන දිනයේ සිට දින තුන්සිය හැට පහකට (365) පසුවය.

| සැත්කමේ නම/රෝගී තත්ත්වය | |
|---|---|
| 1 | Medical or Surgical management of Deviated Nasal Septum, diseases of Tonsils, Adenoids and Sinuses and related conditions (except Malignancy). |
| 2 | All types of Hernias and Benign Prostatic Hypertrophy. |
| 3 | Hydrocele / Varicocele / Spermatocoele. |
| 4 | Piles / Fissure / Fistula-in-Ano / Rectal Prolapse / Pilonidal Sinus. |
| 5 | Treatment of all gynecological conditions (Such as but not limited to Uterine Fibroid, Dysfunctional Uterine Bleeding, Hysterectomy, Uterine Prolapse, Endometriosis, Adenomyosis Uteri, Ovarian Cyst etc.) except those arising from malignancy. |
| 6 | Medical or Surgical management of Prolapsed Intervertebral Disc. |
| 7 | Skin and all internal cysts/tumors/nodules/ polyps/ganglions/lipomas of any kind unless malignant. |
| 8 | Calculus Diseases of any etiology. |
| 9 | Peripheral vascular diseases of any etiology, including treatment for Varicose veins. |
| 10 | All types of CRF and acute on chronic Renal Failures but not ARF, including Renal Failure due to Diabetes. |
| 11 | Osteoporosis / Pathological Fracture / Degenerative Joint Diseases including joint replacement surgeries. However, joint surgeries necessitated due to accidents would not be a part of this exclusion. |
| 12 | Cataract, Retinopathy and Retinal detachment. |

Specimen

ඉහත සැත්කම් සඳහා අදාල වන දින 365 ක ආවරණ හිමි නොවන කාලය යූනියන් ස්මාට් හෙල්ත් ප්‍රීමියර් රක්ෂිත මුදල රු.500,000/- සහ ඊට වැඩි සැලසුම් සඳහා අදාල නොවේ. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් පළමු වසර තුලදී ඇති වන හිමිකමකදී කරන ගෙවීම හිමිකම් අගයෙන් 50% කට සීමා කර ඇති අතර එය උපරිම 200,000 කට යටත් වේ. එසේම මෙය ප්‍රතිලාභ වගුව සහ පලමු උපලේඛනයේ අඩංගු කරුණු හා යටතේ වේ.

එසේම පලමු උපලේඛනයේ සඳහන් කර ඇත්නම් 3.2.4.3 හි දක්වා ඇති ආවරණ හිමි නොවන කාලය අදාල ජීවිත රක්ෂිතයාට අදාල නොවේ.

රෝහල් ගතවීම හෝ සැත්කම සඳහා සෘජුව හෝ වක්‍රකාරයෙන් හේතුවු අසනීප හෝ ආබාධ තත්ත්වය හඳුනාගැනීම සඳහාද ආවරණය හිමි නොවන කාලය අදාළ වේ. ආවරණය හිමි නොවන කාලයෙන් පසුව රෝහල්ගතවීම හෝ සැත්කම සිදු කළද එම රෝහල් ගතවීමට හෝ සැත්කමට හේතුවූ අසනීප තත්ත්වය හඳුනාගනු ලැබුයේ ආවරණ හිමි නොවන කාලසීමාව තුළදී නම් ඒ සඳහා ගෙවීමක් කරනු නොලැබේ.

කෙසේ වෙතත් අදාළ රෝහල්ගතවීම හදිසි අනතුරක් හේතුවෙන් සිදුවූයේ නම් 'ආවරණ හිමි නොවන කාලය' අදාළ නොවේ.

### 3.2.4.4 ආවරණය වන එක් දින (Day Care) සැත්කම්

එක් දින (Day Care) සැත්කම් යන්න අර්ථ දැක්වෙන්නේ එක් රැයක රෝහල් ගත වීම අවශ්‍ය නොවන ශල්‍යකර්මයක් හෝ ප්‍රතිකාරයක් වන අතර එක් දින (Day Care) සැත්කම් සඳහා පශ්චාත් ශල්‍යකර්ම රෝහල් ගත ප්‍රතිකාර හෝ කළමනාකරණය අවශ්‍ය නොවන සැත්කම් ගාස්තු සහ වෛද්‍ය ගාස්තු පමණක් ආවරණය කෙරෙන අතර කාමර ගාස්තු සහ හෙද සත්කාර, වාට්ටු ක්‍රියා පටිපාටි වැනි රෝහල් වාට්ටු ගාස්තු බැහැර කෙරේ.

වෛද්‍ය/තාක්ෂණයේ දියුණුව නිසා හෝ වැඩිදියුණු වූ යටිතල පහසුකම් හේතුවෙන් පැය විසිහතරකට (24) අඩු කාලයක් අවශ්‍ය වන රෝහල්ගත වීමක් තුළින් සිදුකර ගත හැකි එක් දින (Day Care) සැත්කම් සහ අනෙකුත් සැත්කම් පහත දක්වා ඇති අදාළ සැත්කම් ඔප්පුවේ පොදු විධිවිධාන, කොන්දේසි හා බැහැරකිරීම් වලට යටත්වේ.

| | | |
|---|---|---|
| **Microsurgical operations on the middle ear** | 1 | Stapedectomy |
| | 2 | Revision of a stapedectomy |
| | 3 | Other operations on the auditory ossicles |
| | 4 | Myringoplasty (Type -I Tympanoplasty) |
| | 5 | Tympanoplasty (closure of an eardrum perforation/ reconstruction of the auditory ossicles) |
| | 6 | Revision of a Tympanoplasty |
| | 7 | Other microsurgical operations on the middle ear |
| **Other operations on the middle & internal ear** | 8 | Myringotomy |
| | 9 | Removal of a tympanic drain |
| | 10 | Incision of the mastoid process and middle ear |
| | 11 | Mastoidectomy |
| | 12 | Reconstruction of the middle ear |
| | 13 | Other excisions of the middle and inner ear |
| | 14 | Fenestration of the inner ear |
| | 15 | Revision of a fenestration of the inner ear |
| | 16 | Incision (opening) and destruction (elimination) of the inner ear |
| | 17 | Other operations on the middle and inner ear |

Specimen

| | | |
|---|---|---|
| **Operations on the nose & the nasal sinuses** | 18 | Excision and destruction of diseased tissue of the nose |
| | 19 | Operations on the turbinates (nasal concha) |
| | 20 | Other operations on the nose |
| | 21 | Nasal sinus aspiration |
| **Operations on the eyes** | 22 | Incision of tear glands |
| | 23 | Other operations on the tear ducts |
| | 24 | Incision of diseased eyelids |
| | 25 | Excision and destruction of diseased tissue of the eyelid |
| | 26 | Operations on the canthus and epicanthus |
| | 27 | Corrective surgery for entropion and ectropion |
| | 28 | Corrective surgery for blepharoptosis |
| | 29 | Removal of a foreign body from the conjunctiva |
| | 30 | Removal of a foreign body from the cornea |
| | 31 | Incision of the cornea |
| | 32 | Operations for pterygium |
| | 33 | Other operations on the cornea |
| | 34 | Removal of a foreign body from the lens of the eye |
| | 35 | Removal of a foreign body from the posterior chamber of the eye |
| | 36 | Removal of a foreign body from the orbit and eyeball |
| | 37 | Operation of cataract |
| **Operations on the skin & subcutaneous tissues** | 38 | Incision of a pilonidal sinus |
| | 39 | Other incisions of the skin and subcutaneous tissues |
| | 40 | Surgical wound toilet (wound debridement) and removal of diseased tissue of the skin and subcutaneous tissues |
| | 41 | Local excision of diseased tissue of the skin and subcutaneous tissues |
| | 42 | Other excisions of the skin and subcutaneous tissues |
| | 43 | Simple restoration of surface continuity of the skin and subcutaneous tissues |
| | 44 | Free skin transplantation, donor site |
| | 45 | Free skin transplantation, recipient site |
| | 46 | Revision of skin plasty |
| | 47 | Other restoration and reconstruction of the skin and subcutaneous tissues |
| | 48 | Chemosurgery to the skin |
| | 49 | Destruction of diseased tissue in the skin and subcutaneous tissues |

Specimen

| | | |
|---|---|---|
| **Operations on the tongue** | 50 | Incision, excision and destruction of diseased tissue of the tongue |
| | 51 | Partial glossectomy |
| | 52 | Glossectomy |
| | 53 | Reconstruction of the tongue |
| | 54 | Other operations on the tongue |
| **Operations on the salivary glands & salivary ducts** | 55 | Incision and lancing of a salivary gland and a salivary duct |
| | 56 | Excision of diseased tissue of a salivary gland and a salivary duct |
| | 57 | Resection of a salivary gland |
| | 58 | Reconstruction of a salivary gland and a salivary duct |
| | 59 | Other operations on the salivary glands and salivaryducts |
| **Other operations on the mouth & face** | 60 | External incision and drainage in the region of the mouth, jaw and face |
| | 61 | Incision of the hard and soft palate |
| | 62 | Excision and destruction of diseased hard and soft palate |
| | 63 | Incision, excision and destruction in the mouth |
| | 64 | Plastic surgery to the floor of the mouth |
| | 65 | Other operations in the mouth |
| **Operations on the tonsils & adenoids** | 66 | Transoral incision and drainage of a pharyngeal abscess |
| | 67 | Tonsillectomy without adenoidectomy |
| | 68 | Tonsillectomy with adenoidectomy |
| | 69 | Excision and destruction of a lingual tonsil |
| | 70 | Other operations on the tonsils and adenoids |
| **Orthopaedic Surgeries** | 71 | Trauma surgery and orthopaedics |
| | 72 | Incision on bone, septic and aseptic |
| | 73 | Closed reduction on fracture, luxation or epiphyseolysis with osteosynthesis |
| | 74 | Suture and other operations on tendons and tendon sheath |
| | 75 | Reduction of dislocation under GA |
| | 76 | Arthroscopic knee aspiration |
| **Operations on the breast** | 77 | Incision of the breast |
| | 78 | Operations on the nipple |
| **Operations on the digestive tract** | 79 | Incision and excision of tissue in the perianal region |
| | 80 | Surgical treatment of anal fistulas |
| | 81 | Surgical treatment of haemorrhoids |
| | 82 | Division of the anal sphincter (sphincterotomy) |
| | 83 | Other operations on the anus |
| | 84 | Ultrasound guided aspirations |
| | 85 | Sclerotherapy etc. |
| | 86 | Laparoscopic cholecystectomy |

Specimen

| | | |
|---|---|---|
| **Operations on the female sexual organs** | 87 | Incision of the ovary |
| | 88 | Insufflation of the Fallopian tubes |
| | 89 | Other operations on the Fallopian tube |
| | 90 | Dilatation of the cervical canal |
| | 91 | Conisation of the uterine cervix |
| | 92 | Other operations on the uterine cervix |
| | 93 | Incision of the uterus (hysterotomy) |
| | 94 | Therapeutic curettage |
| | 95 | Culdotomy |
| | 96 | Incision of the vagina |
| | 97 | Local excision and destruction of diseased tissue of the vagina and the pouch of Douglas |
| | 98 | Incision of the vulva |
| | 99 | Operations on Bartholin's glands (cyst) |
| **Operations on the prostate & seminal vesicles** | 100 | Incision of the prostate |
| | 101 | Transurethral excision and destruction of prostate tissue |
| | 102 | Transurethral and percutaneous destruction of prostate tissue |
| | 103 | Open surgical excision and destruction of prostate tissue |
| | 104 | Radical prostatovesiculectomy |
| | 105 | Other excision and destruction of prostate tissue |
| | 106 | Operations on the seminal vesicles |
| | 107 | Incision and excision of periprostatic tissue |
| | 108 | Other operations on the prostate |
| **Operations on the scrotum & tunica vaginalis testes** | 109 | Incision of the scrotum and tunica vaginalis testes |
| | 110 | Operation on a testicular hydrocele |
| | 111 | Excision and destruction of diseased scrotal tissue |
| | 112 | Plastic reconstruction of the scrotum and tunica vaginalis testes |
| | 113 | Other operations on the scrotum and tunica vaginalis testes |
| **Operations on the testes** | 114 | Incision of the testes |
| | 115 | Excision and destruction of diseased tissue of the testes |
| | 116 | Reconstruction of the testes |
| | 117 | Implantation, exchange and removal of a testicular prosthesis |
| | 118 | Other operations on the testes |

Specimen

| | | |
|---|---|---|
| **Operations on the spermatic cord, epididymis und ductusdeferen** | 119 | Surgical treatment of a varicocele and a hydrocele of the spermatic cord |
| | 120 | Excision in the area of the epididymis |
| | 121 | Epididymectomy |
| | 122 | Reconstruction of the spermatic cord |
| | 123 | Reconstruction of the ductus deferens and epidididymis |
| | 124 | Other operations on the spermatic cord, epididymis and ductus deferens |
| **Operations on the penis** | 125 | Operations on the foreskin |
| | 126 | Local excision and destruction of diseased tissue of the penis |
| | 127 | Amputation of the penis |
| | 128 | Plastic reconstruction of the penis |
| | 129 | Other operations on the penis |
| **Operations on the urinary system** | 130 | Cystoscopical removal of stones |
| **Other Operations** | 131 | Lithotripsy |
| | 132 | Coronary angiography |
| | 133 | Haemodialysis |
| | 134 | Radiotherapy for Cancer |
| | 135 | Cancer chemotherapy |

**End of list of surgeries**

### 3.2.4.5 වාර මුදල් කොන්දේසි සංශෝධනය කිරීම

මෙම ආවරණය සඳහා අය කෙරෙන වාරිකය සහතික කරනුයේ අවුරුද්දක (01) කාලයක් සඳහා පමණි. අදාළ කොන්දේසි හා විධිවිධාන සංශෝධනය කිරීමට සහ/හෝ වාරික සංශෝධනය කිරීමට හෝ මෙම ප්‍රතිලාභය අවලංගු කිරීමට සමාගමට අයිතියක් ඇති අතර, ඔප්පුහිමියා වෙත දින තිහක (30) ක පෙර දැනුම් දීමකින් පසුව එසේ සිදුකළ හැකිය. එවන් සංශෝධනයක් සිදු වුයේ නම් එම වෙනස ක්‍රියාත්මක වන්නේ ඉන් පසුව එළඹෙන ඔප්පු සංවත්සර දිනයේ සිටය.

### 3.2.4.6 රැකියාවේ වෙනස්වීම දැනුම්දීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවේ හෝ ඊට අදාළ කටයුතු වල වෙනස්වීමක් සිදුවූයේ නම් එම වෙනස සිදු වී දින දහ හතරක් (14) ඇතුළත ඒ බව සමාගම වෙත ලිඛිතව දැනුම් දී මෙම ආවරණයේ වලංගුභාවය තහවුරු කරගත යුතුය. යෝජනා පත්‍රයේ/ඉල්ලුම් පත්‍රයේ සහ/හෝ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇති රැකියාවෙන් වෙනස් වූ රැකියාවක නිරතවන අතරතුර පැනනගින්නාවූ කිසිදු හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම බැඳී නොමැත.

### 3.2.4.7 හිමිකම දැන්වීම සහ සනාථ කිරීම

මෙම ආවරණය යටතේ හිමිකම් ලබා ගැනීමට සුදුසුකම් ලබන රෝහල් ගතවීමකදී සහ/හෝ සැත්කමකදී, රෝහලට ඇතුලත් වීමෙන් පසු පැය හතලිස් අට (48) ක් ඇතුළත ඒ බව සමාගමේ ප්‍රධාන කාර්යාලය හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

එම කාලය ඇතුළත දැනුම් දීමට අපොහොසත් වීම නිසාම හිමිකම නිෂ්ප්‍රභා කිරීම සඳහා සමාගමට අයිතියක් ලැබේ.

Specimen

එවැනි දැනුම්දීමකින් අනතුරුව සමාගම විසින් හිමිකම්පෑමක් සඳහා අවශ්‍ය පෝරම නිකුත් කරනු ලැබේ. එම පෝරම නියමිත පරිදි සම්පූර්ණ කොට, නිකුත් කළ දින සිට වැඩ කරන දින දහයක් (10) ඇතුළත නැවත සමාගම වෙත ඉදිරිපත් කළ යුතු වේ. බිල්පත් වල මුල් පිටපත් සහ මුදල් ගෙවීම් කුවිතාන්සි වල මුල් පිටපත් ඇතුළුව සිදු කරන ලද රෝහල් ගතවීම සහ/හෝ සැත්කම සනාථ කිරීම සඳහා පිළිගත හැකි සාක්ෂි, රෝහලින් පිටවී දින තිහක් (30) ඇතුළත සමාගම වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා වියදම් ඇතොත් රක්ෂිතයා විසින් දරනු ලැබිය යුතු වේ.

ආවරණය වු තැනැත්තා ප්‍රතිලාභය ලබාගෙන ඇත්තේ පවුල් ඒකකයක් ලෙස නම් අදාළ සාමාජිකයා අදාළ විශේෂඥ වෛද්‍යවරයා විසින් දෙනු ලබන උපදෙස් නියමාකාරයට අනුගමනය කළ යුතු වන අතර ප්‍රතිකාර/සැත්කමට අදාළ සම්පූර්ණ විස්තර සමාගමට සැපයිය යුතුවේ.

ආවරණය වු තැනැත්තා/ඔහු හෝ ඇයගේ ඥාතීන් හෝ පැවතෙන්නන්, සමාගමේ අනුමැතිය ලද හෝ සමාගම නියෝජනය කරන නිලධාරීන්ගේ පැමිණීම හා විමසීම් සඳහා අවසර දිය යුතු වන අතර එම නිලධාරීන් විසින් සොයාගන්නා කරුණු පිළිබඳව රහස්‍යභාවය රැකීමේ වගකීමෙන් සමාගම නිදහස් වේ.

හිමිකමක් පැනනැගුණු විටෙකදී, ආවරණය වු තැනැත්තා සමාගම විසින් සඳහන් කරන ලද ක්‍රියා පිළිවෙළ අනුගමනය නොකරන්නේ නම් මෙම ප්‍රතිලාභය යටතේ වන හිමිකම් නිශ්ප්‍රභා කිරීමේ බලය සමාගම සතු වේ.

### 3.2.4.8 කොන්දේසි

(i) මෙම අතිරේක ආවරණය යටතේ ප්‍රතිලාභ ගෙවීම සලකා බැලෙනුයේ ජීවිත රක්ෂිතයා;

(අ) යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රීමියර් කල් ඉකුත්වීමේ දින; හෝ

(ආ) එක් එක් රක්ෂිතයන්ගේ පහත සඳහන් වයස් සීමාවන් සම්පූර්ණ වීමෙන් පසුව එළැඹෙන ඔප්පු සංවත්සර දින;

යන දෙකෙන් කලින් එළැඹෙන දිනට පෙර රෝහල්ගත වුවහොත් සහ/හෝ සැත්කමක් සඳහා භාජනය වුවහොත් පමණි.

- ජීවිත රක්ෂිතයා/කලත්‍රයා/දෙමාපියන්ගේ හැත්තෑව (70) වන උපන්දිනය හෝ
- රක්ෂිත දරුවන්ගේ විසිතුන් (23) වන උපන්දිනය

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය තුළදී වාරිකය ගෙවා නැත්නම් මෙම අතිරේක ආවරණය බලරහිත වනු ඇත. බල රහිත ආවරණය නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සමාගම සතුව ඇත. එසේ අනුග්‍රහ කාලසීමාව පසුවී වාරික ගෙවීම් සිදුකර ආවරණය නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කළහොත් ආවරණ හිමි නොවන කාලය බලපැවත්වෙන්නේ එසේ ප්‍රාණවත් කිරීම/ප්‍රතිෂ්ඨාපනය කළ දින සිටයි.

(iii) කිසියම් හේතුවක් නිසා මුලික ඔප්පුව අවලංගු වුයේ නම් යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රීමියර් ප්‍රතිලාභයද අවලංගු වේ.

(iv) මෙම අතිරේක ආවරණය,

(අ) ලාභාංශ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ අගයක්, ගෙවා නිමි අගයක් හෝ පූර්ණත්ව අගයක් අත්කර නොගනී.

(v) මෙම උපලේඛනය යටතේ සලසා ඇති ප්‍රතිලාභය යටතේ පැන නගින හිමිකමක් වෙනුවෙන් කිසිදු ගෙවීමක් ලැබීම සඳහා පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට අයිතියක් නැත.

(vi) ප්‍රතිලාභ වගුවේ අංක 10 සිට 17 දක්වා සඳහන් කර ඇති, රක්ෂිත මුදල රු. මිලියන දෙක (රු. 2,000,000/-) හෝ ඊට වැඩි වන රක්ෂණ සැලසුම් වලදී හැර, මෙම ප්‍රතිලාභය මගින් ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන රෝහල්ගත කිරීම් සහ සැත්කම් පමණක් ආවරණය වේ. අංක 10 සිට 17 දක්වා වන සැලසුම් යටතේ පලමු උපලේඛනයේ පරිදි ශ්‍රී ලංකාව සහ සියලුම විදේශ රටවල් (USA සහ කැනඩාව හැර) වලදී සිදුකරනු ලබන රෝහල්ගත කිරීම් සහ සැත්කම් ආවරණය වනු ඇත.

Specimen

(vii) ආවරණ වර්ධක ප්‍රතිලාභය හෝ පුනස්ථාපන ප්‍රතිලාභය අදාළ නොවන අවස්ථාවකදී, යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් යටතේ එක් අයෙකුට එක් සැලසුම් වර්ෂයක් සඳහා ඉල්ලුම් කළ හැකි උපරිම රක්ෂණ හිමිකම් මුදල, යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් රක්ෂිත මුදලින් 100% සීමාව ඉක්මවා යා නොහැක.

(viii) යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ පුද්ගලයෙකුට සමාගම වෙතින් ලබාගත හැකි සියලුම රක්ෂණ සැලසුම්වල උපරිම රක්ෂිත මුදල රු. මිලියන හතලිහ (රු. ලක්ෂ 400) කට සීමා වේ.

(ix) ඔප්පුහිමියා විසින් මෙම ඔප්පුවේ ඔප්පු කාල සීමාව තුළ බලපැවැත්වෙන, අනෙකුත් රක්ෂණ සමාගම් වලින් ලබාගන්නා ලද මේ හා සමාන අනෙකුත් වෛද්‍ය වියදම් රක්ෂණාවරණ සම්බන්ධයෙන් සමාගම දැනුවත් කළ යුතුය. මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වන පුද්ගලයකු වෙනුවෙන් ඔප්පුව යටතේ හිමිකම් පෑ හැකි රෝහල් වියදම් ආවරණය වන වෙනත් රක්ෂණ ඔප්පු ඇත්නම් සමාගම මෙම ඔප්පුවේ පළමු උපලේඛනයේ සඳහන් උපරිම සීමාවන්ට සහ ඔප්පුවේ විධිවිධාන සහ කොන්දේසි වලට යටත්ව ගෙවිය හැකි උපරිම හිමිකම් මුදලින්, අනිකුත් රක්ෂණ ආයතන මගින් ගෙවූ හෝ ගෙවීමට තීරණය කර ඇති මුදල අඩු කර ඉතිරි මුදල පමණක් ගෙවනු ලබයි.

(x) යූනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය ලබාගත හැක්කේ (i) ශ්‍රී ලාංකික පුරවැසියන් සහ (ii) අවම වශයෙන් මාස 6 ක් ශ්‍රී ලංකාවේ ජීවත් වන සහ ශ්‍රී ලංකාව තුළ සත්‍ය වශයෙන් පදිංචි ලිපිනයක් සහිත ශ්‍රී ලංකාවේ පදිංචි වූවන්ට පමණි. රක්ෂිතයා දින 90 ක් හෝ ඊට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත් වන්නේ නම් සැලසුම් අංක 10 සිට 17 දක්වා සැලසුම් යටතේ ලැබෙන ආවරණය අවලංගු වේ. කෙසේ වුවද රක්ෂණ හිමියා ආපසු ශ්‍රී ලංකාවට පැමිණි විට රක්ෂණ සැලසුම ආපසු සක්‍රීය වන අතර මුලින් පැවති වගන්ති හා කොන්දේසි යටතේ එය නැවත ක්‍රියාත්මක වේ.

(xi) පිටරටකදී USA සහ කැනඩාව යන රටවල් හැර ප්‍රතිකාර ලබාගන්නේ නම් සැලසුම් හිමියා ඒ සම්බන්ධයෙන් සමාගම වෙත ලිඛිතව දන්වා අවසර ලබාගත යුතු ය. මෙම සැලසුමේ ප්‍රථම උප කොටස යටතේ දක්වා ඇති උපරිම සීමාවන්ට යටත්ව විදේශ රටවල රෝහල්ගත වී ප්‍රතිකාර ගැනීම් සඳහා වන වියදම් ප්‍රතිපූරණය සිදුකෙරේ. රෝහලින් බැහැර වන දිනයට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත විනිමය අනුපාතයන්ට අනුව, ශ්‍රී ලංකා මුදල් වලින් අදාළ ප්‍රතිලාභ ගෙවීම සිදුකෙරෙනු ඇත.

(xii) කිසියම් හිමිකම් මුදල් ඉල්ලීමක් සමාගම විසින් පිළිගනු ලැබුවේ නම්, ඒ සම්බන්ධ මුදල් තම අභිමතය පරිදි රක්ෂණ හිමියාට හෝ, අදාළ රෝහලට හෝ වෙනත් අදාළ සේවා සම්පාදකයෙකුට හෝ ගෙවීමේ පූර්ණ අයිතිය සමාගම සතු ය. මෙසේ රෝහල වෙත හෝ වෙනත් අදාළ පාර්ශවයක් වෙත ගෙවන ලද මුදල, හිමිකම් මුදල් ඉල්ලීමට අදාළව සමාගම විසින් පූර්ණ සහ අවසන් වශයෙන් හිමිකම් මුදල් ගෙවනු ලැබීමක් ලෙස සැලකිය යුතු අතර එය මෙම ප්‍රතිලාභය යටතේ රක්ෂණ සැලසුම් හිමියා වෙත කරන ලද හිමිකම් මුදල් ගෙවීමක් ලෙස සැලකිය යුතු වේ.

(xiii) ජීවිත රක්ෂණ හිමියා විසින් කිසියම් රක්ෂණ ඔප්පු වර්ෂයකදී හිමිකම් මුදල් සම්බන්ධයෙන් තමන් විසින් වියදම් දැරීමට එකඟව ඩිඩක්ටිබල් (Deductible) ඔප්ෂන් එකක් තෝරාගනු ලැබුවේ නම් සහ එම මුදලට සමාන මුදලක් සමාගම විසින් ගෙවීමට අනුමත හිමිකම් මුදලින් එක් ඔප්පු වර්ෂයක් තුලදී ජීවිත රක්ෂණ හිමියා විසින් දැරිය යුතු අතර (සමාගම වෙත දැනුම් දී සමාගම මගින් ගෙවීමට අනුමත වූ හිමිකම් සඳහා) එම අදාල මුළු මුදල රක්ෂණ හිමියා විසින් දරාගැනීමෙන් අනතුරුව පමණක් පැනනඟින සෙසු හිමිකම් මුදල් ඔප්පු කොන්දේසි යටතේ හිමිකම් ගෙවීම සඳහා සලකා බැලීමට සමාගම මගින් කටයුතු කරනු ඇත.

### 3.2.4.9 මෙම ආවරණයට අදාළ බැහැර කිරීම්

සෘජුව හෝ වක්‍රව පහත සඳහන් හේතු බලපෑම නිසා රෝහල්ගත වීමට හෝ සැත්කමක් කිරීමට සිදුවන අවස්ථාවකදී, ඒ සඳහා කිසිදු ගෙවීමක් කිරීමට සමාගම බැඳී නොසිටී.

Specimen

(i) සියදිවි නසාගැනීමේ උත්සාහයකදී ඇතිවන හෝ තමන් විසින් තමන්ටම සිදුකරගනු ලබන තුවාල (මත්ද්‍රව්‍ය සහ මත්පැන් අවභාවිතයෙන් ඇතිවන ප්‍රතිවිපාක ඇතුළුව, එහෙත් එයට සීමා නොවී) සහ/හෝ

(ii) මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් ඇතිවන සංකූලතා හෝ ප්‍රතිකාර අවශ්‍ය වන රෝගී තත්ත්ව/මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීමෙන් මුදවාගැනීමට සිදුකරන ප්‍රතිකාර සහ මත්පැන් පානය කර රිය පැදවීමෙන් සිදුවන රිය අනතුරු; සහ/හෝ

(iii) කිසියම් රෝග තත්ත්වයන් පිළිබඳ යෝජනා පත්‍රයේ හෝ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි හෙළිදරව් කොට එම තත්ත්වයන් ආවරණය වන බවට සමාගම විසින් ලිඛිතව ප්‍රකාශ කර ඇති විටකදී හැරෙන්නට ඔප්පුව ලබා ගැනීමට පෙර සිටම පැවති රෝග, අසනීප හෝ ආබාධ තත්ත්වයන් (රෝග නිශ්චයක් කළද, නොකළද, ප්‍රතිකාර ලැබූ හෝ නොලැබූ කිසියම් රෝග තත්ත්වයක්, රෝග ලක්ෂණයක්, තුවාලයක් හෝ/හා සමාන තත්ත්වයක්. එමෙන්ම රක්ෂිතයා දැනුවත්ව සිටි හෝ නොසිටි පෙර පැවති රෝගයකින් ඍජුවම හෝ වක්‍රාකාරයෙන් ඇතිවන සංකූලතා ද පෙර පැවති රෝග තත්ත්වයන් ලෙස සැලකේ); සහ/හෝ

(iv) යුද්ධයක් හෝ යුද තත්ත්වයකට සමාන සිදුවීමක්, ත්‍රස්තවාදී ක්‍රියාවක්, ආක්‍රමණයක්, විදේශ සතුරු ක්‍රියාවක්, එදිරිවාදීකමක්, යුධ තත්ත්වයක් ප්‍රකාශ කළ හෝ නොකළ යුද්ධයකට සමාන සිද්ධියක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, විප්ලවයක්, රාජ්‍ය හෝ කිසියම් පළාත් පාලන අධිකාරියක නියෝගය මත කෙරෙන රාජසන්තකවීමට එරෙහිවීමක්, නීත්‍යානුකූලව පිහිටුවන ලද ආණ්ඩුවක් බලයෙන් පෙරළාදැමීම සඳහා ක්‍රියාකරන පුද්ගලයෙකුට හෝ සංවිධානයකට සහය දැක්වීමක්; සහ/හෝ

(v) නාවුක, ගුවන් හෝ සන්නාහ සන්නද්ධ බලකාවල, හමුදා මෙහෙයුම් නිසා හෝ ත්‍රස්තවාදීන්, කැරලිකරුවන් මැඩපැවැත්වීම සඳහා හමුදා නියෝග මත අවිආයුධ පාවිච්චි කිරීමේ මෙහෙයුම් වලට සහභාගිවීම නිසා; සහ/හෝ

(vi) පරමාණුක අවදානම්: එනම් පරමාණුක බලශක්තියට (පරමාණුක ප්‍රතික්‍රියා, විකරණ අවදානම්), පරමාණුක අපද්‍රව්‍යවලට හෝ ඕනෑම ආකාරයක රසායනික බලපෑම්වලට නිරාවරණය වීම; සහ/හෝ

(vii) අවදානම් සහිත ක්‍රිඩා/ක්‍රියාකාරකම්; පහත සඳහන් ක්‍රීඩා/ක්‍රියාකාරම් ඇතුලුව එහෙත් ඒවාට පමණක් සීමා නොවූ, භයානක නැතහොත් අනතුරුදායක ක්‍රියාකාරකම්; දියයට කිමිදීම, මෝටර් රථ ධාවන,ගවනේ සිට පැරෂුට් වලින් පැනීම, එල්ලී ලිස්සායාම (හැංග් ග්ලයිඩින්), කඳු හෝ ගිරි ශිඛර තරණය කිරීම, දෙපයින් හැර කරන ඕනෑම වර්ගයක ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජී පැනීම, ගල් ගුහා තරණය හා ගවේෂණය (පොට්හෝලින්), දඩයම් කිරීම්, පොලෝ ක්‍රීඩා, අයිස් හොකී ඇතුලුව අනෙකුත් හිම ක්‍රීඩා හෝ සමාගම විසින් ලිඛිතව අනුමත කර ඇති ක්‍රීඩාවක/ක්‍රියාවකට හැර ඕනෑම වෘත්තීමය ගණයට වැටෙන ක්‍රීඩාවක්; සහ/හෝ

(viii) හිම කඳු කඩාවැටීම්, නාය යාම්, භූමිකම්පා, ගංවතුර, භූමිකම්පා හෝ ගිනිකඳු පිපිරීම් නිසා ඇතිවන සුනාමි හෝ උදම් රළ, සුළිසුළං, කුණාටු, ටෝනේඩෝ ඇතුළු සහ තවත් ආකාරයේ ස්වභාවික උපද්‍රව; සහ/හෝ

(ix) අත්හදා බැලීම් සඳහා කරනු ලබන ප්‍රතිකාර කිරීම් සහ රෝග නිශ්චය සඳහාම පමණක් කරනු ලබන බයොප්සි, එන්ඩොස්කොපි, ලැප්රොස්කොපි, ආර්තරොස්කොපි, එක්ස් කිරණ පරික්ෂා හෝ රසායනාගාර පරීක්ෂණ හෝ රෝහල් ගතවීමට හේතුවූ රෝග, අසනීප හෝ තුවාල නිශ්චය කරගැනීම සඳහා සම්බන්ධතාවයක් නොමැති අනෙකුත් පරීක්ෂණ; සහ/හෝ

(x) සමාගමේ ලිඛිත අනුමැතිය ඇතිවිටෙක හැර; ඇස් කණ්නාඩි/කාච, ශ්‍රවණාධාර සම්පාදනය, කිහිලිකරු,කෘතිම අත්/පා, දන්ත උපාංග, කෘතිම දත් සහ අනෙකුත් සියලු බාහිර උපාංග සඳහා වන ගාස්තු; සහ/හෝ

(xi) ශරීරයේ සිදුවන ස්වාභාවික වෙනස්කම් (ආර්තවහරණය) නිසා අවශ්‍ය වන සැත්කම්, ගර්භනීභාවය, ගබ්සා වීම සහ ගබ්සා කිරීම් හෝ ඉන් ඇතිවන සංකූලතා හෝ දරු ප්‍රසූතිය හෝ

Specimen

ඒ හා සම්බන්ධව ඇතිවන සංකූලතා; සහ/හෝ

(xii) දරුවන් ලැබීමේ නොහැකියාව හා මඳ සරු බව නිසා කෙරෙන පරීක්ෂණ සහ ඒ සඳහා කෙරෙන ප්‍රතිකාර, ලිංගික වෙනස් කිරීම් සඳහා වූ සැත්කම්, කෘතිම සංසේචනය හෝ දරුවන් පිළිසිඳවා ගැනීම සම්බන්ධ සැත්කම්, පැලෝපීය නාලයේ වන සිඳලීම් හා මාරු කිරීම්, කළල මාරු කිරීම්, ස්ත්‍රී බීජ බද්ධය යනාදී ප්‍රතිකාර ක්‍රම හෝ උපත්පාලන ක්‍රම Gamete Intra-Fallopian Transfer (GIFT) සැත්කම්, Zygote intra-fallopian transfer (ZIFT) සැත්කම්, Embryo Transport, Donor Ovum වැනි සැත්කම් හා ප්‍රතිකාර ක්‍රම සඳහා යන වියදම්. සහ/හෝ

(xiii) උපතේදීම ඇතිවන අබල දුබලතා, අක්‍රමිකතා සහ සංජානීය රෝග, වර්ණ දේහ විකෘතිතා නිසා ඇතිවන අසාමාන්‍යතා (උදා: ඩවුන්ස් සින්ඩ්‍රෝම්); සහ/හෝ

(xiv) ප්‍රවේනිගත රෝග ජාන දෝෂ සහ මූලික ජනක සෛල බද්ධය/සැත්කම්/තැන්පත් කිරීම; සහ/හෝ

(xv) රෝගී තත්ත්වයක් හෝ ශරීරයේ ඇතිවන තුවාලයක් නිසා අවශ්‍ය වන අවස්ථාවකදී හැර අනෙක් ඕනෑම අවස්ථාවකදී සිදුකරනු ලබන ඕනෑම ආකාරයක රූපලාවණ්‍ය ප්‍රතිකාර, අක්ෂි ප්‍රතිකාර, සහ ඕනෑම ආකාරයක ප්ලාස්ටික් සැත්කම්; සහ/හෝ

(xvi) වෙනත් පාර්ශවයකට ඉන්ද්‍රියන් ප්‍රදානය කිරීම සඳහා කරන සැත්කම් (දායකයෙකු ලෙස) හෝ ඉන්ද්‍රිය ප්‍රදානය සුදුසුදැයි බැලීමට සිදුකරන පරීක්ෂණ සහ ප්‍රතිකාර; සහ/හෝ

(xvii) වෛද්‍ය හේතූන් මත නොවන ප්‍රතිකාර ක්‍රම හෝ සුදුසුකම්ලත්, ලියාපදිංචි වෛද්‍යවරයකු/ශල්‍ය වෛද්‍යවරයෙකුගේ අනුමැතියෙන් තොරව හෝ රෝගයකට හෝ තුවාලයකට හැර වෙනත් කිසියම් හේතුවක් නිසා සිදුකරන ප්‍රතිකාර; සහ/හෝ

(xviii) අඥාත හේතුක අපස්මාරය සහ මනෝ චිකිත්සක හෝ මානසික රෝග නිසා කරනු ලබන ප්‍රතිකාර; සහ/හෝ

(xix) ස්ථූලතාවට ප්‍රතිකාර, බර අඩුකිරීම හෝ බර කළමනාකරණය සඳහා කරනු ලබන සැත්කම් හෝ ප්‍රතිකාර ක්‍රම; සහ/හෝ

(xx) මෙම ආවරණය යටතේ බැහැර කිරීමට ලක්නොවන රෝගයක්, අසනීපයක් හෝ තුවාලයක් හේතුවෙන් හෝ හදිසි අනතුරක් නිසා අවශ්‍ය වන සුන්නත් කිරීම හැර අනෙකුත් සුන්නත් කිරීම්; සහ/හෝ

(xxi) නිල වශයෙන් පිළිගත් (ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් හෝ දේශීයව) වසංගත රෝගයන්, මුළු රටේ පැතිර ඇති රෝග තත්ත්වයන් සහ රජය විසින් රෝග නිවාරණය වෙනුවෙන් පවත්වන වැඩසටහන්; සහ/හෝ

(xxii) HIV රෝගය, AIDS රෝග තත්ත්වය හා/හෝ ලිංගිකව බෝවන රෝග හා ඒ ආශ්‍රිත රෝග තත්ත්ව නිසා ඇතිවන තත්ත්වයන්; ඒඩ්ස් හා සමාන කිසියම් අදාළ රෝග තත්ත්වයක් සෘජුව හෝ වක්‍රව හේතු වන්නේ නම් සහ/හෝ

(xxiii) සුදුසුකම්ලත්, ලියාපදිංචි වෛද්‍යවරයෙකු/ශල්‍ය වෛද්‍යවරයකු හැරෙන්නට වෙනත් පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන ප්‍රතිකාර (රක්ෂිත පුද්ගලයාගේ නෛතික නිවසේ වෙසෙන්නෙකු විසින්, රක්ෂිත පුද්ගලයා ලෙස හෝ රක්ෂිතයාගේ පවුලේ සාමාජිකයෙකු ලෙස කලත්‍රයා, සහෝදරයා/සහෝදරිය, දෙමාපියන් හෝ දරුවෙකු විසින් දෙන ලද වෛද්‍ය සේවාවන්ද ඇතුළත් වේ) සහ/හෝ

(xxiv) බටහිර වෛද්‍ය ක්‍රමයට ඇතුළත් නොවන ස්වභාවික ප්‍රතිකාර ක්‍රම, කටු චිකිත්සාව, ශාකසාර ප්‍රතිකාර සහ ආයුර්වේද ප්‍රතිකාර ආදිය සිදුකරන අවස්ථා; සහ/හෝ

(xxv) රෝහල විසින් අයකරනු ලබන ඕනෑම ආකාරයක සේවා ගාස්තු, වැට්, බදු, අතිරේක ගාස්තු, ඇතුළත්වීමේ ගාස්තු/ ලියාපදිංචි ගාස්තු ආදිය; සහ/හෝ

(xxvi) රෝහල්ගත වී සිටි කාලයේදී පෞද්ගලික පරිභෝජනය සඳහා ලබාගත් අතිරේක පහසුකම්

Specimen

වන, සහ රෝහල/සාත්තු නිවාසය මගින් නිකුත් කරන ලද බිල්පතේ පැහැදිලිව වෙනම සඳහන් කර ඇති, රූපවාහිනී හා දුරකථන පහසුකම් ආදිය සඳහා වන ගාස්තු; සහ/හෝ

(xxvii) Sleep Apnoea Syndrome (C.P.A.P), Continuous Ambulatory Peritoneal Dialysis (C.P.A.D), සහ ක්ලෝමීය ශ්වාස තත්ත්වය සඳහා වන Oxygen concentrator වැනි ප්‍රතිකාර ක්‍රම සඳහා යන වියදම් ඇතුළුව, ප්‍රතිකාරයෙන් පසු කරන සත්කාර වශයෙන් නිවසේදී භාවිතා කරන ලද ඕනෑම ආකාරයක බාහිර වෛද්‍ය උපාංග සඳහා යන වියදම්; රෝහලින් පිටවීමෙන් පසු නිවසේදී භාවිතය සඳහා නියම කරනු ලබන සියලුම ආකාරයේ වෛද්‍ය උපකරණ වෙනුවෙන් වන වියදම් සහ/හෝ

(xxviii) හදිසි අනතුරක් නිසා ස්වභාවික දත්වලට සිදුවූ හානිවලට ප්‍රතිකාරයක් ලෙස හැර, වෙනත් හේතුවක් නිසා සිදුකරනු ලබන දන්ත වෛද්‍ය සැත්කම් හා ප්‍රතිකාර ආදිය; සහ/හෝ

(xxix) උපසමනය, සාමාන්‍ය දුබලතාව, කාලයත් සමග ක්‍රමයෙන් සුව වන රෝග සාමාන්‍ය ගිලන් බව/දුර්වල වීම, සහ බාහිර හෝ අභ්‍යන්තර වශයෙන් උප්පත්තියෙන් පැවතෙන අසනීප තත්ත්ව/රෝග/විකලතා; සහ/හෝ අධික තෙහෙට්ටුව, විවේක ගැනීමේ ප්‍රතිකාරය, උපතින් එන අභ්‍යන්තර හෝ බාහිර රෝග තත්ත්ව හා දුබලතා සහ/හෝ

(xxx) ඕනෑම ආකාරයක එන්නත්; සහ/හෝ

(xxxi) රෝගයක් හෝ තුවාලයක් සඳහා කෙරෙන ප්‍රතිකාරවල අනිවාර්ය අංගයක් නොවන, අදාළ වෛද්‍යවරයා විසින් තහවුරු නොකරන ලද විටමින්, ටොනික් වර්ග සහ පෝෂණ අතිරේක ආදිය; සහ/හෝ

(xxxii) හදිසි අනතුරක් නිසා සිදුවූ හානියක් නිවැරදි කිරීමක් බවට සමාගමට සතුටුදායක කරුණු ඉදිරිපත් කරන ලද අවස්ථාවකදී හැර, නාසයේ හැඩයේ වෙනස්කම් ආදිය සිදුකිරීමට කරනු ලබන සැත්කම්; සහ අධිවර්ධිත බඹුරු අස්ථිය සඳහා සිදුකරන සැත්කම් සහ/හෝ

(xxxiii) මෙහි දක්වා ඇති, පැය 24 ක් තුළ අවසන් වන සැත්කම් හැර බාහිර රෝගී රෝග විනිශ්චයන්, ප්‍රතිකාර හා සැත්කම්, නිර්දේශ කර නොමැති ඖෂධ සහ වෛද්‍ය සැපයුම්, හෝමෝන ප්‍රතිස්ථාපන චිකිත්සා, ලිංග පරිවර්තන හෝ ලිංග පරිවර්තනය නිසා කිරීමට සිදුවන ප්‍රතිකාර ආදිය; සහ/හෝ

(xxxiv) මෙම සැලසුම යටතේ ආවරණය වන, මූලික ප්‍රතිකාරවලින් පසු සත්කාරයන් අවශ්‍ය නොවන රෝග තත්ත්වවලදී, රෝග විනිශ්චයකින් තොරව පැය 24 ක කාලයක් රෝහලේ රැඳී සිට ඇති අවස්ථා (ප්‍රතිකාර ලබා නොගෙන රෝහලක නැවතී සිටීම සහ වෛද්‍යවරයෙකු විසින් එක දිගට, සක්‍රීය ප්‍රතිකාරයක් ලබා නොදෙන අවස්ථාද මීට ඇතුළත් වේ).

(xxxv) විවේක මධ්‍යස්ථාන, සුවවීම් මධ්‍යස්ථාන, භාරකාර නිවාස, වැඩිහිටි නිවාස, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සඳහා වන නිවාස, මානසිකව රෝගී වූවන් සඳහා වන මධ්‍යස්ථාන ආදියේදී ලබාගන්නා ප්‍රතිකාර (අදාළ ආයතනය රෝහලක් හෝ සාත්තු නිවාසයක් ලෙස නිසි බලධාරී ආයතනවල ලියාපදිංචි කර තිබුණද මෙය අදාළ වේ); සහ/හෝ

(xxxvi) සමාගම විසින් වෙනත් ආකාරයකට දක්වා නොමැති නම් ශ්‍රී ලංකාවෙන් පිටතදී කරනු ලබන ප්‍රතිකාර සහ/හෝ

(xxxvii) ජල ප්‍රතිකාර මධ්‍යස්ථාන, ස්වාභාවික ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ ස්පා ආදියේදී සිදුකරනු ලබන ප්‍රතිකාර

Specimen

**උපලේඛණ අංක 3.2.5**

## 3.2.5 පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන්) (TPS)

### 3.2.5.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ඔප්පුවෙහි පළමු උපලේඛණයෙහි II කොටසේ පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා (හදිසි අනතුරක් හෝ රෝග යක් හේතුවෙන්) ප්‍රතිලාභය (TPS) ඇතුලත් වේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව, පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම් සහ මෙම ප්‍රතිලාභය සඳහා අදාළ වාරිකය ගෙවා තිබේනම්, සමාගම සෑහීමට පත්වන පරිදි රක්ෂිතයාගේ පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවය හදිසි අනතුරක් හෝ රෝගයක් මඟින් සිදුවූ බවට සාක්ෂි ඉදිරිපත් කළහොත්, සහ එම අකර්මණ්‍යතාවය දින එකසිය අසූවකට (180) නොඅඩු කාලයක් පැවතීමෙන් පසු, මෙම ප්‍රතිලාභය යටතේ අදාළ පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයක් වශයෙන් ඔප්පු වුවහොත් සහ රැකියාවක හෝ වෘත්තියක ප්‍රමාණවත්ව යෙදී ආදායමක් ලැබීමට නොහැකි බව තහවුරු වුවහොත්, රක්ෂණ ඔප්පුවේ පළමු උපලේඛණයේ II කොටසේ 'TPS' යටතේ සඳහන් රක්ෂිත මුදලට සමාන මුදලක්, සමාන වාර්ෂික වාරික පහ (05) කින් ගෙවන අතර, ඉන් පළමු කොටස සමාගම හිමිකම සඳහා වගකීම භාරගත් දිනද, ඉතිරි කොටස් මුදල් පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා හිමිකමට පසුව යෙදෙන ඔප්පු සංවත්සරයන්හිදී ගෙවනු ලැබේ. රක්ෂණ ඔප්පුව කල්පිරීම හෝ ජීවිත රක්ෂිතයාගේ මරණය යන අවස්ථාවන්, මෙම කොටස් මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිම කිරීමට පෙර සිදුවුවහොත්, එම නොගෙවන ලද ඉතිරි කොටස් මුදල්, රක්ෂණ ඔප්පුව කල් පිරීමකදී ජීවිත රක්ෂිතයා වෙතද, ජීවිත රක්ෂිතයාගේ මරණයකදී රක්ෂිතයාගේ උරුමකරුවන් වෙතද ගෙවනු ලැබේ.

උපලේඛණ අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.2.5.2 ආවරණය හිමි නොවන කාලය

කිසියම් රෝගයක් හේතුකොටගෙන සිදුවන පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයක්, ඔප්පුව ආරම්භක දිනය හෝ ඔප්පුවේ දිනය හෝ නැවත ප්‍රාණවත්/ප්‍රතිෂ්ඨාපනය කල දිනය යන අවස්ථා වලින් අවසාන සිදුවීමේ සිට දින තිහ (30) කට ප්‍රථම සිදුවන අකර්මණ්‍යතාවකට මෙම ප්‍රතිලාභ ගෙවීම අදාළ නොවේ.

මෙම ප්‍රතිලාභය රක්ෂණ ඔප්පුව ආරම්භ කල දිනට පසුව ඔප්පුවට ඇතුලත් කරන ලද්දේ නම් ආවරණ හිමි නොවන කාල සීමාව, ප්‍රතිලාභය ඇතුලත් කල දින සිට දින එකසිය අසූව (180) කි.

### 3.2.5.3 වාර මුදල්

මෙම ප්‍රතිලාභය සඳහා වාරික ගෙවීම පිළිබඳව ඔප්පුවේ උපලේඛණයේ II කොටසේ දක්වා ඇති පරිදි පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය යටතේ ගෙවිය යුතු වාරිකය සහතික කරනුයේ මෙම ප්‍රතිලාභය ආරම්භ කළ දින සිට වසර එක (01) ක කාලයක් සඳහා පමණක් වන අතර ඒ බව රක්ෂිතයාට දින තිහ (30) ක දැනුම් දීමකින් පසුව වාරික මුදල් හෝ අදාළ කොන්දේසි සංශෝධනය කිරීමේ බලය සමාගම සතුය. එවැනි සංශෝධන බලපවත්වනු ලබන්නේ ඊළඟ ඔප්පු සංවත්සර දිනයේ සිටය.

### 3.2.5.4 රැකියාවේ වෙනස්වීම් දැන්වීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීම්ක් සිදුවුවහොත් එම වෙනස්වීමේ දින සිට දින දහහතරක් (14) ක් ඇතුළත ඒ බව සමාගම වෙත දැනුම් දී ඒ අනුව මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වූ අවදානම් නැවත අනුමත කරගත යුතුය. අකර්මණ්‍යතාවය සිදුවන අවස්ථාවේ දී ජීවිත රක්ෂිතයා යෝජනා පත්‍රයේ /සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් රැකියාවට වඩා වෙනස් වූ රැකියාවක නිරතවීමෙන් පැනනගින්නාවූ හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම කිසිසේත් බැඳී නොමැත.

### 3.2.5.5 හිමිකම්පෑම පිළිබඳ දැන්වීම හා සනාථ කිරීම

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම්පෑමකට තුඩුදිය හැකි රෝගයක් හෝ තුවාල පිළිබඳ එම සිදුවීමෙන් දින හැටක් (60) ඇතුලත සමාගමේ ප්‍රධාන කාර්‍යාලය හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිතව දැන්වීමක් කළ යුතු වන අතර යෝජනා පත්‍රයේ දී ඇති ලිපිනය සහ වර්තමාන ලියාපදිංචි ලිපිනයද සමාගම වෙත දැන්විය යුතුය. නියමිත කාලය තුළදී එසේ දැන්වීමට අපොහොසත් වීම මගින් එම හිමිකම් නිශ්ප්‍රභා කිරීමේ බලය සමාගම සතුවේ. අකර්මණ්‍යතාවය සනාථ කිරීම සඳහා අවශ්‍ය වන සාක්ෂි, සමාගමේ වියදම මත ලබා දිය යුතුය

### 3.2.5.6 අකර්මණ්‍යතාවය දිගමට පවත්නා බවට සාධක

අකර්මණ්‍යතාවය පිළිබඳ සාධක සෑහීමකට පත්විය හැකි බව සමාගම විසින් පිළිගෙන තිබුණත් එම අකර්මණ්‍යතාවය දිගමට පවතින බවට සාධක ජීවිත රක්ෂිතයාගෙන් සාධාරණ කාල සීමාවක් ඇතුළත, සමාගමේ වියදම මත ඉල්ලීමට සමාගමට අයිතිය තිබේ. එබඳු සාධක සමාගමට සැපයීමට ජීවිත රක්ෂිතයා පැහැර හරින විටෙක හෝ වැටුපක් ලැබීම සඳහා හෝ වෙනත් අයුරින් හෝ යම් වැඩක හෝ රැකියාවක යෙදීමට ජීවිත රක්ෂිතයාට හැකියාවක් ඇති වූ විටක හෝ එම අවස්ථා දෙකෙන් කුමක් එළඹියද මෙම ප්‍රතිලාභය යටතේ රක්ෂිතයාට කරනු ලබන ගෙවීම් නතර වනු ඇත.

### 3.2.5.7 කොන්දේසි

(i) ප්‍රතිලාභ ගෙවීම සලකා බැලීම සඳහා, මෙම පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාව සිදුවිය යුත්තේ;

   (අ) මෙහි පළමු උපලේඛණයේ II කොටසේ සඳහන් පරිදි මෙම ප්‍රතිලාභය කල්පිරීමේ දිනයට පෙර; හෝ

   (ආ) ජීවිත රක්ෂිතයාගේ වයස අවුරුදු හැත්තෑව (70) සපිරෙන දිනට හෝ ඊට පසු එළඹෙන ඔප්පු සංවත්සර දින යන සිදුවීම් දෙකෙන් පළමු සිදුවීමේ දීය.

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය ඉකුත් වී ගොස් තවදුරටත් වාරිකය නොගෙවා ඇත්නම් මෙම ප්‍රතිලාභය අක්‍රිය වනු ඇත.

(iii) මුල් රක්ෂණ ඔප්පුව අවලංගු වන අවස්ථාවක මෙම අතිරේක ප්‍රතිලාභයද අවලංගු වනු ඇත.

(iv) මෙම ප්‍රතිලාභය;

   (අ) ලාභ සඳහා දායක නොවන අතර

   (ආ) පවාරණ, ගෙවානිමි හෝ පූර්ණත්ව අගයකට හිමිකම් නොලබනු ඇත.

(v) පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට මෙම ප්‍රතිලාභය යටතේ පැනනගින හිමිකමක් ලබාගැනීමට අයිතිවාසිකමක් නොමැත.

(vi) තනි පුද්ගලයෙකු විසින් සියළුම රක්ෂණ සමාගම් මගින් මෙම ප්‍රතිලාභය සඳහා උපරිම වශයෙන් හිමිකම් කිව හැක්කේ රුපියල් මිලියන පනහක් (රු.50,000,000) දක්වා පමණයි.

(vii) මෙම ඔප්පුවේ අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (EPD) යටතේ කිසියම් හිමිකමක් සඳහා සමාගම විසින් වගකීම පිළිගෙන ඇති නම්, මෙම ප්‍රතිලාභය යටතේ වගකීම පිළිගැනීමේ දී අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය (EPD) සඳහා ගෙවන ලද මුදල අඩු කරනු ඇත.

### 3.2.5.8 මෙම ප්‍රතිලාභය සඳහා වන බැහැරකිරීම්

මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑමට හේතුවූ සිද්ධිය හෝ රෝග තත්ත්වය පහත සඳහන් සිද්ධි හෝ සිද්ධීන් එකකට හෝ වැඩි ගණනක සෘජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් සිදුවී ඇත්නම් මෙම ප්‍රතිලාභය යටතේ කිසිදු හිමිකමක් ගෙවීමට සමාගම බැඳී නොමැත.

Specimen

(i) තමන් විසින් කරගත් තුවාලයකින් හෝ සියදිවි හානිකර ගැනීමට තැත් කිරීමෙන්; සහ/හෝ

(ii) පමණ ඉක්මවා මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන්, මත්පැන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් සිදුවන රෝගී තත්ත්වයන්, එමෙන්ම මත්පැන්/මත්ද්‍රව්‍ය භාවිත කර තිබෙන අවස්ථාවක සිදුවන රිය අනතුරු හා අනෙකුත් හදිසි අනතුරකදී; සහ/හෝ

(iii) කලින් තිබූ රෝගී තත්ත්වයක් හෝ තුවාල හෝ එවන් තත්ත්වයන් රක්‍ෂිතයා ජීවිත රක්‍ෂණ යෝජනා පත්‍රයේ/සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කර ඔප්පුව ආරම්භක දිනට හෝ ඊට පෙර රක්‍ෂණ ඔප්පුව මගින් හෝ වෙනයම් තහවුරු ලිපියක් මගින් සමාගම විසින් ලිඛිතව පිළිගෙන තිබේනම් හැර; සහ/හෝ

(iv) පිළිගත් ගුවන් සමාගමක ගාස්තු ගෙවන මගියෙකු වශයෙන් හැර ජීවිත රක්‍ෂිතයා කවර තරාතිරමක හෝ ගුවන් තරණයෙහි හෝ ගුවන් යානයක් හැසිරවීමකදී හෝ ගුවන් යානයක් තුල කාර්යභාරයක් නොමැතිව ඉන් ඉවත්වීමට සිදුවීම නිසා සිදුවන හදිසි අනතුරක් හේතුකොට ගෙන ඇතිවන තුවාල හේතුවෙන්; සහ/හෝ

(v) යුද්ධයක් හෝ යුද්ධයක් බඳු මෙහෙයුමක් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්) සිවිල් යුද්ධයක්, කැරැල්ලක් අභිද්‍රෝහයක් කුමන අන්දමේ හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක්, ජන කැළඹීමක්, හමුදාව විසින් හෝ වෙනත් අන්දමකින් හෝ රාජ්‍ය බලය පැහැර ගැනීමක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, ආක්‍රමණයක්, විදේශ සතුරන්ගේ ක්‍රියාවක් හෝ නීත්‍යානුකූල අධිබලයකට විරුද්ධව යම් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවන තුවාල; සහ/හෝ

(vi) යුද්ධ, නාවුක ගුවන් හෝ පොලිස් හමුදා සංවිධානයක හෝ ඊට සමාන සේවයක යෙදී සිටියදී හමුදා අණමත ත්‍රස්තවාදීන්, රාජ්‍ය විරෝධී ක්‍රියාකාරීන් මැඩ පැවැත්වීමට සහය වීමෙන්; සහ/හෝ

(vii) න්‍යෂ්ටික අනතුරු උදා: න්‍යෂ්ටික බල ශක්තියට නිරාවරණය වීම, (විකිරණශීලීතා දූෂණය, න්‍යෂ්ටික බද්ධය, විබද්ධය) හෝ ඕනෑම න්‍යෂ්ටික අපද්‍රව්‍යයක් නිසා හෝ රසායනික දූෂණය හේතුවෙන්; සහ/හෝ

(viii) භයානක නැතහොත් අනතුරුදායක ක්‍රීඩා, නමුත් පහත සඳහන් ක්‍රියාකාරකම් වලට පමණක් සීමා නොවූ දියයට කිමිදීම, මෝටර් රථ ධාවන තරඟ, අහසේ සිට පැරෂුට් මගින් පැනීම, හැංග් ග්ලයිඩින්, කඳු හෝ ගිරි ශිඛර තරණය, දෙපයින් හැර අනෙකුත් ඕනෑම වර්ගයේ ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජි පැනීම, පොතොලින්, දඩයමේ යෙදීම, බාධක අශ්ව තරඟ, පෝලෝ ක්‍රීඩා, හිම ක්‍රීඩා, අයිස් හොකී ක්‍රීඩාවන් හෝ සමාගම ලිඛිතව පිළිගන්නා ලද දෙයකට හැර ඕනෑම අනෙකුත් වෘත්තීමය ගණයට ගැනෙන ක්‍රීඩා වලට සහභාගි වීමෙන්; සහ/හෝ

(ix) ස්වාභාවික අනතුරු පහත සඳහන් ස්වාභාවික අනතුරු වලට පමණක් සීමා නොවූ අයිස් කඳු කඩා වැටීම්, නාය යෑම්, භූමි කම්පා, ගංවතුර, භූමි කම්පා හෝ ගිණිකඳු පිපිරීම් මගින් ඇතිවන සුනාමි හෝ උදම් රළ තත්ත්වයන්, සුළිසුළං, ධාරානිපාත වර්ෂාව, හරිකේන්, ටෝනාඩෝ හා ටයිෆුන් වැනි ස්වාභාවික විපත්; සහ/හෝ

(x) අනතුරකින් සිදුවන තුවාලයක් හේතුවෙන් හෝ ඒ හා සමඟම සිදුවන ආසාදනයක් හේතුවෙන් හැර සිදුවන විෂවීමකින්.

Specimen

## උපලේඛණ අංක 3.2.6

## 3.2.6. යුනියන් හෙල්ත් 360 (UH360)

### 3.2.6.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

යුනියන් හෙල්ත් 360 (UH360) අදාළ වන්නේ එම ප්‍රතිලාභය ඇතුළත් බවට පළමු උපලේඛනයේ දෙවන කොටසේ සඳහන් වන්නේ නම් පමණි
යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ හිමිකම් ගෙවීම සලකා බලනුයේ

(i) පළමු උපලේඛනයේ පරිදි මෙම ආවරණය යටතේ ආවරණය වී ඇති තැනැත්තා රෝගයක් හෝ හදිසි අනතුරක් හේතුවෙන් වෛද්‍යවරයකුගේ නිර්දේශය හා අනුමැතිය ඇතිව පෞද්ගලික හෝ රජයේ රෝහලක අඛණ්ඩව පැය විසි හතරකට (24) වැඩි කාලයක් රෝහල් ගතව සිටියේ නම් සහ/හෝ මෙහි 3.2.6.4 කොටසේ නිර්වචනය කර ඇති සැත්කමක් සිදුකලේ නම් සහ රෝහල් ගාස්තු සහ ප්‍රතිකාර සඳහා වියදම් දරා ඇති විටකදී සහ/හෝ

(ii) ආවරණය හිමි පුද්ගලයා කිසියම් රෝගයක් හෝ හදිසි අනතුරක් නිසා. වෛද්‍යවරයකුගේ නිර්දේශය හා අනුමැතිය ඇතිව අවම වශයෙන් පැය විසි හතරක (24) කාලයක් රජයේ රෝහලක මුදල් නොගෙවන වාට්ටුවක අඛණ්ඩව ප්‍රතිකාර ලැබීමට සිදුවන අවස්ථාවකදී මෙම ලේඛනයේ 3.2.6.2.2 කොටසේ දක්වා ඇති පරිදි රෝහල් දීමනා ප්‍රතිලාභය හිමි වේ.

(iii) ආවරණය හිමි පුද්ගලයාට සෞඛ්‍ය අවශ්‍යතාවක් ලෙස වෛද්‍යවරයෙකුගේ නිර්දේශය හා අනුමැතිය පරිදි 3.2.6.2.2 (VIII) සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය. 3.2.6.2.2 (X) සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභය යටතේ නිර්වචනය කර ඇති ආකාරයේ ඖෂධ/ ප්‍රතිකාර ලබාගැනීමට සිදු වී ඇත්නම් සහ ඉහත සීමාවන් යටතේ ප්‍රතිකාර/ ඖෂධ සඳහා කිසියම් මුදලක් වැය වී ඇත්නම්,

මෙම ආවරණය ඔප්පුවේ පොදු විධිවිධාන. කොන්දේසි හා බැහැරකිරීම් වලට සහ පහත දක්වා ඇතවිශේෂ විධිවිධාන කොන්දේසි හා බැහැර කිරීම් වලට යටත් වේ උපලේඛන අංක 04 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ.

### 3.2.6.2 ප්‍රතිලාභ මුදල

ප්‍රතිලාභ සඳහා වන සුදුසුකම් සපුරා ඇත්නම්. මෙහි ප්‍රථම උපලේඛනයේ සහ 3.2.6.2.2 (I) කොටසේ දක්වා ඇති ප්‍රතිලාභ වගුවෙහි සඳහන් සීමාවන්ට යටත්ව, වැය වූ වියදම් ප්‍රතිපූරණය කිරීමට සමාගම කටයුතු කරනු ඇති වියදම් තහවුරු කිරීම සඳහා සවිස්තර බිල්පතේ මුල් පිටපත සහ ගෙවීම් ලදුපතේ මුල් පිටපත සමග, රෝහල්ගත වීම සහ/හෝ සිදුකරන ලද සැත්කම සහ/හෝ ප්‍රතිකාර, වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහ අනුමැතිය මත ඖෂධ මිලදී ගැනීම යනාදිය සම්බන්ධයෙන් සමාගම සෑහීමකට පත්වන ආකාරයට සා-ක්ෂි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගෙවීම සිදුකරනු ලැබේ රෝහල්ගතව ලැබූ ප්‍රතිකාර නිසා හෝ සැත්කමක් නිසා හෝ සැත්කමකින් පසුව නැගෙන හෝ සංකූලතා සඳහා සමාගම වගකීමක් දරන්නේ නැත.

එක් පුද්ගලයෙකු සඳහා සමාගමේ යුනියන් හෙල්ත් 360, යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර්, යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්ලස්, යුනියන් ස්මාර්ට් හෙල්ත් සහ යුනියන් මෙඩිගාඩ් ප්‍රතිලාභ යටතේ ලබාගන්නා සියලුම රක්ෂණ සැලසුම් සඳහා වන සමස්ත උපරිම රක්ෂිත මුදල රු මිලියන 60 (රු 60,000,000/-) කට සීමා වේ.

Specimen

## 3.2.6.2 (I) ප්‍රතිලාභ වගුව

| ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින) | සැලසුම 1/2 | සැලසුම 3/4 | සැලසුම 5/6 | සැලසුම 7/8 | සැලසුම 9/10 | සැලසුම 11/12 | සැලසුම 13/14 | සැලසුම 15/16 |
|---|---|---|---|---|---|---|---|---|
| භූගෝලීය සීමාව (ආවරණය වන රටවල්) | ශ්‍රී ලංකාව පමණක් හෝ<br>ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව,<br>තායිලන්තය හා මැලේසියාව | | | | රක්ෂණ ඔප්පුවෙහි පළමු උපලේඛනයෙහි දක්වා<br>ඇති පරිදි, ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා<br>මැලේසියාව හෝ සියලු රටවල්<br>සඳහා ආවරණය (ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව හැර) | | | |
| වාර්ෂික සමස්ත සීමාව - මූලික වාර්ෂික රක්ෂිත මුදල (රු) | රු 300,000/- | රු 500,000/- | රු 750,000/- | රු 1,000,000/- | රු 2,000,000/- | රු 3,000,000/- | රු 4,000,000/- | රු 5,000,000/- |

**විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන්**

| | | |
|---|---|---|
| 1 | **රෝහල්ගත වීමේ ප්‍රතිලාභය** | රෝහල් කාමර සහ දැඩි සත්කාර ඒකක වියදම් ප්‍රතිපූරණය කිරීම මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 30% ක උපරිමයකට යටත් වේ. |
| | **(අ) දෛනික රෝහල් දීමනා** | |
| | ශ්‍රී ලංකාව තුළ දෛනික රෝහල් කාමර හා නැවතීම් ගාස්ත | තනි පුද්ගල සාමාන්‍ය වායුසමීකරණය කරන ලද රෝහල් කාමරයක් අදාළ වේ.<br><br>කෙසේ වුවද රක්ෂිතයා වඩාත් ඉහළ මට්ටමක රෝහල් කාමරයක් තෝරාගතහොත්, සුදුසුකම් ලබන මුළු හිමිකම් මුදලින් 25% ක රක්ෂිතයා විසින් ගෙවනු ලැබිය යුතු යි ශ්‍රී ලංකාව තුළ රෝහල්ගත කිරීම් සඳහා අදාළ නොවේ. |
| | ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රතිකාර ගැනීමේදී දිනකට උපරිම රෝහල් කාමර හා නැවතීම් ගාස්ත | |
| | **(ආ) දෛනික රෝහල් දැඩි සත්කාර ඒකක කාමර හා නැවතීම් ප්‍රතිලාභය** | |
| | ශ්‍රී ලංකාව තුළ උපරිම රෝහල් කාමර හා නැවතීම් ගාස්තු | සත්‍ය වියදම් අනුව |
| | ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රතිකාර ගැනීමේදී දිනකට උපරිම රෝහල් කාමර හා නැවතීම් ගාස්තු | |
| 2 | **ශල්‍යකර්ම ප්‍රතිලාභය** (ශල්‍ය වෛද්‍ය නිර්වින්දන වෛද්‍ය උපදේශක වෛද්‍ය සහ විශේෂඥ වෛද්‍ය වෛද්‍ය ගාස්තු ඇතුළත් වේ) | (i) අදාළ රටේ සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු, අයකරනු ලබන පරිදි ආවරණය වේ<br>(ii) විදේශගත ප්‍රතිකාර වලදී, එක් රෝගියෙකු සඳහා දිනකට පැමිණීමේ වාර 2 කට යටත් වේ |
| 3 | **වෙනත් රෝහල් සේවා හා සැපයුම් ප්‍රතිලාභය (සෞඛ්‍ය නොවන සේවාවන් හැර, ශල්‍යාගාර ගාස්තු, නිර්වින්දනය, රුධිරය, ඔක්සිජන්, සහ ඖෂධ ඇතුළත් වේ)** | (i) අදාළ රටේ සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු, අයකරනු ලබන පරිදි ආවරණය වේ.<br><br>(ii) විදේශගත ප්‍රතිකාර වලදී, එක් රෝගියෙකු සඳහා දිනකට පැමිණීමේ වාර 2 කට යටත් වේ. |
| 4 | **ගිලන්රථ ගාස්තු** | (i) මූලික රක්ෂිත මුදලින් 2% ක උපරිමයකට යටත්ව, අයකරනු ලබන පරිදි<br><br>(ii) ලියාපදිංචි ගිලන්රථ සේවාවක් භාවිතා කරන ලද අවස්ථාවකදී සහ අදාල රෝහල්ගතවීම සඳහා යූනියන් හෙල්ත් 360 ආවරණය යටතේ හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් සහ හිමිකම් මුදල් ඉල්ලීම පිළිගත හැකි නම් පමණක්, වසරකට එක වරක් ගෙවනු ලැබේ |

Specimen

<table>
<tr><th colspan="2">ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්)</th><th>සැලසුම 1/2</th><th>සැලසුම 3/4</th><th>සැලසුම 5/6</th><th>සැලසුම 7/8</th><th>සැලසුම 9/10</th><th>සැලසුම 11/12</th><th>සැලසුම 13/14</th><th>සැලසුම 15/16</th></tr>
<tr><td colspan="2">භූගෝලීය සීමාව (ආවරණය වන රටවල්)</td><td colspan="4">ශ්‍රී ලංකාව පමණක් හෝ ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා මැලේසියාව</td><td colspan="4">රක්ෂණ ඔප්පුවෙහි පළමු උපලේඛනයෙහි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා මැලේසියාව හෝ සියලු රටවල් සඳහා ආවරණය (ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව හැර)</td></tr>
<tr><td colspan="2">වාර්ෂික සමස්ත සීමාව - මූලික වාර්ෂික රක්ෂිත මුදල (රු)</td><td>රු 300,000/-</td><td>රු 500,000/-</td><td>රු 750,000/-</td><td>රු 1,000,000/-</td><td>රු 2,000,000/-</td><td>රු 3,000,000/-</td><td>රු 4,000,000/-</td><td>රු 5,000,000/-</td></tr>
<tr><td colspan="10">විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන්</td></tr>
<tr><td>5</td><td>එක්දින ප්‍රතිකාර<br>(අභ්‍යන්තර රෝගියෙකු ලෙස රෝහල්ගත වී ප්‍රතිකාර ලබන කාලය පැය 24 ට අඩු ය)</td><td colspan="8">(i) මූලික වාර්ෂික රක්ෂිත මුදලට යටත්ව සැත්කම් හෝ ප්‍රතිකර්ම පමණක් ආවරණය වේ<br>(ii) ආවරණය වන බවට සඳහන් කළ ඇති එක් දින සැත් කම් ලැයිස්තු වට පමණක් ආවරණය සී මා වේ<br>(iii) බාහිර රෝගී ප්‍රතිකර්ම හෝ ප්‍රතිකාර ආවරණය නොවේ</td></tr>
<tr><td rowspan="2">6</td><td rowspan="2">පූර්ව-රෝහල්ගත කිරීම් වියදම් ප්‍රතිලාභය<br>(පෞද්ගලික හෝ රජයේ රෝහල් භේදයකින් තොරව සියලුම රෝහල්ගත කිරීම් සඳහා අදාළ වේ)</td><td colspan="8">රෝහල්ගත කිරීමට සිදුවන රෝගය/අනතුර නිසා රෝහල්ගත කරන දිනයට පෙර දින 30 ක කාලයක් දක්වා, රෝහල්ගත කිරීමට අදාළ වන රෝග විනිශ්චය කළමනාකරණය සම්බන්ධ වියදම් සඳහා පමණක් ගෙවනු ලැබේ මෙම ප්‍රතිලාභය මූලික රක්ෂිත මුදල සම්බන්ධ උප සීමාවක් වන අතර ල එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව.<br>ගෙවනු ලැබේ කෙසේ වුවත් මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි.</td></tr>
<tr><td>රු 15,000/-</td><td>රු 25,000/-</td><td>රු 37,500/-</td><td>රු 50,000/-</td><td>රු 100,000/-</td><td>රු 150,000/-</td><td>රු 200,000/-</td><td>රු 250,000/-</td></tr>
<tr><td rowspan="2">7</td><td rowspan="2">පශ්චාත්-රෝහල්ගත කිරීම් වියදම් ප්‍රතිලාභය<br>(පෞද්ගලික හෝ රජයේ රෝහල් භේදයකින් තොරව සියලුම රෝහල්ගත කිරීම් සඳහා අදාළ වේ)</td><td colspan="8">රෝහල්ගත කිරීමට සිදුවන රෝගය/අනතුර නිසා රෝහලෙන් පිටව යාමෙන් පසු දින 30 ක කාලයක් දක්වා රෝහල්ගත කිරීමට අදාළ වු රෝග කළමනාකරණය සම්බන්ධ වියදම් සඳහා පමණක් ගෙවනු ලැබේ මෙම ප්‍රතිලාභය මූලික රක්ෂිත මුදල සම්බන්ධ උප සීමාවක් වන අතර ල එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ කෙසේ වුවත් මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි</td></tr>
<tr><td>රු 15,000/-</td><td>රු 25,000/-</td><td>රු 37,500/-</td><td>රු 50,000/-</td><td>රු 100,000/-</td><td>රු 150,000/-</td><td>රු 200,000/-</td><td>රු 250,000/-</td></tr>
<tr><td>8</td><td>ඉන්ද්‍රිය දායක වියදම්</td><td colspan="8">රක්ෂිතයාට සිදුවන ඉන්ද්‍රිය බද්ධයකදී, ඉන්ද්‍රිය බද්ධ කරනු ලබන පුද්ගලයාගේ සමස්ත රක්ෂිත මුදලේ සීමාවන්ට යටත්ව ඉන්ද්‍රිය පරිත්‍යාග කරන පුද්ගලයාගේ රෝහල්ගත වීම් සඳහා පමණක් ආවරණය හිමි වේ</td></tr>
<tr><td rowspan="2">9</td><td rowspan="2">කෘත්‍රිම අවයව සහ උපාංග ශරීරයට බද්ධ කිරීම</td><td colspan="8">අයකෙරෙන පරිදි, මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 20% කට යටත්ව</td></tr>
<tr><td>රු 60,000/-</td><td>රු 100,000/-</td><td>රු 150,000/-</td><td>රු 200,000/-</td><td>රු 400,000/-</td><td>රු 600,000/-</td><td>රු 800,000/-</td><td>රු 1,000,000/-</td></tr>
<tr><td>10</td><td>විදේශගත ප්‍රතිකාර</td><td colspan="8">සැලසුම් කළ රෝහල්ගත වීමකදී ඊට පෙර රක්ෂණ සමාගම දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වේ හදිසි රෝහල්ගත කිරීමකදී පැය 48 ක් ඇතුළත රක්ෂණ සමාගම දැනුවත් කිරීම සිදු කළ යුතුය රක්ෂණ සැලසුමට අදාළ දෛනික කාමර ගාස්තු වලට වඩා ඉහළ ගාස්තු අයකරනු ලබන කාමරයකට ඇතුළත්ව ප්‍රතිකාර ලබාගැනීම සිදු කළේ නම්, ගෙවීම් සිදුකරනුයේ මුළු හිමිකම් මුදලින් 75% ක් පමණි ඉතිරි 25% ක මුදල රක්ෂිතයා විසින් ගෙවිය යුතු වේ</td></tr>
<tr><td rowspan="3">11</td><td rowspan="3">රෝහල් දීමනා ප්‍රතිලාභය<br>- මුදල් නොගෙවන වාට්ටුවකට ඇතුළත්ව ප්‍රතිකාර ගැනීම (රජයේ රෝහල් හෝ ඊට සමාන) (ශ්‍රී ලංකාව තුළ පමණි)</td><td colspan="8">මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 0.5% ක්, දිනකට රු 20,000/- ක උපරිමයක් දක්වා</td></tr>
<tr><td>රු 1,500/-</td><td>රු 2,500/-</td><td>රු 3,750/-</td><td>රු 5,000/-</td><td>රු 10,000/-</td><td>රු 15,000/-</td><td>රු 20,000/-</td><td>රු 20,000/-</td></tr>
<tr><td colspan="8">රෝහල්ගත වීමට සිදුවූ හේතුවට අදාළව වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන පරීක්ෂණ සහ ඖෂධ සම්බන්ධ වියදම් සඳහා, මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 70% කට යටත්ව ගෙවීම් කරනු ලැබේ</td></tr>
</table>

Specimen

| ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | සැලසුම 1/2 | සැලසුම 3/4 | සැලසුම 5/6 | සැලසුම 7/8 | සැලසුම 9/10 | සැලසුම 11/12 | සැලසුම 13/14 | සැලසුම 15/16 |
|---|---|---|---|---|---|---|---|---|
| **භූගෝලීය සීමාව (ආවරණය වන රටවල්)** | **ශ්‍රී ලංකාව පමණක් හෝ ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා මැලේසියාව** | | | | **රක්ෂණ ඔප්පුවෙහි පළමු උපලේඛනයෙහි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා මැලේසියාව හෝ සියලු රටවල් සඳහා ආවරණය (ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව හැර)** | | | |
| **වාර්ෂික සමස්ත සීමාව - මූලික වාර්ෂික රක්ෂිත මුදල (රු)** | **රු 300,000/-** | **රු 500,000/-** | **රු 750,000/-** | **රු 1,000,000/-** | **රු 2,000,000/-** | **රු 3,000,000/-** | **රු 4,000,000/-** | **රු 5,000,000/-** |
| **විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන්** | | | | | | | | |
| 12 **සෞඛ්‍ය සුරැකුම් ප්‍රතිලාභය** (භූගෝලීය ආවරණය - ශ්‍රී ලංකාව තුළ පමණි) | හිමිකම් මුදල් ඉල්ලීමකින් තොරව අඛණ්ඩව වසර 2 ක් ගතවුණු පසුව□ ශ්‍රී ලංකා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලයේ ලියාපදිංචි රෝහල් වලදී සිදුකරන සෞඛ්‍ය පරීක්ෂාවන් සඳහා රු 50,000/- ක උපරිමයකට යටත්ව මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 2% ක් දක්වා ගෙවීමට සුදුසුකම් ලබයි. | | | | | | | |
| | රු 6000/- | රු 10,000/- | රු 15,000/- | රු 20,000/- | රු 40,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- |
| 13 **රෝහල් වලට ඇතුළත් වීමේ ගාස්තු** | මූලික රක්ෂිත මුදලින් 70% ක් වන සීමාව තුළ උප සීමාවක් ලෙස, එක් රෝහල්ගත වීමක් සඳහා මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව, අයකෙරෙන පරිදි ගෙවනු ලැබේ | | | | | | | |
| 14 **සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය (භූගෝලීය ආවරණය - ශ්‍රී ලංකාව තුළ පමණි)** | මෙම ගෙවීම වාර්ෂික රක්ෂිත මුදලේ උප-සීමාවකි | | | | | | | |
| | රු 5,000/- | රු 5,000/- | රු 5,000/- | රු 10,000/- | රු 10,000/- | රු 10,000/- | රු 10,000/- | රු 10,000/- |
| 15 **බරපතළ රෝග ප්‍රතිපූරණ ප්‍රතිලාභය** | වසරකට රක්ෂිත මුදලින් 50% ක සහ ආයු කාලය තුළරැ ඔප්පු කාලසීමාව තුළ මූලික රක්ෂිත මුදල මෙන් දෙගුණයක උපරිමයකට යටත් වේ සෑම වර්ෂයකදී 50% ක් ප්‍රතිස්ථාපනය වන නමුත් යාවජීව සීමාව එළඹීමෙන් පසුව එය අවසන් වනු ඇත. | | | | | | | |
| | රු 150,000/- | රු 250,000/- | රු 375,000/- | රු 500,000/- | රු 1,000,000/- | රු 1,500,000/- | රු 2,000,000/- | රු 2,500,000/- |
| **තෝරාගත හැකි ප්‍රතිලාභ** | | | | | | | | |
| 16 **මාතෘ ප්‍රතිලාභය** (භූගෝලීය ආවරණය - ශ්‍රී ලංකාව තුළ පමණි) | NVD 50,000/- LSCS- 100,000/- | NVD- 75,000/- LSCS- 150,000/- | NVD- 75,000/- LSCS- 150,000/- | NVD- 75,000/- LSCS- 150,000/- | NVD- 75,000/- LSCS- 150,000/- | NVD- 100,000/- LSCS- 200,000/- | NVD- 100,000/- LSCS- 200,000/- | NVD- 100,000/- LSCS- 200,000/- |
| 17 **සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභය (භූගෝලීය ආවරණය - ශ්‍රී ලංකාව තුළ පමණි)** | රු 7,500/- | රු 12,500/- | රු 18,750/- | රු 25,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- |

specimen

| **ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්)** | **සැලසුම 9/10** | **සැලසුම 11/12** | **සැලසුම 13/14** | **සැලසුම 15/16** | **සැලසුම 17/18** | **සැලසුම 19/20** | **සැලසුම 21/22** | **සැලසුම 23/24** |
|---|---|---|---|---|---|---|---|---|
| **භූගෝලීය සීමාව (ආවරණය වන රටවල්)** | **රක්ෂණ ඔප්පුවෙහි පළමු උපලේඛනයෙහි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා මැලේසියාව හෝ සියලු රටවල් සඳහා ආවරණය (ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව හැර)** | | | | | | | |
| **වාර්ෂික සමස්ත සීමාව - මූලික වාර්ෂික රක්ෂිත මුදල (රු)** | **රු 10,000,000/-** | **රු 15,000,000/-** | **රු 20,000,000/-** | **රු 25,000,000/-** | **රු 30,000,000/-** | **රු 40,000,000/-** | **රු 50,000,000/-** | **රු 60,000,000/-** |

| **විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන්** | | |
|---|---|---|
| 1 | **රෝහල්ගත වීමේ ප්‍රතිලාභය** | රෝහල් කාමර සහ දැඩි සත්කාර ඒකක වියදම් ප්‍රතිපූරණය කිරීම මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 30% ක උපරිමයකට යටත් වේ. |
| | **(අ) දෛනික රෝහල් දීමනා** | |
| | ශ්‍රී ලංකාව තුළ දෛනික රෝහල් කාමර හා නැවතීම් ගාස්ත | තනි පුද්ගල සාමාන්‍ය වායුසමීකරණය කරන ලද රෝහල් කාමරයක් අදාළ වේ. |
| | ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රතිකාර ගැනීමේදී දිනකට උපරිම රෝහල් කාමර හා නැවතීම් ගාස්ත | කෙසේ වුවද රක්ෂිතයා වඩාත් ඉහළ මට්ටමක රෝහල් කාමරයක් තෝරාගතහොත්, සුදුසුකම් ලබන මුළු හිමිකම් මුදලින් 25% ක රක්ෂිතයා විසින් ගෙවනු ලැබිය යුතු යී ශ්‍රී ලංකාව තුළ රෝහල්ගත කිරීම් සඳහා අදාළ නොවේ. |
| | **(ආ) දෛනික රෝහල් දැඩි සත්කාර ඒකක කාමර හා නැවතීම් ප්‍රතිලාභය** | |
| | ශ්‍රී ලංකාව තුළ උපරිම රෝහල් කාමර හා නැවතීම් ගාස්තු | සත්‍ය වියදම් අනුව |
| | ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රතිකාර ගැනීමේදී දිනකට උපරිම රෝහල් කාමර හා නැවතීම් ගාස්තු | |
| 2 | **ශල්‍යකර්ම ප්‍රතිලාභය** (ශල්‍ය වෛද්‍ය නිර්වින්දන වෛද්‍ය උපදේශක වෛද්‍ය සහ විශේෂඥ වෛද්‍ය වෛද්‍ය ගාස්තු ඇතුළත් වේ) | (i) අදාළ රටේ සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු, අයකරනු ලබන පරිදි ආවරණය වේ<br>(ii) විදේශගත ප්‍රතිකාර වලදී, එක් රෝගියෙකු සඳහා දිනකට පැමිණීමේ වාර 2 කට යටත් වේ |
| 3 | **වෙනත් රෝහල් සේවා හා සැපයුම් ප්‍රතිලාභය (සෞඛ්‍ය නොවන සේවාවන් හැර, ශල්‍යාගාර ගාස්තු, නිර්වින්දනය, රුධිරය, ඔක්සිජන්, සහ ඖෂධ ඇතුළත් වේ)** | (i) අදාළ රටේ සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු, අයකරනු ලබන පරිදි ආවරණය වේ.<br>(ii) විදේශගත ප්‍රතිකාර වලදී, එක් රෝගියෙකු සඳහා දිනකට පැමිණීමේ වාර 2 කට යටත් වේ. |
| 4 | **ගිලන්රථ ගාස්තු** | (i) මූලික රක්ෂිත මුදලින් 2% ක උපරිමයකට යටත්ව, අයකරනු ලබන පරිදි<br>(ii) ලියාපදිංචි ගිලන්රථ සේවාවක් භාවිතා කරන ලද අවස්ථාවකදී සහ අදාල රෝහල්ගතවීම සඳහා යූනියන් හෙල්ත් 360 ආවරණය යටතේ හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් සහ හිමිකම් මුදල් ඉල්ලීම පිළිගත හැකි නම් පමණක්, වසරකට එක වරක් ගෙවනු ලැබේ |

Specimen

| ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | | සැලසුම 9/10 | සැලසුම 11/12 | සැලසුම 13/14 | සැලසුම 15/16 | සැලසුම 17/18 | සැලසුම 19/20 | සැලසුම 21/22 | සැලසුම 23/24 |
|---|---|---|---|---|---|---|---|---|---|
| භූගෝලීය සීමාව (ආවරණය වන රටවල්) | | **රක්ෂණ ඔප්පුවෙහි පළමු උපලේඛනයෙහි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා මැලේසියාව හෝ සියලු රටවල් සඳහා ආවරණය (ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව හැර)** | | | | | | | |
| වාර්ෂික සමස්ත සීමාව - මූලික වාර්ෂික රක්ෂිත මුදල (රු) | | **රු 10,000,000/-** | **රු 15,000,000/-** | **රු 20,000,000/-** | **රු 25,000,000/-** | **රු 30,000,000/-** | **රු 40,000,000/-** | **රු 50,000,000/-** | **රු 60,000,000/-** |
| **විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන්** | | | | | | | | | |
| 5 | **එක්දින ප්‍රතිකාර** (අභ්‍යන්තර රෝගියෙකු ලෙස රෝහල්ගත වී ප්‍රතිකාර ලබන කාලය පැය 24 ට අඩු ය) | (i) මූලික වාර්ෂික රක්ෂිත මුදලට යටත්ව සැත්කම් හෝ ප්‍රතිකර්ම පමණක් ආවරණය වේ<br>(ii) ආවරණය වන බවට සඳහන් කළ ඇති එක් දින සැත් කම් ලැයිස්තු වට පමණක් ආවරණය සී මා වේ<br>(iii) බාහිර රෝගී ප්‍රතිකර්ම හෝ ප්‍රතිකාර ආවරණය නොවේ | | | | | | | |
| 6 | **පූර්ව-රෝහල්ගත කිරීම් වියදම් ප්‍රතිලාභය** (පෞද්ගලික හෝ රජයේ රෝහල් භේදයකින් තොරව සියලුම රෝහල්ගත කිරීම් සඳහා අදාළ වේ) | රෝහල්ගත කිරීමට සිදුවන රෝගය/අනතුර නිසා රෝහල්ගත කරන දිනයට පෙර දින 30 ක කාලයක් දක්වා, රෝහල්ගත කිරීමට අදාළ වන රෝග විනිශ්චය කළමනාකරණය සම්බන්ධ වියදම් සඳහා පමණක් ගෙවනු ලැබේ මෙම ප්‍රතිලාභය මූලික රක්ෂිත මුදල සම්බන්ධ උප සීමාවක් වන අතර ල එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව. ගෙවනු ලැබේ කෙසේ වුවත් මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි. | | | | | | | |
| | | රු 500,000/- | රු 750,000/- | රු 1,000,000/- | රු 1,250,000/- | රු 1,500,000/- | රු 2,000,000/- | රු 2,500,000/- | රු 3,000,000/- |
| 7 | **පශ්චාත්-රෝහල්ගත කිරීම් වියදම් ප්‍රතිලාභය** (පෞද්ගලික හෝ රජයේ රෝහල් භේදයකින් තොරව සියලුම රෝහල්ගත කිරීම් සඳහා අදාළ වේ) | රෝහල්ගත කිරීමට සිදුවන රෝගය/අනතුර නිසා රෝහලෙන් පිටව යාමෙන් පසු දින 30 ක කාලයක් දක්වා රෝහල්ගත කිරීමට අදාළ වු රෝග කළමනාකරණය සම්බන්ධ වියදම් සඳහා පමණක් ගෙවනු ලැබේ මෙම ප්‍රතිලාභය මූලික රක්ෂිත මුදල සම්බන්ධ උප සීමාවක් වන අතර ල එක් ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ කෙසේ වුවත් මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි | | | | | | | |
| | | රු 500,000/- | රු 750,000/- | රු 1,000,000/- | රු 1,250,000/- | රු 1,500,000/- | රු 2,000,000/- | රු 2,500,000/- | රු 3,000,000/- |
| 8 | **ඉන්ද්‍රිය දායක වියදම්** | රක්ෂිතයාට සිදුවන ඉන්ද්‍රිය බද්ධයකදී, ඉන්ද්‍රිය බද්ධ කරනු ලබන පුද්ගලයාගේ සමස්ත රක්ෂිත මුදලේ සීමාවන්ට යටත්ව ඉන්ද්‍රිය පරිත්‍යාග කරන පුද්ගලයාගේ රෝහල්ගත වීම් සඳහා පමණක් ආවරණය හිමි වේ | | | | | | | |
| 9 | **කෘත්‍රිම අවයව සහ උපාංග ශරීරයට බද්ධ කිරීම** | අයකෙරෙන පරිදි, මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 20% කට යටත්ව | | | | | | | |
| | | රු 2,000,000/- | රු 3,000,000/- | රු 4,000,000/- | රු 5,000,000/- | රු 6,000,000/- | රු 8,000,000/- | රු 10,000,000/- | රු 12,000,000/- |
| 10 | **විදේශගත ප්‍රතිකාර** | සැලසුම් කළ රෝහල්ගත වීමකදී ඊට පෙර රක්ෂණ සමාගම දැනුවත් කිරීම අත්‍යවශය වේ හදිසි රෝහල්ගත කිරීමකදී පැය 48 ක් ඇතුළත රක්ෂණ සමාගම දැනුවත් කිරීම සිදු කළ යුතුය රක්ෂණ සැලසුමට අදාළ දෛනික කාමර ගාස්තු වලට වඩා ඉහළ ගාස්තු අයකරනු ලබන කාමරයකට ඇතුළත්ව ප්‍රතිකාර ලබාගැනීම සිදු කළේ නම්, ගෙවීම් සිදුකරනුයේ මුළු හිමිකම් මුදලින් 75% ක් පමණි ඉතිරි 25% ක මුදල රක්ෂිතයා විසින් ගෙවිය යුතු වේ | | | | | | | |
| 11 | **රෝහල් දීමනා ප්‍රතිලාභය** - මුදල් නොගෙවන වාට්ටුවකට ඇතුළත්ව ප්‍රතිකාර ගැනීම (රජයේ රෝහල් හෝ ඊට සමාන) (ශ්‍රී ලංකාව තුළ පමණි) | මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 0.5% ක්□ දිනකට රු 20□000/- ක උපරිමයක් දක්වා | | | | | | | |
| | | රු 20,000/- | රු 20,000/- | රු 20,000/- | රු 20,000/- | රු 20,000/- | රු 20,000/- | රු 20,000/- | රු 20,000/- |
| | | රෝහල්ගත වීමට සිදුවූ හේතුවට අදාළව වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන පරීක්ෂණ සහ ඖෂධ සම්බන්ධ වියදම් සඳහා□ මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 70% කට යටත්ව ගෙවීම් කරනු ලැබේ | | | | | | | |

Specimen

| | ප්‍රතිලාභ වගුව (සීමාවන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | සැලසුම 9/10 | සැලසුම 11/12 | සැලසුම 13/14 | සැලසුම 15/16 | සැලසුම 17/18 | සැලසුම 19/20 | සැලසුම 21/22 | සැලසුම 23/24 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **භූගෝලීය සීමාව (ආවරණය වන රටවල්)** | **රක්ෂණ ඔප්පුවෙහි පළමු උපලේඛනයෙහි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා මැලේසියාව හෝ සියලු රටවල් සඳහා ආවරණය (ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව හැර)** | | | | | | | |
| | **වාර්ෂික සමස්ත සීමාව - මූලික වාර්ෂික රක්ෂිත මුදල (රු)** | රු 10,000,000/- | රු 15,000,000/- | රු 20,000,000/- | රු 25,000,000/- | රු 30,000,000/- | රු 40,000,000/- | රු 50,000,000/- | රු 60,000,000/- |
| | **විවිධ වියදම් කාණ්ඩ සඳහා අදාළ වන සීමාවන්** | | | | | | | | |
| 12 | **සෞඛ්‍ය සුරැකුම් ප්‍රතිලාභය** (භූගෝලීය ආවරණය - ශ්‍රී ලංකාව තුළ පමණි) | හිමිකම් මුදල් ඉල්ලීමකින් තොරව අඛණ්ඩව වසර 2 ක් ගතවුණු පසුව ශ්‍රී ලංකා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලයේ ලියාපදිංචි රෝහල් වලදී සිදුකරන සෞඛ්‍ය පරීක්ෂාවන් සඳහා රු 50,000/- ක උපරිමයකට යටත්ව මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 2% ක් දක්වා ගෙවීමට සුදුසුකම් ලබයි. | | | | | | | |
| | | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- |
| 13 | **රෝහල් වලට ඇතුළත් වීමේ ගාස්තු** | මූලික රක්ෂිත මුදලින් 70% ක් වන සීමාව තුළ උප සීමාවක් ලෙස, එක් රෝහල්ගත වීමක් සඳහා මූලික වාර්ෂික රක්ෂිත මුදලින් 5% ක උපරිමයකට යටත්ව, අයකෙරෙන පරිදි ගෙවනු ලැබේ | | | | | | | |
| 14 | **සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය (භූගෝලීය ආවරණය - ශ්‍රී ලංකාව තුළ පමණි)** | මෙම ගෙවීම වාර්ෂික රක්ෂිත මුදලේ උප-සීමාවකි | | | | | | | |
| | | රු 25,000/- | රු 25,000/- | රු 25,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- |
| | **තෝරාගත හැකි ප්‍රතිලාභ** | | | | | | | | |
| 15 | **මාතෘ ප්‍රතිලාභය** (භූගෝලීය ආවරණය - ශ්‍රී ලංකාව තුළ පමණි) | NVD 150,000/- LSCS- 300,000/- | NVD 150,000/- LSCS- 300,000/- | NVD 150,000/- LSCS- 300,000/- | NVD 150,000/- LSCS- 300,000/- | NVD 150,000/- LSCS- 300,000/- | NVD 150,000/- LSCS- 300,000/- | NVD 150,000/- LSCS- 300,000/- | NVD 150,000/- LSCS- 300,000/- |
| 16 | **සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභය (භූගෝලීය ආවරණය - ශ්‍රී ලංකාව තුළ පමණි)** | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- | රු 50,000/- |

### 3.2.6.2 (II) ආවරණ වර්ධක ප්‍රතිලාභය

සම්පූර්ණ ඔප්පු වර්ෂයක් සඳහා රක්ෂණ මුදල් හිමිකම් ඉල්ලීමක් සිදු වී නොමැති නම් සහ, අනුග්‍රහ කාලසීමාව තුළ අඛණ්ඩව නිසි පරිදි වාරික මුදල් ගෙවමින් ඔප්පුව බලාත්මකව පවත්වා ගනු ලබන්නේ නම්, එම රක්ෂණ ඔප්පුව සඳහා ආවරණ වර්ධක ප්‍රතිලාභය ක්‍රියාත්මක කිරීමට සමාගම කටයුතු කරයි ඒ යටතේ ඊළඟ ඔප්පු වර්ෂය සඳහා යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ රක්ෂිත මුදල ස්වයංක්‍රීයව 25% කින් වැඩි වනු ඇති.

ආවරණ වර්ධක ප්‍රතිලාභය යටතේ යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ රක්ෂිත මුදල වැඩිවිය හැකි උපරිම සීමාව රක්ෂිත මුදල මෙන් 100% ක් වන අතර එය රු මිලියන 100 ක (රු 100,000,000/-) උපරිමයකට යටත් වේ.

ආවරණ වර්ධක ප්‍රතිලාභය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව ඔප්පු වර්ෂයක් තුළ යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ හිමිකම් මුදල් ඉල්ලීමක් ඉදිරිපත් වුයේ නම්, ඊළඟ ඔප්පු වර්ෂය සඳහා යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ රක්ෂිත මුදල ස්වයංක්‍රීයව 25% කින් අඩු වනු ඇති කෙසේ වුවත් එම මුදල මෙහි ප්‍රථම උපලේඛනයේ දෙවැනි කොටසේ සඳහන් කර ඇති, යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ මූලික වාර්ෂික රක්ෂිත මුදලට වඩා අඩුවීමක් සිදු නොවේ.

Specimen

ප්‍රතිලාභයට අදාළ කාලසීමාව තුළ රක්ෂිත මුදල අඩු වුයේ නම්, එක්රැස් වූ ආවරණ වර්ධක ප්‍රතිලාභයද යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ මූලික වාර්ෂික රක්ෂිත මුදලෙහි අඩුවීමට සමානුපාතිකව අඩුවනු ඇති ආවරණ වර්ධක ප්‍රතිලාභය ක්‍රියාත්මක වීම මගින්, සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය, මාතෘ ප්‍රතිලාභය, බරපතළ රෝග ප්‍රතිපූර්ණ ප්‍රතිලාභය, සහ සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභයට අදාළව 22 (I) ප්‍රතිලාභ වගුවෙහි සඳහන් ප්‍රතිලාභ සීමාවන් වැඩි නොවේ.

### 3.2.6.2 (III) පුනස්ථාපන ප්‍රතිලාභය

යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ මූලික වාර්ෂික රක්ෂිත මුදල සහ ආවරණ වර්ධක ප්‍රතිලාභය යටතේ එක්රැස් වූ රක්ෂිත මුදල මුළුමනින්ම හිමිකම් ලෙස ලබාගෙන අවසන් වූ අවස්ථාවක, පෙර රෝහල්ගත වීම්වලට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ නොමැති හේතුවක් නිසා රෝහල්ගත වීමක් සිදුවන්නේ නම්, ඔප්පු වර්ෂයකට එක්වරක් ප්‍රතිලාභය පුනස්ථාපනය කරගැනීමේ අවස්ථාවක් ලබාදීමට සමාගම කටයුතු කරයි ඕනෑම ඔප්පු වර්ෂයක් තුළ මෙසේ පුනස්ථාපන ප්‍රතිලාභය මගින් යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ මුල් රක්ෂිත මුදල මෙන් 100% උපරිමයක් දක්වා අතිරේක ආවරණයක් හිමි වේ එය එක් හිමිකමක් ලබාගැනීම සඳහා පමණක් වලංගු වන අතර ප්‍රතිලාභයේ ශේෂයක් පැවතුණහොත් එය ඉදිරි ඔප්පු වර්ෂය සඳහා වලංගු නොවනු ඇත.

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය, මාතෘ ප්‍රතිලාභය, බරපතළ රෝග ප්‍රතිපූර්ණ ප්‍රතිලාභය, සහ සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභය යන ප්‍රතිලාභ සඳහා මෙම පුනස්ථාපන ප්‍රතිලාභය අදාළ නොවේ

### 3.2.6.2 (VI) රෝහල්ගත කිරීමට පෙර හා පසු වියදම් නැවත ගෙවීමේ ප්‍රතිලාභය (පූර්ව හා පශ්චාත්-රෝහල්ගත කිරීම් වියදම් ප්‍රතිලාභය)

රෝහල්ගත කිරීමට හේතු වන රෝගය/අනතුර නිසා, රෝහල්ගත කිරීමට දින 30 කට පෙර සහ දින 30 කට පසු කාලය දක්වා වැයවන වෛද්‍ය ගාස්තු, යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ කෙරෙන හිමිකම් මුදල් ඉල්ලීම් සඳහා සලකා බලනු ලැබේ මෙසේ රෝහල්ගත වීමට පෙර හා පසු වැයවන වියදම් නැවත ගෙවීමේ සීමාව, එක් ඔප්පු වර්ෂයක් සඳහා යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ රක්ෂිත මුදලේ වටිනාකමින් 5% ක උපරිමයකට යටත් වනු ඇත කෙසේ වෙතත් මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් පෑ හැකි වනුයේ යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ රෝහල් ගතවීම සම්බන්ධයෙන් හිමිකම් ගෙවීමක් සිදුවන්නේ නම් පමණි.

### 3.2.6.2 (V) රෝහල් දීමනා ප්‍රතිලාභය - රෝග නිශ්චය කිරීමේ පරීක්ෂණ/ඖෂධ ආදියට සම්බන්ධ දෛනික රෝහල් ගාස්තු හා වියදම් පියවීම

රෝග නිශ්චය කිරීමේ පරීක්ෂණ/ඖෂධ ආදියට සම්බන්ධ දෛනික රෝහල් ගාස්තු හා වියදම් පියවීම රෝහල්ගත කර ඇත්තේ රජයේ රෝහලක මුදල් නොගෙවන වාට්ටුවක නම් සහ අඛණ්ඩව රෝහල් ගතව සිටි කාලසීමාව පැය 24 ඉක්මවන්නේ නම් හිමිකමට අදාළ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අවස්ථාවක, පහත සඳහා ප්‍රතිලාභ ගෙවනු ලබනු ඇත.

- යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ රක්ෂිත මුදලේ වටිනාකමින් 0.5% ක් වන දෛනික රෝහල් වියදම් ප්‍රතිලාභය, රු 20,000 ක උපරිමයක් දක්වා, රෝහල්ගත වී සිටින දින ගණනින් වැඩිකර, එක් ඔප්පු වර්ෂයක් සඳහා යුනියන් හෙල්ත් 360 රක්ෂිත මුදලේ වටිනාකමින් 30% ක උපරිමයකට යටත්ව සහ/හෝ
- ආවරණය ලැබූ පුද්ගලයාට රෝහල්ගත වීමට සිදුවන රෝග තත්ත්වය සම්බන්ධයෙන්, අදාළ රෝගයට ප්‍රතිකාර කරනු ලබන වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණ හෝ ඖෂධ සඳහා වැයවන වියදම්, එක් ඔප්පු වර්ෂයක් සඳහා යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ රක්ෂිත මුදලේ වටිනාකමින් 70% ක උපරිමයකට යටත්ව ගෙවනු ලැබේ

Specimen

### 3.2.6.2 (VI) ශරීර ඉන්ද්‍රියන් දන්දෙන පුද්ගලයන්ගේ වියදම්

මෙම ප්‍රතිලාභය යටතෙ, ඉන්ද්‍රියන් දන්දෙන පුද්ගලයෙකු ඒ සම්බන්ධයෙන් රෝහල්ගත වීමට අදාළ වියදම් ආවරණය වේ ඉන්ද්‍රිය ලබන පුද්ගලයා මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වී ඇත්නම්, එම පුද්ගලයා රෝහල්ගත වීම සම්බන්ධ හිමිකම් මුදල් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්නම් සහ එම ඉල්ලීම මෙම ආවරණයට අදාළ වගන්ති හා කොන්දේසි වලට අනුව පිළිගත හැකිනම් පමණක් මෙම ප්‍රතිලාභය ගෙවනු ලබනු ඇත. ඉන්ද්‍රියන් ප්‍රදානය කිරීම සම්බන්ධ මුදල් ගනුදෙනු මේ යටතේ ආවරණය නොවන අතර, යුනියන් හෙල්ත් 360 ආවරණය යටතේ ආවරණය ලබන සාමාජිකයාට අවශ්‍ය වන ඉන්ද්‍රියන් දන්දීම සඳහා එසේ දන්දෙන පුද්ගලයා සැත්කමකට ලක්වීමට රෝහල්ගත වීම සම්බන්ධයෙන් වැයවන වියදම් පමණක් ආවරණය වේ අදාළ දායකයා මුදල් නොගෙවන රජයේ රෝහල් වාට්ටුවකට ඇතුළත් වන්නේ නම් දෛනික රෝහල් ගාස්තු දීමනාව අදාළ නොවේ.

ශරීර ඉන්ද්‍රියන් දන්දෙන පුද්ගලයන්ගේ වියදම් කාණ්ඩය යටතේ කරනු ලබන ඕනෑම ආකාරයක ගෙවීමක්, රක්ෂිත ඉන්ද්‍රිය ලාභියාගේ ප්‍රතිලාභ සීමාව තුළ සිදුකරන ලද ගෙවීමක් ලෙස සැලකේ ශරීර ඉන්ද්‍රියන් දන්දෙන පුද්ගලයන්ගේ රෝහල්ගත වීම සම්බන්ධ වියදම් වලට අදාළව ප්‍රතිලාභ ගෙවීම් සලකා බැලෙනුයේ ප්‍රතිලාභ වගුවේ අංක 01 සහ 02 යටතේ සඳහන්, රක්ෂිතයාට අදාළ ප්‍රතිලාභ සීමාවන්ට යටත්ව යි.

### 3.2.6.2 (VII) කෘත්‍රිම අවයව සහ උපාංග ශරීරයට බද්ධ කිරීම්

මෙම රක්ෂණ සැලසුම යටතේ ආවරණය වන කරුණකට රක්ෂණ හිමියා රෝහල්ගත කිරීමෙන් අනතුරුව, ඔහුට හෝ ඇයට කෘත්‍රිම අවයවක් හෝ උපාංගයක් ශරීරයේ තැන්පත් කිරීමක් සිදුකිරීම අවශ්‍ය වන බවට වෛද්‍යවරයා විසින් තීරණය කරනු ලබන්නේ නම්, ප්‍රතිලාභ සටහනෙහි සහ මෙම රක්ෂණාවරණයේ ප්‍රථම උප ලේඛනයේ සඳහන් සීමාවන්ට යටත්ව අදාළ කෘත්‍රිම අවයව සහ උපාංග ශරීරයේ තැන්පත් කිරීම් සඳහා වැයවන සත්‍ය වියදම් පියවීමට සමාගම කටයුතු කරනු ඇත.

කෘත්‍රිම අවයව යන්නෙන් රක්ෂිතයාගේ ස්වාභාවික අත්, පා හෝ ඇස් අහිමි වීම නිසා සවිකරනු ලබන කෘත්‍රිම අවයව අදහස් වේ් පහත සඳහන් කොන්දේසි සපුරාලීමෙන් අනතුරුව, රක්ෂිතයාට කෘත්‍රිම අවයව මිලදී ගැනීම සඳහා වන වියදම් ගෙවනු ලබනු ඇත.

- රෝහල්ගත වී සිටීමට සිදුවන ආකාරයේ හදිසි අනතුරක් හෝ රෝගයක් නිසා අත්, පා, හෝ ඇස් අහිමි වීම මගින් රක්ෂිතයට කෘත්‍රිම අවයව අවශ්‍ය වී තිබිය යුතු ය.
- ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් අදාළ කෘත්‍රිම අවයවය සවිකළ යුතු බවට නිර්දේශ කර තිබිය යුතු ය.
- රක්ෂිතයා රෝහලෙන් පිට වී ගොස් දින 180 ක කාලයක් ඇතුළත අදාළ කෘත්‍රිම අවයව මිලදීගෙන තිබිය යුතු අතර මෙම ප්‍රතිලාභයට අදාළ සීමාව (ප්‍රතිලාභ සටහනෙහි දැක්වෙන පරිදි) රෝහලෙන් පිටත් ව යන දිනයේදී අදාළ වූ සීමාවන් මත පදනම් විය යුතු ය.

සමාගම විසින් මුදල් ගෙවනු ලබන්නේ දෑත, දෙපා, හෝ දෑස් සඳහා වන කෘත්‍රිම අවයව වලින් එක් වර්ගයකින් එක් කෘත්‍රිම අවයවයක්/ඉන්ද්‍රියක් සඳහා පමණි කෙසේ වුවද වෙනත් අනතුරක් හෝ රෝගයක් නිසා එම අවයවය/ඉන්ද්‍රිය වෙනුවෙන් නැවත කෘත්‍රිම අවයවයක් මිලදී ගැනීමට රක්ෂිතයාට සිදුවන්නේ නම් එම වියදම් පියවීමට සමාගම කටයුතු කරනු ඇත් අලුත් අවයව සවිකිරීම, කෘත්‍රිම අවයවය අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම ආදිය සඳහා සමාගම විසින් මුදල් ගෙවනු නොලැබේ ශල්‍යකර්ම මගින් ශරීරය තුළ සිදුකරන ලබන උපාංගය සාමාන්‍ය මිලගණන් යටතේ පවතින, අනුමත උපාංග වර්ග විය යුතු අතර ශල්‍යකර්මයෙන් පසු රක්ෂිතයාගේ සිරුර තුළ පවතින ඒවා විය යුතු ය.

Specimen

### 3.2.6.2 (VIII) සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය තුළින් පහත සඳහන් වියදම් ආවරණය වේ,

1 දත් පිරවීම හා සවිකිරීම

2 පරීක්ෂාව

3 එක්ස් කිරණ පරීක්ෂණ

4 දත් ගැලවීම

5 දත්වල සිදුරු සඳහා ප්‍රතිකාර කිරීම

6 විදුරුමස් රෝග සඳහා ප්‍රතිකාර

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය යටතේ ප්‍රතිලාභ එකතුවේ 22(1) කොටසේ දක්වා ඇති සීමාවන්ට යටත්ව, ප්‍රතිපූරණ පදනම යටතේ පමණක් ප්‍රතිලාභ ගෙවනු ලැබේ මේ සඳහා බිල්පතේ මුල් පිටපත, ගෙවීම් ලදුපතේ මුල් පිටපත, සේවා විස්තරය (ලියාපදිංචි දන්ත වෛද්‍යවරයෙකු/දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරන ලද) සහ හිමිකම් මුදල් ඉල්ලීමේ අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. රක්ෂිතයා සහ, යුනියන් හෙල්ත් 360 රක්ෂණ ඔප්පුවේ පළමු උපලේඛනය යටතේ ආවරණය හිමි පුද්ගලයන් ලෙස දක්වා ඇති කලත්‍රයා සහ දරුවන් විසින් ශ්‍රී ලංකාවේදී ලබාගන්නා ලද ප්‍රතිකාර සඳහා පමණක් මෙම ආවරණය වලංගු වේ.

ආවරණ වර්ධක ප්‍රතිලාභය මගින් මෙම ආවරණයේ සීමාවන් වැඩි කළ නොහැකි අතර පුනස්ථාපන ප්‍රතිලාභය යටතේ ආවරණය නැවත ස්ථාපිත කිරීමක්ද සිදු නොවේ. ඉහත අර්ථ දැක්වීමට පහත සඳහන් දේවල් ඇතුළත් නොවේ.

i. දත් පිරිසිදු කිරීම සහ මැලියම් ඉවත් කිරීම.

ii. මුඛ ආරක්ෂක, විදුරුමස් ආරක්ෂක හෝ වෙනත් ඕනෑම ආකාරයක දන්ත උපකරණ

iii. සකස් කිරීම, සවි කිරීම සහ ඒ සඳහා භාවිතා කරන උපකරණ (crowns සහ bridges ඇතුළුව) ඇතුළු සියලු වියදම්.

iv. බ්ලීච් කිරීම, වෙනත් දත් සුදු කිරීමේ ක්‍රම සහ විකලාංග ප්‍රතිකර්ම.

v. මුඛ සෞඛ්‍යය සඳහා අත්‍යවශ්‍ය නොවන රූපලාවණ්‍යමය ප්‍රතිකාර.

vi. විශේෂඥ ප්‍රතිකාර, එනම් සාමාන්‍ය දන්ත වෛද්‍යවරයකුගේ සීමාවෙන් ඔබ්බට යන ඕනෑම ආකාරයක දන්ත වෛද්‍ය ප්‍රතිකාරයක්.

vii. දන්ත වෛද්‍ය ශල්‍යකර්මයකින් හැර වෙනත් ක්‍රමයකින් ඥාන දත් ඉවත් කිරීම.

viii. 'දන්ත ආභරණ' සඳහා ප්‍රතිකාර, සත්කාර, අළුත්වැඩියා කටයුතු හෝ එවැනි කටයුතු.

ix. ක්‍රීඩා සහ පුහුණු වීම් කටයුතු වලදී නිර්දේශිත මුඛ ආරක්ෂක උපකරණ පැළඳ නොසිටීම නිසා ඇතිවන හානි හේතුවෙන් සිදුකිරීමට අවශ්‍ය වන ප්‍රතිකාර.

x. කෘත්‍රිම දත් සහ දන්ත නව නිපැයුම් ඇතුළුව කෘත්‍රිම අවයව හා උපකරණ සඳහා වියදම.

### 3.2.6.2 (IX) මාතෘ ප්‍රතිලාභය

රක්ෂිතයා මාතෘ ප්‍රතිලාභය සඳහා අයදුම් කර ඇත්නම් සහ සහ එම ප්‍රතිලාභය ඇතුළත් බවට රක්ෂණ ඔප්පුවේ ප්‍රථම උපලේඛනයේ සඳහන් කර ඇත්නම් මෙම ප්‍රතිලාභය වලංගු වේ.

මාතෘ ප්‍රතිලාභ යටතේ, ශ්‍රී ලංකාවේ රෝහලකදී සිදුකරන සාමාන්‍ය දරු ප්‍රසූතිය (NVD) (අඬු සහ රික්තක ආධාරයෙන් වන ප්‍රසූතියද ඇතුළත්ව) සහ ශල්‍යකර්ම මගින් සිදුවන දරු ප්‍රසූතිය (LSCS) සහ ගබ්සා වීම් සම්බන්ධ වෛද්‍ය වියදම් පමණක් ආවරණය වනු ඇති මෙම ප්‍රතිලාභය වයස අවුරුදු හතළිස් පහ (45) ට පෙර, ප්‍රතිලාභයේ කාලසීමාව තුළ සිදු වන දරු උපත් අවස්ථා දෙකකට (ගබ්සා වීම් ඇතුළුව) සීමා වේ.

මෙම ආවරණය රක්ෂිතයා හෝ කලත්‍රයාට පමණක් අදාළ වන අතර, රක්ෂණය ලබාගන්නා අවස්ථාවේදී වයස අවුරුදු 40 ට වැඩි නොවිය යුතු යි හිමිකම් මුදල් ලබාගෙන ඇති හෝ නොමැති කවර තත්වයක් යටතේ වුවද, මෙම රක්ෂණ ඔප්පුවේ ප්‍රථම උපලේඛනයේ දක්වා ඇති කල් ඉකුත්වීමේ දිනය එළඹුණු විට මෙම ප්‍රතිලාභය අවලංගු වේ මෙම මාතෘ ප්‍රතිලාභය රක්ෂණය ආරම්භ වන අවස්ථාවේදී සහ/හෝ යුනියන් හෙල්ත් 360 ආවරණය ඇතුළත් කරගනු ලබන අවස්ථාවේදී පමණක් ලබාගත හැකි මාතෘ ප්‍රතිලාභය

Specimen

ලබාගත් පසුව◻ ප්‍රතිලාභයට අදාළ කාලසීමාව තුළ එය ඉවත් කිරීමට අවසර නොලැබේ මාතෘ ප්‍රතිලාභයට අදාළ හිමිකම් මුදල් ඉල්ලීම් පියවීම, 22 (1) කොටසේ දක්වා ඇති ප්‍රතිලාභ වගුවෙහි සඳහන් කර ඇති සීමාවන්ට යටත්ව ප්‍රතිපූරණ පදනම යටතේ පමණක් සිදුකෙරේ.

ආවරණ වර්ධක ප්‍රතිලාභය මගින් මෙම ආවරණයේ සීමාවන් වැඩි කළ නොහැකි අතර පුනස්ථාපන ප්‍රතිලාභය යටතේ ආවරණය නැවත ස්ථාපිත කිරීමක්ද සිදු නොවේ ජීවිත රක්ෂිතයා විසින් කිසියම් මුදල් තමන් විසින්ම පියවනු ලැබීමට තීරණය කර එයට අදාළව Deductible option ලබාගෙන ඇත්නම්, එය මාතෘ ප්‍රතිලාභ යටතේ හිමිකම් ඉල්ලීම් සඳහා අදාළ නොවේ.

ඉහත අර්ථකථනයන් මගින් පහත සඳහන් දේවල් ආවරණය නොවේ.

අ) සරු බව හෝ මඳසරු බව සම්බන්ධ ප්‍රතිකාර කිරීම, පිළිසිඳ ගැනීමේ සහය ප්‍රතිකර්ම හෝ වන්ධ්‍යකරණය, උපත් පාලනය හා සම්බන්ධ ප්‍රතිකාර, ලිංගික දුර්වලතා සඳහා ප්‍රතිකාර කිරීම සහ දරුගැබ ස්වේච්ඡාවෙන් ඉවත් කිරීම.

ආ) පෞද්ගලික හෙද වියදම්.

ඇ) සාමාන්‍ය පරීක්ෂාවන් සඳහා පැමිණීම, රෝග විනිශ්චය පරීක්ෂණ, මාතෘ භාවය ආශ්‍රිත තත්වයන් සඳහා ප්‍රතිකාර/ උපදේශනය සහ වෛද්‍ය නොවන වියදම්.

ඈ) අලුත උපන් බිලිඳෙකුට අදාළ ඕනෑම ආකාරයක වියදම්.

### 3.2.6.2 (X) සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභය

රක්ෂිතයා මෙම ප්‍රතිලාභය සඳහා අයදුම් කර ඇත්නම් සහ සහ එම ප්‍රතිලාභය ඇතුළත් බවට රක්ෂණ ඔප්පුවේ ප්‍රථම උපලේඛනයේ සඳහන් කර ඇත්නම් මෙම ප්‍රතිලාභය වලංගු වේ අක්ෂි රෝග විශේෂඥ වෛද්‍යවරයකු/ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයකු විසින් අවිදුර දෘෂ්ටිය නිවැරදි කිරීම සඳහා නියම කරන ලද සහ, ලියාපදිංචි දෘෂ්ටි විශේෂඥ සමාගමක් වෙතින් මිලදී ගන්නා ලද වර්තන දෝෂ නිවැරදි කිරීමේ ප්‍රතිකර්ම මෙමගින් ආවරණය වේ. මෙම ප්‍රතිලාභය රක්ෂිතයාට සහ, යුනියන් හෙල්ත් 360 ආවරණයේ ප්‍රථම උපලේඛනයෙහි ආවරණය ලබන පුද්ගලයන් යටතේ සඳහන් කර ඇති කලත්‍රයාට පමණක් අදාළ වනු ඇත.

වසර දෙකකට වරක්, පහත සඳහන් ආකාරයට මෙම ආවරණය හිමි වේ.

i. අක්ෂි පරීක්ෂාවන් සඳහා අයකරනු ලබන වියදම් (උපරිම වශයෙන් වසර 2 කට වරක්)

ii. වෛද්‍යවරයෙකු විසින් නියම කරන ලද ආකාරයේ ඇස් කන්නාඩි රාමු සහ කාච (උපරිම වශයෙන් වසර 2 කට වරක් එක් ඇස් කන්නාඩියක්)

සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභයට අදාළ හිමිකම් මුදල් ඉල්ලීම් පියවීම, 22 (1) කොටසේ දක්වා ඇති ප්‍රතිලාභ එකතුවේ සඳහන් කර ඇති සීමාවන්ට යටත්ව, ප්‍රතිපූරණ පදනම යටතේ පමණක් සිදුකෙරේ මේ සඳහා වෛද්‍ය නිර්දේශයේ මුල් පිටපත, බිල්පතේ මුල් පිටපත, ගෙවීම් ලදුපතේ මුල් පිටපත සහ සම්පූර්ණ කරන ලද හිමිකම් මුදල් ඉල්ලීමේ ආකෘති පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

ආවරණ වර්ධක ප්‍රතිලාභය මගින් මෙම ආවරණයේ සීමාවන් වැඩි කළ නොහැකි අතර පුනස්ථාපන ප්‍රතිලාභය යටතේ ආවරණය නැවත ස්ථාපිත කිරීමක්ද සිදු නොවේ ජීවිත රක්ෂිතයා විසින් කිසියම් මුදල් තමන් විසින්ම පියවනු ලැබීමට තීරණය කර එයට අදාළව Deductible option ලබාගෙන ඇත්නම්, එය මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් ඉල්ලීම් සඳහා අදාළ නොවේ.

ඉහත අර්ථකථනයන් මගින් පහත සඳහන් දේවල් ආවරණය නොවේ.

අ) අඳුරු කරන ලද / Reactive වර්ගයේ කාච, අව් කණ්ණාඩි, අක්ෂි දෝෂ නිවැරදි නොකරන කාච (වෛද්‍යවරයෙකු නියම කර තිබුණද), ලේසර් අක්ෂි සැත්කම් හෝ වෙනත් සමාන තාක්ෂණයක්.

ආ) දෘෂ්ටි නිවැරදි කිරීමකින් තොර සාමාන්‍ය කාච

ඇ) රූපලාවණ්‍යමය කාච

ඈ) අක්ෂි අභ්‍යන්තර කාච

ඉ) පරිගණක කන්නාඩි සහ අක්ෂි ආරක්ෂක

ඊ) කියවීම සඳහා වන කන්නාඩි

Specimen

උ) අක්ෂි කාච ඇතුළුව ඇස් කණ්ණාඩි නඩත්තු කිරීම

ඌ) ඇස් කණ්ණාඩි අලුත්වැඩියා කිරීමේ ගාස්තු

### 3.2.6.2 (XI) සෞඛ්‍ය සුරැකුම් ආවරණය

අඛණ්ඩ හිමිකම් මුදල් ඉල්ලීම් රහිත රක්ෂණ ඔප්පු වර්ෂ දෙකකට පසු, යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයේ මූලික වාර්ෂික රක්ෂිත මුදලින් සියයට 2 ක් (2%) දක්වා, උපරිම වශයෙන් රුපියල් පනස් දහසකට (රු 50,000/) යටත්ව, ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලය යටතේ ලියාපදිංචි රෝහලක සෞඛ්‍ය පරීක්ෂාව සඳහා සෞඛ්‍ය සුරැකුම් ආවරණයක් ලෙස පිරිනමනු ලැබේ ප්‍රතිලාභයට අදාළ හිමිකම් මුදල් ඉල්ලීම් පියවීම, 22 (1) කොටසේ දක්වා ඇති ප්‍රතිලාභ එකතුවේ සඳහන් කර ඇති සීමාවන්ට යටත්ව, ප්‍රතිපූරණ පදනම යටතේ පමණක් සිදුකෙරේ. මෙම ආවරණයට අදාළ රක්ෂිත මුදලේ ශේෂයක් සහ/හෝ හිමිකම් ලෙස ලබා නොගන්නා ලද මුදලක් වේ නම් එය ඊළඟ ඔප්පු වර්ෂය සඳහා ඉදිරියට ගෙන යා නොහැක.

ආවරණ වර්ධක ප්‍රතිලාභය මගින් මෙම ආවරණයේ සීමාවන් වැඩි කළ නොහැකි අතර පුනස්ථාපන ප්‍රතිලාභය යටතේ ආවරණය නැවත ස්ථාපිත කිරීමක්ද සිදු නොවේ ජීවිත රක්ෂිතයා විසින් කිසියම් මුදල් තමන් විසින්ම පියවනු ලැබීමට තීරණය කර එයට අදාළව Deductible option ලබාගෙන ඇත්නම්, මෙම ප්‍රතිලාභය රක්ෂිතයාට සහ, යුනියන් හෙල්ත් 360 ආවරණයේ ප්‍රථම උපලේඛනයෙහි ආවරණය ලබන පුද්ගලයන් යටතේ සඳහන් කර ඇති කලත්‍රයාට පමණක් අදාළ වනු ඇත.

මාතෘ ප්‍රතිලාභය, සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම් මගින් සෞඛ්‍ය සුරැකුම් ආවරණයට සුදුසුකම් ලැබීම සම්බන්ධයෙන් බලපෑමක් ඇති නොවේ.

### 3.2.6.2 (XII) බාහිර රෝගී සහ ආයුර්වේද රෝහල්ගත වීමේ ප්‍රතිලාභය

පහත දක්වා ඇති නියමයන් හා කොන්දේසි වලට යටත්ව, බාහිර රෝගී සහ ආයුර්වේද රෝහල්ගත වීමේ ප්‍රතිලාභය යටතේ පහත සඳහන් වියදම් පියවනු ලැබේ

අ) අවම වශයෙන් පැය 24 ක් රෝහල්ගත වී ප්‍රතිකාර ලැබීම අවශ්‍ය වන ආයුර්වේද ප්‍රතිකාර

ආ) ඖෂධ

ඇ) පූර්වාරක්ෂක එන්නත් සහ රෝග විනිශ්චය කිරීමේ පරීක්ෂණ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයකු විසින් නියම කරන ලද රසායනාගාර, විකිරණ හා උපකරණ පරීක්ෂණ යනාදී පූර්වාරක්ෂක එන්නත් සහ රෝග විනිශ්චය පරීක්ෂණ මෙම ප්‍රතිලාභය යටතේ ප්‍රතිපූරණය කෙරේ. පරීක්ෂණ සිදුකිරීම/එන්නත් ලබා දීම ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලය යටතේ ලියාපදිංචි ආයතනයක සිදුකළ යුතු ය. 'ඖෂධ' යන්නෙන් ශ්‍රී ලංකා ඖෂධ නියාමන අධිකාරිය විසින් පිළිගනු ලබන, ශ්‍රී ලංකාව තුළදී මිලදීගන්නා ලද ඖෂධ අදහස් වේ.

පහත සඳහන් රෝහල් වෙතින් ලබාගන්නා ප්‍රතිකාර, ආයුර්වේද රෝහලක රෝහල්ගත කිරීම යන කාණ්ඩය යටතේ පමණක් සලකා බැලේ.

- ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල
- හොරණ සුගත රසායනාගාරය/ ආයුර්වේද සුගත රෝහල
- සිද්ධාලේප ආයුර්වේද රෝහල
- පිලපිටිය රෝහල සහ ඕනෑම ජාතික ආයුර්වේද රෝහලක්
- ආදිත්‍යා ආයුර්වේද රෝහල

ප්‍රතිලාභ ලබාගැනීම සඳහා රෝහල්ගත වූ/ ඖෂධ මිලදී ගත් දිනයේ සිය දින 7 ක් ඇතුළත, අදාළ සාක්ෂි සමගින් ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වේ. මේ සඳහා වෛද්‍ය නිර්දේශයේ මුල් පිටපත, බිල්පතේ මුල් පිටපත, ගෙවීම් ලදුපතේ මුල් පිටපත සහ සම්පූර්ණ කරන ලද හිමිකම් මුදල් ඉල්ලීමේ ආකෘති පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රතිලාභයට අදාළ හිමිකම් මුදල් ඉල්ලීම් පියවීම, 2.2 (1) කොටසේ දක්වා ඇති ප්‍රතිලාභ එකතුවේ සඳහන් කර ඇති සීමාවන්ට යටත්ව, ප්‍රතිපූරණ පදනම යටතේ පමණක් සිදුකෙරේ. මෙම බාහිර රෝගී ප්‍රතිලාභය අදාළ වන්නේ ශ්‍රී ලංකාව තුළ වැය වූ වියදම් සඳහා පමණි.



Specimen

ආවරණ වර්ධක ප්‍රතිලාභය මගින් මෙම ආවරණයේ සීමාවන් වැඩි කළ නොහැකි අතර පුනස්ථාපන ප්‍රතිලාභය යටතේ ආවරණය නැවත ස්ථාපිත කිරීමක්ද සිදු නොවේ. ජීවිත රක්ෂිතයා විසින් කිසියම් මුදලක් තමන් විසින්ම පියවනු ලැබීමට තීරණය කර එයට අදාළව Deductible option ලබාගෙන ඇත්නම්, එය මෙම ප්‍රතිලාභය යටතේ හිමිකම් ඉල්ලීම් සඳහා අදාළ නොවේ.

මෙම ප්‍රතිලාභය රක්ෂිතයාට සහ, යුනියන් හෙල්ත් 360 ආවරණයේ ප්‍රථම උපලේඛනයෙහි ආවරණය ලබන පුද්ගලයන් යටතේ සඳහන් කර ඇති කලත්‍රයාට පමණක් අදාළ වනු ඇත.

ඉහත සඳහන් අර්ථකථනයන්ට පහත සඳහන් දේවල් අයත් නැත.

අ) ට්‍රොපිකල් ස්ප්‍රේ, ෂැම්පු, සබන් සහ බාර් ආකාරයට පවතින ඖෂධ

ආ) ආහාර රුචිය වර්ධනය කරන දේවල් සහ ස්ථූලතාව සඳහා ප්‍රතිකාර

ඇ) ප්‍රතිජීවක සහ ඉදිමුම් සමනය කරන ඖෂධ හැර චර්ම ප්‍රතිකාර සඳහා ලබාගන්නා අනෙකුත් ඖෂධ

### 3.2.6.2 (XIII) බරපතළ රෝග ප්‍රතිපූරණ ප්‍රතිලාභය

ප්‍රතිලාභ වගුවෙහි දක්වා ඇති පරිදි, බරපතළ රෝගාබාධ ප්‍රතිපූරණ ප්‍රතිලාභය පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, පහත සඳහන් රෝගාබාධ සඳහා වසරකට යුනියන් හෙල්ත් 360 හි මූලික රක්ෂණ මුදලින් 50% ක් දක්වා ලබාදෙනු ලැබේ.

හිමිකම් මුදල් ඉල්ලීම් පියවීම සිදුකරනු ලබන්නේ, දක්වා ඇති සීමාවන්ට යටත්ව, ප්‍රතිපූර්ණ පදනම යටතේ පමණි මෙම ප්‍රතිලාභය යටතේ ඔප්පු කාලසීමාව තුළ ලබාගත හැකි උපරිම මුදල යුනියන් හෙල්ත් 360 ආවරණයේ මූලික වාර්ෂික රක්ෂණ මුදල මෙන් දෙගුණයකට සීමා වේ යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයට අදාළ වාර්ෂික රක්ෂිත මුදල් සීමාව සහ, ආවරණ වර්ධක ප්‍රතිලාභය හා පුනස්ථාපන ප්‍රතිලාභය යටතේ එක්රැස් වූ ප්‍රතිලාභ අවසන් වූ විට පමණක් බරපතළ රෝග ප්‍රතිපූර්ණ ප්‍රතිලාභය බලාත්මක වනු ඇතී යාවජීව සීමාව පසුකළ විට ප්‍රතිලාභය අවසන් වේ.

උපලේඛනයෙහි සහ ප්‍රතිලාභ වගුවෙහි අංක 3.2.6.2.2 (1) යටතේ දක්වා ඇති සැලසුම් අංක 01 සහ 08 සඳහා පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ ආවරණ වර්ධක ප්‍රතිලාභය මගින් මෙම ආවරණයේ සීමාවන් වැඩි කළ නොහැකි අතර පුනස්ථාපන ප්‍රතිලාභය යටතේ ආවරණය නැවත ස්ථාපිත කිරීමක්ද සිදු නොවේ.

මෙම ප්‍රතිලාභය යුනියන් හෙල්ත් 360 ආවරණයේ ප්‍රථම උපලේඛනයෙහි ආවරණය ලබන පුද්ගලයන් යටතේ සඳහන් කර ඇති සියලුම රක්ෂිතයන්ට අදාළ වනු ඇත.

#### 1) පිළිකා

ඖතික වේදීය සොයාගැනීම් මගින් තහවුරු කරන ලද මාත්සරික සෛලයන්ගේ පාලනය කළ නොහැකි වර්ධනය හා පටකයන් ආක්‍රමණය කිරීම පෙන්නුම් කරනු ලබන සියළු අර්බුදයක් (Malignant Tumor) මෙයින් අදහස් කෙරේ රෝග නිර්ණය පිළිකා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් තහවුරු කල යුතු වේ.

විශේෂයෙන් බැහැරකල අවස්ථාවකදී හැරුනුකොට ලියුකේමියාව (Leukaemia) හෝ මාත්සරික ලිම්පෝමා හා මයලොඩිස්ප්ලාස්ටික් සහලක්ෂණය මෙම නිර්වචනය යටතේ ආවරණය වේ. ඉහත නිර්වචනයෙන් මතු කියවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

- ඖතික වේදීය සාක්ෂි මගින් පූර්ව මාත්සරික ලෙස වර්ගීකරණය කරන ලද හෝ ආක්‍රමණික නොවන හෝ ස්වාස්ථීත අර්බුදයන් (පයෝධරයන්හි ස්වාස්ථීත ප්‍රණාලීය හෝ ඛන්ඩිකාමය කාර්සිනෝමාවන් හා ග්‍රෛවීය ඩිස්ප්ලාසියාවන් (CIN-1, CIN-2 and CIN-3)
- ග්ලිසන් අගය 6 ඉක්මවූ හෝ TNM සායනික වර්ගීකරණයට අනුව T2N0M0. අවස්ථාව දක්වාවත් ප්‍රගමණය වූ පිළිකාවන් හැර අනෙකුත් සියළු පුරස්ථි ග්‍රන්ථි පිළිකාවන් හා අර්බුදයනී
- බිනෙට් ඊ අවස්ථාව දක්වා වත් ප්‍රගමණය නොවූ නිදන්ගත වසා සෛලික ශ්වේත රක්තිය (lymphocytic leukaemia)
- ස්ථනාත්තරයන් (metastases) පිළිබඳ සාක්ෂි නොමැති මුලස්ථ සෛල කාර්සිනෝමාවන්, ශල්කමය සෛල කාර්සිනෝමාවන් සහ මාත්සරික මෙලනෝමා 1A අවස්ථාව (T1aN0M0).
- ඖතික වේදීය හඳුනාගැනීම් මගින් T1N0M0 ලෙස විස්තර කෙරුනු හා සෙ.මී. 1 ට අඩු



Specimen

විශ්කම්භයකින් යුතු තෛරොයිඩ් පිටිකා පිළිකාවන්.

- ඖතික වේදීය මගින් Ta ලෙස විස්තර කෙරුනු හා ආශගත ( මුත්‍රාශයෙහි ) පිටිකාමය ක්ෂුද්‍ර කාර්සිනෝමාවන්.
- තත්‍ය රුබ්රා පොලිසයිතිමීයාව හා සාමාන්‍ය ත්‍රොම්බොසයිතීමියාව.
- තීව්රතාවය නිර්ණය නොකල ඒක ක්ලෝනික ගැමෝපතිය.
- හෙලිකො බැක්ටීරියා සමූලෝත්පාඨනය මගින් ප්‍රතිකාර කල හැකි ජඨර MALT ලිම්පෝමාව
- AJCC පිළිකා අවස්ථානීර්ණ සංග්‍රහයේ 7 වන වෙළුමට (2010) අනුව 1 හා 11 අවස්ථාවේ පවතින ජඨර හා ආන්ත්‍රික පංජර අර්බුද (GIST).
- රසායන හෝ කිරණ චිකිත්සා මගින් ප්‍රතිකාර කිරීම අවශ්‍ය නොවන ත්වචීය ලිම්පෝමාවන්.
- රසායන හෝ කිරණ චිකිත්සා මගින් ප්‍රතිකාර කිරීම හෝ කුච විච්ඡේදනය (Mastectomy) අවශ්‍ය නොවන ඖතික වේදීය පරීක්ෂණ මගින් T1 mic ලෙස වර්ගීකරණය කෙරුණු පයොධරයන්හි ක්ෂුද්‍ර ආක්‍රමණික කාර්සිනෝමාවන්.
- රසායන හෝ කිරණ චිකිත්සා මගින් ප්‍රතිකාර කිරීම හෝ ජරායු විච්ඡේදනය (Hysterectomy) අවශ්‍ය නොවන ඖතික වේදීය පරීක්ෂණ මගින් IA1 ලෙස වර්ගීකරණය කෙරුණු ධරා ග්‍රිවයෙහි (cervix) ක්ෂුද්‍ර ආක්‍රමණික කාර්සිනෝමාවන්.

**2) බහු අවයව බද්ධය (අස්ථි මිදුළුව ඇතුළුව)**

ස්වවර්ග බද්ධ (ඇලෝග්‍රැෆ්ට්) හෝ සර්වසම බද්ධ (අයිසොග්‍රැෆ්ට්) කිරීමකට ප්‍රතිග්‍රාහකයෙකු වීම මෙයින් අදහස් කෙරේ. එහිදී පහත සඳහන් ඉන්ද්‍රියයන්ගෙන් එකක් හෝ කිහිපයක් බද්ධකිරීම සිදු කල යුතුය.

- හෘදය
- වකුගඩු
- අක්මාව (සජීවී දායක අක්මා බද්ධය හා විභේදන අක්මා බද්ධයද ඇතුළුව)
- පෙනහළු (සජීවී දායක පෙනහළු ඛණ්ඩිකා බද්ධය හා තනි පෙනහළු බද්ධයද ඇතුළුව)
- ඇටමිදුළු (සම්පූර්ණ අස්ථි මජ්ජා අපහරණයට පෙර ඇලෝජීනික් රක්තපාත ප්‍රාථමික සෙල බද්ධ කිරීම ඇතුළුව)
- කුඩා බඩවැල
- අග්න්‍යාසය

අර්ධ හෝ පූර්ණ වශයෙන් මුහුණ, හස්තය සහ පාදය බද්ධ කිරීම (සංයුක්ත පටක ඇලෝග්‍රැෆ්ට් බද්ධ කිරීම) ද මෙම අර්ථ දැක්වීම යටතේ ආවරණය වේ.

බද්ධ කිරීමකට තුඩු දෙන තත්ත්වයට වෙනත් ආකාරයකින් ප්‍රතිකාර කළ නොහැකි බවට විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් සනාථ කල යුතුය.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ,

- වෙනත් අවයව, ශරීර කොටස් හෝ පටක බද්ධ කිරීම (කණිනිකාව සහ චර්මය ඇතුළු)
- වෙනත් සෙල බද්ධ කිරීම (රක්තෝත්පාදකයන් හැර ද්වීපිකා සෙල හා වෙනත් ප්‍රාථමික සෙල ඇතුළුව)

**3) මොළයේ සැත්කම්**

පොදු නිර්වින්දනය යටතේ මොළයේ සිදුකරනු ලබන, සහ එය සිදුකිරීම සඳහා Craniotomy සමග අස්ථිමය ආවරණය ඉවත් කිරීමට සිදුවන සැත්කමක්. සුදුසුකම් ලත් විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් සැත්කම අවශ්‍ය බවට නිර්දේශ කර තිබිය යුතු අතර, සැත්කම සිදුකිරීමෙන් අනතුරුව පමණක් ප්‍රතිලාභය ගෙවනු ලැබේ.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ.

අ) Burr hole procedures, trans-phenoidal procedures iy irradiation by gamma knife හෝ endovascular embolizations, thrombolysis iy stereotactic biopsy, අවම ආක්‍රමණශීලී සැත්කම් සහ,

ආ) හදිසි අනතුරක් නිසා සිදුකරනු ලබන මොළයේ සැත්කම්

Specimen

**4) නිදන්ගත වකුගඩු අකර්මණ්‍ය වීමේ රෝගය**

වකුගඩු බද්ධ කිරීමක් සිදුකල හෝ නිත්‍ය රුධිර කාන්දු පෙරීම හෝ පරිතාන කාන්දු පෙරීම අරඹා ඇති වකුග ඩු දෙකෙහිම නිදන්ගත අප්‍රතිවර්ත්‍ය අකර්මන්‍යවීමක් මෙයින් අදහස් කෙරේ රෝග නිශ්චය හා කාන්දුකරණය සඳහා වූ වෛද්‍යමය අවශ්‍යතාවය වකුගඩු පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් සනාථ කළ යුතුය.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ,

- තාවකාලිකව කාන්දුකරණය අවශ්‍ය වන උග්‍ර ප්‍රතිවර්ත්‍ය වකුගඩු ක්‍රියා විරහිත වීම

**5) Coronary Artery Bypass Graft (CABG) සැත්කම**

අවම හානිකර යතුරු සිදුරු කිරීටක ධමණි බයිපාස් ශල්‍යකර්මයක් හෝ ක්‍රෝඩක විඡේදනයක් හරහා සිදුකෙරෙන සැබෑ කිරීටක ධමණි බයිපාස් ශල්‍යකර්මයක් මගින් එක් කිරීටක ධමණියක හෝ කිහිපයක ඇති පටු වීම් හෝ අවහිරවීම් නිදොස් කිරීම සඳහා හෘද සැත්කමක් සිදුකිරීම මෙයින් අදහස් කෙරේ රෝග නිශ්චය කිරීටක ධමණි ඇන්පියෝග්‍රෑම් (වහිත්‍ර කන්තු රේඛණ) වාර්ථා මගින් සනාථ වියයුතු අතර ශල්‍යකර්මය අත්‍යවශ්‍යයෙන්ම සිදුකලයුතු බව හෘද රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කල යුතු වේ.

මතු කියැවෙන තත්ත්වයන් මෙම අර්ථ දැක්වීමෙන් බැහැර කෙරේ

- ඇන්පියෝප්ලාස්ටි සහ/හෝ අන්තඃ ධමණික ක්‍රියාවලීන්

**6) මහා ධමනියේ සැත්කම් /ප්‍රාහ්‍යුද රෝග ශල්‍යකර්ම**

ප්‍රාහ්‍යුදයේ විඛණ්ඩනයක් (Dissection) අවහිර වීමක් හා උපුලුවක් (Aneurysm) හෝ පටු වීමක් සඳහා ප්‍රතිකාරය ලෙස ශල්‍යකර්මයට භාජනය වීම මෙයින් අදහස් කෙරේ අන්තඃ වාහිණී ප්‍රතිසංස්කරණයන් (endovascular repair) වැනි අව හානි ක්‍රියාවලීන් මෙම නිර්වචනය මගින් ආවරණය කෙරේ ප්‍රාහ්‍යුද ශල්‍යකර්මයක් අවශ්‍ය බව හෘදරෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් තහවුරු කළ යුතු අතර පරිලෝකණ පරීක්ෂණ ප්‍රතිඵල ඇසුරින් සනාථ කල යුතු වේ.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ

- උරස් හෝ උදර සංස්ථානික ධමණි ශාඛාවන්හි ශල්‍යකර්ම (ඌර්වසංස්ථානික හෝ ජඝනසංස්ථානික බයිපාස් වැනි ශල්‍යකර්ම)
- ප්‍රවේණිගත සම්හන්ධක පටක රෝගයන් හා සම්හන්ධ ප්‍රාහ්‍යුද ශල්‍යකර්ම (මර්ෆන් සහලක්ෂණය එහ්ලෙර්ස් ඩන්ලොස් සහලක්ෂණය වැනි /Marfan syndrome, Ehlers-Danlos syndrome)
- ක්ෂතික හානියක් හේතුවෙන් සිදුකෙරෙන ප්‍රාහ්‍යුද ශල්‍යකර්ම Marfan syndrome, Ehlers-Danlos syndrome

**7) හෘද කපාට සැත්කම්**

රෝගී හෘද කපාට එකක් හෝ කිහිපයක් පුනස්ථාපනය හෝ ප්‍රතිසංස්කරණය සඳහා ශල්‍යකර්මයකටභාජනය වීම මෙයින් අදහස් කෙරේ මතු කියැවෙන ක්‍රියාවලීන් මෙම නිර්වචනය මගින් ආවරණය කෙරේ,

- ක්‍රෝඩක වීඡේදනය අර්ධ ක්‍රෝඩක වීඡේදනය හෝ උරස් වීඡේදනය හරහා සිදු කෙරෙන හෘද කපාට පුනස්ථාපනය හෝ ප්‍රතිසංස්කරණය
- රෝස් ක්‍රියාවලිය
- කැතීටර පාදක කපාට කලප්‍යය (valvuloplasty)
- කතීටරික ප්‍රාහ්‍යුද කපාට රෝපණය

හෘදරෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු හෝ හෘද ශල්‍ය වෛද්‍යවරයකු විසින් ශල්‍යකර්මයක වෛද්‍යමය අවශ්‍යතාවය තහවුරු කල යුතු අතර එකෝ කාර්ඩියෝග්‍රෑම් හා කැතීටරිකරණ ප්‍රතිඵල මගින් සනාථ කල යුතු වේ.

ඉහත නිර්වචනයෙන් මතු කියැවෙන තත්ත්වයන් ආවරණය නොකෙරේ

- කැතීටරිකරන ද්විතුණ්ඩ කපාට ඉමැයීම

Specimen

### 3.2.6.2 (XIV) Deductible ක්‍රමය

රක්ෂණ ඔප්පු වර්ෂයක හිමිකම් මුදල් ඉල්ලීම් සඳහා Deductible ක්‍රමය භාවිතා කිරීමට රක්ෂණ හිමියා එකඟ වී, ඒ සඳහා රක්ෂණ යෝජනාව ඔස්සේ කැමැත්ත ප්‍රකාශ කර තිබේ නම්, සහ රක්ෂණ ඔප්පුවේ/ පසුකාලීන සංශෝධන වල අදාළ තෝරාගත් Deductible option එක සඳහන් වන්නේ නම්, හිමිකම් ඉල්ලීමකට අදාළ වන සිදුවීමකදී එම මුදලට සමාන මුදලක් රක්ෂිතයා මුලින් පියවිය යුතු අතර (මුදල ගෙවා ඒ බව සමාගමට දැන්විය යුතු ය) එම Deductible මුදල ගෙවා අවසන් කිරීමෙන් අනතුරුව පමණක් හිමිකම් මුදල් සඳහා සුදුසුකම් ලබයි.

රක්ෂිත මුදල අඩු කරන ලද අවස්ථාවකදී Deductible මුදලද අඩු වන අතර, අඩු කළ ප්‍රතිලාභ සැලසුම යටතේ Deductible ක්‍රම තෝරාගැනීමට රක්ෂිතයාට අවස්ථාව හිමි වේ.

Deductible option එක ඉවත් කිරීමට අවස්ථාව ලබාදෙනුයේ රක්ෂණ සැලසුම ආරම්භයේදී හෝ ප්‍රතිලාභය ඇතුළත් කළ අවස්ථාවේදී ප්‍රධාන රක්ෂිතයාගේ වයස අවුරුදු හතළිස් පහක් (45) සහ ඊට අඩු නම් පමණි තෝරාගත් Deductible ක්‍රමය අවුරුදු 10 ක් වාරික ගෙවීමෙන් පසු, සහ රක්ෂණ යෝජනා පත්‍රයේ සඳහන් කළ නිශ්චිත වයස එළඹීමෙන් පසු පමණක් ඉවත් කළ හැකි වේ රක්ෂණය ආරම්භ වන අවස්ථාවේදී එකඟ වී රක්ෂණ යෝජනාවට ඇතුළත් කර ඇත්නම් හෝ අතිරේක ආවරණය ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී එකඟ වී ඇත්නම් හැර, අතිරේක ආවරණයේ කාලසීමාව තුළදී Deductible තෝරාගැනීම ඉවත් කිරීමට අවසර නැති Deductible ක්‍රමය ඉවත් කිරීම සඳහා ලිඛිත එකඟත්වය සමාගම වෙත ලැබීමෙන් අනතුරුව සහ අදාළ සියලු වාරික ගෙවා ඇත්නම්, ඊළඟ ඔප්පු වර්ෂය ආරම්භයේ සිට වලංගු වන පරිදි Deductible ක්‍රමය ඉවත් කිරීම සිදු කරනු ඇති Deductible ක්‍රමය තෝරාගනු ලැබූ පසුව, යුනියන් හෙල්ත් 360 රක්ෂණයට අදාළ රක්ෂිත මුදලේ අඩුවීමක් සිදු වූයේ නම් හැර, Deductible මුදල අඩු කළ නොහැක.

මාතෘ ප්‍රතිලාභය, සහ සාමාන්‍ය අක්ෂි ප්‍රතිලාභය සඳහා හැර අනෙකුත් සියලුම ප්‍රතිලාභ සඳහා Deductible ක්‍රමය වලංගු වේ.

### 3.2.6.3 ආවරණ හිමි නොවන කාලය

යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය ආරම්භ වන්නේ,

- මෙම ආවරණය ආරම්භක දිනය ; හෝ
- ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කළ දිනය

යන දින වලින් අවසානයට යෙදෙන දිනයේ සිට දින අනූවක් (90) ගතවූ පසුවය.

පහත සඳහන් දින වලින් අවසානයට යෙදෙන දිනයට පසුව ඇතිවන හදිසි අනතුරු නිසා සිදුවන රෝහල්ගත කිරීම් සහ/හෝ සැත්කම් සඳහා, 'ආවරණය හිමි නොවන කාලය' අවලංගු කිරීමට සමාගම කටයුතු කිරීමට ඉඩ ඇත.

- මෙම ආවරණය ආරම්භක දිනය ; හෝ
- ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කළ දිනය

මෙහි පහතින් දක්වා ඇති සැත්කම් වර්ග/ රෝග සඳහා, යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රිමියර් ප්‍රතිලාභය යටතේ හිමිකමක් පෑමට සුදුසුකමක් ලබන්නේ

- මෙම ආවරණය ආරම්භක දිනය ; හෝ
- ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- නැවත ප්‍රාණවත් කිරීම කළ දිනය

යන දින වලින් අවසානයට යෙදෙන දිනයේ සිට දින තුන්සිය හැට පහකට (365) පසුවය.

Specimen

| | සැත්කමේ නම/රෝගී තත්ත්වය |
|---|---|
| 1 | Medical or Surgical management of Deviated Nasal Septum, diseases of Tonsils, Adenoids and Sinuses and related conditions (except Malignancy). |
| 2 | All types of Hernias and Benign Prostatic Hypertrophy. |
| 3 | Hydrocele / Varicocele / Spermatocoele. |
| 4 | Piles / Fissure / Fistula-in-Ano / Rectal Prolapse / Pilonidal Sinus |
| 5 | Treatment of all gynecological conditions (Such as but not limited to Uterine Fibroid, Dysfunctional Uterine Bleeding, Hysterectomy, Uterine Prolapse, Endometriosis, Adeno-myosis Uteri, Ovarian Cyst etc.) except those arising from malignancy. |
| 6 | Medical or Surgical management of Prolapsed Intervertebral Disc. |
| 7 | Skin and all internal cysts/tumors/nodules/ polyps/ganglions/lipomas of any kind unless malignant. |
| 8 | Calculus Diseases of any etiology |
| 9 | Peripheral vascular diseases of any etiology, including treatment for Varicose veins. |
| 10 | All types of CRF and acute on chronic Renal Failures but not ARF, including Renal Failure due to Diabetes. |
| 11 | Osteoporosis / Pathological Fracture / Degenerative Joint Diseases including joint replacement surgeries. However, joint surgeries necessitated due to accidents would not be a part of this exclusion. |
| 12 | Cataract, Retinopathy and Retinal detachment. |

ඉහත සැත්කම් සඳහා අදාල වන දින 365 ක ආවරණ හිමි නොවන කාලය යූනියන් හෙල්ත් 360 රක්ෂිත මුදල රු.500,000/- සහ ඊට වැඩි සැලසුම් සඳහා අදාල නොවේ. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් පළමු වසර තුලදී ඇති වන හිමිකමකදී කරන ගෙවීම හිමිකම් අගයෙන් 50% කට සීමා කර ඇති අතර එය උපරිම 200,000 කට යටත් වේ. එසේම මෙය ප්‍රතිලාභ වගුව සහ පලමු උපලේඛනයේ අඩංගු කරුණු හා යටතේ වේ.

එසේම පලමු උපලේඛනයේ සඳහන් කර ඇත්නම් 3.2.6.3 හි දක්වා ඇති ආවරණ හිමි නොවන කාලය අදාල ජීවිත රක්ෂිතයාට අදාල නොවේ. රෝහල් ගතවීම හෝ සැත්කම සඳහා සෘජුව හෝ වක්‍රකාරයෙන් හේතුවු අසනීප හෝ ආබාධ තත්ත්වය හඳුනාගැනීම සඳහාද ආවරණය හිමි නොවන කාලය අදාළ වේ. ආවරණය හිමි නොවන කාලයෙන් පසුව රෝහල්ගතවීම හෝ සැත්කම සිදු කළද එම රෝහල් ගතවීමට හෝ සැත්කමට හේතුවූ අසනීප තත්ත්වය හඳුනාගනු ලැබුයේ ආවරණ හිමි නොවන කාලසීමාව තුළදී නම් ඒ සඳහා ගෙවීමක් කරනු නොලැබේ. කෙසේ වෙතත් අදාළ රෝහල්ගතවීම හදිසි අනතුරක් හේතුවෙන් සිදුවූයේ නම් 'ආවරණ හිමි නොවන කාලය' අදාළ නොවේ.

### 3.2.6.3.1 බාහිර රෝගී සහ ආයුර්වේද රෝහල්ගත වීමේ ප්‍රතිලාභය/සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය

පහත සඳහන් දිනයේ සිට දින 180 කට පසුව ආවරණය බලාත්මක වේ:

- ආවරණය ආරම්භ වූ දිනය; හෝ
- රක්ෂණ ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- රක්ෂණ ඔප්පුව නැවත බලාත්මක කළ දින, යන දින අතරින් අවසානයට එළඹෙන දිනය

### 3.2.6.3.2 මාතෘ ප්‍රතිලාභය

පහත සඳහන් දිනයේ සිට මාස 24 කට පසුව ආවරණය බලාත්මක වේ:

- ආවරණය ආරම්භ වූ දිනය; හෝ

Specimen

- රක්ෂණ ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- රක්ෂණ ඔප්පුව නැවත බලාත්මක කළ දින, යන දින අතරින් අවසානයට එළඹෙන දිනය ගබ්සා වීම් ඉහත දිනවල සිට දින 180 කට පසුව ආවරණය වනු ඇත.

### 3.2.6.3.3. සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභය

පහත සඳහන් දිනයේ සිට මාස 24 කට පසුව ආවරණය බලාත්මක වේ:

- ආවරණය ආරම්භ වූ දිනය; හෝ
- රක්ෂණ ඔප්පුව නිකුත් කළ දිනය; හෝ
- රක්ෂණ ඔප්පුව නැවත බලාත්මක කළ දින, යන දින අතරින් අවසානයට එළඹෙන දිනය

### 3.2.6.4 ආවරණය වන එක් දින (Day Care) සැත්කම්

එක් දින (Day Care) සැත්කම් යන්න අර්ථ දැක්වෙන්නේ එක් රැයක රෝහල් ගත වීම අවශ්‍ය නොවන ශල්‍යකර්මයක් හෝ ප්‍රතිකාරයක් වන අතර එක් දින (Day Care) සැත්කම් සඳහා පශ්චාත් ශල්‍යකර්ම රෝහල් ගත ප්‍රතිකාර හෝ කළමනාකරණය අවශ්‍ය නොවන සැත්කම් ගාස්තු සහ වෛද්‍ය ගාස්තු පමණක් ආවරණය කෙරෙන අතර කාමර ගාස්තු සහ හෙද සත්කාර, වාට්ටු ක්‍රියා පටිපාටි වැනි රෝහල් වාට්ටු ගාස්තු බැහැර කෙරේ.

වෛද්‍ය/තාක්ෂණයේ දියුණුව නිසා හෝ වැඩිදියුණු වූ යටිතල පහසුකම් හේතුවෙන් පැය විසිහතරකට (24) අඩු කාලයක් අවශ්‍ය වන රෝහල්ගත වීමක් තුළින් සිදුකර ගත හැකි එක් දින (Day Care) සැත්කම් සහ අනෙකුත් සැත්කම් පහත දක්වා ඇති අදාළ සැත්කම් ඔප්පුවේ පොදු විධිවිධාන, කොන්දේසි හා බැහැරකිරීම් වලට යටත්වේ.

| | | |
|---|---|---|
| **Microsurgical operations on the middle ear** | 1 | Stapedectomy |
| | 2 | Revision of a stapedectomy |
| | 3 | Other operations on the auditory ossicles |
| | 4 | Myringoplasty (Type -I Tympanoplasty) |
| | 5 | Tympanoplasty (closure of an eardrum perforation/ reconstruction of the auditory ossicles) |
| | 6 | Revision of a Tympanoplasty |
| | 7 | Other microsurgical operations on the middle ear |
| **Other operations on the middle & internal ear** | 8 | Myringotomy |
| | 9 | Removal of a tympanic drain |
| | 10 | Incision of the mastoid process and middle ear |
| | 11 | Mastoidectomy |
| | 12 | Reconstruction of the middle ear |
| | 13 | Other excisions of the middle and inner ear |
| | 14 | Fenestration of the inner ear |

Specimen

| | | |
|---|---|---|
| | 15 | Revision of a fenestration of the inner ear |
| | 16 | Incision (opening) and destruction (elimination) of the inner ear |
| | 17 | Other operations on the middle and inner ear |
| **Operations on the nose & the nasal sinuses** | 18 | Excision and destruction of diseased tissue of the nose |
| | 19 | Operations on the turbinates (nasal concha) |
| | 20 | Other operations on the nose |
| | 21 | Nasal sinus aspiration |
| **Operations on the eyes** | 22 | Incision of tear glands |
| | 23 | Other operations on the tear ducts |
| | 24 | Incision of diseased eyelids |
| | 25 | Excision and destruction of diseased tissue of the eyelid |
| | 26 | Operations on the canthus and epicanthus |
| | 27 | Corrective surgery for entropion and ectropion |
| | 28 | Corrective surgery for blepharoptosis |
| | 29 | Removal of a foreign body from the conjunctiva |
| | 30 | Removal of a foreign body from the cornea |
| **Operations on the eyes** | 31 | Incision of the cornea |
| | 32 | Operations for pterygium |
| | 33 | Other operations on the cornea |
| | 34 | Removal of a foreign body from the lens of the eye |
| | 35 | Removal of a foreign body from the posterior chamber of the eye |
| | 36 | Removal of a foreign body from the orbit and eyeball |
| | 37 | Operation of cataract |
| **Operations on the skin & subcutaneous Tissues** | 38 | Incision of a pilonidal sinus |
| | 39 | Other incisions of the skin and subcutaneous tissues |
| | 40 | Surgical wound toilet (wound debridement) and removal of diseased tissue of the skin and subcutaneous tissues |
| | 41 | Local excision of diseased tissue of the skin and subcutaneous tissues |
| | 42 | Other excisions of the skin and subcutaneous tissues |
| | 43 | Simple restoration of surface continuity of the skin and subcutaneous tissues |
| | 44 | Free skin transplantation, donor site |

Specimen

| | | |
|---|---|---|
| | 45 | Free skin transplantation, recipient site |
| | 46 | Revision of skin plasty |
| | 47 | Other restoration and reconstruction of the skin and subcutaneous tissues |
| | 48 | Chemosurgery to the skin |
| | 49 | Destruction of diseased tissue in the skin and subcutaneous tissues |
| **Operations on the tongue** | 50 | Incision, excision and destruction of diseased tissue of the tongue |
| | 51 | Partial glossectomy |
| | 52 | Glossectomy |
| | 53 | Reconstruction of the tongue |
| | 54 | Other operations on the tongue |
| **Operations on the salivary glands & Salivary ducts** | 55 | Incision and lancing of a salivary gland and a salivary duct |
| | 56 | Excision of diseased tissue of a salivary gland and a salivary duct |
| | 57 | Resection of a salivary gland |
| | 58 | Reconstruction of a salivary gland and a salivary duct |
| | 59 | Other operations on the salivary glands and salivaryducts |
| | 60 | External incision and drainage in the region of the mouth, jaw and face |
| | 61 | Incision of the hard and soft palate |
| **Other operations on the mouth & face** | 62 | Excision and destruction of diseased hard and soft palate |
| | 63 | Incision, excision and destruction in the mouth |
| | 64 | Plastic surgery to the floor of the mouth |
| | 65 | Other operations in the mouth |
| **Operations on the tonsils & adenoids** | 66 | Transoral incision and drainage of a pharyngeal abscess |
| | 67 | Tonsillectomy without adenoidectomy |
| | 68 | Tonsillectomy with adenoidectomy |
| | 69 | Excision and destruction of a lingual tonsil |
| | 70 | Other operations on the tonsils and adenoids |
| **Orthopedic Surgeries** | 71 | Trauma surgery and orthopaedics |
| | 72 | Incision on bone, septic and aseptic |
| | 73 | Closed reduction on fracture, luxation or epiphyseolysis with osteosynthesis |

Specimen

| | | |
|---|---|---|
| | 74 | Suture and other operations on tendons and tendon sheath |
| | 75 | Reduction of dislocation under GA |
| | 76 | Arthroscopic knee aspiration |
| **Operations on the breast** | 77 | Incision of the breast |
| | 78 | Operations on the nipple |
| **Operations on the digestive tract** | 79 | Incision and excision of tissue in the perianal region |
| | 80 | Surgical treatment of anal fistulas |
| | 81 | Surgical treatment of haemorrhoids |
| | 82 | Division of the anal sphincter (sphincterotomy) |
| | 83 | Other operations on the anus |
| | 84 | Ultrasound guided aspirations |
| | 85 | Sclerotherapy etc. |
| | 86 | Laparoscopic cholecystectomy |
| | 87 | Incision of the ovary |
| | 88 | Insufflation of the Fallopian tubes |
| | 89 | Other operations on the Fallopian tube |
| **Operations on the female sexual organs** | 90 | Dilatation of the cervical canal |
| | 91 | Conisation of the uterine cervix |
| | 92 | Other operations on the uterine cervix |
| **Operations on the female sexual organs** | 93 | Incision of the uterus (hysterotomy) |
| | 94 | Therapeutic curettage |
| | 95 | Culdotomy |
| | 96 | Incision of the vagina |
| | 97 | Local excision and destruction of diseased tissue of the vagina and the pouch of Douglas |
| | 98 | Incision of the vulva |
| | 99 | Operations on Bartholin's glands (cyst) |
| **Operations on the prostate & Seminal vesicles** | 100 | Incision of the prostate |
| | 101 | Transurethral excision and destruction of prostate tissue |
| | 102 | Transurethral and percutaneous destruction of prostate tissue |

Specimen

| | | |
|---|---|---|
| | 103 | Open surgical excision and destruction of prostate tissue |
| | 104 | Radical prostatovesiculectomy |
| | 105 | Other excision and destruction of prostate tissue |
| | 106 | Operations on the seminal vesicles |
| | 107 | Incision and excision of periprostatic tissue |
| | 108 | Other operations on the prostate |
| **Operations on the testes** | 109 | Incision of the scrotum and tunica vaginalis testes |
| | 110 | Operation on a testicular hydrocele |
| | 111 | Excision and destruction of diseased scrotal tissue |
| | 112 | Plastic reconstruction of the scrotum and tunica vaginalis testes |
| | 113 | Other operations on the scrotum and tunica vaginalis testes |
| | 114 | Incision of the testes |
| | 115 | Excision and destruction of diseased tissue of the testes |
| | 116 | Reconstruction of the testes |
| | 117 | Implantation, exchange and removal of a testicular prosthesis |
| | 118 | Other operations on the testes |
| **Operations on the spermatic cord, epididymis und ductus deferen** | 119 | Surgical treatment of a varicocele and a hydrocele of the spermatic cord |
| | 120 | Excision in the area of the epididymis |
| | 121 | Epididymectomy |
| | 122 | Reconstruction of the spermatic cord |
| | 123 | Reconstruction of the ductus deferens and epididIdymis |
| | 124 | Other operations on the spermatic cord, epididymis and ductus deferens |
| **Operations on the penis** | 125 | Operations on the foreskin |
| | 126 | Local excision and destruction of diseased tissue of the penis |
| | 127 | Amputation of the penis |
| | 128 | Plastic reconstruction of the penis |
| | 129 | Other operations on the penis |
| **Operations on the urinary system** | 130 | Cystoscopical removal of stones |

Specimen

| | | |
|---|---|---|
| Other Operations | 131 | Lithotripsy |
| | 132 | Coronary angiography |
| | 133 | Haemodialysis |
| | 134 | Radiotherapy for Cancer |
| | 135 | Cancer chemotherapy |

### 3.2.6.5 වාර මුදල් කොන්දේසි සංශෝධනය කිරීම

මෙම ආවරණය සඳහා අය කෙරෙන වාරිකය සහතික කරනුයේ අවුරුද්දක (01) කාලයක් සඳහා පමණි අදාළ කොන්දේසි හා විධිවිධාන සංශෝධනය කිරීමට සහ/හෝ වාරික සංශෝධනය කිරීමට හෝ මෙම ප්‍රතිලාභය අවලංගු කිරීමට සමාගමට අයිතියක් ඇති අතර, ඔප්පු හිමියා වෙත දින තිහක (30) ක පෙර දැනුම් දීමකින් පසුව එසේ සිදුකළ හැකියි එවන් සංශෝධනයක් සිදු වුයේ නම් එම වෙනස ක්‍රියාත්මක වන්නේ ඉන් පසුව එළඹෙන ඔප්පු සංවත්සර දිනයේ සිටය.

### 3.2.6.6 රැකියාවේ වෙනස්වීම දැනුම්දීම

ජීවිත රක්ෂිතයාගේ රැකියාවේ හෝ ඊට අදාළ කටයුතු වල වෙනස්වීමක් සිදුවූයේ නම් එම වෙනස සිදු වී දින දහ හතරක් (14) ඇතුළත ඒ බව සමාගම වෙත ලිඛිතව දැනුම් දී මෙම ආවරණයේ වලංගුභාවය තහවුරු කරගත යුතුය. යෝජනා පත්‍රයේ/ඉල්ලුම් පත්‍රයේ සහ/හෝ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇති රැකියාවෙන් වෙනස් වූ රැකියාවක නිරතවන අතරතුර පැනනගින්නාවූ කිසිදු හිමිකමක් වෙනුවෙන් වගකීමට සමාගම බැඳී නොමැත.

### 3.2.6.7 දැනුම් දීම සහ හිමිකම් ඉල්ලීම් සම්බන්ධ සාක්ෂි

ආවරණය හිමි වන සහ හිමිකම් මුදල් ඉල්ලීමට පාදක වන රෝහල්ගත වීමකදී හෝ සැත්කමකදී, රෝහල්ගත වන දිනයේ සිට පැය 48 ක් ඇතුළත ඒ බව සමාගමේ ප්‍රධාන කාර්යාලයට හෝ ආසන්නතම ශාඛාව වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් හිමිකම් මුදල් ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට සමාගමට අයිතිය ඇත.

මෙම ලිඛිත ඉල්ලීම ලැබුණු පසුව සමාගම විසින් හිමිකම් මුදල් ඉල්ලීම සඳහා පිරවිය යුතු වන ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර, නිකුත් කළ දිනයේ සිට දින 10 ක් ඇතුළත සමාගම වෙත භාරදිය යුතු ය. සමාගමට පිළිගත හැකි සාක්ෂි සමග බිල්පත් හා ලදුපත් වල සත්‍ය පිටපත් රෝහලෙන් පිටව ගිය දිනයේ සිට/බාහිර රෝගී ප්‍රතිකාර ලබාගත් දිනයේ සිට දින 30 ක් ඇතුළත, රක්ෂිතයාගේ වියදමින් සමාගම වෙත භාරදිය යුතු වේ.

රක්ෂිතයා හෝ පවුලේ සාමාජිකයෙකු, ප්‍රතිකාර භාරව සිටි වෛද්‍යවරයාගේ උපදෙස් නිවැරදිව පිළිපැදිය යුතු අතර, ප්‍රතිකාර වල තත්ත්වය පිළිබඳව සම්පූර්ණ විස්තර සමාගම වෙත ලබාදිය යුතු ය.

සමාගමේ විශේෂඥයන්ට රෝගියා වෙත පැමිණීමට සහ අවශ්‍ය බවට තීරණය කරනු ලබන විමසීම් සිදුකිරීමට රක්ෂිතයා හෝ පවුලේ සාමාජිකයකු හෝ ඔහුගේ/ඇයගේ ඥාතීන් හෝ අනුප්‍රාප්තිකයන් හෝ අවසර ලබාදිය යුතු අතර, එම පැමිණීම් මගින් වෘත්තීය රහස්‍යභාවයට ඇතිවීමට ඉඩ ඇති බලපෑම් සම්බන්ධයෙන් සමාගම වග නොකියයි.

හිමිකම් මුදල් ඉල්ලීමකදී, රක්ෂිතයා අදාළ ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොමැත බව පෙනී යන්නේ නම්, මෙම ප්‍රතිලාභය යටතේ අදාළ ගෙවීම් සිදුකිරීම ප්‍රතික්ෂේප කිරීමට සමාගමට අයිතිය ඇත.

### 3.2.6.8 කොන්දේසි

(i) මෙම අතිරේක ආවරණය යටතේ ප්‍රතිලාභ ගෙවීම සලකා බැලෙනුයේ ජීවිත රක්ෂිතයා;

(අ) යුනියන් හෙල්ත් 360 ආවරණය කල් ඉකුත්වීමේ දින; හෝ

(ආ) එක් එක් රක්ෂිතයන්ගේ පහත සඳහන් වයස් සීමාවන් සම්පූර්ණ වීමෙන් පසුව එළැඹෙන ඔප්පු සංවත්සර දින; යන දෙකෙන් කලින් එළැඹෙන දිනට පෙර රෝහල්ගත වුවහොත්

Specimen

සහ/හෝ සැත්කමක් සඳහා භාජනය වුවහොත් පමණි.

- ජීවිත රක්ෂිතයා/කලත්‍රයා/දෙමාපියන්ගේ හැත්තෑ පස් (75) වන උපන්දිනය හෝ
- රක්ෂිත දරුවන්ගේ විසිතුන් (23) වන උපන්දිනය

(ii) දින තිහක (30) අනුග්‍රහ කාලය තුළදී වාරිකය ගෙවා නැත්නම් මෙම අතිරේක ආවරණය බලරහිත වනු ඇති බල රහිත ආවරණය නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සමාගම සතුව ඇති එසේ අනුග්‍රහ කාලසීමාව පසුවී වාරික ගෙවීම් සිදුකර ආවරණය නැවත ප්‍රාණවත් කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කළහොත් ආවරණ හිමි නොවන කාලය බලපැවත්වෙන්නේ එසේ ප්‍රාණවත් කිරීම/ප්‍රතිෂ්ඨාපනය කළ දින සිටය.

(iii) කිසියම් හේතුවක් නිසා මූලික ඔප්පුව අවලංගු වුයේ නම් යූනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයද අවලංගු වේ

(iv) මෙම අතිරේක ආවරණය,

(අ) ලාභාංශ සඳහා දායක නොවන අතර

(ආ) පවාරණ අගයක් ගෙවා නිමි අගයක් හෝ පූර්ණත්ව අගයක් අත්කර නොගනී

(v) මෙම උපලේඛනය යටතේ සලසා ඇති ප්‍රතිලාභය යටතේ පැන නගින හිමිකමක් වෙනුවෙන් කිසිදු ගෙවීමක් ලැබීම සඳහා පැවරුම්ලාභියාට, නාමිකයාට හෝ ප්‍රතිලාභියාට අයිතියක් නැත.

(vi) මෙම ප්‍රතිලාභය මගින් පලමු උපලේඛනයේ සඳහන් පරිදි ශ්‍රී ලංකාව තුළ විදේශ රටවල සිදුකරනු ලබන රෝහල්ගත කිරීම් සහ සැත්කම් ආවරණය වේ.

(vii) ආවරණ වර්ධක ප්‍රතිලාභය හෝ පුනස්ථාපන ප්‍රතිලාභය අදාළ නොවන අවස්ථාවකදී, යූනියන් හෙල්ත් 360 යටතේ එක් අයෙකුට එක් සැලසුම් වර්ෂයක් සඳහා ඉල්ලුම් කළ හැකි උපරිම රක්ෂණ හිමිකම්. මුදල, යූනියන් හෙල්ත් 360 රක්ෂිත මුදලින් 100% සීමාව ඉක්මවා යා නොහැක.

(viii) යූනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය යටතේ පුද්ගලයෙකුට සමාගම වෙතින් ලබාගත හැකි සියලුම රක්ෂණ සැලසුම්වල උපරිම රක්ෂිත මුදල රු මිලියන 60 (රු 60,000,000/-) කට සීමා වේ.

(ix) සාමාන්‍ය ගාස්තු සීමාවන් ඉක්මවා නොයන සහ අවස්ථාව අනුව සාධාරණ සේවා ගාස්තු අයකරනු ලබන වෛද්‍යමය වශයෙන් සිදු කළ යුතු ප්‍රතිකාර ආවරණය වේ.

(x) යූනියන් හෙල්ත් 360 ප්‍රතිලාභයෙහි රක්ෂිත මුදල ඔප්පු කාල සීමාව තුළදී වැඩි කළ නොහැක.

(xi) ඔප්පු හිමියා විසින් මෙම ඔප්පුවේ ඔප්පු කාල සීමාව තුළ බලපැවැත්වෙන, අනෙකුත් රක්ෂණ සමාගම් වලින් ලබාගන්නා ලද මේ හා සමාන අනෙකුත් වෛද්‍ය වියදම් රක්ෂණාවරණ සම්බන්ධයෙන් සමාගම දැනුවත් කළ යුතුය මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය වන පුද්ගලයකුවෙනුවෙන් ඔප්පුව යටතේ හිමිකම් පෑ හැකි රෝහල් වියදම් ආවරණය වන වෙනත් රක්ෂණ ඔප්පු ඇත්නම් සමාගම මෙම ඔප්පුවේ පළමු උපලේඛනයේ සඳහන් උපරිම සීමාවන්ට සහ ඔප්පුවේ විධිවිධාන සහ කොන්දේසි වලට යටත්ව ගෙවිය හැකි උපරිම හිමිකම් මුදලින්, අනිකුත් රක්ෂණ ආයතන මගින් ගෙවූ හෝ ගෙවීමට තීරණය කර ඇති මුදල අඩු කර ඉතිරි මුදල පමණක් ගෙවනු ලබයි.

(xii) යූනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය ලබාගත හැක්කේ (i) ශ්‍රී ලාංකික පුරවැසියන් සහ (ii) අවම වශයෙන් මාස 6 ක් ශ්‍රී ලංකාවේ ජීවත් වන සහ ශ්‍රී ලංකාව තුළ සත්‍ය වශයෙන් පදිංචි ලිපිනයක් සහිත ශ්‍රී ලංකාවේ පදිංචි වුවන්ට පමණි රක්ෂිතයා දින 90 ක් හෝ ඊට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත් වන්නේ නම් සැලසුම් යටතේ විදේශ රටවල සිදුකරනු ලබන රෝහල්ගත කිරීම් සහ සැත්කම් ලැබෙන ආවරණ අවලංගු වේ කෙසේ වුවද රක්ෂණ හිමියා ආපසු ශ්‍රී ලංකාවට පැමිණි විට රක්ෂණ සැලසුම ආපසු සක්‍රීය වන අතර මුලින් පැවති වගන්ති හා කොන්දේසි යටතේ එය නැවත ක්‍රියාත්මක වේ.

(xiii) පිටරටකදී (USA සහ කැනඩාව යන රටවල් හැර) ප්‍රතිකාර ලබාගන්නේ නම් සැලසුම් හිමියා ඒ සම්බන්ධයෙන් සමාගම වෙත ලිඛිතව දන්වා අවසර ලබාගත යුතු යී මෙම සැලසුමේ ප්‍රථම උප කොටස යටතේ දක්වා ඇති උපරිම සීමාවන්ට යටත්ව විදේශ රටවල රෝහල්ගත වී ප්‍රතිකාර ගැනීම් සඳහා වන වියදම් ප්‍රතිපූරණය සිදුකෙරේ රෝහලින් බැහැර වන දිනයට අදාලව ශ්‍රී ලංකා

Specimen

මහ බැංකුව විසින් ප්‍රකාශිත විනිමය අනුපාතයන්ට අනුව, ශ්‍රී ලංකා මුදල් වලින් අදාළ ප්‍රතිලාභ ගෙවීම සිදුකෙරෙනු ඇති කිසියම් හිමිකම් මුදල් ඉල්ලීමක් සමාගම විසින් පිළිගනු ලැබුවේ නම්, ඒ සම්බන්ධ මුදල් තම අභිමතය පරිදි රක්ෂණ හිමියාට හෝ, අදාළ රෝහලට හෝ වෙනත් අදාළ සේවා සම්පාදකයෙකුට හෝ ගෙවීමේ පූර්ණ අයිතිය සමාගම සතු ය. මෙසේ රෝහල වෙත හෝ වෙනත් අදාළ පාර්ශවයක්වෙත ගෙවන ලද මුදල, හිමිකම් මුදල් ඉල්ලීමට අදාළව සමාගම විසින් පූර්ණ සහ අවසන් වශයෙන් හිමිකම් මුදල් ගෙවනු ලැබීමක් ලෙස සැලකිය යුතු අතර එය මෙම ප්‍රතිලාභය යටතේ රක්ෂණ සැලසුම් හිමියා වෙත කරන ලද හිමිකම් මුදල් ගෙවීමක් ලෙස සැලකිය යුතු වේ.

### 3.2.6.9 මෙම ආවරණයට අදාළ බැහැර කිරීම්

ඍජුව හෝ වක්‍රව පහත සඳහන් හේතු බලපෑම නිසා රෝහල්ගත වීමට හෝ සැත්කමක් කිරීමට සිදුවන අවස්ථාවකදී, ඒ සඳහා කිසිදු ගෙවීමක් කිරීමට සමාගම බැඳී නොසිටී.

(i) සියදිවි නසාගැනීමේ උත්සාහයකදී ඇතිවන හෝ තමන් විසින් තමන්ටම සිදුකරගනු ලබන තුවාල (මත්ද්‍රව්‍ය සහ මත්පැන් අවභාවිතයෙන් ඇතිවන ප්‍රතිවිපාක ඇතුළුව, එහෙත් එයට සීමා නොවී) සහ/හෝ

(ii) මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් හෝ මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් ඇතිවන සංකූලතා හෝ ප්‍රතිකාර අවශ්‍ය වන රෝගී තත්ත්ව/මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීමෙන් මුදවාගැනීමට සිදුකරන ප්‍රතිකාර සහ මත්පැන් පානය කර රිය පැදවීමෙන් සිදුවන රිය අනතුරු; සහ/හෝ

(iii) කිසියම් රෝග තත්ත්වයන් පිළිබඳ යෝජනා පත්‍රයේ හෝ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි හෙළිදරව් කොට එම තත්ත්වයන් ආවරණය වන බවට සමාගම විසින් ලිඛිතව ප්‍රකාශ කර ඇති විටකදී හැරෙන්නට ඔප්පුව ලබා ගැනීමට පෙර සිටම පැවති රෝග, අසනීප හෝ ආබාධ තත්ත්වයන් (රෝග නිශ්චයක් කළද, නොකළද, ප්‍රතිකාර ලැබූ හෝ නොලැබූ කිසියම් රෝග තත්ත්වයක්, රෝග ලක්ෂණයක්, තුවාලයක් හෝ/හා සමාන තත්ත්වයකි. එමෙන්ම රක්ෂිතයා දැනුවත්ව සිටි හෝ නොසිටි පෙර පැවති රෝගයකින් ඍජුවම හෝ වක්‍රකාරයෙන් ඇතිවන සංකූලතා ද පෙර පැවති රෝග තත්ත්වයන් ලෙස සැලකේ); සහ/හෝ

(iv) යුද්ධයක් හෝ යුද තත්ත්වයකට සමාන සිදුවීමක්, ත්‍රස්තවාදී ක්‍රියාවක්, ආක්‍රමණයක, විදේශ සතුරු ක්‍රියාවක්, එදිරිවාදීකමක්, යුධ තත්ත්වයක් ප්‍රකාශ කළ හෝ නොකළ යුද්ධයකට සමාන සිද්ධියක්, කැරලි කෝලාහලයක්, හමුදා කැරැල්ලක්, විප්ලවයක්, රාජ්‍ය හෝ කිසියම් පළාත් පාලන අධිකාරියක නියෝගය මත කෙරෙන රාජසන්තකවීමටඑරෙහිවීමක්, නීත්‍යානුකූලව පිහිටුවන ලද ආණ්ඩුවක් බලයෙන් පෙරළාදැමීම සඳහා ක්‍රියාකරන පුද්ගලයෙකුට හෝ සංවිධානයකට සහය දැක්වීමක්; සහ/හෝ

(v) නාවුක, ගුවන් හෝ සන්නාහ සන්නද්ධ බලකාවල, හමුදා මෙහෙයුම් නිසා හෝ ත්‍රස්තවාදීන්, කැරලිකරුවන් මැඩපැවැත්වීම සඳහා හමුදා නියෝග මත අවිආයුධ පාවිච්චි කිරීමේ මෙහෙයුම් වලට සහභාගිවීම නිසා; සහ/හෝ

(vi) පරමාණුක අවදානම්: එනම් පරමාණුක බලශක්තියට (පරමාණුක ප්‍රතික්‍රියා, විකරණ අවදානම්), පරමාණුක අපද්‍රව්‍යවලට හෝ ඕනෑම ආකාරයක රසායනික බලපෑම්වලට නිරාවරණය වීම; සහ/හෝ

(vii) අවදානම් සහිත ක්‍රීඩා/ක්‍රියාකාරකම්; පහත සඳහන් ක්‍රීඩා/ක්‍රියාකාරම් ඇතුලුව එහෙත් ඒවාට පමණක් සීමා නොවූ, භයානක නැතහොත් අනතුරුදායක ක්‍රියාකාරකම්; දියයට කිමිදීම, මෝටර් රථ ධාවන, ගවනේසිට පැරෂුට් වලින් පැනීම, එල්ලී ලිස්සායාම (හැංග් ග්ලයිඩින්), කඳු හෝ ගිරි ශිඛර තරණය කිරීම, දෙපයින් හැර කරන ඕනෑම වර්ගයක ධාවන තරඟ, රාෆ්ටින්, බන්ජි පැනීම, ගල් ගුහා තරණය හා ගවේෂණය (පොට්හෝලින්), දඩයම් කිරීම්, පොලෝ ක්‍රීඩා, අයිස් හොකී ඇතුලුව අනෙකුත් හිම ක්‍රීඩා හෝ සමාගම විසින් ලිඛිතව අනුමත කර ඇති ක්‍රීඩාවක/ක්‍රියාවකට හැර ඕනෑම වෘත්තීමය ගණයට වැටෙන ක්‍රීඩාවක්; සහ/හෝ

(viii) හිම කඳු කඩාවැටීම්, නාය යාම්, භූමිකම්පා, ගංවතුර, භූමිකම්පා හෝ ගිනිකඳු පිපිරීම් නිසා ඇතිවන සුනාමි හෝ උදම් රළ, සුළිසුළං, කුණාටු, ටෝනේඩෝ ඇතුළු සහ තවත් ආකාරයේ ස්වභාවික උපද්‍රව; සහ/හෝ

Specimen

(ix) අත්හදා බැලීම් සඳහා කරනු ලබන ප්‍රතිකාර කිරීම් සහ රෝග නිශ්චය සඳහාම පමණක් කරනු ලබන බයොප්සි, එන්ඩොස්කොප, ලැප්රොස්කොපි, ආර්තරොස්කොපි, එක්ස් කිරණ පරීක්ෂා හෝ රසායනාගාර පරීක්ෂණ හෝ රෝහල් ගතවීමට හේතුවූ රෝග, අසනීප හෝ තුවාල නිශ්චය කරගැනීම සඳහා සම්බන්ධතාවයක් නොමැති අනෙකුත් පරීක්ෂණ; සහ/හෝ

(x) සමාගමේ ලිඛිත අනුමැතිය ඇතිවිටෙක හැර; ඇස් කණ්නාඩි/කාච□ ශ්‍රවණාධාර සම්පාදනය, කිහිලිකරු, කෘතිම අත්/පා, දන්ත උපාංග, කෘතිම දත් සහ අනෙකුත් සියලු බාහිර උපාංග සඳහා වන ගාස්තු සමාගම විසින් විශේෂයෙන් පිළිගෙන හෝ සාමාන්‍ය අක්ෂි ප්‍රතිකාර ප්‍රතිලාභය සහ සාමාන්‍ය දන්ත ප්‍රතිකාර ප්‍රතිලාභය යටතේ ආවරණය නොකළහොත් සහ/හෝ

(xi) ශරීරයේ සිදුවන ස්වාභාවික වෙනස්කම් (ආර්තවහරණය) නිසා අවශ්‍ය වන සැත්කම්, ගර්භනීභාවය, ගබ්සා වීම සහ ගබ්සා කිරීම්: මාතෘ ප්‍රතිලාභ යටතේ විශේෂයෙන් ලබාගෙන නොමැති නම්* හෝ ඉන් ඇතිවන සංකූලතා හෝ දරු ප්‍රසූතිය හෝ ඒ හා සම්බන්ධව ඇතිවන සංකූලතා; සහ/හෝ

(xii) දරුවන් ලැබීමේ නොහැකියාව හා මඳ සරු බව නිසා කෙරෙන පරීක්ෂණ සහ ඒ සඳහා කෙරෙන ප්‍රතිකාර, ලිංගික වෙනස් කිරීම් සඳහා වූ සැත්කම්, කෘතිම සංසේචනය හෝ දරුවන් පිළිසිඳවා ගැනීම සම්බන්ධ සැත්කම්, පැලෝපීය නාලයේ වන සිඳලීම් හා මාරු කිරීම්□ කළල මාරු කිරීම්□ ස්ත්‍රී බීජ බද්ධය යනාදී ප්‍රතිකාර ක්‍රම හෝ උපත්පාලන ක්‍රම Gamete Intra-Fallopian Transfer (GIFT) සැත්කම්, Zygote intra-fallopian transfer (ZIFT) සැත්කම්. Embryo Transport, Donor Ovum වැනි සැත්කම් හා ප්‍රතිකාර ක්‍රම සඳහා යන වියදම් සහ/හෝ

(xiii) උපතේදීම ඇතිවන අබල දුබලතා, අක්‍රමිකතා සහ සංජානීය රෝග, වර්ණ දේහ විකෘතිතා නිසා ඇතිවන අසාමාන්‍යතා (උදා: ඩවුන්ස් සින්ඩ්‍රෝම්); සහ/හෝ

(xiv) ප්‍රවේනිගත රෝග ජාන දෝෂ සහ මූලික ජනක සෛල බද්ධය/සැත්කම්/තැන්පත් කිරීම; සහ/හෝ

(xv) රෝගී තත්ත්වයක් හෝ ශරීරයේ ඇතිවන තුවාලයක් නිසා අවශ්‍ය වන අවස්ථාවකදී හැර අනෙක් ඕනෑම  අවස්ථාවකදී සිදුකරනු ලබන ඕනෑම ආකාරයක රූපලාවණ්‍ය ප්‍රතිකාර, අක්ෂි ප්‍රතිකාර, සහ ඕනෑම ආකාරයක ප්ලාස්ටික් සැත්කම්; සහ/හෝ

(xvi) වෙනත් පාර්ශවයකට ඉන්ද්‍රියන් ප්‍රදානය කිරීම සඳහා කරන සැත්කම් (දායකයෙකු ලෙස) හෝ ඉන්ද්‍රිය ප්‍රදානය සුදුසුදැයි බැලීමට සිදුකරන පරීක්ෂණ සහ ප්‍රතිකාර; සහ/හෝ

(xvii) වෛද්‍ය හේතූන් මත නොවන ප්‍රතිකාර ක්‍රම හෝ සුදුසුකම්ලත්, ලියාපදිංචි වෛද්‍යවරයකු/ශල්‍ය වෛද්‍යවරයෙකුගේ අනුමැතියෙන් තොරව හෝ රෝගයකට හෝ තුවාලයකට හැර වෙනත් කිසියම් හේතුවක් නිසා සිදුකරන ප්‍රතිකාර; සහ/හෝ

(xviii) අඥාත හේතුක අපස්මාරය සහ මනෝ චිකිත්සක හෝ මානසික රෝග නිසා කරනු ලබන ප්‍රතිකාර; සහ/හෝ

(xix) ස්ථූලතාවට ප්‍රතිකාර, බර අඩුකිරීම හෝ බර කළමනාකරණය සඳහා කරනු ලබන සැත්කම් හෝ ප්‍රතිකාර ක්‍රම; සහ/හෝ

(xx) මෙම ආවරණය යටතේ බැහැර කිරීමට ලක්නොවන රෝගයක්□ අසනීපයක් හෝ තුවාලයක් හේතුවෙන් හෝ හදිසි අනතුරක් නිසා අවශ්‍ය වන සුන්නත් කිරීම හැර අනෙකුත් සුන්නත් කිරීම්; සහ/හෝ

(xxi) නිල වශයෙන් පිළිගත් (ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් හෝ දේශීයව) වසංගත රෝගයන්, මුළු රටේ පැතිර ඇති රෝග තත්ත්වයන් සහ රජය විසින් රෝග නිවාරණය වෙනුවෙන් පවත්වන වැඩසටහන්; සහ/හෝ

(xxii) HIV රෝගය, AIDS රෝග තත්ත්වය හා/හෝ ලිංගිකව බෝවන රෝග හා ඒ ආශ්‍රිත රෝග තත්ත්ව නිසා ඇතිවන තත්ත්වයන්; ඒඩ්ස් හා සමාන කිසියම් අදාළ රෝග තත්ත්වයක් සෘජුව හෝ වක්‍රව හේතු වන්නේ නම් සහ/හෝ

(xxiii) සුදුසුකම්ලත්, ලියාපදිංචි වෛද්‍යවරයෙකු/ශල්‍ය වෛද්‍යවරයකු හැරෙන්නට වෙනත් පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන ප්‍රතිකාර (රක්ෂිත පුද්ගලයාගේ නෛතික නිවසේ වෙසෙන්නෙකු විසින්, රක්ෂිත පුද්ගලයා ලෙස හෝ රක්ෂිතයාගේ පවුලේ සාමාජිකයෙකු ලෙස කලත්‍රයා,

Specimen

සහෝදරයා/සහෝදරිය, දෙමාපියන් හෝ දරුවෙකු විසින් දෙන ලද වෛද්‍ය සේවාවන්ද ඇතුළත් වේ) සහ/හෝ

(xxiv) බටහිර වෛද්‍ය ක්‍රමයට ඇතුළත් නොවන ස්වභාවික ප්‍රතිකාර ක්‍රම, කටු චිකිත්සාව, ශාකසාර ප්‍රතිකාර සහ ආයුර්වේද ප්‍රතිකාර ආදිය සිදුකරන අවස්ථා; සහ/හෝ

(xxv) රෝහල විසින් අයකරනු ලබන ඕනෑම ආකාරයක සේවා ගාස්තු, වැට්, බදු, අතිරේක ගාස්තු, ඇතුළත්වීමේ ගාස්තු/ ලියාපදිංචි ගාස්තු ආදිය; සහ/හෝ

(xxvi) රෝහල්ගත වී සිටි කාලයේදී පෞද්ගලික පරිභෝජනය සඳහා ලබාගත් අතිරේක පහසුකම් වන, සහ රෝහල/සාත්තු නිවාසය මගින් නිකුත් කරන ලද බිල්පතේ පැහැදිලිව වෙනම සඳහන් කර ඇති, රූපවාහිනී හා දුරකථන පහසුකම් ආදිය සඳහා වන ගාස්තු; සහ/හෝ

(xxvii) Sleep Apnoea Syndrome (C.P.A.P), Continuous Ambulatory Peritoneal Dialysis (C.P.A.D), සහ ක්ලෝමීය ශ්වාස තත්ත්වය සඳහා වන Oxygen concentrator වැනි ප්‍රතිකාර ක්‍රම සඳහා යන වියදම් ඇතුළුව, ප්‍රතිකාරයෙන් පසු කරන සත්කාර වශයෙන් නිවසේදී භාවිතා කරන ලද ඕනෑම ආකාරයක බාහිර වෛද්‍ය උපාංග සඳහා යන වියදම්; රෝහලින් පිටවීමෙන් පසු නිවසේදී භාවිතය සඳහා නියම කරනු ලබන සියලුම ආකාරයේ වෛද්‍ය උපකරණ වෙනුවෙන් වන වියදම් සහ/හෝ

(xxviii) හදිසි අනතුරක් නිසා ස්වභාවික දත්වලට සිදුවූ හානිවලට ප්‍රතිකාරයක් ලෙස හැර, වෙනත් හේතුවක් නිසා සිදුකරනු ලබන දන්ත වෛද්‍ය සැත්කම් හා ප්‍රතිකාර ආදිය; සහ/හෝ

(xxix) උපසමනය, සාමාන්‍ය දුබලතාව, කාලයත් සමග ක්‍රමයෙන් සුව වන රෝග සාමාන්‍ය ගිලන් බව/දුර්වල වීම, සහ බාහිර හෝ අභ්‍යන්තර වශයෙන් උප්පත්තියෙන් පැවතෙන අසනීප තත්ත්ව/රෝග/විකලතා; සහ/හෝ අධික තෙහෙට්ටුව, විවේක ගැනීමේ ප්‍රතිකාරය, උපතින් එන අභ්‍යන්තර හෝ බාහිර රෝග තත්ත්ව හා දුබලතා සහ/හෝ

(xxx) ඕනෑම ආකාරයක එන්නත්; ආවරණය හැර සහ/හෝ

(xxxi) රෝගයක් හෝ තුවාලයක් සඳහා කෙරෙන ප්‍රතිකාරවල අනිවාර්ය අංගයක් නොවන, අදාළ වෛද්‍යවරයා විසින් තහවුරු නොකරන ලද විටමින, ටොනික් වර්ග සහ පෝෂණ අතිරේක ආදිය; සහ/හෝ

(xxxii) හදිසි අනතුරක් නිසා සිදුවූ හානියක් නිවැරදි කිරීමක් බවට සමාගමට සතුටුදායක කරුණු ඉදිරිපත් කරන ලද අවස්ථාවකදී හැර, නාසයේ හැඩයේ වෙනස්කම් ආදිය සිදුකිරීමට කරනු ලබන සැත්කම්; සහ අධිවර්ධිත බඹුරු අස්ථිය සඳහා සිදුකරන සැත්කම් සහ/හෝ

(xxxiii) මෙහි දක්වා ඇති, පැය 24 ක් තුළ අවසන් වන සැත්කම් හැර බාහිර රෝගී රෝග විනිශ්චයන්, ප්‍රතිකාර හා සැත්කම්, නිර්දේශ කර නොමැති ඖෂධ සහ වෛද්‍ය සැපයුම්, හෝමෝන ප්‍රතිස්ථාපන චිකිත්සා, ලිංග පරිවර්තන හෝ ලිංග පරිවර්තනය නිසා කිරීමට සිදුවන ප්‍රතිකාර ආදිය; සහ/හෝ

(xxxiv) මෙම සැලසුම යටතේ ආවරණය වන, මූලික ප්‍රතිකාරවලින් පසු සත්කාරයන් අවශ්‍ය නොවන රෝග තත්ත්වවලදී, රෝග විනිශ්චයකින් තොරව පැය 24 ක කාලයක් රෝහලේ රැඳී සිට ඇති අවස්ථා (ප්‍රතිකාර ලබා නොගෙන රෝහලක නැවතී සිටීම සහ වෛද්‍යවරයෙකු විසින් එක දිගට, සක්‍රිය ප්‍රතිකාරයක් ලබා නොදෙන අවස්ථාද මීට ඇතුළත් වේ.

(xxxv) විවේක මධ්‍යස්ථාන, සුවවීම් මධ්‍යස්ථාන, භාරකාර නිවාස, වැඩිහිටි නිවාස, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සඳහා වන නිවාස, මානසිකව රෝගී වූවන් සඳහා වන මධ්‍යස්ථාන ආදියේදී ලබාගන්නා ප්‍රතිකාර (අදාළ ආයතනය රෝහලක් හෝ සාත්තු නිවාසයක් ලෙස නිසි බලධාරී ආයතනවල ලියාපදිංචි කර තිබුණද මෙය අදාළ වේ); සහ/හෝ

(xxxvi) සමාගම විසින් වෙනත් ආකාරයකට දක්වා නොමැති නම් ශ්‍රී ලංකාවෙන් පිටතදී කරනු ලබන ප්‍රතිකාර සහ/හෝ

(xxxvii) ජල ප්‍රතිකාර මධ්‍යස්ථාන, ස්වාභාවික ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ ස්පා ආදියේදී සිදුකරනු ලබන ප්‍රතිකාර

Specimen

**උපලේඛණ අංක 3.2.7**

## 3.2.7 ළමා සෞඛ්‍ය ප්‍රතිලාභය (CHB)

### 3.2.7.1 ප්‍රධාන අරමුණු සහ අවශ්‍යතාවය

ළමා සෞඛ්‍ය ප්‍රතිලාභය (CHB) ඇතුලත් වන බව ඔප්පුවෙහි පළමු උපලේඛණයේ ෂෂ කොටසේ සඳහන් වී තිබේ නම් පමණක් මෙම ප්‍රතිලාභය අදාළ වේ.

රක්ෂණ ඔප්පුවේ පොදු ඔප්පු කොන්දේසි, විධිවිධාන හා වරප්‍රසාද වලට යටත්ව පහත සඳහන් විශේෂ ඔප්පු කොන්දේසි හා විධිවිධාන වලට යටත්ව, ඔප්පුව ප්‍රාණවත්ව පවතී නම් සහ මෙම ප්‍රතිලාභය සඳහා අදාළ වාරිකය ගෙවා තිබේ නම් සහ සමාගම සෑහීමකට පත්වන පරිදි සාක්ෂි ඉදිරිපත් කොට තිබේ නම්, සමාගම විසින් පහත සඳහන් ප්‍රතිලාභ ලබා දෙනු ඇත. උපලේඛන අංක 4 හි අඩංගු නිර්වචනයන් මෙම ප්‍රතිලාභයට අදාළ වේ. (i) සැත්කම් ප්‍රතිලාභය මෙම ප්‍රතිලාභයේ “3.2.7.3” සැත්කම් ලැයිස්තුවෙහි සඳහන් සැත්කමක්, දරුවා/දරුවන් හට කරන ලද්දේ නම්, එම සැත්කම වෙනුවෙන් වියදම් වූ මුදල නොසලකා හැර, සමාගම විසින් පළමු උපලේඛණයේ II කොටසේ ළමා සැත්කම් ප්‍රතිලාභයෙහි මූලික රක්ෂිත මුදලින් අදාළ සැත්කම සඳහා වලංගු ප්‍රතිශතයන් ගණනය කොට එම කොටස එකවර ගෙවනු ලැබේ. මෙම සැත්කම් සඳහා වන රක්ෂිත මුදල් ගෙවීමේ ප්‍රතිශතයන්, 3.2.7.3” යටතේ දක්වා ඇත.

(ii) **රෝහල් දීමනා ප්‍රතිලාභය**

